325 වන කාණ්ඩය - 09 වන කලාපය
தொகுதி 325 - இல. 09
Volume 325 - No. 09

2026 මාර්තු 04වන බදාදා
2026 மார்ச் 04, புதன்கிழமை
Wednesday, 04th March, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1581]

**පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරිනියකට ලිංගික හිරිහැර සිදු වූවා යැයි එල්ල වන චෝදනා හා සම්බන්ධ විමර්ශන වාර්තාව** [තීරුව 1582]

**ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න** [තීරු 1584-1603]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1605-1632]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
මැදපෙරදිග යුද තත්ත්වයෙහි බලපෑම අවම කිරීමට රජයේ සූදානම [තීරුව 1633]
උද්ධමන ඉලක්කවලින් බැහැර වීම [තීරුව 1646]

**ගරු චමින්ද විජේසිරි මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම** [තීරුව 1649]

**ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරු 1654–1747]

**කල්තැබීමේ ප්‍රශ්න** [තීරු 1747-1754]


# பிரதான உள்ளடக்கம்


**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப:** 1581]

**பாராளுமன்ற தகவல் முறைமை மற்றும் முகாமைத்துவத் திணைக்கள பெண் அலுவலருக்குப் பாலியல் துன்புறுத்தல் இழைக்கப்பட்டதாகக் கூறப்படும் குற்றச்சாட்டு சம்பந்தமான விசாரணை அறிக்கை [ப:** 1582]

**மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள் [ப:** 1584-1603]

**வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப:** 1605-1632]

**தனி அறிவித்தல் மூல வினா:**
மத்திய கிழக்கில் போர் சூழ்நிலையின் தாக்கத்தை குறைக்க அரசாங்கத்தின் தயார்நிலை **[ப:** 1633]
பணவீக்க இலக்கிலிருந்து விலகல் **[ப:** 1646]

**மாண்புமிகு சமிந்த விஜேசிறியினது சொந்த விளக்கம் [ப:** 1649]

**நுண்நிதி மற்றும் கடன் ஒழுங்குபடுத்தும் அதிகாரசபை சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது **[ப:** 1654-1747]

**ஒத்திவைப்பு வினாக்கள் [ப:** 1747-1754]


# PRINCIPAL CONTENTS


AUDITOR-GENERAL'S REPORT [Col. 1581]

REPORT OF INVESTIGATION INTO ALLEGED SEXUAL HARASSMENT OF A FEMALE EMPLOYEE IN INFORMATION SYSTEMS AND MANAGEMENT DEPARTMENT OF PARLIAMENT [Col.1582]

QUESTIONS POSED TO HON. PRIME MINISTER [Cols. 1584–1603]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1605–1632]

QUESTION BY PRIVATE NOTICE:
Government's Preparedness to Mitigate Impact of War Situation in the Middle East [Col. 1633]
Deviation from Inflation Target [Col. 1646]

PERSONAL EXPLANATION BY HON. CHAMINDA WIJESIRI [Col. 1649]

MICROFINANCE AND CREDIT REGULATORY AUTHORITY BILL:
Read a Second, and the Third time and passed as amended [Cols. 1654-1747]

ADJOURNMENT QUESTIONS [Cols. 1747-1754]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026* මාර්තු *04*වන බදාදා**
*2026 மார்ச் 04, புதன்கிழமை*
*Wednesday, 04th March, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXXVII, XXXVIII, XXXIX, XL සහ XLI කොටස් සහ සිව්වැනි කාණ්ඩයේ XXI, XXII, XXIII සහ XXIV කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## II
## පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරිනියකට ලිංගික හිරිහැර සිදු වූවා යැයි එල්ල වන චෝදනා හා සම්බන්ධ විමර්ශන වාර්තාව
## பாராளுமன்ற தகவல் முறைமை மற்றும் முகாமைத்துவத் திணைக்கள பெண் அலுவலருக்குப் பாலியல் துன்புறுத்தல் இழைக்கப்பட்டதாகக் கூறப்படும் குற்றச்சாட்டு சம்பந்தமான விசாரணை அறிக்கை
REPORT OF INVESTIGATION INTO ALLEGED SEXUAL HARASSMENT OF A FEMALE EMPLOYEE IN INFORMATION SYSTEMS AND MANAGEMENT DEPARTMENT OF PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරිනියකට සිදු වූවා යැයි කියනු ලබන ලිංගික හිංසන පිළිබඳ සොයා බලා වාර්තා කිරීම සඳහා බාහිර පරීක්ෂණයක් පැවැත්වීමට 2025.07.25 දින පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය උපදේශක කාරක සභාව ගනු ලැබූ තීරණය ප්‍රකාරව, විශ්‍රාමික මහාධිකරණ විනිසුරු සුජාතා අලහප්පෙරුම මහත්මිය විසින් සිදු කරන ලද විමර්ශනයට අදාළව 2025.11.24 දින මා වෙත ඉදිරිපත් කරන ලද එකී අවසන් පරීක්ෂණ වාර්තාව 2026.02.19 දින පැවති පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය උපදේශක කාරක සභාවේ තීරණය ප්‍රකාරව, සභාගත කරමි.

ගරු මන්ත්‍රීවරයන්ගේ පරිශීලනය සඳහා එකී වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තු පුස්තකාලයේ තබා ඇති බවත් සඳහන් කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Report on the submission of observations and steps taken in terms of Standing Order No. 119(4) of Parliament with regard to the matters mentioned on the Department of Meteorology in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2019/2020 සහ 2020/2021 වර්ෂ සඳහා ගල්ඔය වැවිලි පුද්ගලික සමාගමේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මෙම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා තාක්ෂණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)
ගරු කථානායකතුමනි, රත්ගම, කටුපොල්වත්ත, දින 100 නිවාස, අංක 183 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ගුණදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂණ රාජකරුණා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
ගරු කථානායකතුමනි, උඩවලව, මුදුන්මංකඩ, අංක 990/1 යන ලිපිනයෙහි පදිංචි එච්.එම්. අමරපාල මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
ගරු කථානායකතුමනි, මුලටියන, සීනිපැල්ල, තිත්මලේ නිවස යන ලිපිනයෙහි පදිංචි ජේ.ඒ. ලලිත් බෝදන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නන්ද බණ්ඩාර මහතා**
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)
ගරු කථානායකතුමනි, වත්තල, කෙරවලපිටිය, පරණවත්ත පාර, අංක 24 යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්. අනුර බණ්ඩාර විජේතුංග මහතා සහ වෙනත් තිදෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මා අසන ප්‍රශ්නය මෙයයි.

2025/2026 මහ කන්නයේ වී අස්වනු නෙළීම ආරම්භ වී තිබේ. අස්වනු නෙළීම ආරම්භ වීමත් සමඟ සෑම වර්ෂයකම වී මිලදී ගැනීම හා සබැඳි ගැටලු නිරාකරණය කරමින්, ගොවියා ආරක්ෂා කර ගනිමින්, පාරිභෝගිකයාද අපහසුතාවට පත් නොකිරීමට රජය කටයුතු කළ යුතුය.

01. 2025/2026 මහ කන්නය සඳහා රජය විසින් වී මිලදී ගැනීම සඳහා නියම කර ඇති සහතික මිල වී වර්ගය අනුව සඳහන් කරන්න.
02. 2025/2026 මහ කන්නයේ වී නිසි මිලට ගොවීන් වෙතින් මිලදී ගැනීම සඳහා රජය විසින් අනුගමනය කරනු ලබන යාන්ත්‍රණ මොනවාද?
03. 2025/ 2026 මහ කන්නය සඳහා වී මිලදී ගැනීමට රජය විසින් වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද?
04. වී අලෙවි මණ්ඩලය හෝ රජයේ මැදිහත්වීම මත වී මිලදී ගැනීම් සිදු කරන මධ්‍යස්ථාන ප්‍රමාණය දිස්ත්‍රික්ක මට්ටමින් කොපමණද?
05. පසුගිය කන්නයේ වී මිලදී ගැනීමේදී ඇති වූ ගැටලු අවම කර ගැනීම සඳහා ගෙන ඇති නව ප්‍රතිපත්තිමය සංශෝධන කවරේද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු සුසන්ත කුමාර නවරත්න මහතා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. නාඩු වී කිලෝ 01ක් - රු. 120යි

සම්බා වී කිලෝ 01ක් - රු. 130යි

කීරි සම්බා වී කිලෝ 01ක් - රු. 140යි

02. වී මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලයේ ගබඩා විවෘත කර ඇත. වී මිලදී ගැනීම සඳහා සහතික මිලක් නියම කර ඇති අතර, ප්‍රමිතියට සකස් කර ඇති වී, වී අලෙවි මණ්ඩලයේ ගබඩාවලට ලබා දීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත.

03. රුපියල් මිලියන 10,000ක්.

04. වී මිලදී ගැනීම් සිදු කරන මධ්‍යස්ථාන ප්‍රමාණ පහත ඇමුණුම මඟින් ඉදිරිපත් කරනවා.

### වී අලෙවි මණ්ඩලය

### 2025 /26 මහ කන්නය වී මිළදී ගැනීමට විවෘත කර ඇති ගබඩා 2026.02.28

| | දිස්ත්‍රික්කය | ගබඩාව |
|---|---|---|
| 1 | අම්පාර | දීඝවාපිය |
| 2 | | අක්කරපත්තු 1 |
| 3 | | මහානාගපුර |
| 4 | | පොතුවිල් 2 |
| 5 | | දමන |
| 6 | | හුලංනුගේ |
| 7 | | ලාහුගල |
| 8 | | ගුරුපුර |
| 9 | | වලගම්පපුර |
| 10 | | මල්වත්ත |
| 11 | | නවින්දගවලි |
| 12 | | සාගම |
| 13 | මඩකලපුව | පුලිපංචිකල් |
| 14 | | වාලච්චේන |
| 15 | | සතොස |
| 16 | | කරදියොනාරු |
| 17 | | මනල්පිඩ්ඩි |
| 18 | | මුල්ලාමනේ |
| 19 | | තුම්පන්කරණි |
| 20 | කුරුණෑගල | මිල්ලෑව |
| 21 | | ගැට්ටුවාන |
| 22 | | නිකවැරටිය |
| 23 | | මීගලෑව |
| 24 | | මහව |
| 25 | | මාඑළිය |
| 26 | | ගල්ගමුව |
| 27 | | ඉපලෝගම |
| 28 | පුත්තලම | රොජකදළුව |
| 29 | | තබ්බෝව 02 |
| 30 | | ආණමඩුව |
| 31 | | නවගත්තේගම |
| 32 | | වරාවැව 02 |
| 33 | | රාමනාදපුරම් |
| 34 | කිලිනොච්චි | අක්කරායන් |
| 35 | | අක්කරායන් සමූපකාර |
| 36 | | පුලියපොක්කනෙයි |
| 37 | | ක්නඩාවේලි |
| 38 | | මුලන්නකවිල් |
| 39 | ගම්පහ | මරදගහමුල්ල |
| 40 | මුලතිව් | කුමුලමුනෙයි |
| 41 | | කුරිප්පු |
| 42 | | තන්නිරිට්ටු |
| 43 | | සුකන්තිරපුරම් |
| 44 | | ඔළුමඩු |
| 45 | | තුනුක්කායි |
| 46 | | පුදුකුඩිඉරිප්පු |
| 47 | වව්නියාව | වෙප්පම්කුලම |
| 48 | | පර්ක් රෝඩ් |
| 49 | | මාමඩුව |
| 50 | | නෙදුන්කරනි සමූපකාර |
| 51 | මන්නාරම | අල්කඩිවේලි |
| 52 | | මුරුන්ගන් |
| 53 | හම්බන්තොට | පල්ලෙමලල |
| 54 | | සීනිමුන්න |
| 55 | | වීර කැටිය |
| 56 | | කච්චිගල්ආර |
| 57 | | සූරියවැව |
| 58 | | දෙහිගහලන්ද |
| 59 | | වීරවිල |
| 60 | | යෝධකන්ඩිය |
| 61 | රත්නපුර | කුට්ටිගල |
| 62 | | මොරකැටිය |
| 63 | | කල්තොට |
| 64 | මොනරාගල | හුලංදාව |
| 65 | | මැදගම |
| 66 | | මුතුකන්ඩිය |
| 67 | | වැල්ලවාය |
| 68 | | අළුත්වැව |
| 69 | | ඇතිමලේ |
| 70 | මාතර | මැද්දවත්ත |
| 71 | | තලාව |
| 72 | | තඹුත්තේගම |
| 73 | අනුරාධපුරය | කටියාව |
| 74 | | සේනපුර |
| 75 | | කැකිරාව |
| 76 | | නොච්චියාගම |
| 77 | | නෑගම |
| 78 | | පේමඩුව |
| 79 | | හැළඹෑව |
| 80 | | කලාවැව |
| 81 | | පබුල්නෑව |

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

| | | |
|---|---|---|
| 82 | | ශ්‍රාවස්තිපුර |
| 83 | | සේනානායක |
| 84 | | මැදවච්චිය |
| 85 | | පදවිපරාක්‍රමපුර |
| 86 | | පහලහල්මිල්ලෑව |
| 87 | | ගල්කිරියාගම |
| 88 | | ජයන්තිපුර |
| 89 | මාතලේ | පැල්වෙහෙර |
| 90 | | ගලේවෙල |
| 91 | ත්‍රිකුණාමලය | කන්තලේ |
| 92 | | කල්ලාරු |
| 93 | | තඹලගමුව |
| 94 | | ගොමරන්කඩවල |
| 95 | | ලව්ලේන් |

05. වී අලෙවි මණ්ඩලය මඟින් මිලදී ගත් සම්බා/ කීරි සම්බා වීවල මිල ඉහළ නැංවීමට කටයුතු කිරීම.

වී අලෙවි මණ්ඩලයේ ගබඩා අලුත්වැඩියා කිරීමේ වැඩසටහන යටතේ ගබඩා ධාරිතාව වී මෙට්‍රික් ටොන් 250,000 දක්වා වර්ධනය කර ගෙන ඇත. එම ධාරිතාව වැඩි වන ප්‍රමාණයත් එක්කම වී මිලදී ගැනීමට වෙන් කරන මුදලුත් ඒ අනුව වැඩි කරන්න නියමිතයි.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු කථානායකතුමනි, මේ වෙනකොට අපේ රටේ ගොවි ජනතාව අස්වැන්න නෙළමින් සිටිනවා. එවැනි මොහොතක තැනින් තැන, තැනින් තැන වැරදි මතයක් හදන්න උත්සාහ කරමින් තිබෙනවා, වී මිලදී ගැනීම සඳහා ආණ්ඩුව මැදිහත් වෙන්නේ නැහැ කියලා. මේ වෙනකොට ආණ්ඩුව වී මිලදී ගැනීමට අදාළව මැදිහත් වීමේදී නියම කරලා තිබෙන මිල කොපමණද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය අමාත්‍ය ගරු නාමල් කරුණාරත්න මැතිතුමා ඒ ප්‍රශ්නයට උත්තරයක් ලබා දෙයි.

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා යොමු කරපු ප්‍රශ්නයට අදාළව උත්තරයක් දෙන්නම්. අපි ආණ්ඩුව ගන්නකොට නාඩු වී කිලෝ එකක මිල රුපියල් 105යි. වී කිලෝ එකක නිෂ්පාදන වියදම රුපියල් 99.75යි. ඒ අනුව, රුපියල් 5.25ක ලාභයක් තමයි ගොවියාට තිබුණේ. නමුත් මේ වෙනකොට වී කිලෝ එකක නිෂ්පාදන වියදම ඊට වඩා ගොඩාක් අඩු වෙලා තිබෙනවා. නාඩු වී කිලෝ එකක් රුපියල් 120කට ගන්නවා. මෙතැනදී රතු නාඩුවල නිෂ්පාදන වියදම ගොඩාක්ම අඩුයි. රතු නාඩු විකුණන ගොවියාට ලොකු ලාභයක් තිබෙනවා. පසුගිය කන්නයේ අපි සම්බා වී කිලෝ එකක් ගත්තේ රුපියල් 125ට. මේ කන්නයේ රුපියල් 130ට ගන්නවා. පසුගිය කන්නයේ අපි කීරි සම්බා ගත්තේ රුපියල් 132ට. ඒක රුපියල් 132 වුණේත් කලින් තිබුණු මිලට වඩා මිල වැඩි කරපු නිසා. සම්බා රුපියල් 125 වුණේ කලින් තිබුණු මිලට වඩා මිල වැඩි කරපු නිසා. ඒ අනුව ගොවියාට මේ කන්නයේ කීරි සම්බා වී කිලෝ එකක මිල රුපියල් 60කින් වැඩි කරලා තිබෙනවා. ඒ අනුව, කීරි සම්බා වී කිලෝ එකක් රුපියල් 140ටත්, සම්බා වී කිලෝ එකක් රුපියල් 130ටත්, නාඩු වී කිලෝ එකක් රුපියල් 120ටත් මිලදී ගන්නවා. මේ වෙනකොට රජයේ ගබඩා විවෘත කර තිබෙනවා. ගොවීන්ගේ ලොකු උනන්දුවක් තිබෙනවා වී ගෙනැවිත් දෙන්න. මේ වෙනකොටත් වී මෙට්‍රික් ටොන් 13,000කට වැඩි ප්‍රමාණයක් ගබඩාවලට ගෙනැවිත් දීලා තිබෙනවා. ගබඩාවලට වී ලබා දීම සඳහා තව විශාල ප්‍රමාණයක් සාම්පල් ගෙනැවිත් දීලා තිබෙනවා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම වී අලෙවි මණ්ඩලය මේ වෙනකොට මේ කටයුත්ත කරගෙන යනවා. පසුගිය දවස්වල වී අලෙවි මණ්ඩලයේ සභාපතිතුමා කිව්වා අපි දැක්කා, dryers සවි කරන්න, අලුත් තාක්ෂණය එක්කහු කරන්න මැදිහත්වීමක් කරමින් ඉන්නවා කියලා. මේ වී අලෙවි මණ්ඩලය ඇතුළුව ආණ්ඩුව සමඟ ඊට මැදිහත් වන තව ආයතන තිබෙනවාද, මේ වෙලාවේ ඒ කටයුත්තට දායකත්වය දෙමින් තිබෙන්නේ කොහොමද කියන එක මම දැනගන්න කැමැතියි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා යොමු කළේ වැදගත් ප්‍රශ්නයක්. අපි - වී අලෙවි මණ්ඩලය - ක්‍රියාත්මක වෙන්නේ 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනත අනුවයි. ඒ පනතට අනුව අපට ප්‍රමිතිගත වී හැර වෙනත් වී ලබා ගැනීමට නීතිමය ප්‍රතිපාදන නැහැ. මේ පනත සංශෝධනය වෙන්න ඕනෑ කියන ස්ථාවරයේ අපි ඉන්නවා. ඒකට අදාළ කටයුතු කරගෙන යනවා. අපට ගන්න පුළුවන් වෙන්නේ සියයට 14 දක්වා තෙත බර ඉවත් කරපු වී පමණයි. ඒ අනුව වී විකිණීමට යෑමේදී ගොවියා මුහුණ දෙන ගැටලු තමයි වී වේළා ගැනීමේදී තිබෙන ගැටලු. ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වෙනකොට අමාත්‍යාංශය විධියට ඒකටත් අත ගසා තිබෙනවා. මම හිතන විධියට, ඔබතුමන්ලාගේ මේ ඉල්ලීම අනුව ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ තලාව ප්‍රදේශයේත් වී වේළන යන්ත්‍ර 02ක් රජයේ මැදිහත් වීම යටතේ අපි සවිකළා. අම්පාර තමයි, ලංකාවේ වැඩියෙන්ම වී නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කය. අම්පාර දිස්ත්‍රික්කයේත් එම කටයුත්ත කරන්න අපි සැලසුම් කර තිබෙනවා. අපි ඉදිරියේදී වී වේළන යන්ත්‍ර වී ගබඩාවලට සම්බන්ධ කරලා සවි කිරීමට සැලසුම් කරගෙන යනවා. ඒ වාගේම පෞද්ගලික අංශයත් සම්බන්ධ කරගෙන වී වේළීමේ යන්ත්‍ර සවි කිරීමේ ක්‍රියාවලියක් මේ වනකොට අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ අනුව ගොවි ජනතාවට ඇත්තටම එම ගැටලුවටත් උත්තරයක් ලබා ගන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, කොහොම නමුත් රජයේ ගබඩාවලට අර මිල ගණන්වලට වී ගත්තත්, අපේ ගොවි ජනතාවට රුපියල් අසූ ගණන්වලට, අනූ ගණන්වලට තමන්ගේ වී ටික විකුණන්න සිද්ධ වෙලා තිබෙන්නේ මෙන්න මේ වී වේළන ක්‍රියාවලියට අදාළව නිසි උත්තරයක් නැති නිසායි. පසුගිය කාලය පුරාවටම මේවාට කිසිම උත්තරයක් හම්බ වුණේ නැහැ. ඒ නිසා අපි ඊට අදාළ පිළිතුරු මේ වනකොට සකස් කරමින් සිටිනවා. තවත් කන්න කිහිපයක් යනකොට ගොවියාගේ මේ ගැටලු ටික ඇත්තටම නිරාකරණය කරන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා.

**ගරු කථානායකතුමා**
**(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)**
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු සුසන්ත දොඩාවත්ත මහතා.

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
**(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)**
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මා අසන ප්‍රශ්නය මෙසේයි.

ගරු අගමැතිතුමියනි, ඉන්දියානු අග්‍රාමාත්‍යතුමාගේ ආරාධනාව පරිදි, පසුගිය සතියේ ගරු ජනාධිපතිතුමා ඉන්දියාවේ පැවති කෘත්‍රිම බුද්ධි සමුළුවට සහභාගි වුණා. ඒ අතරතුර එතුමා රාජ්‍ය නායකයින් රැසක් සමඟ සාකච්ඡා කළ බවත් මාධ්‍ය මඟින් වාර්තා කර තිබුණා. ඒ ඇසුරින් මා ප්‍රශ්න තුනක් අසනවා.

01. මෙම සමුළුවට සහභාගිවීමේ වැදගත්කම කුමක්ද?
02. එහිදී ගරු ජනාධිපතිතුමා හමු වූ රාජ්‍ය නායකයින් සහ විශේෂිත පුද්ගලයින් කවුරුන්ද?
03. ඒ හරහා මේ රටට ලැබුණු වාසි සහ අවස්ථා මොනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
**(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)**
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඇසූ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. i. පෙබරවාරි 16 සිට 20 දක්වා පැවැත් වූ 2026 කෘත්‍රිම බුද්ධි සමුළුව එම අංශය සම්බන්ධයෙන් ගෝලීය දක්ෂිණ කලාපයේදී පවත්වන ලද පළමු රැස්වීම විය.

ජනතාව, ලෝක ප්‍රජාව සහ ප්‍රගතිය - People, Planet and Progress - යන මහ පෙන්වීම් අංශ යටතේ කෘත්‍රිම බුද්ධි පාලනයේ අනාගතය හැඩගැස්වීම පිළිබඳව සාකච්ඡා කිරීම අරමුණු කර ගනිමින්, එම සමුළුවට රාජ්‍ය නායකයින් සහ රජයේ ප්‍රධානීන්, එක්සත් ජාතීන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ජාත්‍යන්තර සංවිධානවල නායකයින් සහ ගෝලීය තාක්ෂණ අංශයේ ප්‍රමුඛ පුද්ගලයින් සහභාගි විය. මානව ප්‍රාග්ධනය, සමාජ බලගැන්වීම සඳහා සියල්ලන් ඇතුළත් කිරීම, ආරක්ෂිත සහ විශ්වාසදායී කෘත්‍රිම බුද්ධි තාක්ෂණය, විද්‍යාව, ඔරොත්තු දීමේ හැකියාව, නවෝත්පාදනය සහ කාර්යක්ෂමතාව, කෘත්‍රිම බුද්ධි සම්පත් ප්‍රජාතන්ත්‍රීකරණය - Democratizing AI Resources - සහ ආර්ථික සංවර්ධනය සහ සමාජ යහපත සඳහා කෘත්‍රිම බුද්ධිය උපයෝගී කර ගැනීම ඇතුළු ප්‍රධාන තේමාත්මක ක්ෂේත්‍ර පිළිබඳව එහිදී සාකච්ඡා කෙරිණි.

ii. මෙම සමුළුවට සහභාගි වීම සඳහා ඉන්දීය අග්‍රාමාත්‍යවරයා විසින් ආරාධනා කරන ලද ලෝක නායකයින් අතරට ගරු ජනාධිපතිතුමා ද ඇතුළත් විය. ජනාධිපතිවරයා මෙම සමුළුවට සහභාගි වීම මඟින් ද්විපාර්ශ්වික හවුල්කාරිත්වයන් තවදුරටත් ශක්තිමත් වූ අතරම, වගකිවයුතු සියල්ලන් ඇතුළත් කර ගත් සහ මානව කේන්ද්‍රීය කෘත්‍රිම බුද්ධිය සඳහා වූ කැපවීම නැවත තහවුරු කිරීමට ශ්‍රී ලංකාවට අවස්ථාවක් ලැබිණි.

iii. රාජ්‍ය නායක මට්ටමින් ශ්‍රී ලංකාවේ සහභාගිත්වය, ශ්‍රී ලංකාවේ ස්ථාවරය මෙන්ම, මෙම ක්ෂේත්‍රය කෙරෙහි දක්වන උනන්දුව ද පෙන්නුම් කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු සටහන් කළ හැකිය.

(අ) පෙබරවාරි 19වන දින රාජ්‍ය නායකයින්ගේ පූර්ණ සැසිවාරය අමතමින්, සංස්කෘතික වටිනාකම් ශක්තිමත් කිරීම, අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ අවස්ථාවන්ට සාධාරණ ප්‍රවේශය සහතික කිරීම සඳහා, කෘත්‍රිම බුද්ධිය මනුෂ්‍යත්වය වෙනුවෙන් සේවය කළ යුතු බවත්, ආර්ථික හා සංස්කෘතික සහයෝගිතාවේ මීළඟ පරිවර්තනය කෘත්‍රිම බුද්ධි යටිතල පහසුකම බව ඉස්මතු කරමින්, කෘත්‍රිම බුද්ධිය හා සම්බන්ධ අභිලාෂ, අයිතිවාසිකම් සහ ආරක්ෂණ පිළිබඳ විකාශනය වන ගෝලීය කතිකාව කෙරෙහි ජනාධිපතිවරයා අවධානය යොමු කරන ලදී. කෘත්‍රිම බුද්ධිය භාවිතයේදී බොහෝ විට නොසලකා හරින ලද සංස්කෘතික මානය අවධාරණය කරමින්, නැඟී එන කෘත්‍රිම බුද්ධි පද්ධතිවල භාෂාමය විවිධත්වය ආරක්ෂා කළ යුතු අතර, එමඟින් ජාතීන්ගේ හවුල් උරුමය පිළිබිඹු කළ යුතු බවද ජනාධිපතිවරයා අවධාරණය කරන ලදී. තවද, තාක්ෂණික දියුණුව, සංස්කෘතික අනන්‍යතා කෙරෙහි හානිදායක නොවිය යුතු බවත්, ඒ වෙනුවට ප්‍රජාව බලගැන්විය යුතු බවත් ඔහු සඳහන් කරන ලදී.

(ආ) පහසු ප්‍රවේශය, මධ්‍යගතව පාලනය වන භාෂා දත්ත කට්ටල, පොදු ඇගැයීම් යන්ත්‍රණ සහ ආරක්ෂක මෙවලම් සහ ඒකාබද්ධ ධාරිතා සංවර්ධනය යන ප්‍රධාන කරුණු 4ක් වටා ව්‍යුහගත කර ඇති වැඩිදියුණු කළ කලාපීය සහයෝගීතාව සම්බන්ධයෙන්ද ජනාධිපතිවරයා යෝජනා කරන ලදී.

(ඇ) ශ්‍රී ලංකාව කෘත්‍රිම බුද්ධි සමුළු ප්‍රකාශනයට සම්බන්ධ වූ අතර, සදාචාරාත්මක, විනිවිද පෙනෙන සහ ජනතාව කේන්ද්‍ර කරගත් කෘත්‍රිම බුද්ධි සංවර්ධනය ඉදිරියට ගෙන යාමට සහ සියල්ලන් ඇතුළත් වන නවෝත්පාදන සහ සංවර්ධන ප්‍රමුඛතා සහතික කිරීම සඳහා ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඇති කැපවීම නැවත තහවුරු කරන ලදී.

02. (i) Hon. Narendra Modi, Prime Minister of India.
(ii) H.E. Emmanuel Macron, President of the French Republic.
(iii) Hon. Dasho Tshering Tobgay, Prime Minister of Bhutan.
(iv) H.E. Luiz Inacio Lula da Silva, President of Federative Republic of Brazil.
(v) H.E. Sheikh Khaled bin Mohamed bin Zayed Al Nahyan, Crown Prince of Abu Dhabi.
(vi) Mr. Sergey Gorokhovsky, US Ambassador to the Republic of India, Special Envoy to South and Central Asia.

03. i. ආර්ථික තරගකාරිත්වය, ජාතික ආරක්ෂණය, පාලන කාර්යක්ෂමතාව සහ සමාජ සංවර්ධනය සඳහා වර්තමානයේ කෘත්‍රිම බුද්ධිය කේන්ද්‍රීය වී ඇති බැවින්, කෘත්‍රිම බුද්ධියේ සැබෑ ගෝලීය

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

බලපෑම සඳහා කැප වූ සමුළුවකදී ගෝලීය නායකයින් සමඟ අදහස් හුවමාරු කර ගැනීම, නවෝත්පාදනය, හවුල්කාරිත්වය සහ ඉදිරි දැක්මක් සහිත ප්‍රතිපත්තිමය මැදිහත් වීම සඳහා විවෘත රටක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම තහවුරු කරන ලදී.

ii. සමුළුවට සමගාමීව පැවති ද්විපාර්ශ්වික රැස්වීම් අතරතුරදී, ඩිජිටල් සහ කෘත්‍රිම බුද්ධි සහයෝගීතාව පිළිබඳව ඉහළම මට්ටමින් අදාළ රටවල් සමඟ සාකච්ඡා කිරීමට අතිගරු ජනාධිපතිතුමාට අවස්ථාව සැලසිණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු සටහන් කළ හැකිය.

(අ) අබුඩාබිහි ඔටුන්න හිමි කුමරු වන H.E. Sheikh Khaled bin Mohamed bin Zayed Al Nahyan සමඟ පැවති හමුවේදී වෙළෙඳාම, ආයෝජන, සංචාරක, කෘත්‍රිම බුද්ධිය හා අනෙකුත් නැඟී එන අංශවල ශ්‍රී ලංකා-එක්සත් අරාබි එමීර් රාජ්‍ය සහයෝගීතාව පුළුල් කිරීම කෙරෙහි සාකච්ඡාවල අවධානය යොමු විය.

(ආ) භූතාන අගමැති Dasho Tshering Tobgay සමඟ පැවති හමුවේදී, නායකයින් දෙදෙනාම දිගු කාලීන මිත්‍ර සම්බන්ධතා නැවත තහවුරු කළ අතර සංස්කෘතිය, අධ්‍යාපනය, තරුණ කටයුතු සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ශක්තිමත් සහයෝගීතාව ගවේෂණය කරන ලදී.

(ඇ) ප්‍රංශ ජනාධිපති Emmanuel Macron සමඟ පැවති හමුවේදී දෙපාර්ශ්වයම තාක්ෂණය, ඩිජිටල් නවෝත්පාදනය, සංචාරක ව්‍යාපාරය, ආයෝජන සහ සමුද්‍රීය ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳව සාකච්ඡා කරන ලදී. පැරිස් සමාජ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය - Paris Club Debt Restructuring Process - ඇතුළුව ප්‍රංශය ශ්‍රී ලංකාවට අඛණ්ඩව ලබා දෙන සහයෝගය පිළිබඳව ජනාධිපතිතුමා කෘතඥතාව පළ කරන ලදී.

(ඈ) බ්‍රසීල ජනාධිපති Luiz Inacio Lula da Silva සමඟ පැවති හමුවේදී, වර්ධනය වන දකුණු-දකුණු සම්බන්ධතාව පිළිබිඹු කරමින් සහයෝගීතාවය සඳහා වූ ක්ෂේත්‍ර ගවේෂණය කිරීම පිළිබඳව සාකච්ඡා කෙරිණි. ජනාධිපති Luiz Inacio Lula da Silva බ්‍රසීල සංචාරයක නිරත වන ලෙස ජනාධිපතිවරයාට ආරාධනා කරන ලදී.

(ඉ) ඇමෙරිකා එක්සත් ජනපද - ශ්‍රී ලංකා සබඳතා සමාලෝචනය කිරීම සහ වැඩිදුර සහයෝගීතාවේ මාර්ග ගවේෂණය කිරීම සඳහා ජනාධිපතිතුමා ඉන්දියාවේ ඇමෙරිකා එක්සත් ජනපද තානාපති සහ දකුණු හා මධ්‍යම ආසියාව සඳහා ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපතිවරයාගේ විශේෂ නියෝජිත Sergey Gorokhovsky මහතා ද හමු විය.

(ඊ) අතිගරු ජනාධිපතිතුමා, ඉන්දීය අග්‍රාමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වන ලදී. 2024 දෙසැම්බර් මාසයේදී ජනාධිපතිතුමාගේ ඉන්දීය රාජ්‍ය සංචාරයෙන් සහ 2025 අප්‍රේල් මාසයේදී අගමැති මෝදි මහතාගේ ශ්‍රී ලංකා සංචාරයෙන් පසු ලබා ඇති ප්‍රගතිය නායකයින් දෙදෙනා සමාලෝචනය කරන ලදී. වෙළෙඳාම, බලශක්ති සම්බන්ධතාව, ඩිජිටල් සහයෝගීතාව, ආර්ථික කටයුතු සහ සංස්කෘතික සබඳතා හරහා සහයෝගීතාව තවදුරටත් වැඩිදියුණු කිරීම කෙරෙහි සාකච්ඡාවල අවධානය යොමු විය. "දිට්වා" සුළි කුණාටුවෙන් පසු ලබා දුන් සහයෝගය ඇතුළුව ඉන්දියාවේ අඛණ්ඩ මානුෂීය ආධාර මෙන්ම ඓතිහාසික කෘත්‍රිම බුද්ධි සමුළුවට සහභාගි වීමට ආරාධනා කිරීම පිළිබඳව ජනාධිපතිතුමා සිය කෘතඥතාව පළ කරන ලදී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්න අහනවාද?

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
පිළිතුරු ලැබුණා, ගරු කථානායකතුමනි. අතුරු ප්‍රශ්න නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමියගෙන් අසනු ලබන මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 38(1) යටතේ රජයේ මුද්‍රණාලය පිළිබඳ පහත සඳහන් ප්‍රශ්න මම ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් විමසීමට කැමැත්තෙමි.

1. රජයේ මුද්‍රණාලය යනු අතිශය වැදගත් හා සංවෘත සේවයක් - closed service එකක් - වන අතර, එය නියමිත ස්ථිර රජයේ මුද්‍රණාලයාධිපතිවරයෙක් නොමැතිව කාලයක සිට කාර්යභාරයන් සිදු කරනුයේ මක් නිසාද?

   මෙය දිගටම, පදනමක් රහිතව සිදු කිරීම සම්මත සේවා විධිවිධානවලට අනුකූලද?

2. ආරක්ෂාව සහ රහස්‍ය මුද්‍රණය ආදියට සම්බන්ධව, මාර්ගගතව සිදු කරන ලද ව්‍යායාමයන් අඩු කිරීමේ පියවර මඟින් ගුණාත්මකභාවය, රහස්‍යභාවය සහ ක්‍රියාකාරකම්වල අඛණ්ඩතාවට බරපතළ ලෙස බලපෑම් සිදු වන බව රජය සලකා බැලුවේද?

3. ස්ථිර රජයේ මුද්‍රණාලයාධිපතිවරයෙක් නොමැති වීමෙන් හා තාක්ෂණික හැකියාවන් අවම වීමෙන් පැන නඟින අවදානම් හා අස්ථාවරභාවය පිළිබඳව තක්සේරු කිරීමක් හෝ ස්වාධීන විගණනයක් සිදු කර ඇත්ද?

4. රජයේ මුද්‍රණාලයේ සම්පූර්ණ තාක්ෂණික සහ ක්‍රමානුකූල අඛණ්ඩතාවන් යථා තත්ත්වයට පත් කිරීමට සහ නියමිත සුදුසුකම් ඇති ස්ථිර මුද්‍රණාලයාධිපතිවරයෙකු පත් කිරීමට රජය විසින් ගනු ලබන ඉක්මන් පියවර මොනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ශ්‍රී ලංකා මුද්‍රණ සේවා ව්‍යවස්ථාවට අනුව අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරන ලද දෙපාර්තමේන්තුගත නිලධාරියෙකු

මේ වනවිට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව තුළ නොමැති බැවින් ආයතනයේ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අත්දැකීම් බහුල නිලධාරියෙකු 2025.01.02 දින සිට පත් කිරීමට කටයුතු කරන ලදී. වර්තමානයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (විශේෂ ශ්‍රේණිය) සේවය කළ අත්දැකීම් බහුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනමින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පත්කොට ඇත.

2. ආරක්ෂාව සහ රහස්‍ය මුද්‍රණ ආදියට සම්බන්ධව මාර්ගගතව සිදු කරන ලද කිසිදු ව්‍යායාමයක් අඩු කර නොමැති අතර, මුද්‍රණ කටයුතුවල ගුණාත්මක බව, රහස්‍යභාවය සහ කාර්ය පටිපාටික ඒකාග්‍රතාව පවත්වාගෙන යාම පිළිබඳව රජයේ විශේෂ අවධානය මත ක්‍රියා කරයි.

3. ශ්‍රී ලංකා මුද්‍රණ සේවා ව්‍යවස්ථාවට අනුව රජයේ මුද්‍රණාලයාධිපති තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරන ලද සහ අවශ්‍ය පරිචය සහිත දෙපාර්තමේන්තුගත නිලධාරියෙකු මේ වන විට දෙපාර්තමේන්තුව තුළ නොමැත. එබැවින් දෙපාර්තමේන්තුව තුළ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා අත්දැකීම් සහිත නිලධාරියෙකු රජයේ මුද්‍රණාලයාධිපති ලෙස පත් කර ඇත. එබැවින් ස්වාධීන විගණනයක් සිදු කිරීමේ අවශ්‍යතාවක් ප්‍රායෝගිකව පැන නැඟී නැත. (දෙපාර්තමේන්තු කටයුතු මනාව සිදු කිරීම තහවුරු කිරීම සඳහා රජයේ විගණකාධිපති විසින් ස්වාධීන විගණනයන් සිදු කරනු ලබයි.)

4. පූර්ණ කාලීන පදනමින් යෝග්‍ය නිලධාරියෙකු පත් කර ගැනීමට පියවර ගනිමින් සිටී.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු අගමැතිතුමියනි, මේ සම්බන්ධයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. රජයේ සේවයේ ලක්ෂ 16ක් තබාගෙන සුදුසුකම් නැහැ කියලා රාජ්‍ය මුද්‍රණාලය, සෞඛ්‍ය අංශය, විගණකාධිපති දෙපාර්තමේන්තුව වාගේ හැම එකකටම මේ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. ඒ කියන්නේ රජයේ සේවයේ කඩා වැටීමක් පෙනෙන්න තිබෙනවාද? මොකද, මේ සම්බන්ධයෙන් මම ඉතාම ඕනෑකමින් කියන්නේ, රජයෙන් මීට වඩා දියුණු තත්ත්වයක් ඇති කරන්න ඕනෑ කියන එකයි, ගරු කථානායකතුමනි. ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු අගමැතිතුමියගෙන් උත්තරයක් බලාපොරොත්තු වනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු විෂයභාර අමාත්‍යතුමා ඒ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙයි. නමුත්, ගරු මන්ත්‍රීතුමනි, මෙය අද ඊයේ ඇති වුණු ප්‍රශ්නයක් නොවෙයි නේ. රාජ්‍ය සේවයේ කඩා වැටීම අවුරුදු ගණනාවක් තිස්සේ සිද්ධ වුණේ. ඒ වාගේම ඒකට නිශ්චිත හේතු අපි දන්නවා. ඒවාට නිසි පරිදි බඳවා ගැනීම් සිදු නොවුණා. ඔබතුමා හොඳින් දන්නා පරිදි, ඒක මේ ආයතනයට විතරක් නොවෙයි, ආයතන ගණනාවකට බලපානවා. මෙම නිශ්චිත ආයතනය පිළිබඳව ගරු ඇමතිතුමා උත්තර ලබා දේවි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක මගේ ප්‍රශ්නයට උත්තරයක් නොවෙයි නේ. අපි මේ මොහොතේ මේක හදාගත්තේ නැත්නම් තවත් ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. අතීතයට බැණලා අපට අනාගතයට ගමන් කරන්න බැහැ. මේක කොහේ හරි තැනක නවත්වලා හරියාකාරව ඉදිරියට යන්න පුළුවන් මාර්ගයකට පිවිසෙන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

මේ අවුරුදු එකහමාර තුළ ඒ සඳහා අවශ්‍ය qualifications තිබෙන අය සුදුසු විධියට සහ ක්‍රමානුකූලව රාජ්‍ය සේවයට බඳවා ගැනීම ආරම්භ කරලා තිබෙන්නේ ඒ අරමුණෙන්ම තමයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා අහපු මුද්‍රණාලයාධිපති ධුරය සම්බන්ධයෙන් වන නිශ්චිත ප්‍රශ්නයටම මම උත්තර ලබා දෙන්නම්. හැබැයි, ඔබතුමා ඒ අය රාජ්‍ය සේවයේ අනෙක් පත්වීම් සමඟ පොදු කිරීම සාධාරණ නැහැ. මේ හැම ප්‍රශ්නයකටම මට උත්තර ලබා දෙන්න පුළුවන්.

ගරු මන්ත්‍රීතුමනි, අපට කටයුතු කරන්න වෙන්නේ සේවා ව්‍යවස්ථාව අනුව නේ. ඒ සේවා ව්‍යවස්ථාව අනුව රජයේ මුද්‍රණාලයාධිපති ධුරයට පත් කරන්න පුළුවන්කම ලැබෙන්නේ සුදුසුකම් සහිත මුද්‍රණ සේවයේ අතිරේක මුද්‍රණාලයාධිපති කෙනෙක්. එහෙම නැත්නම් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙක්. ඔය දෙක තමයි සේවා ව්‍යවස්ථාව අනුව තිබෙන්නේ. එතකොට, අපේ තිබෙන බඳවා ගැනීම් පටිපාටිය අනුව සහකාර රජයේ මුද්‍රණාලයාධිපතිවරයෙක් හැටියට බැඳුණු කෙනෙක් අවුරුදු 10ක් ගතවුණාට පස්සේ තමයි නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති බවට පත් වෙන්නේ. නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති කියන්නේ Class II තනතුරක්. එතැන අවුරුදු 7ක් සිටියාම තමයි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති බවට පත් වෙන්නේ. ඒ කියන්නේ, Class I තනතුරක්. එතැන අවුරුදු 5ක් හිටපු කෙනෙක් තමයි අතිරේක රජයේ මුද්‍රණාලයාධිපති බවට පත් වෙන්නේ. එතකොට සාමාන්‍යයෙන් අවුරුදු 22ක් යනවා, අතිරේක රජයේ මුද්‍රණාලයාධිපති තනතුරට එන්න. දැන් මුද්‍රණාලයේ ඉන්න ජ්‍යෙෂ්ඨතම නිලධාරියා නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති ධුරයට පත් වෙන්නේ 2024.10.10 දින. ඒ කියන්නේ, අවුරුදු එකහමාරකටත් වඩා අඩු කාලයකට පෙර. මේ සේවා ව්‍යවස්ථාව අනුව ඔහු රජයේ මුද්‍රණාලයාධිපති ධුරයට පත් වෙන්න නම් තව වසර දහයහමාරක් ඉන්න ඕනෑ. එහෙම කෙනෙක් මුද්‍රණ සේවයෙන් පත් කරනවා නම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාව මත පත් කරන්න සිදු වෙන්නේ ස්ථිර තනතුරක් හැටියට නොවෙයි වැඩ බලන පදනමින් පමණයි. අවුරුදු දහයහමාරක් යනකම් ජ්‍යෙෂ්ඨතමයාටවත් බැහැ, ඒ සුදුසුකම් අනුව එන්න. ඊළඟ කණ්ඩායමට තව අවුරුදු 14ක් ගියත් බැහැ එතැනට එන්න. ඒක තමයි සේවා ව්‍යවස්ථාව. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා දන්නවා ඇති, මේ තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා. අපිත් කැමැතියි මුද්‍රණ සේවයෙන් කෙනෙක් එතැනට බඳවා ගන්න. නමුත් තිබෙන සේවා ව්‍යවස්ථාව අනුව කෙනෙක් සහකාර මුද්‍රණාලයාධිපති ධුරයේ ඉඳලා මුද්‍රණාලයාධිපති ධුරය දක්වා යන්න අවුරුදු 22ක් ගත වෙනවා. මේ ක්‍රියාවලිය අනුව දැනට ඉන්න ජ්‍යෙෂ්ඨතමයාත් පත් කර ගන්න හැකියාවක් නැහැ. ඒ නිසායි අපි සුදුසුකම් සහිත, පළපුරුද්ද ඇති විශේෂ ශ්‍රේණියේ SLAS officer කෙනෙක් පත් කරලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේක පාදක කර ගත්තාම මට පේන්නේ අපේ රටේ විශේෂඥ දැනුවත්කම අඩු වීගෙන, නැති වීගෙන යන බවයි. මම පාදක කර ගන්නවා මම පාර්ලිමේන්තුවට අවුරුදු 10කට ඉස්සෙල්ලා ගෙනාව යෝජනාවක්. දේශපාලනඥයන්ට විතරයි කිසිම විශේෂ දැනුවත්කමක් නැතිව තනතුරුවලට එන්න පුළුවන් වෙන්නේ. O/L, A/L ඕනෑ නැහැ, දක්ෂතාව අවශ්‍ය නැහැ. මේ කඩා වැටුණු ක්‍රමය නිවැරදි කරලා දක්ෂතාව, පළපුරුද්ද ඇති නිලධාරින් හරහා රටේ ඉදිරි ගමන ඉලක්ක කරලා වැඩ කිරීමේ අවශ්‍යතාව දැන් ඇවිල්ලා තිබෙනවා.

ඒ සම්බන්ධයෙන් අපි අලුතින් හිතලා අලුත් ගමනක් යමු, පළපුරුද්දක් සහිතව රටේ පාලනයක් ඇති කරන්න පුළුවන් ගමනක් ආරම්භ කරමු කියන ඉල්ලීම මේ ප්‍රශ්නයෙන් ඉස්මතු වෙන කරුණු තුළින් මම ඉදිරිපත් කරනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
අනිවාර්යයෙන්ම. ගරු කථානායකතුමනි, ඒ කියන කාරණය හරියටම හරි. ඒ නිසාම විශේෂයෙන්ම රාජ්‍ය සේවයේ වෘත්තියභාවය සහ qualifications දියුණු කිරීම සඳහා වන වැඩසටහන් කිහිපයක් අපි මේ වෙලාවේ ආරම්භ කරලා තිබෙනවා. උදාහරණයක් හැටියට දැනට සේවයේ ඉන්න අපේ රාජ්‍ය සේවකයන්ට වැඩිදුර පුහුණුව ලබා දෙන්න අවස්ථා ලබා දීම සඳහා අපි ඉන්දියාව, සිංගප්පූරුව වැනි රටවල් එක්ක අවබෝධතා ගිවිසුම් සහ වැඩසටහන් ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම, අපි ඊටත් වඩා දීර්ඝ කාලීනව හිතලා, විශේෂයෙන්ම උසස් පෙළ විභාගයෙන් ඉතාම ඉහළ ලකුණු ලබා ගන්නා අය මේ රටට අවශ්‍ය වන නිශ්චිත ක්ෂේත්‍රවලට අදාළව, රජයේ වියදමින් ලෝකයේ තිබෙන හොඳම විශ්වවිද්‍යාලවල පුහුණුව ලබා දීම සඳහා තෝරා ගෙන තිබෙනවා. අපි දැන් ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඒ සඳහා යවනවා. එසේ යවන්නේත් මේ කියන ධාරිතාව වැඩි කිරීමේ සහ අනාගතයේදී ඔවුන් ඒ නිශ්චිත සේවාව මේ රටට ලබා දේවි කියන අරමුණ ඇතිවයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ අය ගියාට පස්සේ එන්නේ නැහැ නේ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
අපි ඒකට ශිෂ්‍යයන් තෝරාගෙන, ඒ අය එක්ක bond එකක් sign කරලා තිබෙනවා. ඒ සියල්ලම කරලා තමයි, අපි ඒ අය යවන්නේ. අපි ඒ ශිෂ්‍යයන් පිළිබඳව යම් විශ්වාසයකුත් ඇති කරගෙනයි ඒක කරන්නේ. එහෙම නැත්නම් මේක කවදාවත් කරන්න බැහැ නේ. නමුත්, අපි ඒ එකඟතාව සහ bond එකක් එක්ක තමයි ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන් යවන්නේ. ඒක මීට කලින් වෙලා නැහැ, ගරු කථානායකතුමනි. අපි මේ ගැන සොයා බැලුවා. වෙනත් රටවල්ද මූලික අවධියේදී මෙවැනි දක්ෂ අය headhunt කරලා, ඔවුන්ව විශේෂ පුහුණුවීම් සඳහා යොමු කිරීම කරගෙන යනවා. ඒක තමයි දැන් අපිත් මේ කරගෙන යන්නේ. යම් කාලයක් තුළ මේ තිබෙන හිඩැස - gap එක - පුරවන්න හැකි වෙයි කියන විශ්වාසය අපට තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, 2025 වසරේ අග භාගයේ ශ්‍රී ලංකාවට බලපෑ "දිට්වා" සුළි කුණාටුව සම්බන්ධයෙන් පහත ප්‍රශ්න සඳහා මම ගරු අගමැතිතුමියගෙන් පිළිතුරු බලාපොරොත්තු වෙමි.

(අ)
1. "දිට්වා" ආපදාවට ලක් වූවන්ගේ සංඛ්‍යාව සමස්ත දිවයින ආවරණය වන පරිදි කොපමණද?
2. ආපදා සහන වශයෙන් ලබා දුන් රුපියල් 25,000 සහ 50,000 මුදල ලබා දුන් නිවාස සංඛ්‍යාව 2025.02.15 දිනට කොපමණද?
3. නිවාස හානි සඳහා වන්දි ලබා දීමට තෝරාගත් ගණන සහ ඒවායෙන් දැනට වන්දි මුදල් ගෙවා අවසන් ගණන 2025.02.15 දිනට කොපමණද?
4. සෑම නිවාස ඒකකයකටම රුපියල් 25,000 මුදල, 50,000 මුදල සහ නිවාස වන්දි ලබා දෙනවාද?
5. මෙම මුදල් ගෙවා අවසන් කරන දින වකවානු කවරේද?

(ආ)
1. "දිට්වා" ආපදාවෙන් බලපෑමට ලක් වූ පාසල් සිසුන් සංඛ්‍යාව කොපමණද?
2. එම සිසුන් සඳහා රජය පොරොන්දු වූ ආධාර මුදල කොපමණද?
3. එය ගෙවනු ලබන්නේ කුමන ආයතන මඟින්ද?
4. 2025.02.15වන විට කොපමණ සිසුන් ප්‍රමාණයකට මෙම ආධාර ගෙවා තිබේද?
5. ආපදාවට ලක් වූ සියලු සිසුන්ට මෙය ගෙවනවාද?
6. මෙම මුදල් ගෙවා අවසන් කරන දින වකවානු කවරේද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ)
1. "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූවන්ගේ සංඛ්‍යාව - 2,487,114කි. දිස්ත්‍රික්ක වශයෙන් සමස්ත සිද්ධි වාර්තාව ඇමුණුම 01 වශයෙන් ඉදිරිපත් කරනවා.
2. 2026.02.15 දිනට රුපියල් 25,000 මුදල ලබා දුන් නිවාස සංඛ්‍යාව - 426,963කි. දිස්ත්‍රික්ක වශයෙන් රුපියල් 25,000 ලබා දීම පිළිබඳ තොරතුරු වාර්තාව ඇමුණුම 02 වශයෙන් ඉදිරිපත් කරනවා.

   රුපියල් 50,000ක මුදල ලබා දුන් නිවාස සංඛ්‍යාව - 144,377කි. දිස්ත්‍රික්ක වශයෙන් රුපියල් 50,000 ලබා දීම පිළිබඳ තොරතුරු වාර්තාව ඇමුණුම 03 වශයෙන් ඉදිරිපත් කරනවා. ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරනවා.

---

** පිළිතුර අවසානයේ පළ කර ඇත.*
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

3. නිවාස හානි වන්දි ලබා දීමට තෝරාගත් ගණන සහ වන්දි ගෙවා අවසන් ගණන

| නිවසට සිදු වී ඇති හානියේ ස්වභාවය | ගෙවීම් කිරීමට ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ගෙවා ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| පූර්ණ හානි නිවාස | 6,088 | 210 |
| අර්ධ හානි නිවාස | 118,889 | 2,992 |
| එකතුව | 124,977 | 3,202 |

4. "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ හදිසි ආපදා තත්ත්වය පහව යැමත් සමඟ ආපදාවේ බලපෑමට ලක්වූ පවුල්වලට තම නිවාස නැවත පදිංචියට යෝග්‍ය පරිදි පිරිසිදු කර සුරක්ෂිතව පදිංචි වීම සඳහා එක් නිවාස ඒකකයකට රුපියල් 25,000ක එක්වරක් ගෙවන දීමනාව හිමි වන අතර, එලෙස බලපෑමට ලක්වූ නිවාසවල නැවත පදිංචියට අත්‍යවශ්‍ය මුළුතැන්ගෙයි බඩුමුට්ටු ආදිය මිලදී ගැනීම සඳහා එක් නිවාස ඒකකයකට එක්වරක් පමණක් ගෙවන රුපියල් 50,000ක දීමනාව හිමි වේ.

5. 2026.02.20 වනවිට රුපියල් 25,000ක දීමනාව සියයට 98.07ක් සඳහා ගෙවා අවසන් කර ඇති අතර, රුපියල් 50,000 දීමනාව සියයට 86ක් සඳහා ගෙවා අවසන් කර ඇත. ඉතිරි ගෙවීම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් මඟින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යොමුකර ඇත. මෙම දීමනා ගෙවීම් සම්බන්ධයෙන් ඉදිරිපත් වන අභියාචනා ද සලකා කටයුතු කරන අතර, ගෙවා අවසන් වන දිනයක් තීරණය කර නොමැත.

(ආ) 1. ආපදා බලපෑමට ලක් වූ පාසල් සිසුන්ට පොත් පත්, ඇඳුම් පැළඳුම් මිලදී ගැනීම සඳහා එක් වරක් පමණක් ලබා දෙන දීමනාව ගෙවීමට සුදුසුකම් ලැබූ පාසල් සිසුන් සංඛ්‍යාව 2026.02.20 දිනට 207,312කි.

2. එම සිසුන් සඳහා රජය විසින් එක් පාසල් දරුවෙකුට රු. 25,000ක් බැගින් දීමනාවක් ලබාදේ.

3. ඉහත 2හි සඳහන් දීමනාවෙන් රුපියල් 15,000ක් ආපදා කළමනාකරණ අංශයේ ප්‍රතිපාදන මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ගෙවනු ලබන අතර, රුපියල් 10,000ක් ජනාධිපති අරමුදලේ ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ගෙවනු ලැබේ.

4. 2026.02.15 වන දිනට පාසල් සිසුන් 159,271ක් සඳහා රුපියල් 15,000ක දීමනාව ගෙවා ඇත. ජනාධිපති අරමුදලින් සිසුන් 196,467ක් සඳහා ගෙවා ඇත.

5. ආපදාවෙන් බලපෑමට ලක්වූ සියලු සිසුන් මෙම දීමනාව සඳහා සුදුසුකම් ලබයි.

6. දැනට ඉතිරි ගෙවීම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් මඟින් ප්‍රාදේශීය ලේකම්කරුවන් වෙත යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වන අභියාචනා ද සලකා කටයුතු කරන අතර, ගෙවා අවසන් කරන දිනයක් තීරණය කර නොමැත.

**සභාමේසය මත තබන ලද ඇමුණුම්:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புக்கள் :*
*Annexes tabled:*

ඇමුණුම 01

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් බලපෑමට ලක්වූවන් පිළිබඳ තත්ත්ව වාර්තාව

| අනු අංකය | දිස්ත්‍රික්කය | ආපදාවට පත් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන | බලපෑමට ලක්වූ | | මරණ සංඛ්‍යාව | තුවාල ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව | අතුරුදහන් වූ පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | | පවුල් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව | | | |
| 1 | අම්පාර | 20 | 7,716 | 25,882 | 12 | 6 | - |
| 2 | අනුරාධපුර | 22 | 23,276 | 75,739 | 12 | 2 | - |
| 3 | බදුල්ල | 15 | 26,517 | 90,667 | 90 | 30 | 9 |
| 4 | මඩකපුව | 14 | 17,653 | 52,581 | 4 | - | - |
| 5 | කොළඹ | 13 | 86,251 | 331,371 | 9 | 3 | - |
| 6 | ගාල්ල | 22 | 1,023 | 3,268 | 1 | - | - |
| 7 | ගම්පහ | 13 | 89,606 | 346,639 | 17 | - | 1 |
| 8 | හම්බන්තොට | 12 | 3,326 | 11,732 | 1 | 8 | - |
| 9 | යාපනය | 15 | 23,010 | 73,730 | 3 | 3 | - |
| 10 | කළුතර | 14 | 2,998 | 10,621 | 1 | - | - |
| 11 | මහනුවර | 20 | 57,356 | 201,130 | 254 | 107 | 52 |
| 12 | කෑගල්ල | 11 | 25,531 | 90,621 | 41 | 43 | 37 |
| 13 | කිලිනොච්චි | 4 | 10,499 | 33,492 | - | - | - |
| 14 | කුරුණෑගල | 30 | 29,688 | 101,086 | 64 | 20 | 11 |
| 15 | මන්නාරම | 5 | 41,480 | 140,583 | 4 | - | 1 |
| 16 | මාතලේ | 11 | 12,270 | 42,694 | 29 | 12 | 8 |
| 17 | මාතර | 16 | 889 | 3,476 | - | 2 | - |
| 18 | මොනරාගල | 11 | 1,756 | 5,944 | 5 | 3 | 1 |
| 19 | මුලතිව් | 6 | 22,992 | 67,514 | 1 | - | - |
| 20 | නුවරඑළිය | 10 | 25,054 | 86,697 | 82 | 18 | 31 |
| 21 | පොළොන්නරුව | 7 | 12,036 | 42,429 | 3 | 2 | - |
| 22 | පුත්තලම | 16 | 128,698 | 457,575 | 38 | 1 | 4 |
| 23 | රත්නපුර | 18 | 19,093 | 74,238 | 2 | 1 | - |
| 24 | ත්‍රිකුණාමලය | 11 | 27,390 | 90,782 | - | - | - |
| 25 | වවුනියාව | 4 | 7,814 | 26,623 | 3 | - | - |
| | එකතුව | 340 | 703,922 | 2,487,114 | 676 | 261 | 155 |

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

ඇමුණුම 02

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පීඩාවට පත් වූවන්ගේ නිවාස යථාවත් කිරීම සඳහා රු. 25000 ක දීමනාව ගෙවීම (2026.02.15 දිනට)

| අනු අංකය | දිස්ත්‍රික්කය | දීමනාවට සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ගෙවා අවසන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | තවදුරටත් ගෙවීමට ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ගෙවා ඇති මුදල (රු.මි) | ගෙවීම් ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|
| 1 | පුත්තලම | 93,723 | 90,788 | 2,935 | 2269.70 | 96.87 |
| 2 | බදුල්ල | 17,950 | 17,936 | 14 | 448.40 | 99.92 |
| 3 | මොනරාගල | 716 | 716 | - | 17.90 | 100.00 |
| 4 | මාතලේ | 6,236 | 6,165 | 71 | 154.13 | 98.86 |
| 5 | කොළඹ | 53,958 | 51,269 | *466 | 1281.73 | 95.02 |
| 6 | මඩකලපුව | 9,065 | 9,065 | - | 226.63 | 100.00 |
| 7 | කෑගල්ල | 14,380 | 13,357 | 1,023 | 333.93 | 92.89 |
| 8 | ත්‍රිකුණාමලය | 15,829 | 15,788 | 41 | 394.70 | 99.74 |
| 9 | අනුරාධපුර | 13,786 | 13,614 | 172 | 340.35 | 98.75 |
| 10 | මුලතිවු | 4,753 | 4,705 | 48 | 117.63 | 98.99 |
| 11 | කිළිනොච්චිය | 6,052 | 6,052 | - | 151.30 | 100.00 |
| 12 | අම්පාර | 1,831 | 1,831 | - | 45.78 | 100.00 |
| 13 | යාපනය | 13,168 | 13,168 | - | 329.20 | 100.00 |
| 14 | පොළොන්නරුව | 8,341 | 8,114 | 227 | 202.85 | 97.28 |
| 15 | මහනුවර | 39,433 | 39,092 | 341 | 977.30 | 99.14 |
| 16 | රත්නපුර | 9,286 | 9,238 | 48 | 230.95 | 99.48 |
| 17 | කුරුණෑගල | 21,299 | 21,187 | 112 | 529.68 | 99.47 |
| 18 | නුවරඑළිය | 8,579 | 8,237 | 342 | 205.93 | 96.01 |
| 19 | මාතර | 568 | 566 | 2 | 14.15 | 99.65 |
| 20 | හම්බන්තොට | 1,588 | 1,555 | 33 | 38.88 | 97.92 |
| 21 | ගාල්ල | 425 | 425 | - | 10.63 | 100.00 |
| 22 | කළුතර | 1,431 | 1,431 | - | 35.78 | 100.00 |
| 23 | මන්නාරම | 11,043 | 10,360 | 683 | 259.00 | 93.82 |
| 24 | ගම්පහ | 76,732 | 76,204 | 528 | 1905.10 | 99.31 |
| 25 | වවුනියාව | 6,106 | 6,100 | 6 | 152.50 | 99.90 |
| | එකතුව | **436,278** | **426,963** | **7,092** | 10674.08 | **97.86** |

❖ කොළඹ දිස්ත්‍රික්කයේ රු. 25,000.00 දීමනාව ලබා ගැනීම සඳහා 2026.02.15 දින වන විට ඉදිරිපත් කර තිබූ අයදුම්පත්‍ර 53,958 අතරින් අයදුම්පත්‍ර 2,223ක් ප්‍රතික්ෂේප වී ඇත.

ඇමුණුම 03

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පීඩාවට පත් වූවන්ගේ නිවාස යථාවත් කිරීම සඳහා රු. 50000 ක දීමනාව ගෙවීම් ප්‍රගතිය (2026.02.15 දිනට)

| අනු අංකය | දිස්ත්‍රික්කය | දීමනාවට සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ගෙවා අවසන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | තවදුරටත් ගෙවීමට ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ගෙවා ඇති මුදල (රු.මි) | ගෙවීම් ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|
| 1 | පුත්තලම | 42,736 | 30,044 | 12692 | 1,502.20 | 70.30 |
| 2 | බදුල්ල | 4034 | 4034 | 0 | 201.70 | 100.00 |
| 3 | මොනරාගල | 233 | 233 | 0 | 11.65 | 100.00 |
| 4 | මාතලේ | 1253 | 1237 | 16 | 61.85 | 98.72 |
| 5 | කොළඹ | 39370 | 36513 | *2570 | 1,825.65 | 92.74 |
| 6 | මඩකලපුව | 11 | 11 | 0 | 0.55 | 100.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7 | කෑගල්ල | 8,385 | 8,047 | 338 | 402.35 | 95.97 |
| 8 | ත්‍රිකුණාමලය | 3,106 | 496 | 2610 | 24.80 | 15.97 |
| 9 | අනුරාධපුර | 5979 | 5422 | 557 | 271.10 | 90.68 |
| 10 | මුලතිවු | 615 | 613 | 2 | 30.65 | 99.67 |
| 11 | කිළිනොච්චිය | 1 | 1 | 0 | 0.05 | 100.00 |
| 12 | අම්පාර | 383 | 383 | 0 | 19.15 | 100.00 |
| 13 | යාපනය | 2 | 2 | 0 | 0.10 | 100.00 |
| 14 | පොළොන්නරුව | 5,799 | 2,533 | 3266 | 126.65 | 43.68 |
| 15 | මහනුවර | 9392 | 9154 | 238 | 457.70 | 97.47 |
| 16 | රත්නපුර | 3314 | 3313 | 1 | 165.65 | 99.97 |
| 17 | කුරුණෑගල | 10401 | 9808 | 593 | 490.40 | 94.30 |
| 18 | නුවරඑළිය | 1,258 | 1,194 | 64 | 59.70 | 94.91 |
| 19 | මාතර | 1 | 1 | 0 | 0.05 | 100.00 |
| 20 | හම්බන්තොට | 266 | 254 | 12 | 12.70 | 95.49 |
| 21 | ගාල්ල | 10 | 10 | 0 | 0.50 | 100.00 |
| 22 | කළුතර | 0 | 0 | 0 | 0 | - |
| 23 | මන්නාරම | 2,737 | 2,672 | 65 | 133.60 | 97.63 |
| 24 | ගම්පහ | 33454 | 28190 | 5264 | 1,409.50 | 84.26 |
| 25 | වවුනියාව | 212 | 212 | 0 | 10.60 | 100.00 |
| | එකතුව | **172,952** | **144,377** | **28,288** | **7,218.85** | **83.48%** |

❖ කොළඹ දිස්ත්‍රික්කයේ රු.50,000.00 දීමනාව ලබා ගැනීම සඳහා 2026.02.15 දින වන විට ඉදිරිපත් කර තිබූ අයදුම්පත්‍ර 39370 අතරින් අයදුම්පත්‍ර 287ක් ප්‍රතික්ෂේප වී ඇත.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු අගමැතිතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, ලබා දුන් පිළිතුරට. ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමියගෙන් මම අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දැන් නිවාස හානිවලට වන්දි ලබා දීමේදී සාමාන්‍යයෙන් රුපියල් 50,000, 25,000 ගෙවනකොට ප්‍රායෝගික ගැටලු මතු වෙනවා. අඩුපාඩු වෙනවා. හම්බ වුණේ නැහැ කියනවා. ඒ වාගේ ඒවා තිබෙනවා. ඒ නිසා නිවාස හානි සඳහා වන්දි ලබා දීමේදී හරි නිර්ණායකයක් ඉදිරිපත් කරලා, සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වෙච්ච හැම ගෙයකටම, එහෙම නැත්නම් ගංවතුරට යට වෙච්ච හැම ගෙයකටම වන්දි ලබා දීමට අවශ්‍ය නිර්ණායක ඉදිරිපත් කරලා කටයුතු කර තිබෙනවාද කියලා මම ඔබතුමියගෙන් අහන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා සඳහන් කළ විධියට රුපියල් 25,000ත්, 50,000ත් තමයි සියලුදෙනාට ලබා දෙන්න කටයුතු සලස්වා තිබෙන්නේ. ඒ ගෙවා තිබෙන ප්‍රමාණයත් දැන් සඳහන් කරලා තිබෙනවා. ඊළඟට, ගෙවල් හානි සඳහා ඒ නිර්ණායක අනුව තමයි ගෙවීම් කිරීමට ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව තෝරාගෙන තිබෙන්නේ. අර්ධ හානි හා පූර්ණ හානි කියන කොටස් දෙක යටතේ තෝරා ගත්ත පවුල් ගණනාවක් තිබෙනවා; නිවාස ගණනාවක් තිබෙනවා. ඒ අනුව දැන් ඒ සල්ලිත් ක්‍රමානුකූලව බෙදාගෙන යනවා. නිර්ණායක අනුව තමයි ඒ අය තෝරාගෙන තිබෙන්නේ. ඒ තෝරා ගත්ත සංඛ්‍යාව තමයි මම සඳහන් කළේ. එතකොට පූර්ණ හානි වෙච්ච නිවාසවලට යම් මුදලකුත්, අර්ධ වශයෙන් හානි වෙච්ච නිවාසවලට වෙනත් මුදලකුත් දෙන්න තමයි නියමිතව තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු අගමැතිතුමියනි, මට ප්‍රමාණවත් පිළිතුරක් ලැබුණේ නැහැ කියන එක තමයි මගේ හැඟීම. මොකද, ආපදාව වෙලාවේදී ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා කිව්වා, ටකරමක් ගියත් ලක්ෂ 10ක් දෙනවා කියලා. නමුත් ඒ guidelines ඊට පස්සේ වෙනස් වෙලා තිබෙනවා. දැන් ඔබතුමියට මම උදාහරණ සහිතව කිව්වොත් එහෙම, 2016 ගංවතුර අවස්ථාවේදී කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාවට මේ රුපියල් 25,000 දුන්නා වාගේ රුපියල් 10,000ක් දුන්නා, පවුල් 27,000කට. මේ රුපියල් 50,000 දුන්නා වාගේ රුපියල් 15,000ක් දුන්නා පවුල් 23,000කට. ගංවතුර ආපු හැම නිවාසයකටම, ගෙවල් 19,905කට රුපියල් මිලියන 19,000ක් දුන්නා. දැන් මේ වතාවේ ගංවතුරෙන් කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෙවල් 30,000ක් යට වුණා. එතකොට එක ගෙදරකට දීලා ඊට අල්ලපු ගෙදරට නොදී ඉන්න බැහැ, ගරු අගමැතිතුමියනි. අපට ආරංචි විධියට ගෙවල් 3,000කට තමයි දෙන්න හදන්නේ. ඒ නිසා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වෙච්ච මන්ත්‍රීවරියක විධියට ඔබතුමියගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. අනෙක් පළාත් ගැන මට ලොකු අවබෝධයක් නැහැ, ඒ සම්බන්ධව තර්ක කරන්න. නමුත් කොළඹ දිස්ත්‍රික්කය සම්බන්ධව specifically කථා කරන්නේ. රුපියල් 25,000 හෝ 50,000 නොලැබිච්ච අය ගැන මම මෙතැනදී කථා කරන්නේ නැහැ. නමුත් නිවාස හානි තක්සේරු කිරීමේදී නිර්ණායක හරියට දීලා තිබුණා නම්, මීට වඩා ගෙවල් ප්‍රමාණයක් එන්න ඕනෑ. නමුත් එහෙම ප්‍රමාණයක් ඇවිල්ලා නැහැ. ඒ නිසා චෝදනාවක් කරනවාට වඩා මම ඔබතුමියට කියන්නේ, ඒ පිළිබඳව හොයලා බලලා වතුරට යට වෙච්ච හැම ගෙයකටම අවශ්‍ය වන්දි ලබා දීමට කටයුතු කරන්න කියලායි. හේතුව මෙකයි. දැන් පූර්ණ හානියක් කියලා ගන්නේ, එක්කෝ ගේ කඩාගෙන වැටෙන්න ඕනෑ.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

එක්කෝ, වහල කඩාගෙන වැටෙන්න ඕනෑ. නමුත්, මේ ගෙවල්වලට ගියාම පෙනෙනවා, තවම ඒ වතුර ආපු පැල්ලම් ටික තිබෙනවා. ඒ ගෙවල්වල තිබුණු ඇඳ, මේස, පුටු ඇතුළු බඩු මුට්ටු ඔක්කෝම විනාශ වෙලා තිබෙන්නේ. ඒ ගැන සලකා බලලා ඒ නිර්ණායකයේ යම්කිසි වෙනසක් කරනවා නම් ඒ වෙනස කරලා ගංවතුරට යට වුණු හැම ගෙයක් සඳහාම වන්දි ලබා දීමට අවශ්‍ය පියවර ගන්න කියලා තමයි මම ඉල්ලන්නේ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මම නැවත වතාවක් කියන්නේ මුලින් කියපු කාරණාවම තමයි. හානියට ලක් වෙච්ච ඒ සියලු නිවාසවලට අපි රුපියල් 25,000ත්, රුපියල් 50,000ත් කියන දීමනා දීලා තිබෙනවා. දැන් සියයට 98කට රුපියල් 25,000 ලැබිලා තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ සංඛ්‍යාලේඛන තිබෙනවා. කොලොන්නාවේ නිශ්චිත සංඛ්‍යාලේඛනය දැන් නැහැ. ඒ දීමනා දීලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි. හානිය අනුව තමයි ඊළඟ පියවරට යන්නේ. ඒක පූර්ණ හානියක් ද, අර්ධ හානියක් ද කියන නිර්ණායක අනුව තමයි ඒ ගෙවල්වලට ඊළඟ දීමනාව ලැබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 25,000 සියලුදෙනාටම දෙනවා. රුපියල් 50,000ත් සියලුදෙනාටම දෙනවා. ඒකේ වෙනසක් කරලා නැහැ. වහල කඩාගෙන වැටිලා ද, හානිය මොකක්ද කියලා නැතුව ඒ මුදල සියලුදෙනාටම ලබා දීලායි තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මම ඇහුවේ, නිවාස වන්දි ගැන.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

නිවාස වන්දි ලබා දෙන්නේ අර්ධ හානි නිවාස හා පූර්ණ හානි නිවාසවලටට. ඒ සඳහා නිර්ණායකයක් තිබෙනවා. ඒ අනුව තමයි ඒ මුදල ලබා දෙන්නේ. ඒ තොරතුරු තහවුරු වන විධියට සැලසුම්සහගතව හානි වුණු එම නිවාස වෙනුවෙන් වන්දි ලබා දෙනවා. ඒක flat rate එකක් නොවෙයි නේ, ගරු කථානායකතුමනි. නිවාසයට වෙලා තිබෙන හානිය අනුව තමයි ඒ මුදල ලබා දෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමාත් සභාවේ ඉන්න නිසා කියන්න කාරණයක් තිබෙනවා. මට තත්පර 30ක් දෙන්න.

ඊයේ පෙරේදා Glencairn Hospital එකේදී අවුරුදු 23ක ළමයෙක් මැරිලා තිබෙනවා. ඒ dead body එක mortuary එකේ තියෙද්දී ඒකේ හිටපු තුන්දෙනෙක් දූෂණය කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒක ගැන ඔබතුමා විශේෂ අවධානය යොමු කරලා පියවර ගන්න. එක්කෝ, ඒ අය පොලීසියට භාර දෙන්න; උසාවියට ඉදිරිපත් කරන්න. ඒකට පියවරක් ගන්න.

මේ රටේ මැරිච්ච කාන්තාවකටවත් ආරක්ෂාවක් නැත්නම් මොනවාද කරන්නේ?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කරුණ පිළිබඳව සුවිශේෂයෙන් සොයා බලා මම පාර්ලිමේන්තුවට කරුණු වාර්තා කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Point of Order එකක් නොවුණත් ඒක වැදගත් කරුණක්, ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු කථානායකතුමනි, point of Order එකක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

කරුණු පැහැදිලි කර ගැනීමක්, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

"දිට්වා" සුළි කුණාටුව සම්බන්ධව කරුණු පැහැදිලි කර ගැනීමක්. මේ වනවිට වන්දි ලබා දීම් සිදු වෙනවා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ කාරණයේ point of Order එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## රජයේ පාසල්වල අර්ධ වශයෙන් ඉදිකරන ලද ගොඩනැඟිලි: විස්තර
## அரசாங்கப் பாடசாலைகளில் பகுதியளவில் நிர்மாணிக்கப்பட்டுள்ள கட்டடங்கள்: விபரம்
## PARTIALLY CONSTRUCTED BUILDINGS IN GOVERNMENT SCHOOLS: DETAILS

1269/2025

**1. ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) රජයේ පාසල්වල අර්ධ වශයෙන් ඉදිකිරීම් කටයුතු සිදු කර අතහැර දමා තිබෙන ගොඩනැඟිලි පවතින බව දන්නේද;

(ii) එම ගොඩනැඟිලි සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ගොඩනැඟිලිවල ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීමට බලපා ඇති ප්‍රධාන හේතු කවරේද;

(iv) ඉහත ගොඩනැඟිලි අතරින් 2025 වර්ෂයට අදාළ අයවැය මඟින් වැඩ අවසන් කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති ගොඩනැඟිලි සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ගොඩනැඟිලිවල වැඩ අවසන් කරනු ලබන කාල වකවානුව කවරේද;

(vi) අර්ධ වශයෙන් ඉදිකිරීම් කටයුතු සිදු කර ඇති ගොඩනැඟිලි හේතුවෙන් පාසල් සිසුන්ට හා පාසල් කාර්ය මණ්ඩලයට අනතුරක් සිදු නොවීමට ගෙන ඇති පූර්ව ආරක්ෂක විධිවිධාන කවරේද;

(vii) ඉහත ගොඩනැඟිලි කඩිනමින් හා ආරක්ෂාකාරීව සාදා නිම කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கப் பாடசாலைகளில் பகுதியளவில் நிர்மாணிக்கப்பட்டு கைவிடப்பட்டுள்ள கட்டடங்கள் உள்ளதென்பதை அறிவாரா;

(ii) மேற்படி கட்டடங்களின் எண்ணிக்கை ஒவ்வொரு மாகாண வாரியாக வெவ்வேறாக எத்தனை;

(iii) மேற்படி கட்டடங்களின் நிர்மாணப் பணிகள் தாமதமாவதற்கு ஏதுவான பிரதான காரணங்கள் யாவை;

(iv) மேற்குறிப்பிட்ட கட்டடங்களில், 2025ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத் திட்டத்தில் நிர்மாணப் பணிகளை நிறைவு செய்வதற்காக நிதி ஒதுக்கப்பட்டுள்ள கட்டடங்களின் எண்ணிக்கை ஒவ்வொரு மாகாண வாரியாக வெவ்வேறாக எத்தனை;

(v) அக்கட்டடங்களின் நிர்மாணப் பணிகள் நிறைவு செய்யப்படும் காலப்பகுதி யாது;

(vi) பகுதியளவில் நிர்மாணப் பணிகள் மேற்கொள்ளப்பட்டுள்ள கட்டடங்கள் காரணமாக பாடசாலை மாணவர்களுக்கும் பாடசாலை பணியாட்டொகுதிக்கும் ஆபத்தேற்படாத வகையில் மேற்கொள்ளப்பட்டுள்ள முன்னெச்சரிக்கை நடவடிக்கைகள் யாவை;

(vii) மேற்படி கட்டடங்களைத் துரிதமாகவும் பாதுகாப்பாகவும் நிர்மாணித்து முடிப்பதற்கு பின்பற்றப்படும் செயன்முறை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that there are buildings in government schools which had been partially constructed and subsequently abandoned;

(ii) the number of such buildings existing in each province, separately;

(iii) the main reasons that had contributed to the delay in the construction work of the aforesaid buildings;

(iv) out of the aforesaid buildings, the number of buildings in each province for which budgetary allocations had been made in the Budget for the year 2025 for the purpose of completing the construction work, separately;

(v) the time frame within which the construction work of the aforesaid buildings will be completed;

(vi) the precautionary measures taken to prevent any accidents that may occur due to the partially constructed buildings, affecting students and school staff; and

(vii) the methodology followed to complete the construction work of the aforesaid buildings expeditiously and safely?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

(ii)

| පළාත | ගොඩනැගිලි සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 106 |
| දකුණ | 4 |
| මධ්‍යම | 38 |
| වයඹ | 38 |
| ඌව | 08 |
| උතුරු මැද | 54 |
| සබරගමුව | 94 |
| උතුර | 82 |
| නැගෙනහිර | 44 |
| **එකතුව** | **468** |

(iii) මෙහි යම් යම් කර්මාන්ත ඉදිකිරීම් අධීක්ෂණය සිදු කර ඇත්තේ එවකට පැවති "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සිටි ඉංජිනේරුවන් ඇතුළු තාක්ෂණ කාර්ය මණ්ඩලය වන අතර, 2020 වර්ෂයේදී මෙම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය නව රජය බලයට පත්වීමත් සමඟම වසා දමා ඇත. ඒ හේතුවෙන් මෙම කර්මාන්ත ඉදිරියට කරගෙන යාමට අවශ්‍ය ප්‍රමාණවත් තාක්ෂණික කාර්ය මණ්ඩලය අධ්‍යාපන අමාත්‍යාංශය සතු නොවුණු අතර ඇතිවුණු කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ද ව්‍යාපෘති කාලය තුළ වැඩ අවසන් කිරීමට නොහැකි විය.

ඉන් අනතුරුව රට තුළ පැවති ආර්ථික අර්බුදය හමුවේ ද මෙම ඉදිකිරීම් තාවකාලිකව නතර කර තිබූ අතර නැවත මෙම ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කළද ගිවිසුම්ගත මිල ගණන් යටතේ එම වැඩ ඉටු කිරීමට කොන්ත්‍රාත්කරුවන් එකඟ නොවීය.

තවද, පෞද්ගලික ප්‍රතිපාදන හෝ වෙනත් ආධාර මත සම්පූර්ණ කරන බවට තහවුරු කර ඉදිකර ඇති ඇතැම් ගොඩනැගිලිද අනුග්‍රාහකයින් විසින් ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත ඉදිකිරීම් සම්පූර්ණ නොකර අතරමඟ නවතා ඇත.

(iv)

| පළාත | ගොඩනැගිලි සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 77 |
| දකුණ | - |
| මධ්‍යම | 29 |
| වයඹ | 23 |
| ඌව | 01 |
| උතුරු මැද | 38 |
| සබරගමුව | 89 |
| උතුර | 60 |
| නැගෙනහිර | 39 |
| **එකතුව** | **356** |

(v) මෙම ගොඩනැගිලි බොහෝමයක් ඉදිකිරීම වසර කිහිපයකට පෙර ආරම්භ කර මේ වන විට ඉදිකිරීම් නවතා ඇති අතර, නැවත ඉදිකිරීම් ආරම්භ කිරීමේදී විවිධ ගැටලු මතු වී ඇත.

එම ව්‍යාපෘතිය ආරම්භයේදී එකඟ වූ ව්‍යාපෘති පිරිවැයට වඩා මේ වන විට පිරිවැය ඉතා ඉහළ ගොස් ඇති බැවින් ඉදිකිරීම් සමාගම් විසින් පෙර එකඟ වූ මිලට ඉදිකිරීම් සිදු කිරීමට එකඟ නොවන අතර, වර්තමානයේ පවතින මිල ගණන් අනුව එකඟත්වයන්ට පැමිණීමට සිදුව ඇත.

එසේම පවතින ප්‍රතිපාදන සීමා මත ද යම් යම් ගොඩනැගිලි ඉදිකිරීම් සීමා වී ඇත. තවද, යම් ගොඩනැගිලි බාහිර පුද්ගලයන් හෝ ආයතන මඟින් ඉදිකිරීම් ආරම්භ කළ ද ඒවා අවසන් කර නොමැති වීම මත රජයේ ප්‍රතිපාදන මඟින් අවසන් කළ යුතු වීම.

ඒ අනුව, ඉහත ගැටලු නිරාකරණය කරමින් ඉහත ගොඩනැගිලිවල කඩිනමින් වැඩ අවසන් කිරීමට කටයුතු කරනු ඇත.

(vi) දැනට ඉදිකර අතරමඟ නතර කර ඇති ගොඩනැගිලි ආරක්ෂිත ලෙස පාසල් ඉගැන්වීම් කාර්යයන් සඳහා භාවිත කරනු ලබන බවට මා වෙත වාර්තා වී ඇත. කෙසේ වෙතත්, ඉහත අර්ධ ලෙස ඉදිකළ ගොඩනැගිලි භාවිත කිරීමේදී දරුවන්ගේ ආරක්ෂාව සහතික වන ආකාරයට කටයුතු කරන ලෙස ද අවශ්‍ය උපදෙස් විදුහල්පතිවරුන් වෙත ලබා දී ඇත.

(vii) ඉහත (v)හි පරිදි පවතින ගැටලු නිරාකරණය කර ගනිමින් ඉදිකිරීම් නිම කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ சபாநாயகர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ பிரதமர் அவர்களே, “அருகிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை” திட்டத்தின்கீழ் பாடசாலை வளாகங்களுக்குள் தொடக்கம்பெற்று நீண்ட காலமாக முழுமையடையாத கட்டுமானங்கள் காரணமாக விபத்து ஏற்படுவதற்கான சாத்தியக்கூறுகள் இருப்பதாகவும், இந்தப் பிரச்சினையைத் தீர்க்க எந்தவொரு பாதுகாப்பு நடவடிக்கையும் எடுக்கப்படவில்லை என்றும் தேசிய கணக்காய்வுத் திணைக்களத்தின் அறிக்கை சுட்டிக் காட்டுகின்றது. இதை மேற்கோளிட்டு, 2025.08.03ஆம் திகதிய "The Sunday Times" செய்தித்தாளில் செய்தியொன்றும் வெளிவந்தது. அதன் பிரதி இங்கே என்னிடமுள்ளது. மேற்படி இடர்நிலையை முல்லைத்தீவு கல்வி வலயத்திலுள்ள பாடசாலை ஒன்றில் 2025.07.14ஆம் திகதி நான் நேரில் சென்று உறுதிப்படுத்த முடிந்தது. எனவே, விபத்துகளை ஏற்படுத்தக்கூடிய இத்தகைய கட்டிடங்கள் விரைவாக முன்னுரிமை அடிப்படையில் முழுமைப்படுத்தப்பட வேண்டும். மேற்படி கட்டிடங்களின் கட்டுமானம் முடிவுறுத்தப்படும் வரை மாணவர்களும் கல்விசார் ஊழியர்களும் முழுமைப்படுத்தப்படா துள்ள மேற்படி கட்டிடங்களை அணுகாத வகையில் பாதுகாப்பு எல்லைப்படுத்தலை உரிய கட்டிடங்கள் சார்ந்து மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அத்துடன், இவ்வாண்டுக்கான அரசின் நிதி ஒதுக்கீட்டில் இத்தகைய கட்டிட முழுமைப்படுத்தலுக்கான தங்களின் ஏற்பாடு என்ன? என்பதையும் மேற்படி கட்டிடங்களை முழுமைப்படுத்துவதில் முன்னுரிமை ஒழுங்கு எவையேனும் பேணப்படுகின்றதா? என்பதையும் தங்களிடம் தயவாகக் கேட்கின்றேன்.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Speaker, as was mentioned, this is a very old project started in 2016 and came to a halt in 2020. As a result, there are several problems arisen with the contractors. The contracts they entered into are problematic and do not reflect current prices. So, there is a lot of negotiations to be done in order to restart the project. In 2025 and 2026, actually what our Government did was to review all of these projects, look at the contracts and wherever possible, negotiate with the existing contractors to come to some kind of agreement to complete these projects. So, both in 2025 and 2026, the Budget allocation was for their completion. The main portion for education infrastructure from the Budget was allocated to actually complete these incomplete projects. When we were doing that, we had to make a decision about some of the buildings which are now unusable and have to be abandoned. For those that could be continued with, we have allocated money, but the process is not as fast as we would like it to be simply because of the contractual problems. These are really old projects which had been abandoned and we have to renegotiate and restart them. Wherever possible, we have asked the principals not to use the buildings, if those are unsafe, till some decision could be made. But, if the Hon. Member has information about a specific school building which is incomplete and is unsafe, please let me know, and we will look into it.

ගරු තුරෙයිරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

நன்றி, கௌரவ பிரதமர் அவர்களே! குறித்த பாடசாலையின் பெயர் முல்லைத்தீவு, முள்ளியவளை கலைமகள் வித்தியாலயம் என்பதாகும். நான் அங்கு நேரடியாகச் சென்று பார்த்தேன். அங்குள்ள கட்டிடத்தால் அங்குள்ள பிள்ளைகளுக்கோ, ஆசிரியர்களுக்கோ, ஊழியர்களுக்கோ ஆபத்து ஏற்படலாம். எனினும், அங்கு வேறு கட்டிடங்கள் இல்லை. அந்தப் பாடசாலையில் கூடுதலான மாணவர்கள் கற்கின்றார்கள். எனவே, இது தொடர்பில் கூடுதலான கவனமெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

சமமான மற்றும் நியாயமான கல்வி அணுகலை வழங்குவதற்கு இந்த அரசாங்கம் உறுதிபூண்டுள்ளதாக கல்வி அமைச்சின் "இலங்கையின் பொதுக் கல்வியை நிலைமாற்றம் செய்தல்" எனும் அறிக்கை குறிப்பிடுகின்றது. குறிப்பாக, STEM எனப்படுகின்ற விஞ்ஞானம், தொழில்நுட்பம், பொறியியல், கணிதம் ஆகிய பாடங்களில் விசேட கவனம் செலுத்தப்படுவ தாகக் கூறப்படுகின்றது. கல்வி மறுசீரமைப்பை நடைமுறைப்படுத்துவதில் வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள பெரும்பாலான பாடசாலைகளில் நிலவும் சவால், வளப் பற்றாக்குறையும் போதிளவு இடவசதி இன்மையுமே ஆகும். கட்டிமுடிக்கப்படாத கட்டிடங்களால் மாணவர்களின் செயற்பாட்டுக் கற்கை பாதிக்கப்படுகின்றது. பரிசோதனை களுக்கும் தகவல் தொழில்நுட்பச் செயன்முறைகளுக்குமான செயற்பாட்டறைகள் வன்னியில் பெரும்பாலான பாடசாலைகளில் போதுமானதாக இல்லை. ஒரு வகுப்பறையைவிடவும் மிகவும் சிறிய அளவிலான கட்டிடங்களுள் இயங்கும் ஆய்வுகூடங்களும் வன்னித் தேர்தல் மாவட்ட பாடசாலைகளில் உள்ளன. பரிசோதனைகளுக்கும் தகவல் தொழில்நுட்ப பயிற்சிகளுக்கும் போதுமான வளங்கள் இல்லாதிருப்பதோடு, செயற்பாடுகளுக்கான இடவசதியும் இல்லாதிருப்பது வெற்றிகரமான கல்வி மறுசீரமைப்பு நடைமுறைப்படுத்தலுக்குச் சவாலாகும். எனவே, தீவளாவிய வகையில் மறுசீரமைப்புக்கு அத்தியாவசியமாகும் வள நிரப்பலில் குழுச் செயற்பாடுகளின் அடிப்படையிலேனும் மாணவர்கள் தகவல் தொழில்நுட்பச் செயன்முறை அறிவைப் பெற்றுக்கொள்வதற்குப் போதுமான கணினிகள் 2026இல் பாடசாலைகளுக்கு வழங்கப்படுமா? எனக் கேட்கின்றேன்.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, one of the goals or targets of the proposed reforms is, indeed, to address this resource gap that exists between schools and the problems that were highlighted by the Hon. Member are very correct and need to be addressed. That is part of the current education reforms, which is why we have a separate pillar on infrastructure development and that is looking at bridging this gap.

Specifically, with regard to labs, IT connectivity, equipment and devices, we have allocated money for 2026. We have already assessed the number of secondary schools which do not have these facilities, and gradually, their needs are being addressed. At the moment, all secondary schools are to be given, at least, one smart classroom and by the end of the year, we hope to guarantee that all of these schools would have adequate IT connectivity. We are negotiating with the Internet providers to make sure that these schools have connectivity.

In addition, lab facilities and all other facilities, as was mentioned, are provided in a phased manner; we cannot do everything this year. But, the matter is being addressed. We are identifying the schools that need special support and have allocated money. Also, money has been allocated to the province to directly address these issues, in addition to the money that will go from the Line Ministry.

## වී අලෙවි මණ්ඩලය: වී මිලදී ගැනීම සහ ගබඩා පහසුකම්

## நெல் சந்தைப்படுத்தல் சபை: நெல் கொள்வனவு மற்றும் களஞ்சிய வசதிகள்

## PADDY MARKETING BOARD: PURCHASE OF PADDY AND STORAGE FACILITIES

1335/2025

**2.** ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වී අලෙවි මණ්ඩලය සතු ගබඩා, වී ගබඩා කළ හැකි තත්ත්වයේ පවතින්නේද;

(ii) එසේ නම්, එම එක් එක් වී ගබඩාවේ ගබඩා කළ හැකි වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් මෙට්‍රික් ටොන් කොපමණද;

[ගරු සුරංග රත්නායක මහතා]

(iii) 2025 වර්ෂයේ යල කන්නයේ අපේක්ෂා කරනු ලැබූ වී අස්වැන්න කොපමණද;

(iv) එම අස්වැන්නෙන් වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගැනීමට අපේක්ෂා කරන වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(v) එම වී ප්‍රමාණය, ඉහත සඳහන් යල කන්නයේ අපේක්ෂිත වී අස්වැන්නේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(vi) 2025/2026 මහ කන්නයේදී වී අස්වැන්න ඉහළ නැංවීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நெல் சந்தைப்படுத்தல் சபைக்குச் சொந்தமான களஞ்சியசாலைகள் நெல்லை களஞ்சியப்படுத்தக் கூடிய நிலையில் காணப்படுகின்றனவா;

(ii) ஆமெனில், மேற்படி ஒவ்வொரு நெற்களஞ்சிய சாலையிலும் களஞ்சியப்படுத்தக்கூடிய நெல்லின் அளவு வெவ்வேறாக மெற்றிக் தொன்களில் எவ்வளவு;

(iii) 2025ஆம் ஆண்டின் சிறு போகத்தில் எதிர்பார்க்கப்படுகின்ற நெல் விளைச்சல் யாது;

(iv) மேற்படி விளைச்சலில், நெல் சந்தைப்படுத்தல் சபையால் கொள்வனவு செய்ய எதிர்பார்க்கப் பட்டுள்ள நெல்லின் அளவு மெற்றிக் தொன்களில் எவ்வளவு;

(v) மேற்படி நெல்லின் அளவு, மேலே குறிப்பிடப் பட்டுள்ள சிறு போகத்தில் எதிர்பார்க்கப் பட்டுள்ள நெல் விளைச்சலின் வீதமாக எவ்வளவு;

(vi) 2025/2026 பெரும்போகத்தின்போது, நெல் விளைச்சலை அதிகரிப்பதற்காகத் தயார்செய்யப் பட்டுள்ள திட்டங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether the stores owned by the Paddy Marketing Board are in a condition to store paddy;

(ii) if so, the quantity of paddy in metric tons that can be stored in each of those stores, separately;

(iii) the expected paddy harvest in the "Yala" season of the year 2025;

(iv) the quantity of paddy in metric tons that the Paddy Marketing Board expects to purchase from the said harvest;

(v) the quantity of paddy as a percentage of the expected paddy harvest in the aforementioned " Yala" season; and

(vi) the plans that have been prepared to increase the paddy harvest in "Maha" season of 2025/2026?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) අපේ රටේ ඇති වී ගබඩා කලාප මට්ටමින් නම් කර තිබෙනවා.

වයඹ කලාපයේ තිබෙන මුළු වී ගබඩා ප්‍රමාණය 31යි. වයඹ කලාපයට කුරුණෑගල, පුත්තලම, මාතලේ සහ ගම්පහ කියන දිස්ත්‍රික්ක අයත් වනවා. ඒ අනුව එම ගබඩාවලට වී මෙට්‍රික් ටොන් 40,950ක් ලබා ගැනීමේ හැකියාව තිබෙනවා.

ඊළඟට, අම්පාර කලාපය. අම්පාර කලාපයේ සමස්ත වී ගබඩා 56ක් තිබෙනවා. ඒ කලාපයට අම්පාර, මහනුවර ඇතුළු දිස්ත්‍රික්ක කිහිපයක් ඇතුළත් වනවා. ඒ ගබඩා 56 තුළ වී මෙට්‍රික් ටොන් 65,315ක් ගබඩා කරන්න පුළුවන්.

ඊළඟට, නැගෙනහිර කලාපය. නැගෙනහිර කලාපයේ වී ගබඩා 34ක් තිබෙනවා. ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්ක එම කලාපයට අයත් වනවා. එම ගබඩා තුළ වී මෙට්‍රික් ටොන් 23,650ක් ගබඩා කිරීමේ පහසුකම තිබෙනවා.

ඊළඟට, දකුණු කලාපය. දකුණු කලාපයේ වී ගබඩා 32ක් තිබෙනවා. මොනරාගල, හම්බන්තොට, මාතර, ගාල්ල සහ රත්නපුරය කියන දිස්ත්‍රික්ක එම කලාපයට අයත් වනවා. එම ගබඩාවල වී මෙට්‍රික් ටොන් 66,800ක් ගබඩා කිරීමේ පහසුකම තිබෙනවා.

අනුරාධපුර කලාපයේ වී ගබඩා 59ක් තිබෙනවා. එම ගබඩාවල වී මෙට්‍රික් ටොන් 47,730ක් ගබඩා කිරීමේ පහසුකම තිබෙනවා.

ඊළඟට, උතුර කලාපයට කිලිනොච්චිය, වවුනියාව, මුලතිව්, මන්නාරම ආදී දිස්ත්‍රික්ක අයත් වනවා. උතුරු කලාපයේ වී ගබඩා 29ක් තිබෙනවා. එහි වී මෙට්‍රික් ටොන් 25,900ක් ගබඩා කිරීමේ පහසුකම තිබෙනවා.

ඊළඟට, පොළොන්නරුව කලාපය. එම කලාපයට පොළොන්නරුව සහ මාතලේ දිස්ත්‍රික්ක අයත් වනවා. එහි වී ගබඩා 41ක් තිබෙනවා. ඒ තුළ වී මෙට්‍රික් ටොන් 47,440ක් ගබඩා කිරීමේ පහසුකම තිබෙනවා. ඒ අනුව අපේ රට තුළ සමස්ත වී ගබඩා 282ක් තිබෙනවා. මේවායේ වී මෙට්‍රික් ටොන් 317,785ක් ගබඩා කිරීමේ පහසුකම තිබෙනවා.

(iii) ගිය යල කන්නයේ අස්වැන්න ගැන ඔබතුමා අහන්නේ. ඒ ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 2.27යි.

(iv) මෙට්‍රික් ටොන් 48,000ක් ගන්න තමයි අපි සැලසුම් කරලා තිබුණේ.

(v) ඒක මුළු නිෂ්පාදනයෙන් සියයට 2.11යි.

(vi) 1. දැනට ක්‍රියාත්මක වැඩ පිළිවෙළ නව්‍යතාවෙන් යුතුව ශක්තිමත්ව ඉදිරියට සිදු කරගෙන යනවා.

- දැනට හඳුන්වා දී ඇති ඉහළ අස්වනු දෙන වී ප්‍රභේද ප්‍රචලිත කිරීමට අමතරව විශේෂ වෙළෙඳ පොළ සඳහා ආනයනය කරනු ලබන සහල් සඳහා ආදේශක ලෙස සුදුසු ඉහළ ධාන්‍ය ගුණාත්මයෙන් යුතු - බාස්මතී ආකාර හා කීරි සම්බා ආකාරයේ - නව වී ප්‍රභේද නිපදවීම සඳහා පර්යේෂණ කටයුතු සිදු කිරීමත්, ඒ සඳහා අවශ්‍ය වන නව තාක්ෂණයන් ජනනය කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරගෙන යනු ලබන අතර,
  - අභිජනන බීජ වී සම්පූර්ණ අවශ්‍යතාව සැපයීම තුළින් බීජ ගුණන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගැනීම හා බීජ ගුණාත්මය තහවුරු කිරීම.
  - පොහොර කාර්යක්ෂමතාව වැඩි කිරීමේ ක්‍රම හඳුන්වා දීම.
  - නව පරම්පරාවේ පොහොර භාවිතය ප්‍රචලිත කිරීම හා පස පරීක්ෂා කර පොහොර යෙදීම මඟින් තවදුරටත් අස්වැන්න ඉහළ නැංවීම.
  - කම්කරු ශ්‍රමය හිඟවීම නිසා සීමා වී ඇති නිෂ්පාදිත භූමි යාන්ත්‍රිකරණය මඟින් කාර්යක්ෂමව භාවිත කිරීමට හැකි ක්‍රමවේද හඳුන්වා දීම.
  - ඩ්‍රෝන තාක්ෂණය ඇතුළුව නව තාක්ෂණයන් හඳුන්වා දීම හා භාවිතය ප්‍රචලිත කිරීම ඔස්සේ ගොවි ජනතාවගේ ආකර්ෂණයක් ඇති කර ගැනීමට අදාළ වැඩසටහන් මේ වනකොට දියත් කරන්නට පටන් ගෙන තිබෙනවා.
  - යෙදවුම් පිරිවැය අඩු කිරීම සඳහා රෝග හා පළිබෝධ පාලන ක්‍රමවේද, ජල කළමනාකරණය කාර්යක්ෂම කර ගැනීමේ ක්‍රමවේද, වල් වී පාලනය හා වල් පැළ පාලනය සඳහා කාර්යක්ෂම ක්‍රමවේද හඳුනා ගැනීම වැනි දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

2. දේශීය වී නිෂ්පාදනය වැඩි කරගැනීමට අදාළව විශේෂයෙන්ම "පුනරුදයට අරුණළු" ජාතික කෘෂිකර්ම වැඩසටහනට සමගාමීව යාය වැඩසටහනක් මේ වනකොට අපි හඳුන්වා දීලා තිබෙනවා. අපි පළමු වටයේදී යාය 500ක් තෝරා ගත්තා. එහි යම් සාර්ථකභාවයකුත් තිබෙනවා, අසාර්ථකභාවයකුත් තිබෙනවා. ඒ අත්දැකීම් පාවිච්චි කරලා මේක තවත් විධිමත්ව ඉස්සරහට අරගෙන යන්න අපි සැලසුම් කරලා තිබෙනවා. 2028 වසර වනකොට යාය 5,000ක් සැලසුම් කරලා ඉස්සරහට කටයුතු කරගෙන යන එක තමයි අපේ සැලසුම. පස පරීක්ෂා කරලා, ඒ නිර්දේශවලට අනුව පොහොර සහ යෙදවුම් පාවිච්චි කිරීමත්, විද්‍යාත්මකව බිම සකස් කිරීමත් ඇතුළු කාරණා මත එම යායවල් තුළින් අස්වැන්න වැඩි කරලා පෙන්වීමට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වනවා. ඒ අනුව 2028 වසර අවසන් වනකොට අපි අද ගන්න වී නිෂ්පාදනයට වඩා වැඩි මට්ටමකට අපේ වී නිෂ්පාදනය ඔසවා තැබීම සඳහා තමයි කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට අපි මේ ක්‍රියාවලිය මේ වනකොට දියත් කරලා තිබෙන්නේ.

ඒකට අදාළ තව ගොඩක් විස්තර මේ වාර්තාවේ තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ උත්තරය තුළම තිබෙනවා, වී අලෙවි මණ්ඩලය හරහා ගොවි ජනතාවගේ නිෂ්පාදනයට සාධාරණ මිලක් දීලා, ඒවා මිලදී ගැනීමේ ක්‍රියාවලිය කරන්නට රජය අපොහොසත් බව, ඒක ප්‍රමාණවත් මදි බව. ඔබතුමන්ලා බලයට පත්වීමෙන් පසුව හතරවැනි කන්නය තමයි මේ ගතවෙමින් තිබෙන්නේ. ඔබතුමන්ලා බලයට පත් වනකොට වෙළෙඳ පොළේ වී කිලෝවක මිල රුපියල් 120ක් වාගේ වුණා. රුපියල් 120ට වී මිලදී ගනිද්දී, ජනාධිපතිතුමා ඇතුළු ඔබතුමන්ලා වී මෝල් හිමියන් සමඟ සාකච්ඡා කරලා තමයි රුපියල් 10කින් - රුපියල් 130කට- වී මෝල් හිමියන්ට වී කිලෝවක මිල වැඩි කරලා දුන්නේ. *[බාධා කිරීමක්]* ඔව්, මේසයට තට්ටු කරලා තමයි මිල වැඩි කරලා දුන්නේ. හැබැයි, ගොවි ජනතාවගෙන් දැන් වී මිලදී ගන්නේ රුපියල් 75ට, 80ට. ඔබතුමන්ලාගේ ඉදිරිපෙළ හිටපු ඇමතිවරයෙක්ම කිව්වා, වී මෝල් හිමියෝ දෙන්නෙක් තමයි මේ කූට ව්‍යාපාරය කරන්නේ, මේ දෙන්නාව හිර කළාට පස්සේ මේ ප්‍රශ්නය ඉවරයි කියලා. නමුත්, දැන් ආණ්ඩුව මේ ව්‍යාපාරිකයෝ දෙන්නාට හිරවෙලා වාගේ තමයි අපට පෙනෙන්නේ.

මම ඔබතුමාගෙන් අහන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. කෘෂිකර්ම ඇමතිවරයාත් වී මෝල් හිමියන්ව වර්ණනා කරනවා. හැබැයි, ගොවි ජනතාව ගැන නම් වචනයක්වත් කථා කරන්නේ නැහැ. අපට දැන් පෙනෙන්න තිබෙනවා, වී මිලදී ගැනීමට රජය ක්‍රියාත්මක කරලා තිබෙන වැඩ පිළිවෙළ අසමත් කියලා. නමුත් කෘෂිකර්ම ඇමතිවරයා කියනවා, තව අවුරුදු 2කින් මේකට විසඳුමක් දෙන්නම් කියලා. ගොවි ජනතාවට සාධාරණ මිලක් ලබා දෙන්න ඔබතුමන්ලා මේ වැඩ පිළිවෙළ කරන්නේ තවත් අවුරුදු දෙකකින්ද, නැත්නම් වී අලෙවි මණ්ඩලයේ කටයුතුවලට එහා ගිහිල්ලා මේ ගොවි ජනතාවගෙන් සාධාරණ මිලකට මේ අස්වැන්න ගන්නට ඔබතුමාට සැලසුමක්, වැඩ

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සුරංග රත්නායක මහතා]

පිළිවෙළක් තිබෙනවාද කියන එකයි මම අහන්නේ. කුඹුරුවලට ගිහිල්ලා, ගොවීන්ට අමුඩ ගහලා, ඔවුන් පාරට බස්සලා ගොයම් කකා තමයි ඔබතුමා ගොවීන්ගේ ප්‍රශ්න ගැන කථා කළේ. හැබැයි, අද ඔබතුමා ඒවාට කිසිම උත්තරයක් දෙන්නේ නැහැ. අගමැතිතුමිය ඉස්සෙල්ලා කිව්ව විධියට රුපියල් 120ක මිලක් කිසිම තැනක ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ කන්නයේදී ගොවි ජනතාවට ඒ මිල ලබා දෙන්න ඔබතුමාගේ වැඩ පිළිවෙළ මොකක්ද කියන එක ඔබතුමා විධිමත්ව, ඉතා පැහැදිලිව කියන්න.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව ඇවිල්ලා කන්න තුනහමාරයි, කන්න හතරක් නැහැ. අපි ආණ්ඩුව ගන්නකොට වී ගබඩා වහලා තිබුණේ. වී ගබඩාවල යකඩත් අරගෙන ගිහිල්ලා තිබුණා; බිම් තරාදිවල යකඩ පවා අරගෙන ගිහිල්ලා තිබුණා. ඒ ගබඩා වවුලන්ට, පරවියන්ට ඇරලා දාලා තිබුණේ. ඒ ගබඩා ප්‍රතිසංස්කරණය කරන කටයුත්ත තමයි අපිට පළමුවෙන්ම කරන්න සිද්ධ වුණේ. යුද හමුදාව ඒ අවස්ථාවේදී විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ සම්බන්ධයෙන් යුද හමුදාවට අපි ස්තුතිවන්ත වෙනවා. පළමුවෙන්ම අපිට කරන්න වුණේ ඒ ගබඩා ප්‍රතිසංස්කරණය කිරීමයි.

ගරු කථානායකතුමනි, අපි ආණ්ඩුව ගන්නකොට නාඩු වී කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 99.75යි. මගේ ඉලක්කම් නොවෙයි මම මේ කියන්නේ, රජයේ ඉලක්කම්. එතකොට ඒ වනකොට පැවති ආණ්ඩුව වී කිලෝවක් රුපියල් 105 කියලා මිල නියම කරලා තිබුණා. හැබැයි, රුපියල් 105ක මිලක් නියම කරලා තිබුණත් ගබඩා ඇරියේ නැහැ. ගරු කථානායකතුමා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවියා රුපියල් 60ට, රුපියල් 65ට වී වික්කා. එවැනි තත්ත්වයක් තිබුණේ. නමුත්, අපි ඒ තත්ත්වය වෙනස් කළා. වී ගබඩා ප්‍රතිසංස්කරණය කළා. ඒ වෙලාවේ අරින්න පුළුවන් වී ගබඩා ඔක්කොම ඇරියා.

නාඩු වී කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 92යි. රජයේ ඉලක්කම් මම මේ කියන්නේ. ඒ රුපියල් 92ට අපි සියයට 30ක් එකතු කළා. සියයට 30ක් එකතු කළාම නාඩු වී කිලෝවක් රුපියල් 120ක් වනවා. ඒ අනුව ගොවියාට රුපියල් 28ක ශුද්ධ ලාභයක් තිබෙනවා. එතකොට, සම්බා වී කිලෝවක් තිබුණේ රුපියල් 115ට. අපි සම්බා වී කිලෝව රුපියල් 125ක් කළා; රුපියල් 10ක් එකතු කළා.

ඒ වාගේම කීරි සම්බා වී කිලෝවක් තිබුණේ රුපියල් 130ට. ඒ මිලත් අපි වැඩි කළා. මේ කන්නය ගත්තොත්, නාඩු වී කිලෝවක් රජයේ ගබඩාවලට රුපියල් 120ට ගන්නවා. සම්බා වී කිලෝවක මිල අපි ආණ්ඩුව ගන්නවාට කලින් තිබුණු මිලට වැඩිය දැන් රුපියල් 15කින් වැඩි කරලා තිබෙනවා. ඒ අනුව දැන් සම්බා වී කිලෝවක් රුපියල් 130ට ගන්නවා. පසුගිය කන්නයේ සම්බා වී කිලෝවක් ගත්තේ රුපියල් 125ට. කීරි සම්බා වී කිලෝවක් කලින් තිබුණේ රුපියල් 130ට. පසුගිය කන්නයේ සම්බා වී කිලෝවක් රුපියල් 132ට ගත්තා. දැන් රුපියල් 140ට ගන්නවා. ඒ නිසා රජයේ වී ගබඩාවලට මේ මිල ගණන්වලට වී ගන්නවා. පසුගිය සිකුරාදා වනවිටත් රජයේ ගබඩාවලට වී මෙට්‍රික් ටොන් 13,000කට වැඩිය ගොවි ජනතාව ගෙනැවිත් භාර දීලා තිබෙනවා. තව ගොවියෝ විශාල ප්‍රමාණයක් සාම්පල් දීලා තිබෙනවා. ඒ නිසා ගබඩාවලට ගෙනැත් දෙන වී ප්‍රමාණය රජය විධියට මිලදී ගන්න අපි සූදානම් කියන එක මම මේ වෙලාවේදී ප්‍රකාශ කරනවා. ඒ විතරක් නොවෙයි, අපට තෙත වී මිලදී ගැනීමට නීතිමය ප්‍රතිපාදන නැහැ. හැබැයි, තෙත වී සම්බන්ධයෙනුත් ගොවියාට උත්තරයක් සපයන්න අපි ආණ්ඩුව විධියට අතගහලා තිබෙනවා. මේ වනකොටත් වී වේළන යන්ත්‍ර 2ක් තලාව ප්‍රදේශයේ සවි කර තිබෙනවා. ඒ යන්ත්‍ර අම්පාරේත් අපි සවි කරනවා. ඉදිරියේදී ඒ ප්‍රශ්නයෙනුත් ගොවි ජනතාව නිදහස් කර ගැනීම වෙනුවෙන් වැඩ පිළිවෙළක් අපි මේ වනකොටත් සකස් කරලා තිබෙනවා. ඒ අනුව එම ක්‍රියාවලිය ඉස්සරහට යනවා.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කලින් පිළිතුරේදී කිව්වා, සමස්ත අස්වැන්නෙන් මිලදී ගන්න පුළුවන් සියයට 2.25යි කියලා. ඒ පිළිතුරේම තිබෙනවා, මේක ප්‍රමාණවත් නැහැ කියන කාරණය. ඉතින්, වී අලෙවි මණ්ඩලය හරහා රජය වී මිලදී ගැනීම සාධාරණ උත්තරයක් නොවෙයි කියන කාරණය පැහැදිලියි. මම මතු කරන ප්‍රශ්නය මෙයයි. මම ඔබතුමාට ගෞරවයෙන් මේ කාරණයත් මතක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. පසුගිය ආණ්ඩු කළේ මෙහෙමයි, පසුගිය කාලයේ කළේ මෙහෙමයි කියන එක තවදුරටත් වලංගු වෙන්නේ නැහැ. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා මේ වනවිට අවුරුදු එකහමාරක් ගත වෙලා තිබෙනවා. ඒ නිසා දැන් පරණ කථා කියලා තේරුමක් නැහැ. ඔබතුමා කියනවා, එදා නිෂ්පාදන වියදම රුපියල් 98යි, දැන් ඒක අඩු වෙලා කියලා. ප්‍රායෝගිකව බැලුවොත් ඒක ඇත්ත නොවෙයි. ඔබතුමන්ලා කිව්ව විධියට ගොවි ජනතාවගේ වී අස්වැන්න ගන්නේ නැහැ වාගේම "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ අර්ධ වගා හානි වෙනුවෙන් කිසිවක් තවම ගොවි ජනතාවට ලබා දීලාත් නැහැ. අර්ධ වගා හානි වෙනුවෙන් ගොවීන්ට වන්දි ගෙවනවා කියන කාරණය පිළිබඳව මම දන්නා තරමින් ආණ්ඩුව පැත්තෙන් කිසිම පැහැදිලිතාවක් නැහැ.

ඒ වාගේම පොහොර සහනාධාරයත් නියමිත වෙලාවට ගොවීන්ට ලැබෙන්නේ නැහැ. මේ වනවිටත් පොහොර සහනාධාරය නොලැබුණු ගොවීන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. එක පැත්තකින්, ගොවීන්ට පොහොර සහනාධාරය ලැබිලා නැහැ. අනෙක් පැත්තෙන්, "දිට්වා" සුළි කුණාටුව නිසා අර්ධ වගා හානිවලට ලක් වූ ගොවි ජනතාවට ඔබතුමන්ලා සත පහක්වත් ගෙවලා නැහැ. ඒ නිසා මේ ප්‍රශ්න දෙකට ඔබතුමා උත්තර ලබා දෙන්න. අර්ධ වගා හානි සිදු වූ වගා වෙනුවෙන් වන්දි ගෙවනවාද, ගොවි ජනතාවට නිසි වේලාවට පොහොර සහනාධාරය ලබා දෙන්න ඊළඟ කන්නයේදීවත් ඔබතුමන්ලාට වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන කාරණය තමයි මම ඔබතුමාගෙන් අහන්නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න ගොඩක් ඇහුවා. මම කලින් සියයට 2.11ක් කිව්වේ, වී ගෙනැත් දුන් ප්‍රමාණය මුළු නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන්. එහෙම නැතුව දැන් ගන්න පුළුවන් ප්‍රමාණය නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒවා විකෘති කරන්න එපා. දැන් ගොවියා කොච්චර වී ගෙනැල්ලා දුන්නත් අපි ගන්නවා. සල්ලි මදි නම් තව සල්ලි නිදහස් කරනවා. ඒ නිසා ගොවියාට ගබඩා පිරෙන්න වී ගෙනැවිත් දෙන්න පුළුවන්. ඒ නිදහස අපි ලබා දීලා තිබෙනවා. ඒක සීමා කරලා නැහැ; සීමාවක් නැහැ.

ඔබතුමා කිව්ව ඊළඟ කාරණයට පිළිතුර මේකයි. පරණ දේවල් මතක් කරන්නේ නැතුව වර්තමානය ගැන කථා කරන්න අමාරුයි නේ. එහෙම ඉස්සරහට යන්න අමාරුයි. පරණ දේවල්වල ඉඳන් තමයි අපි ඉදිරියට යන්න ඕනෑ. හිටපු තැන ඉඳන් අපි මේ කෙටි කාලය තුළ ඇවිල්ලා තිබෙන දුර පිළිබඳව කථා කරනකොට අපට පරණ දේවල් ගැන කථා කරන්න සිදු වෙනවා. එතැන ඉඳන් තමයි අපට ඉස්සරහට යන්න වෙන්නේ. ඒ විධියට තමයි ගොවියාගේ ප්‍රශ්නය අපි ක්‍රමානුකූලව මේ වෙනකොට විසඳා ගෙන යන්නේ.

ඔබතුමා පොහොර සහනාධාරය ගැනත් මතක් කළා. අපි ආණ්ඩුව භාර ගන්නකොට වී වගාව වෙනුවෙන් හෙක්ටෙයාර 2ක් සඳහා ගොවීන්ට පොහොර සහනාධාරය වශයෙන් ගෙව්වේ රුපියල් 30,000යි. දැන් අපි රුපියල් 50,000ක් ගෙවනවා. වී වගා කරන ඉඩම්වල අතුරු භෝග වගා කරපු ගොවීන්ට සහනාධාර වශයෙන් කලින් කිසිම මුදලක් ලැබුණේ නැහැ. දැන් ඒ ගොවි ජනතාවට හෙක්ටෙයාර 2ක් සඳහා රුපියල් 30,000ක් ගෙවනවා. ඒ වාගේම ගොවි ජනතාවට තවත් සැලකිය යුතු ප්‍රමාණයේ සහනාධාර ලබා දෙනවා. පොහොර සහනාධාරය ලබා දීම පසුගිය කාලයේදීත් පමා වුණා. ඒ පමාව වෙනුවෙන් අපි වැඩ පිළිවෙළක් හැදුවා. ඒ අනුව වගාව ආරම්භ කරන්න කලින් පොහොර සහනාධාරය ලබා දෙන්න අපි තීන්දුවක් ගත්තා. ඒකේ පළමුවෙනි මුරයේ සහනාධාරය ලබා දුන්නා. හැබැයි, දෙවැනි මුරයේ සහනාධාරය ලබා දීමේදී පොඩි ගැටලුවක් මතු වුණා. මොකද, "දිට්වා" සුළි කුණාටුවත් එක්ක අපට කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින්ම 4,000ක් අඩුයි. ඒ නිලධාරින්ගේ හිඟයක් තිබෙනවා. දැන් තමයි ඒ ප්‍රමාණය සම්පූර්ණ කරගෙන යන්නේ. ඒ නිසා දෙපාර්තමේන්තු මට්ටමින් වැඩ ගොඩක් හිර වුණා. ඒ තත්ත්වය තුළ යම් ගැටලුකාරී තත්ත්වයන් මතු වුණා. ඒ ගැටලු මේ වෙනකොට අපි විසඳාගෙන යනවා.

ඊළඟට, වන්දි ගැනත් ඔබතුමා ප්‍රශ්නයක් මතු කළා. ඒක වැදගත් ප්‍රශ්නයක්. අපි ආණ්ඩුව භාර ගන්නකොට ගොවියාගේ වගාවලට යම්කිසි හානියක් වුණා නම් වන්දි ගෙව්වේ මිරිස්, සෝයා, බඩඉරිඟු, අර්තාපල්, ලොකු ලූනු සහ වී කියන භෝග හය වෙනුවෙන් පමණයි. හැබැයි, දැන් ඒ භෝග හයට අමතරව කැකිරි, පිපිඤ්ඤා, වට්ටක්කා, පත්තක්කා, කෙසෙල්, අන්නාසි, ගෝවා, කැරට් සහ ලීක්ස් කියන මේ හැම භෝගයකටම හානියක් වුණොත් වන්දි ගෙවනවා.

කලින් තිබුණු ක්‍රමවේදයට අනුව වී ගොවියාට අක්කරයකට ලැබුණේ රුපියල් 16,000යි. මේ වෙනකොට රුපියල් 60,000ක් ලැබෙනවා. එළවලු වගා කරපු ගොවීන්ගේ හානි වුණු අක්කරයක් සඳහා වන්දි වශයෙන් කලින් කිසිම මුදලක් ලැබුණේ නැහැ. ඒ, ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ. මෙවර ඒ ගොවීන්ට රුපියල් 80,000ක් ලබා දුන්නා. ඒ වාගේම හරකෙක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 2ක්, ඌරෙක් වෙනුවෙන් රුපියල් 20,000ක්, එළුවෙක් වෙනුවෙන් රුපියල් 20,000ක්, කුකුළෙක් වෙනුවෙන් රුපියල් 500ක් වශයෙන් මැරුණු සත්තු වෙනුවෙනුත් වන්දි ගෙවන්න පටන් ගත්තා. ඒ නිසා වන්දි ලැබුණේ නැති කවුරු හරි ගොවියෙක් ඉන්නවා නම් ඒ බව දන්වන්න. ඊට අදාළ සියලුම මුදල් අපි වෙන් කර තිබෙනවා; මුදල් නිදහස් කර තිබෙනවා. ඒ කටයුත්තත් ඉදිරියේදී ක්‍රමානුකූලව කර ගන්න පුළුවන් කියන කාරණය මේ වෙලාවේදී මම සභාවට ප්‍රකාශ කරනවා.

## වවුනියාව දිස්ත්‍රික්කය: ලියාපදිංචි වාරි වැව්
## வவுனியா மாவட்டம்: பதிவு செய்யப்பட்ட நீர்ப்பாசனக் குளங்கள்
## VAVUNIYA DISTRICT: REGISTERED IRRIGATION TANKS

1406/2025

**3. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කර ඇති වාරි වැව් සංඛ්‍යාව;

(ii) එම වැව් යටතේ තිබෙන සමස්ත කුඹුරු ඉඩම් ප්‍රමාණය;

(iii) එම වැව් අතුරින් මේ වනවිට භෝග වගාව සඳහා ජලය සපයනු ලබන වාරි වැව් සංඛ්‍යාව;

(iv) එමගින් පෝෂණය වන කුඹුරු ඉඩම් ප්‍රමාණය;

(v) මේ වනවිට භාවිතයට නොගෙන අත්හැර දැමූ වැව් සංඛ්‍යාව;

(vi) එම වැව් යටතේ ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) අත්හැර දමා ඇති වාරි වැව් ඉදිරියේදී ප්‍රතිසංස්කරණය කිරීමට කිසියම් සැලැස්මක් තිබේද;

(ii) එසේ නම්, ප්‍රතිසංස්කරණය කිරීමට නියමිත එම වාරි වැව් යටතේ පවතින කුඹුරු ඉඩම් වගා කටයුතු සඳහා කුඹුරු ඉඩම් නොමැති පුද්ගලයන්ට බෙදා දීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வவுனியா மாவட்டத்தில் பதிவு செய்யப்பட்டுள்ள நீர்ப்பாசனக் குளங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி குளங்களின்கீழ் உள்ள மொத்த வயற் காணிகளின் பரப்பளவு யாது;

(iii) மேற்படி குளங்களில் தற்போது பயிர்ச்செய்கைக்காக நீர் வழங்கும் நீர்ப்பாசன குளங்களின் எண்ணிக்கை யாது;

(iv) இதன்மூலம் நீரைப் பெறும் வயற் காணிகளின் பரப்பளவு யாது;

(v) தற்போது பயன்படுத்தப்படாது கைவிடப்பட்டுள்ள குளங்களின் எண்ணிக்கை யாது;

(vi) மேற்படி குளங்களின்கீழ் உள்ள வயற் காணிகளின் பரப்பளவு யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) கைவிடப்பட்டுள்ள நீர்ப்பாசனக் குளங்களை எதிர்காலத்தில் புனரமைப்பதற்கான ஏதேனும் திட்டம் உள்ளதா;

(ii) ஆமெனில், புனரமைக்கப்படவுள்ள குறிப்பிட்ட நீர்ப்பாசனக் குளங்களின்கீழ் உள்ள வயற் காணிகளை, வயற் காணிகள் இல்லாத நபர்களுக்குப் பயிர்ச்செய்கை நடவடிக்கைகளுக்காகப் பகிர்ந்தளிக்க நடவடிக்கை மேற்கொள்வாரா;

(iii) ஆமெனில், அத்திகதி யாது;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he state the -

(i) number of irrigation tanks registered in the Vavuniya District;

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

(ii) total extent of paddy lands under the said tanks;

(iii) number of irrigation tanks currently supplying water for crop cultivation, out of the tanks;

(iv) extent of paddy lands irrigated by the said tanks;

(v) number of tanks that are currently abandoned ; and

(vi) extent of paddy lands under those tanks?

(b) Will he also inform this House -

(i) whether there is any plan to renovate the abandoned irrigation tanks in the future;

(ii) if so, whether steps will be taken to distribute the paddy lands coming under the said irrigation tanks that are to be renovated, among landless persons for cultivation; and

(iii) if so, the date?

(c) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)

(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉතාම වැදගත්, කාලෝචිත ප්‍රශ්නයක් තමයි අසා තිබෙන්නේ. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය හා නඩත්තු වන මන්නාරම කලාපයට යටත්ව, වවුනියාව දිස්ත්‍රික්කයේ ප්‍රධාන වැව් 01ක්ද, මධ්‍ය පරිමාණ වැව් 04ක් ද පිහිටා ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති වාරි වැව් සංඛ්‍යාව 05කි. (වවුනියාව දිස්ත්‍රික්කයට අයත් වනුයේ මහවැලි "එල්" කලාපයේ වෙහෙරතැන්න කොට්ඨාසය පමණි.)

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති වාරි වැව් සංඛ්‍යාව 823කි. ඒ අනුව, මුළු එකතුව වැව් 833ක් ලෙස සඳහන් වනවා.

(ii) ඉහත (අ) (i) හි සඳහන් පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය හා නඩත්තු වන ප්‍රධාන වැව් යටතේ අක්කර 4,134ක කුඹුරු ඉඩම් ප්‍රමාණයක්ද, මධ්‍ය පරිමාණ වැව් යටතේ අක්කර 2,194ක සමස්ත කුඹුරු ඉඩම් ප්‍රමාණයක් ද ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ කුඹුරු ඉඩම් අක්කර 460ක් ද, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ අක්කර 34,806ක්ද වශයෙන් මුළු එකතුව අක්කර 41,594ක ප්‍රමාණයක් සඳහන් වනවා.

(iii) ඉහත සඳහන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය හා නඩත්තු වන මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ වැව් සියල්ල හෝග වගාව සඳහා ජලය සපයනු ලබයි.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ වැව් 04ක්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ වැව් 602ක් වනවා. ඒ අනුව, 611ක වැව් පද්ධතියක් හෝග වගාව සඳහා ජලය සපයමින් තිබෙනවා.

(iv) වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ වන අක්කර 6,328ක් වන මුළු කුඹුරු වගා බිම් ප්‍රමාණයම සාර්ථක ලෙස පෝෂණය වේ.

මීට අමතරව ප්‍රධාන අමුණක් වන කල්ආරු අමුණ ද වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන අතර, එමඟින් අක්කර 600ක පමණ කුඹුරු ප්‍රමාණයක් පෝෂණය කරයි.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අක්කර 335ක් ද, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව අක්කර 32,087ක් පෝෂණය කරනවා. ඒ අනුව සමස්ත වාරි පද්ධතිය ඇතුළේ පෝෂණය කරන වගා භූමි ප්‍රමාණය අක්කර 38,750ක් ලෙස සඳහන් වනවා.

(v) වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය හා නඩත්තු කටයුතු කර අතහැර දැමූ වැව් කිසිවක් නොමැත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ වන වැව් 01ක් ද, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ වන වැව් 221ක් ද වශයෙන් සමස්ත වැව් ප්‍රමාණය 222ක් ලෙස සඳහන් වෙනවා.

(vi) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ වන වැව්වලට අදාළව අක්කර 125ක්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට යටතේ වන වැව්වලට අදාළව අක්කර 2,719ක් වශයෙන් එකතුව අක්කර 2,844ක් ලෙස සඳහන් වනවා.

(ආ) (i)

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ නඩත්තු වන අතහැර දැමූ වැව් නොමැත.
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ අතහැර දමා ඇති වැව් සංවර්ධනය කිවුල් ඔය ව්‍යාපෘතිය යටතේ සිදුවේ.
- අත්හැර දමා ඇති වාරි වැව් 2026 වර්ෂය සඳහා ප්‍රතිසංස්කරණය කිරීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. දිස්ත්‍රික්ක 13ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව තෝරාගනු ලබන වැව් සඳහා රුපියල් මිලියන 125ක ප්‍රමාණයක් වෙන් කර ඇත.

ගරු මන්ත්‍රීතුමා විමසන ප්‍රශ්නයට අදාළව ගත්තොත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ තිබෙන වැව් ප්‍රතිසංස්කරණය කරන්න අපි විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් තිබෙනවා, "වාරි මහිම - අපේ උරුමය" කියලා. ඒ සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 10,000ක් වෙන් කළා. ඒ වාගේම 2026 වර්ෂයට අදාළව අපි රුපියල් මිලියන 3,000ක් යොදා ගත්තා. විශේෂයෙන්ම එතුමා ප්‍රශ්න කළ ප්‍රදේශයට අදාළවත් විශේෂ ව්‍යාපෘති කිහිපයක් අපි සූදානම් කර තිබෙනවා.

(ii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ කුඹුරු ඉඩම් ජනතාවට බෙදා දිය හැක.

(iii) කිවුල් ඔය ව්‍යාපෘතියට අදාළ ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු අවසන් වූ පසුව ඉඩම් ලබා දීම සිදු වේ. දිනය නිශ්චිතව කිව නොහැක.

(ඇ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே!

கமநல சேவைத் திணைக்களத்துக்குக்கீழ் வருகின்ற இந்த 221 குளங்களை மையப்படுத்தித்தான் "கைவிடப்பட்டுள்ள நீர்ப்பாசனக் குளங்களை எதிர்காலத்தில் புனரமைப்பதற்கான ஏதேனும் திட்டம் உள்ளதா?" என்ற கேள்வியை நான் ஆ(i) மூலம் கேட்டிருந்தேன். அவை எதிர்காலத்தில் புனரமைக்கப்படுமென நீங்கள் சொல்லியிருந்தீர்கள்.

என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

தற்போது விவசாயத் திணைக்களத்தின் ஊடாக ஒவ்வொரு விவசாயியும் 5 ஏக்கருக்கான உரமானியத்தைப் பெறுகிறார்கள். சாதாரணமான விளைச்சலாக இருந்தால்கூட, எங்களுடைய பிரதேசத்தில் ஒவ்வோர் ஏக்கரிலும் 2,000 கிலோகிராம் நெல் அறுவடை செய்யக்கூடியதாக இருக்கும். அதன்படி பார்த்தால், 5 ஏக்கரிலிருந்து 10,000 கிலோகிராம் நெல்லை சாகுபடி செய்யக்கூடியதாக இருக்கும். இந்த நிலையில், தற்போது அரசாங்கத்தினூடாக ஒரு விவசாயியிடமிருந்து 2,500 கிலோகிராம் நெல்தான் கொள்வனவு செய்யப்படுகின்றது. இதனால் எங்களுடைய விவசாயிகள் அரசாங்கத்தின் இந்தத் திட்டத்தின் ஊடாகப் பெரியளவில் நன்மை பெற முடியாமல் இருக்கிறது. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, ஒரு விவசாயியிடமிருந்து பெறப்படுகின்ற 2,500 கிலோகிராம் நெல்லின் அளவை அதிகரிக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු මන්ත්‍රීතුමනි, උතුරු ප්‍රදේශයේ වී මිලදී ගැනීමේ ක්‍රියාවලියේදී මුහුණ දෙන ගැටලු පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා පසුගිය අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේදීත් කථා කළා. ඒ ප්‍රදේශයට ආවේණික වුණු ගැටලු ගණනාවක් තිබෙනවා. වී අලෙවි මණ්ඩලය විධියට මේ වෙනකොට ඒ ප්‍රදේශයේ වී මිලදී ගැනීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. යම් යම් ගැටලුකාරී තත්ත්වයන් මධ්‍යයේ තමයි අපි මිලදී ගැනීම් කරන්නේ. නමුත්, ගොවීන්ට සාධාරණයක් කිරීම සඳහා අපි හැම වෙලාවකම වැඩකටයුතු කරමින් ඉන්නවා. ගොවීන්ට අසාධාරණයක් වෙන්න අපි කිසි ලෙසකින්වත් ඉඩ තබන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ගැන අපි අමාත්‍යාංශය විධියට කථා කරලා ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන්ද කියලා බලන්නම්. අපි ඔබතුමාට අවශ්‍ය තොරතුරු ටික සපයලා දෙන්නම්.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
நன்றி, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

இலங்கையில் காணப்படுகின்ற படிமுறை நீர்ப்பாசன முறைமையானது - cascade irrigation system - இலங்கைக்கு மாத்திரம் உரித்தான சிறந்ததொரு நீர்ப்பாசன முறைமையாகும். இந்த படிமுறை நீர்ப்பாசன முறைமையின்கீழ் சிறு குளங்களும் மத்திய அளவிலான குளங்களும்தான் வருகின்றன. இந்த முறைமைக்குள் வருகின்ற குளங்களில் வவுனியா மாவட்டத்தில் மாத்திரம் 222 குளங்கள் கைவிடப்பட்ட நிலையில் இருக்கின்றன. உலகத்திலேயே சிறந்ததும் இலங்கைக்கே உரித்தானதுமான எங்களுடைய மூதாதையரால் உருவாக்கப்பட்ட இந்த படிமுறை நீர்ப்பாசன முறைமையை அபிவிருத்தி செய்வதன் ஊடாக பெரிய நீர்ப்பாசனத் திட்டங்களுக்காக காடுகள் அழிக்கப்படுவதையும் அதனால் சுற்றுச்சூழல் பிரச்சினைகள் ஏற்படுவதையும் தவிர்க்கலாம். மேலும், இந்த நீர்ப்பாசன முறைமையை நடைமுறைக்குக் கொண்டு வருவோமாக இருந்தால், ஒவ்வோர் ஊரிலும் ஒரு குளம் அல்லது நீரைத்தேக்கி வைக்கின்ற ஓர் அமைப்பு உருவாகும். அந்தந்த ஊர் மக்கள் அந்தந்தக் குளங்களிலிருந்து பயனைப் பெறுவார்கள். நன்னீர் மீன்பிடி முதல் விலங்குகளுக்கான குடிநீர் வரை ஒவ்வொரு கிராமமும் அந்தக் குளத்தின்மூலம் பயன்பெறும். மேலும், பாரியளவில் காடுகள் அழிக்கப்படுவது நிறுத்தப்படும். அதுமாத்திரமல்ல, ஒவ்வொரு கிராமத்திலும் இருக்கின்ற நீர்ப்பாசனக் குளங்களின் ஊடாக நிலக்கீழ் நீரின் அளவும் பெருகும். இதனால் கிணறுகளில் தண்ணீர் வரும். இப்படிப் பல நன்மைகள் இந்த படிமுறை நீர்ப்பாசன முறைமையின் கீழுள்ள குளங்களை அபிவிருத்தி செய்வதன் ஊடாக ஏற்படுத்தப்படும்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, would you please ask your Supplementary Question?

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Okay.

இந்த நன்மைகளைக் கருத்திற்கொண்டு, எங்களுடைய பிரதேசத்தில் குறிப்பாக, வன்னிப் பிரதேசத்தில் இருக்கின்ற படிமுறை நீர்ப்பாசன முறைமையின்கீழ் வருகின்ற பல்லாயிரக்கணக்கான குளங்களை அபிவிருத்தி செய்வதற்குப் போதியளவு நிதியை எதிர்வருகின்ற ஆண்டிலாவது ஒதுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු මන්ත්‍රීතුමා ඉතාම වැදගත් ප්‍රශ්නයක් යොමු කළේ. අපේ රටේ ග්‍රාමීය වාරිමාර්ග පද්ධතිය ගත්තාම, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුවත් එක්ක තමයි ගමේ පුංචි වැව නීත්‍යනුකූලව බැඳිලා තිබෙන්නේ. ඉතිහාසය තුළ වැව් නිර්මාණය කළා වාගේම ස්වාභාවිකවත් යම් ප්‍රමාණයක් නිර්මාණය වෙලා තිබුණා. සමහර ඒවා නිර්මාණය කළ ඒවා. මේවා එක්ක තමයි ජීවිත ගැට ගැහිලා තිබුණේ. ගරු මන්ත්‍රීතුමා කියනවා වාගේ මුලතිව්වල විතරක් නොවෙයි, රටේ අනෙකුත් දිස්ත්‍රික්කවලත් ජීවිත සහ ආර්ථිකය බැඳිලා තිබෙන්නේ ගමේ තිබෙන පුංචි වැව් පද්ධතියත් එක්කයි.

අපි ආණ්ඩුවක් විධියට විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා මහා වාරි පද්ධතිය, මධ්‍ය වාරි පද්ධතිය, මහවැලි වාරි යෝජනා ක්‍රමය වාගේම ඔබතුමා ප්‍රශ්න කරන එල්ලංගා වැව් පද්ධතිය විධිමත් ලෙස සංවර්ධනය කිරීම කෙරෙහි. ගමේ තිබෙන භූමි ප්‍රමාණය අනුව ඒ හරහා අස්වද්දන්න පුළුවන් අක්කර 10ක්, 15ක්, 50ක් වෙන්න පුළුවන්, කුඩා භූමි ප්‍රමාණයක් වෙන්න පුළුවන්. හැබැයි ඒ හරහා භූමිය අස්වද්දන්න පුළුවන් වෙනවා වාගේම පරිසරයට විශාල සේවාවක් සිදු වෙනවා. වනසතුන්ට, වනාන්තරවලට මේ වාරි පද්ධතිය, මේ වැව් ටික ප්‍රතිසංස්කරණය කිරීම ඉතාම ඵලදායී වෙනවා.

[ගරු අරවින්ද සෙනරත් මහතා]

අපි ආණ්ඩුවක් විධියට සැලසුම් සකස් කරමින් සිටිනවා. ගරු මන්ත්‍රීතුමා කියන විධියට මුලතිව් දිස්ත්‍රික්කයේ වැව් ටික අපට ලබන අවුරුද්දේ සම්පූර්ණ කර ගන්න බැරි වෙයි. හැබැයි ඔබතුමාගේ ඉල්ලීම වෙනුවෙන් ආණ්ඩුව අවධානය යොමු කරලා තිබෙනවා. මම හිතන විධියට, "වාරි මහිම - අපේ උරුමය" ව්‍යාපෘතියේත් මුලිකම අවධානය යොමු වෙලා තිබෙනවා මුලතිව්, වව්නියාව ආදී වන්නි දිස්ත්‍රික්කවලට. ඉතා මැදහත් දේශපාලනඥයෙක් විධියට ඔබතුමා කරන යෝජනාව ජනතාවගේ පැත්තෙන් ඉතාම වැදගත්. අපි ආණ්ඩුවක් විධියට ඔය ප්‍රදේශයේ තිබෙන වාරි පද්ධති පිළිසකර කරනවා. ඒ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමාගෙනුත් දිගින් දිගටම ඉල්ලීම් තිබෙනවා. ඒ සියල්ල සලකා බලා මේ වාරි පද්ධති පිළිසකර කර දෙන්න අපි ආණ්ඩුවක් විධියට විශේෂ අවධානයක් යොමු කරනවා කියන පිළිතුර මම ලබා දෙනවා.

## විශේෂ ක්‍රීඩා පාසල් සංවර්ධන ව්‍යාපෘතිය: විස්තර
## விசேட விளையாட்டுப் பாடசாலை அபிவிருத்திக் கருத்திட்டம்: விபரம்
## PROJECT FOR DEVELOPMENT OF SPECIAL SPORTS SCHOOLS: DETAILS

1468/2025

**4. ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2025 වර්ෂයට අදාළ අයවැය යටතේ විශේෂිත ක්‍රීඩා පාසල් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දකුණු පළාත තෝරා නොගැනීමට හේතු කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා 2025 වර්ෂයට අදාළ අයවැය මඟින් වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) 2025 අගෝස්තු මාසය වන විට ඉහත මුදලෙන් වියදම් කර ඇති මුදල කොපමණද;

(iv) විශේෂිත ක්‍රීඩා පාසල් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පළාත් පහක් පමණක් තෝරා ගැනීමේ පදනම කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தின்கீழ் விசேட விளையாட்டுப் பாடசாலை அபிவிருத்திக் கருத்திட்டத்துக்கு தென் மாகாணம் தெரிவு செய்யப்படாமைக்கான காரணங்கள் யாவை;

(ii) மேற்படி கருத்திட்டத்துக்கு, 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தின்மூலம் ஒதுக்கப்பட்டுள்ள தொகை எவ்வளவு;

(iii) 2025 ஆகஸ்ட் மாதமளவில் மேற்படி நிதியிலிருந்து செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவு;

(iv) விசேட விளையாட்டுப் பாடசாலை அபிவிருத்திக் கருத்திட்டத்துக்கு ஐந்து மாகாணங்கள் மாத்திரம் தெரிவு செய்யப்பட்டதன் அடிப்படை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) reasons for not selecting the Southern Province for the Project for the Development of Special Sports Schools under the Budget for the year 2025;

(ii) amount that was allocated for the said project under the Budget for the year 2025;

(iii) amount that has been spent, out of the said amount as of August, 2025; and

(iv) basis on which only five provinces were selected for the said Project for the Development of Special Sports Schools?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2025 අය වැය යෝජනා මඟින් පළාත් 5ක විශේෂිත ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත. බස්නාහිර, උතුර, මධ්‍යම, ඌව සහ උතුරු මැද පළාත් ඒ සඳහා තෝරාගෙන ඇති අතර, රුපියල් මිලියන 500ක ප්‍රතිපාදන තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ වූ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වෙන් කර ඇත. ඒ අනුව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අදාළ පළාත්වල ක්‍රීඩා පාසල් නිරීක්ෂණය කිරීමෙන් පසු පළාත් 5ක ක්‍රීඩා පාසල් 6ක් සංවර්ධනය කිරීම සඳහා තෝරාගෙන ඇති අතර, ඒ සඳහා රුපියල් මිලියන 200ක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වෙන් කර ඇත. එම පාසල් 6 පහත පරිදි වේ.

1. යාපනය මධ්‍ය මහා විද්‍යාලය
2. අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය
3. මොනරාගල මහානාම මධ්‍ය මහා විද්‍යාලය
4. අකුරම්බොඩ වීර කැප්පෙටිපොළ මධ්‍ය විද්‍යාලය
5. වළල ඒ රත්නායක මධ්‍ය විද්‍යාලය
6. හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලය

ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී 2025 වර්ෂයට අදාළව මෙම පාසල් තෝරා ගැනීම සිද්ධ වන්නේ

විශේෂිත ව්‍යාපෘති විධියටයි. ඒ නිසා දකුණු පළාත තෝරා නොගත්තා නොවෙයි. මේ සඳහා නිශ්චිතව නම් කරපු පාසල් ප්‍රමාණය තමයි මේ තිබෙන්නේ.

(ii) එම ව්‍යාපෘතිය සඳහා 2025 වර්ෂයට අදාළ අයවැය මඟින් රුපියල් මිලියන 200ක මුදලක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත වෙන් කර ඇත.

(iii) රුපියල් මිලියන 150ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යොමු කර ඇති අතර, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව දන්වා ඇති පරිදි මූල්‍ය ප්‍රගතිය සියයට 44.8ක් වන අතර, භෞතික ප්‍රගතිය සියයට 62.1කි. ඉතිරි රුපියල් මිලියන 50ක මුදල මෙම වසර තුළ උපයෝජනය නොවන බව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙතින් දන්වා ඇත. ඊට අදාළ ප්‍රගතිය ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත.

ඒ වාගේම ගරු කථානායකතුමනි, "දිට්වා" සුළි කුණාටුවත් සමඟ සමහර පාසල්වල මේ ව්‍යාපෘතිය කර ගැනීමට ප්‍රායෝගික දුෂ්කරතා ඇති වෙලා තිබෙනවා. ඒ සම්බන්ධ විස්තර ඇමුණුම මඟින් නිශ්චිතව ඉදිරිපත් කර තිබෙනවා. මා එම ඇමුණුම **සභාගත*** කරනවා.

(iv) ඉහත (i)හි පිළිතුර අදාළ වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු කථානායකතුමනි, මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා ලබා දුන් පිළිතුර පිළිබඳව එතරම් සෑහීමකට පත් වෙන්න ඇත්තටම හැකියාවක් නැහැ. ඊට වඩා පැහැදිලි පිළිතුරක් මම බලාපොරොත්තු වුණා. පාසල් ක්‍රීඩාව ගත්තාම, පාසල් ක්‍රීඩාව ඉතාම පහළ මට්ටමකට වැටෙමින් තිබෙන මොහොතක්, මෙය. අපි දන්නවා, විශේෂයෙන්ම නගරබද ජනප්‍රිය පාසල්වලට පමණක් ක්‍රීඩාව උරුම වන තැනකට අද වන විට පාසල් පද්ධතිය තුළ පවතින ක්‍රීඩාව පත් වී තිබෙන බව. උදාහරණයක් විධියට ගත්තොත්, මලල ක්‍රීඩාව වෙන්න පුළුවන්, ක්‍රිකට් වෙන්න පුළුවන්, රගර් වෙන්න පුළුවන්, ජිම්නාස්ටික් වෙන්න පුළුවන්, බැඩ්මින්ටන් වෙන්න පුළුවන්, ඒ වාගේම පිහිනුම්, පාපන්දු, කබඩි, අත්පන්දු, හොකී, බර ඉසිලීම්, කරාටේ වැනි විවිධ ක්‍රීඩා වෙන්න පුළුවන්, ග්‍රාමීය පාසල්වල එහෙම නැත්නම් පහසුකම් අඩු පාසල්වල දරුවන්ට එවැනි ක්‍රීඩා සඳහා පහසුකම් ලබා ගන්න හැකියාවක් නැති බව අපි දන්නවා. ගරු අගමැතිතුමියනි, ජනප්‍රිය පාසල්වලට එවැනි ක්‍රීඩා පවත්වා ගෙන යෑමේ හැකියාව තිබුණත්, ග්‍රාමීය පාසල්වලට පහසුකම් නැති නිසාත්, පුහුණුකරුවන්ට ගෙවීම් පිළිබඳව තිබෙන ගැටලු නිසාත් එම ක්‍රීඩා පවත්වා ගෙන යන්න හැකියාව නැති වෙලා තිබෙනවා.

ගාල්ල දිස්ත්‍රික්කයේ ක්‍රීඩා පාසල් 2ක් තිබෙනවා. හැබැයි, එම ක්‍රීඩා පාසල් යාවත්කාලීන වෙලා ඒවායෙන් ක්‍රීඩාවට යම් වැඩ කොටසක් වෙනවා කියන කාරණය මම අවුරුදු තුනහතරකින්ම දැක්කේ නැහැ. මා හිතන විධියට එම ක්‍රීඩා පාසල්වලට තෝරා ගනු ලබන්නේ 7 වසර, 8 වසර පන්තිවල සිටින යම් පරිසාධන මට්ටමක් තිබෙන දරුවන්. නමුත් එම දරුවන්ටත් අද වන විට ඒ සඳහා ඉඩ කඩ ඇහිරී තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඉහතින් සඳහන් කළ යම් ක්‍රීඩාවක් කෙරෙහි දක්ෂතාව තිබෙන ග්‍රාමීය පාසලක දරුවෙකුට ඒ පාසල තුළදී එම ක්‍රීඩාවෙන් ඉදිරියට යන්න හැකියාව ලැබෙන්නේ නැහැ. සමහර විට ඒ පාසල තුළ එම ක්‍රීඩාව සඳහා පහසුකම් නොමැති වෙන්න පුළුවන්, එහෙම නැත්නම් එම ක්‍රීඩාව සඳහා හොඳ පුහුණුකරුවෙකු එම පාසල තුළ නොමැති වෙන්න පුළුවන්. හැබැයි, යම් ක්‍රීඩාවකට දක්ෂතාව තිබෙන දරුවෙකුට ජනප්‍රිය පාසලකට ඇතුළත් විය හැකි ක්‍රමවේදයක් අතීතයේ තිබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, would you ask your Supplementary Question?

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
එම දරුවා තුළ තිබෙන පරිසාධන මට්ටම මත ජනප්‍රිය විද්‍යාලයකට ඇතුළත් වීමේ හැකියාවක් එදා තිබුණා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. අද යම් ක්‍රීඩාවකට දක්ෂතාව තිබෙන දරුවෙකුට අතරමැදි ශ්‍රේණිවලට ළමුන් ඇතුළත් කිරීමේ ක්‍රමවේදය හරහා ජනප්‍රිය පාසලකට ඇතුළත් වීමට කිසිදු ඉඩක් නැහැ. ඒ නිසා අද පාසල් ක්‍රීඩාවෙන් ඉහළට යා හැකි දක්ෂතාව තිබෙන නමුත් ග්‍රාමීය පාසල්වල සිටින දරුවන්ට -කණ්ඩායම් වේවා, කේවල වේවා- ක්‍රීඩා තුළින් ඉදිරියට යෑමට ජනප්‍රිය පාසලකට ඇතුළත් වීමේ ඉඩ කඩ ඇහිරී තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ සම්බන්ධව ඔබතුමන්ලා අවධානය යොමු කර තිබෙනවාද, එහෙම නැත්නම් ඒ සඳහා වන ඔබතුමාගේ පිළිතුර කුමක්ද කියන ප්‍රශ්නය මම අසනවා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, එතුමා ප්‍රශ්න කිහිපයක්ම ඇහුවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්න ඇසුවාට ඔබතුමාට බොහොම ස්තුතියි. අප පාසල් ක්‍රීඩා සම්බන්ධයෙන් අවධානය යොමු කරලා බොහෝ කාලයක් වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් වන ඔබතුමාගේ නිරීක්ෂණ කිහිපයක් දැන් සඳහන් කළා. ඒවා නිවැරැදියි. විශේෂයෙන් ක්‍රීඩා පාසල් ගත්තොත්, එම පාසල් ක්‍රීඩාව සම්බන්ධයෙන් වන ක්‍රියාවලියට කොච්චර දුරට දායක වෙනවාද කියන ගැටලුව අපටත් තිබෙනවා. ඒ නිසා තමයි අපි විශේෂයෙන්ම ක්‍රීඩා අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා මේ සියලු ක්‍රීඩා පාසල් නැවත නිරීක්ෂණය කරන්න කටයුතු කරන්නේ. සමහර ක්‍රීඩා පාසල් තවදුරටත් පවත්වා ගත යුතුද, එහෙම නැත්නම් ශක්‍යතාව සහිත ක්‍රීඩා පාසලකට එම දරුවන් ගෙන යා යුතුද කියන කාරණාව සම්බන්ධවත් සොයා බැලීමේ අවශ්‍යතාවක් තිබෙනවා. එහිදී විශේෂයෙන්ම එම දරුවන්ට පෝෂණය ලබා දිය යුතු වෙනවා; පුහුණුකරුවන් අවශ්‍ය වෙනවා වාගේම කාල සටහන් වෙනස් කළ යුතු වෙනවා. ඒ නිසා එම කාරණා කිහිපය කෙරෙහිත් අවධානය යොමු කරමින් තමයි අපට මේ කටයුතු කරන්න සිද්ධ වෙන්නේ.

විශේෂයෙන්ම අපි මේ වසරට අදාළ අය වැයෙන් වෙන් කර ගත් මුදල් ප්‍රමාණයත් එක්ක තමයි පිළිතුරෙහි සඳහන් කළ පාසල් ප්‍රමාණය තීරණය වෙලා තිබෙන්නේ. නමුත් ඉදිරියේදී පළාතකට එකක් වශයෙන් විශේෂයෙන්ම පිහිනුම් ඇතුළු ඔබතුමා සඳහන් කළ සියලුම ක්‍රීඩා සහිත -ණ්ඩායම් ක්‍රීඩා ද සහිත- පාසලක් නිර්මාණය කර දායක කිරීමට තමයි අප උත්සාහ කරන්නේ. එතැනදී ශක්‍යතාව තිබෙන සියලුම සිසු දරු දැරියන්ට ඒ අවස්ථාව හිමි වෙයි.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

අනෙක් කාරණාව මේකයි. පාසල් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ඇතුළත සමහර ක්‍රීඩාවලට අදාළව පාසල් තුළින්ම අවශ්‍යතාවට අනුව ක්‍රීඩා පුහුණුකරුවන් ලබා දීමට සහ භෞතික සම්පත් වර්ධනය කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම තමයි ජාතික මට්ටමේ ක්‍රීඩා දක්ෂතා තිබෙන සිසු දරු දැරියන්ට පුළුවන්, අතරමැදි ශ්‍රේණි සඳහා දරුවන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛය අනුව යම්කිසි පාසලකට ඇතුළත් වීමට. ඒ සඳහා දැන් අවස්ථාව තිබෙනවා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා ක්‍රීඩාව සඳහා දක්ෂතා තිබෙන, පරිසාධන මට්ටම උපරිම වශයෙන් තිබෙන දරුවෙකුට අතරමැදි ශ්‍රේණිවලට ඇතුළත් වීමට ක්‍රමයක් තිබෙනවා කියලා.

හැබැයි ඒ චක්‍රලේඛය තුළ මම දැක්කේ නැහැ, ක්‍රීඩාවට
(7th Start) දක්ෂතා තිබෙන දරුවකුට පාසලට ඇතුළත් වීමේ ක්‍රමයක්. ඒ නිසා ඇත්තටම මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට ඉස්සෙල්ලා දැනගන්න කැමැතියි, ක්‍රීඩාවට දක්ෂතාව තිබෙන, උපරිම පරිසාධන මට්ටම තිබෙන දරුවකුට පාසලට ඇතුළත් වෙන්න තිබෙන ක්‍රමය මොකක්ද කියලා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ක්‍රීඩා පාසල් සංකල්පය ඉදිරියට ගෙනියනවාද, එහෙම ගෙනියන්නේ නැත්නම් ඔබතුමන්ලා වෙනත් ක්‍රමයක් හඳුනාගෙන තිබෙනවාද කියන කාරණයත් මම අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, අතරමැදි පාසල් චක්‍රලේඛය මේ වෙනකොට නිකුත් වෙමින් පවතිනවා. එතැනදී අපට පුළුවන්, විශේෂ දක්ෂතා තිබෙන ගණයේ පාසල් දරු දැරියන්ගේ ප්‍රවේශ ක්‍රියාත්මක කිරීමට.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුර, ඔව් කියන එකයි .

ක්‍රීඩා පාසල් අපි ඉදිරියට පවත්වාගෙන යනවා. ක්‍රීඩා පාසලක නිශ්චිත කරපු වගකීම සහ ක්‍රියාදාමය ගත්තොත්, මම මුලින් කිව්වා වාගේ අපි ශක්‍යතා අධ්‍යයනය කරමින් අපේ අමාත්‍යාංශය විධියට සහ ක්‍රීඩා අමාත්‍යාංශය විධියට ඒ ගැන බලමින් තමයි ඒ ක්‍රියාවලිය සිද්ධ කරන්නේ. මොකද, නම් කරන්න තිබෙන ක්‍රීඩා පාසල්වල පෝෂණ වැඩසටහන ඇතුළු පුහුණුකරුවන් සියලුදෙනා සිටිය යුතුයි. අපි නිශ්චිතව තෝරාගන්න පාසල් සංවර්ධනය කිරීමේ හැකියාවක් තිබිය යුතුයි. ඒ නිසා ඒ පාසල් විද්‍යාත්මකව තෝරා ගැනීම තමයි ඉදිරියට ක්‍රියාත්මක කරන්නේ. ඒ සඳහා නිසි ක්‍රියාවලියක් අපි පවත්වාගෙන යනවා.

## තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය: ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

## இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சு: திருகோணமலை மாவட்டத்தில் அமுல்படுத்தப்படும் கருத்திட்டங்கள்

MINISTRY OF YOUTH AFFAIRS AND SPORTS: PROJECTS IMPLEMENTED IN TRINCOMALEE DISTRICT

1476/2025

**5. ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2025 වර්ෂයට අදාළ අය වැය ප්‍රතිපාදන යටතේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මේ වනවිට ක්‍රියාත්මක කරමින් පවතින ව්‍යාපෘති සහ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ත්‍රිකුණාමලය මැක්හෙයිසර් ක්‍රීඩාංගනය (McHeyzer Stadium) සංවර්ධනය කිරීම සඳහා සකස් කර ඇති සැලසුම් කවරේද;

(iv) 2026 අය වැය ප්‍රතිපාදන යටතේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட ஏற்பாடுகளின்கீழ் இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சினால் திருகோணமலை மாவட்டத்தில் தற்போது அமுல்படுத்தப்பட்டு வருகின்ற கருத்திட்டங்கள் மற்றும் அமுல்படுத்தப்படவுள்ள கருத்திட்டங்கள் வெவ்வேறாக யாவை;

(ii) மேற்படி ஒவ்வொரு கருத்திட்டத்துக்கும் ஒதுக்கப் பட்ட தொகை வெவ்வேறாக எவ்வளவு;

(iii) திருகோணமலை மக்ஹெய்ஸர் (Mc. Heyzer) விளையாட்டு மைதானத்தை அபிவிருத்தி செய்வதற்காகத் தயார் செய்யப்பட்டுள்ள திட்டங்கள் யாவை;

(iv) 2026 வரவு செலவுத்திட்ட ஏற்பாடுகளின்கீழ் இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத் துறை அமைச்சினால் திருகோணமலை மாவட்டத்தில் அமுல்படுத்த உத்தேசிக்கப் பட்டுள்ள கருத்திட்டங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House -

(i) the projects currently being implemented and the projects proposed to be implemented by the Ministry of Youth Affairs and Sports in the Trincomalee District under Budgetary allocations for the year 2025, separately;

(ii) the amount of money allocated for each of those projects, separately;

(iii) the plans prepared for the development of the McHeyzer Stadium in Trincomalee; and

(iv) the projects proposed to be implemented by the Ministry of Youth Affairs and Sports in the Trincomalee District under Budgetary allocations for the year 2026?

(b) If not, why?

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i), (ii) ප්‍රශ්නවලට මම එකවර පිළිතුරු සපයන්නම්.

මෙහිදී ව්‍යාපෘති විධියට ගත්තොත්, ජාතික යෞවන ක්‍රීඩා උළෙල අපි 2025 වර්ෂයේදී පැවැත්වූවා. ඒකට රුපියල් ලක්ෂ 15ක් විතර වියදම් කළා. දිස්ත්‍රික් නාට්‍ය වැඩමුළුව ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ සඳහා රුපියල් 250,000ක් වියදම් කරලා තිබෙනවා. ඒ වාගේම, ජාත්‍යන්තර වැඩසටහන් සඳහා සහභාගි කරවන්න තරුණ තරුණියන් තෝරාගන්න වැඩසටහනක් තිබෙනවා. ඒ සඳහා අපි ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ නියෝජිතයන් දෙදෙනෙක් තෝරාගෙන බංග්ලාදේශයට හා ඉන්දියාවට යැව්වා. ඒ වාගේම, රැකියා අභිමුඛ පාඨමාලා ක්‍රියාත්මක කර තිබෙනවා. ඒකට අපි රුපියල් 314,000ක් වියදම් කර අභ්‍යාසලාභීන් 185ක් පුහුණු කර තිබෙනවා. "Connect 2025" කියන යෞවන සමාජ 230ක් දිස්ත්‍රික්කය තුළ පිහිටුවලා තිබෙනවා. ජාතික තරුණ දිනය සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණයේ පැවැත්වූවා. අපි ඒකට රුපියල් 388,200ක් වියදම් කර තිබෙනවා. තරුණ තරුණියන් 125දෙනෙක් ඒකට සම්බන්ධ කර තිබෙනවා. නායකත්ව කඳවුරු වැඩසටහන් 11ක් ක්‍රියාත්මක කර තිබෙනවා, දිස්ත්‍රික්කයේ. ඒකට රුපියල් 628,000ක් වියදම් කර තිබෙනවා. ඒ වාගේම, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අය වැයෙන් රුපියල් මිලියන 300ක් වෙන් කර තිබෙනවා, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ක්‍රීඩා කටයුතු සංවර්ධනය කරන්න. ඒ තමයි ඒ ව්‍යාපෘති සහ ඒවා වෙනුවෙන් වෙන් කරන ලද මුදල.

වැඩිදුර විස්තර ඇමුණුම 01හි සඳහන් වේ.

(iii) ඔව්. අපි ඒක සැලසුම් කර තිබෙනවා. ඒකට අපි දැනටමත් රුපියල් මිලියන 300ක් වෙන් කර තිබෙනවා, ගරු කථානායකතුමනි. මීටර් 400 ධාවන පථයට රුපියල් මිලියන 50කුත්, ප්‍රේක්ෂකාගාරයට රුපියල් මිලියන 200කුත් සහ බාහිර වැඩ සඳහා රුපියල් මිලියන 50කුත් වෙන් කර තිබෙනවා. අපි දැනටමත් එහි ධාවන පථයේ කටයුතු නිම කරලා ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයේ විවෘත කළා. ඉතුරු වැඩ ටික මේ අවුරුද්දේ නිම කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, තවත් රුපියල් මිලියන 50ක් විතර අපි මේ වසරේ වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා, පාසල්වල ක්‍රීඩාපිටි සංවර්ධනය සඳහා.

(iv) යෝජිත ව්‍යාපෘති හැටියට විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් අපි ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද, පසුගිය කාලවල එම දිස්ත්‍රික්කවල එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක වුණේ නැහැ. ප්‍රාග්ධනය උතුරට, නැඟෙනහිරට ගලාගෙන ගියේ නැහැ. ඒ නිසා අපි මේ අවුරුද්දේ විශේෂ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන් ජාතික යෞවන ක්‍රීඩා උළෙල, ප්‍රාදේශීය යෞවන ක්‍රීඩා, දිස්ත්‍රික් යෞවන ක්‍රීඩා, beach volleyball තරග, එල්ලේ තරග අපි සංවිධානය කරලා තිබෙනවා. ඒ වාගේම යෞවන සම්මාන, යෞවන නාට්‍ය, සෞන්දර්ය නිකේතන, නාට්‍ය පාසල වැනි ජාතික ව්‍යාපෘති සඳහා අනෙකුත් දිස්ත්‍රික්කවල මෙන්ම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ද තරුණ තරුණියන්ට සහභාගි වීමේ අවස්ථාව අපි හදලා තිබෙනවා. ඒවාගේම රැකියා අභිමුඛ පාඨමාලා ක්‍රියාත්මක කරන්න වැටසහනක් ක්‍රියාත්මක කරනවා. අභ්‍යාසලාභීන් 200ක් විතර පළමුවැනි අදියරේදී අපි බලාපොරොත්තු වෙනවා. අපි Youth Circles හදලා තිබෙනවා. මේ වාගේ වැඩසටහන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඇමුණුම 02 වශයෙන් එම තොරතුරු ඉදිරිපත් කරලා තිබෙනවා.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

(ආ) පැන නොනඟී.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ක්‍රීඩාවට කාලයක් තිස්සේ විශේෂ වෙච්ච, ජයග්‍රහණ අත්කරගත්ත ප්‍රදේශයක් තමයි ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රදේශය. කබඩි ක්‍රීඩාව ගත්තොත්, ලංකාවේ ජාතික තලයේ දක්ෂම් දක්වපු ජාතික කණ්ඩායමේ නායකයා පවා බිහි කරපු, වර්තමාන ජාතික කාන්තා කණ්ඩායමේ පුහුණුකරුවා පවා බිහි කරපු ප්‍රදේශයක් තමයි කන්තලේ ප්‍රදේශය. විශේෂයෙන් කන්තලේ මධ්‍ය මහ විද්‍යාලය, අග්‍රබෝධි විද්‍යාලය සහ රජඇල විද්‍යාලය වැනි විද්‍යාල අපට මතකයි. වොලිබෝල්, කබඩි වාගේ ක්‍රීඩාවලින් ජාතික මට්ටමේ දක්ෂම් මේ වනතෙක් අත්කරගෙන තිබෙනවා. නමුත් ඇමතිතුමනි, මේ ක්‍රීඩා පුහුණුවීම් කරගෙන යන්න, ක්‍රීඩා කටයුතු පවත්වාගෙන යන්න, තරග පවත්වන්න විශේෂිත ගෘහස්ථ ක්‍රීඩාංගණයක් කන්තලේ ප්‍රදේශයේ නැහැ. ඉතිහාසයේ කවදාවත් තිබිලාත් නැහැ. ඒ නිසා අපි දිස්ත්‍රික්කයක් විධියට සැලසුම් කළා, කන්තලේ, අග්බෝපුර, වාන්ඇල, රජඇල, තඹලගමුව වාගේ ප්‍රදේශවල ඉන්න තරුණ

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු රොෂාන් අක්මීමන මහතා]

තරුණියන්ට, දුවා දරුවන්ට ක්‍රීඩා කටයුතු කරගෙන යන්න කන්තලේ ලීලාරත්න ක්‍රීඩාංගණය සංවර්ධනය කරන්න. ඒ අනුව අපි මේ අවුරුද්දේ පළාත් විශේෂිත ප්‍රතිපාදන යටතේ එම ක්‍රීඩාංගණයේ පිහිනුම් තටාකය ඉදිකරන්න මුදල් වෙන් කරලා තිබෙනවා. අපි ඔබතුමාගෙන් දැනගන්න කැමතියි, මෙම ක්‍රීඩාංගණයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරගැනීමට හැකියාවක් තිබෙනවාද කියලා.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ගරු කථානායකතුමනි, කන්තලේ ලීලාරත්න ක්‍රීඩාංගණය සංවර්ධනය කරන්න කියලා ඉල්ලීම් කිහිපයක් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබුණා. ඒ අනුව මේ අවුරුද්දේ ඇස්තමේන්තු සකස් කරලා කන්තලේ ලීලාරත්න ක්‍රීඩාංගණයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න අපි උත්සාහ ගන්නවා. අපි මේ අවුරුද්දේ කන්තලේ ක්‍රීඩාංගණයේ indoor stadium එකකට මුදල් ප්‍රතිපාදන වෙන් කරලා නැහැ. නමුත් ඒකේ වැඩ කටයුතු ආරම්භ කරලා ඇස්තමේන්තු හදලා ආරම්භක වැඩ කටයුතු කරන්න අපි සැලසුම් කරගෙන යනවා, දිස්ත්‍රික්කයත් එක්ක සාකච්ඡා කරලා.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි. මෙය පොදුවේ අහන ප්‍රශ්නයක්, දිස්ත්‍රික්කයට සීමා වෙච්ච එකක් නොවෙයි.

වර්තමානයේ තරුණ පරම්පරාව මත්ද්‍රව්‍ය උවදුරෙන් ගලවා ගැනීම සඳහා "රටම එකට" ජාතික ක්‍රියාන්විතය ක්‍රියාත්මක වෙනවා. ගරු ඇමතිතුමනි, ක්‍රීඩාව කියන්නේ ජාතික කණ්ඩායමට ක්‍රීඩකයන් බිහිකර ගැනීම සඳහා පමණක් වෙච්ච ක්‍රියාවලියක් නොවෙයි. අපේ ක්‍රීඩා සංස්කෘතිය අනුව සෑම මනුස්සයෙකුටම ක්‍රීඩාව ජීවිතයේ කොටසක් විය යුතුයි. ලංකාවේ ජනප්‍රියම ක්‍රීඩාව තමයි ක්‍රිකට් ක්‍රීඩාව. ඒකෙනුත් වැඩි පිරිසක් කරන්නේ සැහැල්ලු පන්දු ක්‍රිකට් ක්‍රීඩාව. ලංකාව පුරා හැම ගමකම වාගේ පෞද්ගලික ඉසව් සංවිධායකයන් විසින්, ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය කරන පුද්ගලයන් විසින් තරුණ තරුණියන්ට සවස් වරුවට, සති අන්තයට මේ වාගේ තරග සංවිධාන කරන බව අපි දන්නවා. ක්‍රීඩා අමාත්‍යාංශය මැදිහත් වෙලා සැහැල්ලු පන්දු ක්‍රිකට් ක්‍රීඩාව, අත් පන්දු, එල්ලේ වැනි ක්‍රීඩා ප්‍රාදේශීය මට්ටමින්, පළාත් මට්ටමින්, ජාතික මට්ටමින්, ක්‍රීඩාව දිනපතා ජීවිතයේ කොටසක් බවට පත්කර ගන්න හැකිවන විධියට, සති අන්තවල, අවුරුද්ද පුරා ක්‍රියාත්මක වන තරගාවලි - league එකක් වෙන්න පුළුවන් - සංවිධානය කරන්න පුළුවන් නම් වඩා හොඳයි. එහෙම යෝජනාවක්, අදහසක් අමාත්‍යාංශය පැත්තෙන් තිබෙනවාද කියලා මම දැනගන්න කැමතියි.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ගරු කථානායකතුමනි, අපේ රටේ ක්‍රීඩා සංස්කෘතියක් ගොඩනැඟීම සඳහා අපි විශාල කැපවීමක් සහ වෙහෙස මහන්සියක් දරනවා. විශේෂයෙන්ම උතුරු, නැඟෙනහිර ප්‍රදේශවල ක්‍රීඩාව සංවර්ධනය කිරීම ප්‍රමුඛ කාර්යයක් විධියට සලකා අපි වැඩ කරනවා. ඒ සඳහා දැනටමත් අපි සැලසුම් කරලා තිබෙනවා. බොහෝ දිස්ත්‍රික්කවල ක්‍රීඩා තරග පවත්වන්න අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. ඒ හරහා තමයි අපට ක්‍රීඩා සංස්කෘතියක් නිර්මාණය කර ගන්න පුළුවන් වෙන්නේ. විශේෂයෙන්ම එම දිස්ත්‍රික්කවල ක්‍රීඩකයන්ට ඒ අවස්ථාව ලබා දීම සඳහා මුලතිව්, ත්‍රිකුණාමලය, මන්නාරම, කිලිනොච්චිය වාගේ දිස්ත්‍රික්කවල පාපන්දු තරගාවලි සංවිධානය කරන්නත්, ඒ වාගේම softball තරගාවලි සංවිධානය කරන්නත් අපි මේ වර්ෂයේ සැලසුම් කරලා තිබෙනවා. ඊට අමතරව අපේ ජාතික ක්‍රීඩා උළෙල තිබෙනවා. ජාතික ක්‍රීඩා උළෙලට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් හැම දිස්ත්‍රික්කයකම තරගකරුවන් සහභාගි වෙන ජාතික ක්‍රීඩා උළෙලක් අපි සංවිධානය කරලා තිබෙනවා. ඒ නිසා මේ අවුරුද්දේ තරගාවලි ගණනාවක් පවත්වා, ඒ ප්‍රදේශවල අලුතෙන් ක්‍රීඩා සංස්කෘතියක් ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ක්‍රීඩකයන් ක්‍රීඩාවට හුරු කරන්න, ජනතාව එකතු කරන්න අපි උත්සාහ ගනිමින් ඉන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මම මේක අහන්නේ ස්ථාවර නියෝග 92 (අ) යටතේ, ගරු කථානායකතුමනි. ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාගේ ස්ථාවර නියෝග 27 (2) ප්‍රශ්නය යටතේ, එතුමාගේ කැමැත්ත පරිදි මම පොඩි ප්‍රශ්නයක් -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා කියපු point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

92 (අ). ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය අහන්න සජිත් ප්‍රේමදාස මහත්මයා දැන් නැඟිටිනවා නේ. එතුමාගේ අවසරය ඇතිව මම විනාඩියක කාලයක් ගන්නවා.

ගරු කථානායකතුමනි, මේ වෙනකොට ලංකා මුහුදු තීරයේදී ඉරාන නැවකට ප්‍රහාරයක් එල්ල වෙලාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ලංකාවේ ගාලු මුහුදේදී ඉරාන නැවකට ප්‍රහාරයක් එල්ල වෙලා තිබෙනවා. ඒ නැව සම්බන්ධව මොකක් හරි තොරතුරක් තිබෙනවාද කියලා අපි ආණ්ඩුවෙන් අහනවා. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා ඔබතුමා අපට පොඩි පිළිතුරක් දුන්නා නම් හොඳයි. මොකද, මෙය රටේ ප්‍රශ්නයක්. ලංකාවේදී එහෙම වෙන්න බැහැ. ඉරාන නැවකට ලංකාවේදී එහෙම වෙන්න බැහැ නේ. නමුත් ලංකාවේදී තමයි ඒ සිද්ධිය වෙලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු විපක්ෂ නායකතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, එම point of Order එක raise කරන්න තිබෙන්නේ වැරදියට නේ. කථා කරන මන්ත්‍රීවරයාගේ අවසරය ඇතිව,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ අවස්ථාව. ස්ථාවර නියෝග 27 (2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ඔබතුමා උත්තරයක් දුන්නේ නැහැ, චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, අපේ රට හුණ්ඩුවක් හැටියට හඳුන්වා දීම සම්බන්ධව රටෙනුත්, ජනතාවගෙනුත් සමාව ඉල්ලීම ඉතාම වැදගත් කියලා, ගරු අග්‍රාමාත්‍යතුමියත් සභාවේ සිටින මේ අවස්ථාවේ මගේ ප්‍රශ්නය අහන්නට පෙර මම යෝජනා කරනවා. අපේ රට ඒ ආකාරයෙන් අපහාසයට, නිග්‍රහයට ලක් කිරීම සුදුසු දෙයක් නොවෙයි. ගරු අගමැතිතුමියනි, ඒ නිසා ඔබතුමියත් සභාවේ සිටින මේ අවස්ථාවේ මම ඉල්ලීමක් කරනවා. ජනතාවගෙනුත්, රටෙනුත් සමාව ඉල්ලීම ඉතාම යෝග්‍යයි.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### මැදපෙරදිග යුද තත්ත්වයෙහි බලපෑම අවම කිරීමට රජයේ සූදානම
### மத்திய கிழக்கில் போர் சூழ்நிலையின் தாக்கத்தை குறைக்க அரசாங்கத்தின் தயார்நிலை
### GOVERNMENT'S PREPAREDNESS TO MITIGATE IMPACT OF WAR SITUATION IN THE MIDDLE EAST

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

මැදපෙරදිග රටවල උත්සන්න වන ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් එම ප්‍රදේශ ආරක්ෂක අස්ථාවරභාවයකට ලක්ව ඇති අතර, - එම ප්‍රදේශ පමණක් නොවෙයි, ඇත්ත වශයෙන්ම දැන් ගෝලීය වශයෙනුත් දැවැන්ත අස්ථාවරභාවයක්, අනාරක්ෂිතභාවයක් නිර්මාණය වෙලා තිබෙනවා - විදේශ රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයන්, ගුවන් ගමන්, ඉන්ධන සැපයුම, විදේශ මුදල් ප්‍රේෂණ, ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රය, අපනයන ක්ෂේත්‍රය, සෘජු විදේශ ආයෝජන ක්ෂේත්‍රය යනාදී ක්ෂේත්‍ර ගණනාවක් මත ඒ මඟින් බලපෑමක් ඇති වන බවට පෙනී යන හෙයින්, මේ සියලු කරුණු කාරණා සම්බන්ධව පහත සඳහන් ප්‍රශ්න සඳහා රජයෙන් පැහැදිලි පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

1. මැදපෙරදිග රටවල උත්සන්න වී ඇති යුද්මය වාතාවරණය හමුවේ කලාපීය ආරක්ෂාව සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කුමක්ද?

   විශේෂයෙන්ම අපේ රටේත්, ශ්‍රී ලාංකිකයන්ගේත් ආරක්ෂාව, ඒ වාගේම ආර්ථික, සමාජයීය, දේශපාලනික වශයෙන් එල්ල වෙන්න පුළුවන් බලපෑම යන මේ සියල්ලක් පිළිබඳව රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය මොකක්ද කියන එක රටට පැහැදිලි කිරීම අත්‍යවශ්‍යයි.

2. සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කටාර්, කුවේට්, ඕමාන්, බහරේන්, ඊශ්‍රායල්, ලෙබනන් ඇතුළු - තවත් රටවල් ගණනාවක් තිබෙනවා - මැද පෙරදිග රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව රටවල් අනුව වෙන් වෙන්ව කොපමණ ප්‍රමාණයක්ද?

3. මෙම ගැටුම ව්‍යාප්ත වීම හෝ උත්සන්න වීම තුළින් ශ්‍රී ලාංකිකයන්ගේ ජන ජීවිතවලට තර්ජනයක් ඇති වුවහොත්, එම රටවල සිටින ශ්‍රී ලාංකිකයන් ආරක්ෂිතව ගෙන්වා ගැනීම හෝ ඒ අයට විධිමත් ආරක්ෂාවක් සැපයීම සඳහා අමාත්‍යාංශය සකස් කර ඇති වැඩ පිළිවෙළ කුමක්ද?

   බොහෝ රටවල් ඒ රටවල පුරවැසියන් වෙනුවෙන් විධිමත් වැඩසටහන් රාශියක් ප්‍රායෝගිකව, සක්‍රියව ක්‍රියාත්මක කරලා තිබෙන බව අපි දකිනවා. ඒවා ඇස් දෙකට පෙනෙන්න තිබෙනවා. ඒ කියන්නේ, අනාරක්ෂිතභාවයට ලක් වුණු තමන්ගේ පුරවැසියන් ආපසු ගෙන්වා ගැනීමේ ක්‍රියාවලීන්වලට ලක් කරලා තිබෙනවා. අපේ ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් රජය සකස් කරලා තිබෙන විධිමත් වැඩසටහන කුමක්ද කියලා මම අහන්න කැමැතියි.

4. අදාළ රටවල ශ්‍රී ලංකා දූත මණ්ඩලවල හදිසි ප්‍රතිචාර ඒකක සක්‍රිය කර තිබේද? 24 පැයම හදිසි සම්බන්ධතා මාර්ග ක්‍රියාත්මකද?

   ඒ ඔක්කෝම හරි බව කියයි කියලා මම දන්නවා. හැබැයි, මේ යුද්මය තත්ත්වය නිර්මාණය වන්නටත් පෙර බොහෝ ශ්‍රී ලාංකිකයන්ගෙන් ආපු පැමිණිල්ලක් තමයි, ඒ ඒ රටවල අපේ රට නියෝජනය කරමින් තිබෙන තානාපති කාර්යාලවලින් විධිමත් සේවාවක් අපේ රටේ ශ්‍රමිකයන්ට සිදු වන්නේ නැහැයි කියන එක. එම මැසිවිල්ල බොහෝ අවස්ථාවලදී නැගුණා. මම අහන්න කැමැතියි, මේ හදිසි අවස්ථාව තුළ ශ්‍රී ලංකා දූත මණ්ඩලවල හදිසි ප්‍රතිචාර ඒකක සැබැවින්ම සක්‍රිය කරලා තිබෙනවාද, විසිහතර පැයම හදිසි සම්බන්ධතා ක්‍රියාත්මකද කියන කාරණය.

5. ගුවන් ගමන් අවලංගු වීම හෝ ගුවන් අවකාශ වසා දැමීම හේතුවෙන් මැද පෙරදිග, වෙනත් රටවල ගුවන් තොටුපළවල සිරවී සිටින ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද?

   ඒ පිළිබඳව විධිමත් අධීක්ෂණයක් රජය කරලා තිබෙනවාද, ඒ ශ්‍රී ලාංකිකයන්ට ලබා දෙන්නට යන රැකවරණය - අරක්ෂාව - සහ ඒ අයගේ කැමැත්ත ආපසු මේ රටට එන්නට නම් ඒ සඳහා ගෙන තිබෙන පියවර කවරේද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

6. එම පුද්ගලයන් සඳහා අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩල මඟින් නවාතැන්, ආහාර, වෛද්‍ය පහසුකම්, ආරක්ෂාව, නීතිමය සහාය, රැකවරණය ලබා දීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද?

7. හදිසි ප්‍රවාහන සැලැස්මක් යටතේ විශේෂ ගුවන් ගමන් හෝ වෙනත් ප්‍රවාහන ක්‍රම සලකා බැලීම පිළිබඳව රජයක් හැටියට, එහෙම නැත්නම් අමාත්‍යාංශය හැටියට ගෙන තිබෙන පියවර කවරේද?

8. ගුවන් ගමන් බාධා වී ඇති රටවල් සම්බන්ධයෙන් ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය හෝ අදාළ රටවල් සමඟ සම්බන්ධ වී ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

ඒ පිළිබඳව රටට පැහැදිලි කිරීම අවශ්‍යයි.

9. මැද පෙරදිග ආර්ථික අස්ථාවරතාව හේතුවෙන් විදේශ මුදල් ප්‍රේෂණ අඩු වීමේ අවදානමක් තිබේද?

ඇත්ත වශයෙන්ම හැමදාම අපේ බලාපොරොත්තුව ප්‍රේෂණවල අඩු වීමක් සිදු නොවේවා කියන එකයි. රටට අගතියක් වන එහෙම සිතුවිලි අප තුළ නැහැ. නමුත්, මේ නිර්මාණය වී තිබෙන අනාරක්ෂිතභාවය තුළ, අස්ථාවරභාවය තුළ ප්‍රේෂණ අඩු වීමේ අවදානමක් තිබෙනවාද කියලා මම රජයෙන් දැන ගන්න කැමැතියි.

එවැනි අවාසනාවන්ත තත්ත්වයක් නිර්මාණය වුවහොත් එම තත්ත්වය කළමනාකරණය කරන්නට අමාත්‍යාංශය ඇතුළු රජය සකස් කර ඇති පූර්ව සැලැස්ම කුමක්ද?

එය ගරු සභාවටත්, රටටත් හෙළිදරව් කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

10. OPEC එක මැද පෙරදිග තෙල් නිෂ්පාදනය කරන රටවල් හෝ තෙල් නිෂ්පාදනය කරනු ලබන මැද පෙරදිග නොවන රටවල් සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යන ද්විපාර්ශ්වික රාජ්‍ය තාන්ත්‍රික සබඳතා හරහා, මෙරටට අවශ්‍ය ඉන්ධන සැපයුම අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා ගෙන ඇති සුවිශේෂී පියවර කවරේද?

මෙහිදී සාමාන්‍ය පියවරක් අරගෙන හරියන්නේ නැහැ. මොකද, නිර්මාණය වෙලා තිබෙන්නේ සුවිශේෂී තත්ත්වයක්, අනාරක්ෂිතභාවයක්, අස්ථාවරභාවයක්. ඒ තුළ අපේ රටට අවශ්‍ය ඉන්ධන, ගෑස් අඛණ්ඩව ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. ඉන්ධන, ගෑස් විතරක් නොවෙයි, පොහොර ඇතුළු තවත් අපේ රටට අත්‍යවශ්‍ය භාණ්ඩ, ආම්පන්න රැසක් තිබෙනවා. ඒවා අඛණ්ඩව ලබා ගැනීම වෙනුවෙන් මොකක්ද රජය අරගෙන තිබෙන සුවිශේෂී පියවර කියන එක අපි අහන්න කැමැතියි.

11. හෝර්මුස් සමුද්‍ර සන්ධිය හරහා නාවික ප්‍රවාහන කටයුතුවලට බාධා ඇති වුවහොත්, විකල්ප සැපයුම් ක්‍රමවේද පිළිබඳව ශ්‍රී ලංකාව අවධානය යොමු කර තිබෙනවාද?

අපි හැමෝම දන්නා කාරණයක්, මේක. ලෝකයේ ඉන්ධන සැපයුමෙන් දළ වශයෙන් සියයට 20කට වැඩි ප්‍රමාණයක් හෝර්මුස් සමුද්‍ර සන්ධිය - Strait of Hormuz - හරහා එන බව කියැවෙනවා. ඒ වාගේම LNG supply - gas supply - එකට ඒ සැපයුම් මාර්ගවලදී බාධා ඇති වුවහොත්, අඛණ්ඩව අපේ රටට ඒ සම්පත් ලබා ගන්නට රජය අරගෙන තිබෙන පියවර මොනවාද?

12. ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ඉහළ යාමෙන් ශ්‍රී ලංකාවට ඇති විය හැකි ආර්ථික බලපෑම පිළිබඳව තෙල් අපනයන රටවල් සමඟ විදේශ කටයුතු අමාත්‍යාංශය මට්ටමින් විශේෂ සාකච්ඡා පවත්වා තිබෙනවාද? ඒවායේ ප්‍රගතිය කුමක්ද?

සමහරෙක් අහන්න පුළුවන්, ඉන්ධන මිල අපි හැමෝටම අදාළයි, රටවල් ඔක්කෝටම අදාළයි, අපට විතරක් මෙහෙම සලකයි ද කියලා. මම මතක් කරලා දෙන්න කැමැතියි, මේ රට කෙටි කාලයක් තුළ ඛේදවාචක හතරකට මුහුණ දීලා තිබෙන බව. පාස්කු ඉරුදින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය, කොවිඩ් වසංගතය, රට බංකොලොත්වීම, "දිට්වා" සුළි කුණාටුව කියන ඒ ඛේදවාචක තුළ අපට සුවිශේෂී වැඩ පිළිවෙළක් අවශ්‍යයි, අපේ රටේ ඉන්ධන මිල කළමනාකරණය කිරීමට. ඉන්ධන මිල රටේ සිටින ලක්ෂ 220ටම බලපාන කාරණයක්. ඒ පිළිබඳව සුවිශේෂී පියවර අරගෙන තිබෙනවා නම්, ඒවා පිළිබඳව අපව දැනුවත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නවලට පිළිතුරු බලාපොරොත්තු වනවා.

ඒ වාගේම චාමර සම්පත් මන්ත්‍රීතුමාත් ප්‍රශ්නයක් මතු කළා. ගරු කථානායකතුමනි, ප්‍රවෘත්තියක් ඇවිල්ලා තිබෙනවා, ගාල්ලට තදාසන්න මුහුදේදී යම්කිසි නැවක් හානියකට ලක් වෙලා තිබෙන බවට. ඒ පිළිබඳව සත්‍ය තොරතුරු තිබෙනවා නම්, මේ සභාවට හෙළිදරවු කරන්න කියලා අපි රජයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Leader of the Opposition, you have taken 10 minutes to present your Question under Standing Order No. 27(2).

The Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism.

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු විපක්ෂ නායකතුමා මතු කරන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. මැදපෙරදිග කලාපයේ උද්ගත වී ඇති ගැටුම්කාරී තත්ත්වය වේගයෙන් උත්සන්න වීම පිළිබඳව ශ්‍රී ලංකා රජය දැඩි කනස්සල්ල පළ කරන අතර, මෙය කලාපීය ස්ථාවරත්වයට සහ ජාත්‍යන්තර සාමයට හා ආරක්ෂාවට බරපතළ තර්ජනයක් වේ. මෙම තත්ත්වය සමනය කිරීම සඳහා උපරිම සංයමයෙන් කටයුතු කරන ලෙසත්, ගැටුම්කාරී තත්ත්වය සමනය කිරීම සඳහා ක්ෂණික හා තීරණාත්මක පියවර ගන්නා ලෙසත් ශ්‍රී ලංකාව මෙයට සම්බන්ධ සියලු පාර්ශ්වයන්ගෙන් ඉල්ලා සිටී. බරපතළ මානුෂීය හා ආර්ථික බලපෑම් සහිත පුළුල් කලාපීය ගැටුමක අවදානම වැළැක්වීම සඳහා සියලු පාර්ශ්වයන් තවදුරටත් ප්‍රකෝපකාරී පියවරයන්ගෙන් වැළකී සිටිය යුතුයි.

ගරු කථානායකතුමනි, ඒක තමයි අපේ ස්ථාවරය.

කලාපීය වශයෙන් යුද්ධමය වාතාවරණයක් ඇති වීම අපේ රටටත් ඇත්තටම බලපානවා. එම නිසා එවැනි යුද්ධමය තත්ත්වයක් වර්ධනය වීම වළක්වා ගැනීමට අවශ්‍ය කරන පියවර ගැනීමට සාකච්ඡාමය විසඳුමකට යාම අපේ ස්ථාවරය වනවා. ඒ පිළිබඳව දැනටමත් අපි විවිධ රාජ්‍යයන් සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. ඊයේ රාත්‍රියේත් ගරු ජනාධිපතිතුමා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ නායකත්වය සමඟ දුරකථනයෙන් කථා කළා. ඒ වාගේම අද සවසත් අපි

රාජ්‍ය නායකයින් සහ විදේශ අමාත්‍යවරුන් කිහිපදෙනෙකු සමඟ මේ තත්ත්වය පිළිබඳව දුරකථන මාර්ගයෙන් සාකච්ඡා කරනවා. විශේෂයෙන්ම මෙවැනි තත්ත්වයක් ඇති වීම කලාපයේ ආරක්ෂාවට, ලෝක ආරක්ෂාවට තර්ජනයක්. ඒ නිසා කලාපීය සාමය, ලෝක සාමය ගොඩනැඟීම වෙනුවෙන් රටක් විධියට අපි ඉතාම සක්‍රියව මේ සඳහා මැදිහත් වනවා.

ඒ වාගේම අද උදෑසන ඇති වුණු සිද්ධියක් පිළිබඳවත් විමසා සිටියා. ඒ සිද්ධිය සත්‍යයයි. එය සිදු වුණේ අපේ මුහුදු සීමාවේ නොවෙයි. අපට අයත් නොවන මුහුදු සීමාවේ ඉරාන නාවික හමුදාවට අයිති නෞකාවක් තිබුණා. ඒ, "IRIS Dena" කියන නෞකාව. ඒ නෞකාව ගිලෙනවා කියන පණිවුඩය අද උදෑසන 5.08ට විතර අපේ නාවික හමුදාවට සහ වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට ලැබුණා. ඒ අනුව, අපි උදේ 6 වනකොට මේ සඳහා මැදිහත් වෙලා පළමු නාවික යාත්‍රාව යැව්වා. උදේ 7 වනකොට තවත් නාවික යාත්‍රාවක් යැව්වා. ඒ වාගේම ගුවන් හමුදාව සහ නාවික හමුදාවත් මේ සඳහා මැදිහත් වුණා. ඒ සිදුවීමේදී 30දෙනෙකු පමණ දැඩි අනතුරට ලක්වෙලා තිබෙනවා. 180ක පමණ පිරිසක් නෞකාවේ සිටි බවට දැනට තොරතුරු වාර්තා වනවා. ඒ 30දෙනාගේ ජීවිත බේරාගන්න අපි වහාම මැදිහත් වෙලා ඒ අයව මේ වනකොට කරාපිටිය රෝහලට රැගෙන එමින් සිටිනවා; මේ වනකොටත් කරාපිටිය රෝහලට ඔවුන් රැගෙන ඇවිල්ලා ඇති.

අපි ජාත්‍යන්තර වශයෙන් බැඳිලා ඉන්නවා, International Convention on Maritime Search and Rescue කියන සම්මුතියට. 1979දී අපි අත්සන් කරන ලද ඒ සම්මුතිය අනුව මුහුදු සීමාවලට ඔබ්බෙන් යම්කිසි රටක නැවකට, ඒ නැවක ඉන්න පිරිසට යම්කිසි අනතුරක් වුණොත්, ඒ රට, ජාතිකත්වය නොබලා, කුමන හේතුවක් මත එය අනතුරට ලක් වුණාද කියන එක නොසලකා මානුෂීය වශයෙන් ඒ අයගේ ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා මැදිහත්වීමක් කරන්න අපි බැඳී සිටිනවා. ඒක අපේ වගකීමක්, යුතුකමක්, මානුෂීය අර්ථයෙන් කළ යුත්තක්. ඒ නිසා අපි ඉතා ම පැහැදිලිව ඒ මැදිහත් වීම කරලා, මේ වනකොට ඒ දැඩි අනතුරු තත්ත්වයට පත් වෙච්ච අයගේ ජීවිත මුදාගන්න කරාපිටිය රෝහලේ අපේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මැදිහත් වෙමින් සිටිනවා.

ඒ සිදුවීමත් එක්ක මේ ප්‍රශ්නයෙන් මූලික වශයෙන් අහන්නේ කලාපීය ආරක්ෂාව පිළිබඳව. ඒක ඉතා පැහැදිලියි. කලාපීය ආරක්ෂාවට මෙවැනි සිදුවීම් ගැටලුකාරී විධියට බලපානවා. ඒ නිසා ඒක වළක්වා ගැනීම තමයි අපේ ඉලක්කය, අපේ මැදිහත් වීම වන්නේ. මේ සිදුවීමේදී අපේ පැත්තෙන් රජයක් විධියට ගත යුතු ක්ෂණික ක්‍රියාමාර්ග අපි ඉතාම ඉක්මනින් අරගෙන තිබෙනවා; ගනිමින් තිබෙනවා.

2. Kuwaitවල 322,437යි, Saudi Arabiaවල 242,593යි, Qatarවල 203,182යි, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ 170,468යි, Oman, 36,812යි, Israel, 27,472යි, Jordan, 24,184යි, Bahrain, 14,374යි, Lebanon, 7,925යි, Iraq, 641යි, Yemen, 16යි, Iran, 10යි, Syria, 7යි. ඒ ආදී වශයෙන් විස්තර ඇතුළත් එම සම්පූර්ණ ලේඛනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ වනකොට නිල වශයෙන් අප සතුව තිබෙන සංඛ්‍යා ලේඛනවලට අනුව මැද පෙරදිග කලාපයේ ආසන්න වශයෙන් ලක්ෂ 10ක -මිලියනයක- පමණ ශ්‍රී ලාංකිකයින් ප්‍රමාණයක් රැකියාවල නියුක්ත වෙලා ඉන්නවා.

3. ඉතා පැහැදිලිව අපි දන්නවා, මේ තත්ත්වය තුළ විවිධ රටවල ප්‍රධාන ගුවන් තොටුපොළවල් වසා දැමූ බව. නමුත්, තත්ත්වය වෙනස් වනකොට ගුවන් තොටුපොළ කිහිපයක් දැන් විවෘත කර තිබෙනවා. අපේ වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය අවස්ථා කිහිපයකදීම විවිධ පෞද්ගලික ගුවන් සමාගම් එක්කත් මේ සම්බන්ධව සාකච්ඡා කළා, ඊයේත් සාකච්ඡා කළා. ICAO එක එක්කත් මේ සම්බන්ධව සම්බන්ධීකරණ කටයුතු කළා. ඒ සියලු දේවල් එක්ක අපි ඉක්මනින් එම රටවලට ගුවන් යානා යොමු කිරීම සඳහා මැදිහත් වෙමින් සිටිනවා. ඇත්තටම ගත්තොත්, මේ සියල්ල සම්බන්ධීකරණය කරන්න මේ සිද්ධිය වෙච්ච දවසට පසුවදාම විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් විදේශ රටවල තිබෙන අපේ සියලුම තානාපති කාර්යාල සම්බන්ධීකරණය කරමින් හදිසි මෙහෙයුම් ඒකකයක් පිහිටුවනු ලැබුවා.

එසේ emergency response unit එකක් පිහිටුවා එය දවසේ පැය 24 පුරාම ක්‍රියාත්මක වෙනවා. ලංකාවෙන් පිටත තිබෙන සියලුම missionsවලත් මේ සේවාව 24 පැයේම විවෘත වෙලා තිබෙනවා. ඒ දුරකථන අංක සහ අනෙකුත් සම්බන්ධීකරණයන් පිළිබඳව අපි සියලුම මාධ්‍ය හරහා දැනුවත් කරමින් තිබෙනවා. ඒ නාම ලේඛනය මම මේ සභාවටත් ඉදිරිපත් කරනවා. කවුරුන් හෝ කෙනෙක් යම්කිසි කරදරයකට, අපහසුතාවකට පත් වෙලා ඉන්නවා නම් ඒ අයට මේ හරහා ඉක්මනින් සම්බන්ධීකරණය වෙන්න අවස්ථාව සපයා තිබෙනවා. ඒවාත් එක්ක තමයි අපි මේ සියල්ල සම්බන්ධීකරණය කරමින් යන්නේ.

ඒ අනුව දැනට අපි ගුවන් සමාගම් එක්ක සාකච්ඡා කරලා, විශේෂයෙන්ම Oman airspace එක සම්පූර්ණයෙන්ම විවෘත කරලා තිබෙනවා. ඒ අනුව ඕමාන්වල තිබෙන SalamAir airline එකට අයත් ගුවන් යානයකින් ඔවුන් ලංකාවට රැගෙන එන්න සහ රැගෙන යන්න කටයුතු කර තිබෙනවා. අද උදෑසන 4.00ටත් ගුවන් යානාවක් ආවා. ඒ වාගේම, Flydubai එක ක්‍රියාත්මක වෙනවා. ඒ ගුවන් සේවය තුළිනුත් දැන් මඟීන් ප්‍රවාහනය කිරීම ආරම්භ කර තිබෙනවා. ඊයේ දවස තුළදී අපි FitsAir එකත් එක්ක සාකච්ඡා කරලා, එම ගුවන් සේවයට අයත් ගුවන් යානා දෙකකින් ලංකාවෙන් මඟීන් අරගෙන කටුනායක ගුවන් තොටුපොළින් ඩුබායිවලට ගියා. ආපහු මඟීන් මෙරටට රැගෙන ඒමත් සිද්ධ වෙනවා. මුලදී එය වසා තිබුණා. නමුත්, ඒක විවෘත කළාට පසුව අපි ඒ අවස්ථාව ඉක්මනින් ප්‍රයෝජනයට අරගෙන විවිධ ගුවන් යානා සමාගම් එක්ක සාකච්ඡා කරලා එය ක්‍රියාවට නඟා තිබෙනවා. දැනට ඕමානයේ මස්කට් දක්වා ඒ ප්‍රවාහන කටයුතු සිද්ධ වෙනවා. ඒ වෙනුවෙන් SalamAir airline එක ක්‍රියාත්මක වෙනවා; ඒ වාගේම, Flydubai එක ක්‍රියාත්මක වෙනවා; FitsAir එක ක්‍රියාත්මක වෙනවා. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් එකත් අපි ක්‍රියාත්මක කරනවා. ඒක නතර කරලා නැහැ. අපිට ඒ කටයුතු නතර කරන්න සිද්ධ වුණේ වසා තිබෙන ගුවන් තොටුපොළවල් සඳහා පමණයි. විශේෂයෙන්ම UK, Frankfurt, Paris වැනි යුරෝපා රටවලට අපේ ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගමේ ගුවන් යානා යනවා.

4. මම කලින් පැහැදිලි කරපු විධියටම නැවත ඒ ගැන කියන්නම්. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මේ සඳහා දවසේ පැය 24 පුරා ක්‍රියාත්මක වන තොරතුරු මැදිරියක් විවෘත කර ඇති අතර, මහජනතාවට දවසේ පැය 24 පුරා ක්ෂණික ඇමතුම් අංක 1989 මඟින් කාර්යාංශය සමඟ සම්බන්ධ විය හැකියි. ඒ වෙනුවෙන් හඳුන්වා දී ඇති WhatsApp අංකය වන 071-9802822 හරහා තොරතුරු ලබා ගැනීම සිදු කරනු ලබනවා. තොරතුරු මැදිරිය නිරතුරුව මැද පෙරදිග කලාපයේ දූත මණ්ඩල කාර්යාලවල ස්ථාපිත කම්කරු හා සුභසාධන අංශ සමඟ සම්බන්ධ වෙමින් තොරතුරු හුවමාරු කර ගැනීම සිදු කරනු

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු විජිත හේරත් මහතා]

ලබනවා. ඒ යටතේ පෙබරවාරි 28වැනි දා සිට තවමත් ක්‍රියාත්මක වෙමින් පවතින ඒ විගමනික ශ්‍රමිකයින් සම්බන්ධව පහත සඳහන් පරිදි විමසීම් ඉදිරිපත්ව තිබෙනවා. ඇත්තටම ගත්තොත් මේ වෙනකොට විමසීම් 30ක් විතර ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ විමසීම් 30 පිළිබඳ තොරතුරු ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් මා සතුව තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ තොරතුරු ඇතුළත් වාර්තාව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

අපි මේ ලබා දීපු දුරකථන අංක හා WhatsApp අංක වෙත ඒ අය ලබා දුන් ගැටලු පිළිබඳව තමයි එහි සඳහන් වෙන්නේ. ඔවුන්ව මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා ඥාතීන්ගෙන් ඉල්ලීම් 16ක් ඇවිල්ලා තිබෙනවා. විගමනික ශ්‍රමිකයින් සමඟ සම්බන්ධතා නොමැති වීම පිළිබඳව ඉල්ලීම් ලැබී තිබෙනවා. ඒ කියන්නේ, සම්බන්ධතාවක් -connection එකක්- නැහැ කියලා පැමිණිලි 4ක් ලැබී තිබෙනවා. ඒ වාගේම, අපේ සේවකයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙනුත් ඉල්ලීම් 4ක් ලැබී තිබෙනවා. යුදමය වාතාවරණය පිළිබඳව සාමාන්‍ය තොරතුරු විමසීමකුත්, තොරතුරු ලබා ගැනීම සම්බන්ධ ඉල්ලීමකුත්, විදේශගතව සිටින පවුල් පිළිබඳ විමසීම් 2කුත් ලැබී තිබෙනවා. ඒ ආකාරයට අපි හඳුන්වා දීපු ඒ සන්නිවේදන ක්‍රමවේදයට අනුව විමසීම් 30ක් ලැබී තිබෙනවා.

5. ඊයේ වෙනකොට සවුදි අරාබියේ 109ක් සහ ඕමාන්වල 22ක් හිටියා. අද උදේ ඕමාන් ගුවන් යානය ආපු නිසා එතැනින් පිරිසක් ලංකාවට එන්න ඇති.

6. ඔව්. යම්කිසි ශ්‍රී ලාංකිකයෙක් යම් පීඩාවකට ලක් වෙලා ඉන්නවා නම් අපේ සියලු මැද පෙරදිග තානාපති කාර්යාල හරහා ඒ අයට අවශ්‍ය කෑම බීම, ඉඳුම්-හිටුම්, වෙනයම් හෝ අවශ්‍යතා තිබෙනවා නම් ඒවා ලබා දෙන්න අනිවාර්යයෙන් අපි ඉතා පැහැදිලිව මැදිහත් වෙනවා; ඒ වාගේම අපි මැදිහත් වෙමින් සිටිනවා. එමෙන්ම ඒ රටවල ඉන්න ශ්‍රී ලාංකිකයන්ටත් මම ස්තුතිවන්ත වෙනවා. මොකද, අපේ තානාපති කාර්යාලවලට එහා ගිහිල්ලා ඒ රටවල ඉන්න ශ්‍රී ලාංකිකයෝ තමන්ගේ රටේ පුරවැසියෙක් පීඩාවට පත් වුණාම ස්වේච්ඡාවෙන් ඒ සඳහා මැදිහත් වෙලාත් උදවු උපකාර කරනවා. එවැනි දෙයකුත් දැනට ක්‍රියාත්මක වෙනවා. එම නිසා අපි ඒ සඳහා අමාත්‍යාංශය විධියටත්, රජය විධියටත් මුදල් ප්‍රතිපාදන යවා ක්ෂණිකව මැදිහත් වෙන්න අවශ්‍ය කරන උපදෙස් ලබා දී තිබෙනවා. ඇත්තටම මේ සම්බන්ධයෙන් අපේ මැදිහත් වීම මේ සිදු වීම සිද්ධ වුණු දවසේ ඉඳලා ක්‍රියාත්මක වෙනවා.

7. මම කලින් සඳහන් කළා වාගේ හදිසි ප්‍රවාහන සැලැස්මක් සහ වෙනත් විකල්ප ප්‍රවාහන ක්‍රම සලකා බැලීම පිළිබඳව දැනටමත් අපි අදාළ ඇමතිතුමාත්, අදාළ නිලධාරීනුත්, ජාත්‍යන්තර ගුවන් සමාගම් සමඟත් සාකච්ඡා කරලා, අවශ්‍ය පියවර ගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව විවිධ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. අවශ්‍ය අවස්ථාවලදී ඒවා ක්‍රියාත්මක කරන්න අපි අනිවාර්යයෙන් මැදිහත් වෙනවා.

8. මේ දෙක අන්තර් සම්බන්ධයි. ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය මේ වනතුරු විශේෂ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර, අදාළ රටවල සිවිල් ගුවන් සේවා නියාමන ආයතන විසින් මේ පිළිබඳව ගන්නා තීරණ මත එම රටවල ජාත්‍යන්තර මගී ප්‍රවාහන ගුවන් සමාගම් විසින් සිදු කරනු ලබන ආරක්ෂක හා නිරුපද්‍රිතතා විශ්ලේෂණවල නිරීක්ෂණ අනුව කටයුතු කළ හැක. ඒ කියන්නේ, විවිධ පෞද්ගලික ගුවන් සමාගම් ඒවායේ තීන්දු-තීරණ මත තමයි මේක ක්‍රියාත්මක කරන්නේ. ඒ අයත් එක්ක සාකච්ඡා කරලා අවශ්‍ය පියවර ගන්න දැනටමත් අපි මැදිහත් වෙලා තිබෙනවා.

9. ඇත්තටම මේ වෙලාවේදී විදේශ ප්‍රේෂණ එවීමේ අඩු වීමක් සිදු වෙලා නැහැ. ඔබතුමන්ලා දන්නවා, ලංකා ඉතිහාසයේ වැඩිම විදේශ ප්‍රේෂණ ප්‍රමාණය වන ඩොලර් බිලියන 8.2ක විදේශ ප්‍රේෂණ 2025 අවුරුද්දේ අපි ලබා ගත් බව. අපි මේ අවුරුද්දේත් විදේශ ප්‍රේෂණ ගෙන්වා ගැනීමට අවශ්‍ය කරන පියවර ගන්නවා. යුදමය තත්ත්වය තුළ විදේශ ප්‍රේෂණ එවීමේ යම්කිසි බාධාකාරී තත්ත්වයක් මතු විය හැකිව තිබෙනවා. ඒ කියන්නේ, බැංකු ක්‍රියාත්මක වීම සහ පෞද්ගලික apps ක්‍රියාත්මක වීමේ ගැටලු මතු විය හැකිව තිබෙනවා. එවැනි තත්ත්වයකට අවශ්‍ය විකල්ප ක්‍රියාමාර්ග ගන්න අපි සාකච්ඡා කරමින් ඉන්නවා. විදේශ ප්‍රේෂණ අපේ රටේ ආර්ථිකයේ ප්‍රධානම සංඝටකයක්. ඒ නිසා විදේශ ප්‍රේෂණ නියමිත ආකාරයට ගෙන්වා ගැනීමට අවශ්‍ය කරන මැදිහත් වීම තමයි අප කළ යුත්තේ. නමුත්, යුදමය තත්ත්වයක් තුළදී ඒ විදේශ ප්‍රේෂණ ක්ෂණිකව එවන්න මූල්‍ය ආයතනවලට යෑමේ අපහසුතා, මූල්‍ය ආයතනවල ක්‍රියාකාරිත්වය, බැංකුවල සේවකයන්ගේ ක්‍රියාකාරිත්වය අඩු වීම වැනි දේවල් සිද්ධ වෙන්න පුළුවන්. මම හිතන්නේ කාට වුණත් ඒක තේරෙනවා. නමුත් පොදුවේ ගත්තොත්, මේ සඳහා තිබෙන විකල්ප මොනවාද කියන එක පිළිබඳව තමයි අපි සාකච්ඡා කළ යුත්තේ. ඒ පිළිබඳව අදාළ බලධාරීන් එක්ක අපි දැනටමත් අදාළ සන්නිවේදන කටයුතු සිදු කරමින් තිබෙනවා.

10. OPEC සංවිධානය කියන්නේ, ඇත්තටම තෙල් නිෂ්පාදනය කරන සංවිධානයක්. තෙල් ගෙන්වා ගැනීම තමයි වෙනත් සමාගම් හරහා සිද්ධ වන්නේ. අපි ඇත්තටම තෙල් ගෙන්වා ගැනීමේ සමාගම් එක්ක දැනටමත් කථා කරලා තානාපති සේවය හරහාත් අදාළ කරන සම්බන්ධීකරණය කර ඉවරයි. ඒ නිසා අපිට ඇත්තටම තෙල් පිළිබඳව මේ මොහොතේදී ලොකු ප්‍රශ්නයක් නැහැ. යුදමය තත්ත්වයේ වර්ධනය මත අනාගතයේදී මොන වාගේ තත්ත්වයක් ඇති වේවිද කියන එක ගැන අපි බලන්න ඕනෑ. නමුත්, මේ මොහොත ගත්තොත් අවශ්‍ය කරන තෙල් සංචිත තිබෙනවා. ඊයේත් ඒ සම්බන්ධයෙන් දීර්ඝ පැහැදිලි කිරීම් සිදු කළා. ඒ වාගේම, තෙල් ගෙන්වමින් තිබෙනවා. අපේ රටට තෙල් ගෙන්වීමේ ප්‍රධාන රටවල් වන්නේ ඉන්දියාව, සිංගප්පූරුව, මලයාසියාව සහ දකුණු කොරියාව වාගේ රටවල්.

ඒ නිසා මැදපෙරදිග කලාපයේ ඇති වන යුද තත්ත්වය තෙල් ප්‍රවාහනයේදී මේ මොහොතේ ගැටලුවක් වෙලා නැහැ. ඉදිරියේ තත්ත්වය අනුව තමයි ඒක බලන්න වෙන්නේ. අපි ඒ අනුව විකල්ප සොයා ගත යුතු වෙනවා. අපි ඒ පිළිබඳවත් අවධානය යොමු කරලා තිබෙනවා.

11. හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා ඇති වන බාධාව ගැන කිව්වොත්, ඇත්තටම හෝමුස් සමුද්‍ර සන්ධිය වැසීම අපේ තෙල් ආනයනයට බාධාවක් නොවෙයි. මොකද, දැනටත් ඒ හරහා අපේ තෙල් ආනයනය කිරීම් වෙන්නේ නැහැ. තෙල් නිෂ්පාදනය හා ප්‍රවාහනයේදී ඒ කලාපයට යම් බාධාවක් වෙන්න පුළුවන්. නමුත් ඒ හරහා නොවෙයි, අපේ ලංකාවට තෙල් ගෙන්වන්නේ. මොකද, වෙනත් විකල්ප ක්‍රියාමාර්ග තිබෙනවා. විශේෂයෙන්ම අප්‍රිකානු කේප් තුඩුව හරහා වන නාවික ගමනාන්තවලින් තෙල් ගෙන්වීම් සිද්ධ වෙනවා, විකල්ප ක්‍රියාමාර්ග විධියට. ඒ නිසා හෝමුස් සමුද්‍ර සන්ධිය වැසීම කියන එක බාධාවක් වෙන්නේ නැහැ. දැනටත් එහෙම නැතුව තමයි අපි තෙල් ගෙන්වන්නේ. ඒ නිසා ඒක අපට අදාළ වෙන්නේ නැහැ. නමුත් පොදුවේ

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ලෝකයේ තෙල් නිපැයුම සහ ප්‍රවාහනයට මෙය බලපාන බව ඇත්ත. ලංකාව ගත්තොත්, ලංකාවට මේක ප්‍රධාන බාධකයක් වෙන්නේ නැහැ. මොකද, දැනටමත් අපි වෙනත් ක්‍රමයකින් ගෙන්වන නිසා.

12. තෙල් මිල ඉහළ යාම පිළිබඳ ප්‍රශ්නයක් මතු වුණොත්, ශ්‍රී ලංකාවට ඇති විය හැකි ආර්ථික බලපෑම් පිළිබඳව අපේ ක්‍රියාමාර්ග මොකක්ද කියන කාරණය අසා තිබෙනවා. ඇත්ත. මැදපෙරදිග කලාපයේ යුද්ධයත් එක්ක තෙල් නිෂ්පාදනය, ප්‍රවාහනය සාමාන්‍ය පරිදි සිද්ධ වෙන්නේ නැහැ. ඒ තත්ත්වය වර්ධනය වුණොත් තත්ත්වය තව වෙනස් වෙන්න පුළුවන්. එතකොට ලෝක වෙළඳපොළේ තෙල් මිල ගැටලුවක් වෙන්න පුළුවන්. ඒක සාමාන්‍යයෙන් යුද්මය තත්ත්වයකදී වෙන දෙයක්. ඒක ලංකාවේ අපේ ආණ්ඩුවේ වැරැද්දක් හින්දා සිද්ධ වෙන එකක් නොවෙයි. ඒක මේ ලෝක තත්ත්වය තුළ ඇත්ත යථාර්ථයයි.

තෙල් මිල දැනට එහෙම වැඩි කරන්න හෝ එහෙම දෙයක අවශ්‍යතාවක් මතු වෙලා නැහැ. මේ යුද්ධය කෙටි කාලයක් තුළ අවසන් වුණොත් අපට සුබවාදී බලාපොරොත්තුවකින් යන්න පුළුවන්. යුද්ධය වර්ධනය වීම නොවීම මත තමයි තෙල් මිලේ උච්චාවචනය තීරණය වෙන්නේ. ඇත්තටම මේ තත්ත්වය ගත්තොත්, අනපේක්ෂිත තත්ත්වයක්. අපි කවුරුවත් බලාපොරොත්තු වෙච්ච නැති තත්ත්වයක්. නමුත් ඒ තත්ත්වයට මුහුණ දෙන්න රටක් විධියට, ආණ්ඩුවක් විධියට අපි මේ සිද්ධිය සිදු වෙච්ච ගමන්ම පහුවදාම ගරු ජනාධිපතිතුමාත්, අපේ ආරක්ෂක අංශයත් ක්ෂණිකව මැදිහත් වුණා. ආරක්ෂක මණ්ඩලයේ විශේෂ රැස්වීමක් පසුදාම පැවැත්වුණා. අපේ රටේ ආරක්ෂාවත්, ඒ වාගේම රට තුළ විවිධ රටවලින් ඇවිල්ලා ඉන්න සංක්‍රමණිකයන්, විදේශිකයන්, සංචාරකයින් ආරක්ෂා කර ගැනීම සඳහා වෙච්ච විශේෂ වැඩ පිළිවෙළක් අපි දැනටමත් යොදලා තිබෙනවා. තානාපති කාර්යාලවල ආරක්ෂාව ගත්තොත්, විවිධ ගැටුම්කාරී තත්ත්වයන්ට මැදිහත් වෙන තානාපති කාර්යාල ගණනාවක් අපේ රටේ තිබෙනවා. ඒ සියලු තානාපති කාර්යාලවල ආරක්ෂාව සඳහා අපි විශේෂ මැදිහත්වීමක් කරලා තිබෙනවා. ඒ තීන්දුව පහුවදාම ආරක්ෂක මණ්ඩලය රැස්වෙලා ගනු ලැබුවා.

ඒ වාගේම සංචාරකයන්ගේ ආරක්ෂාව, විදේශ තානාපති කාර්යාලවල, මහ කොමසාරිස් කාර්යාලවල ආරක්ෂාව, අපේ රටින් බැහැරව විවිධ රටවල ඉන්න ශ්‍රී ලාංකිකයන් ගැනත් අපි අවධානය යොමු කළා. මොකද, ගුවන් යානා නැතුව එන්න බැරුව, වීසා කාලය අවසන් වෙලා ඒ අය ගැටලුවලට මුහුණ දීලා තිබෙනවා. අපි රටක් විධියට ක්ෂණිකව පහුවදාම තීන්දුව ගත්තා. ඒ අනුව අපේ වීසා කාලය සති දෙකකින් දිගු කළා. ඒ නිසා විදේශිකයන්ට, සංචාරකයන්ට ඉතාම පහසුවෙන් සති දෙකක කාලයක් තවත් රැඳී ඉන්න පුළුවන්. අවශ්‍ය වුණොත් අපි ඊටත් වඩා දිගු කරන්න සූදානම්. නමුත් අපේ රටින් බැහැරව ඉන්න ගොඩක් අපේ ශ්‍රී ලාංකිකයන්ට ඒ රටවල් එහෙම කළේ නැහැ. ගොඩක් තොරතුරු දන්නේ නැතුව තමයි සමහර අය කථා කළේ. මේ අපේ වෛද්‍යවරු කණ්ඩායමක්ම ඉන්නවා, දරුවන්ගේ convocation එකට ගිහිල්ලා ජෝර්ජියාවේ; ඔවුන්ගේ වීසා ඉවර වෙලා එන්න විධියක් නැහැ. එතකොට ඒ රටවල් එහෙම වීසා කාලය දිගු කරලා නැහැ. අපි ඒවා කරලා තිබෙනවා; ඒ රටවල් නොකළාට අපි කරලා තිබෙනවා. ඒ නිසා ලෝකයේ අනිකුත් රටවල් එක්ක ගත්තාම, රටක් විධියට ලංකාව ගැන අපි ආඩම්බර වෙනවා. අපි ඒ ගන්නා සියලු ක්‍රියාමාර්ග ක්ෂණිකව අරගෙන තිබෙනවා. අපි වීසා දිගු කිරීම් කරලා තිබෙනවා. සංචාරකයන්ට අවශ්‍ය කරන පහසුකම් දෙන්න, අපේ සංචාරක අධිකාරිය ඒ සියලු හෝටල් හිමිකරුවන් සහ travel agentsලාත් එක්ක සාකච්ඡා කරලා ක්ෂණික ක්‍රියාමාර්ග ගත්තා. තව ඉස්සරහට අපි ඒ අයට ආර්ථික වශයෙන් ප්‍රශ්න තිබෙනවා නම්, insurance එක පිළිබඳ ප්‍රශ්න තිබෙනවා නම්, insurance එකේ කාලය අවසන් වෙලා තිබෙනවා නම්, ඒවා නිරාකරණය කර ගන්නත් ක්‍රමවේද හදලා තිබෙනවා. අදත් සවස 2.00ට ඒ පිළිබඳ විශේෂ සාකච්ඡාවක් ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් පැවැත්වෙනවා. විදේශ ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව, සංචාරකයන්ගේ ආරක්ෂාව සහ වෙනත් රැකියා, ව්‍යාපෘති සඳහා ලංකාවට ඇවිල්ලා ඉන්න විදේශිකයන්ගේ ආරක්ෂාව සහතික කරන්න අපි අනිවාර්යයෙන් පියවර අරගෙන තිබෙනවා.

ඔබතුමන්ලා දන්නවා, පසුගිය "දිට්වා" සුළි කුණාටු තත්ත්වයේදී රට බරපතළ ව්‍යසනයකට මුහුණ දුන් බව. හැබැයි, අපි රජයක් විධියට සමත් වුණා, එකදු සංචාරකයෙකුට අනතුරක් වෙන්නේ නැතිව, ඒ අයගේ ජීවිත ආරක්ෂා කරලා අපේ රට ඒ සංචාරකයන්ට සුරක්ෂිත රටක් බවට තහවුරු කරන්න. ඒ වාගේම දෙසැම්බර් මාසයේදී, "දිට්වා" සුළි කුණාටු තත්ත්වය නිසා සංචාරකයන්ගේ පැමිණීම අඩු වෙන්න ඉඩ තිබුණා. ප්‍රවාහන පහසුකම් බිඳ වැටුණා. නමුත්, අපි රජයක් විධියට වහාම, ක්ෂණිකව ඒ වෙනුවෙන් මැදිහත් වුණා. ලංකා ඉතිහාසයේ වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් ආපු මාසය බවට පසුගිය දෙසැම්බර් මාසය අපි පත් කරගත්තා. ඒ වාගේ තමයි, මේ අවස්ථාවේදීත් සංචාරකයන්ගේ ආරක්ෂාව, පහසුකම් වෙනුවෙන් අපි ක්ෂණිකව ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා, ගනිමින් තිබෙනවා. එම නිසා සංචාරකයන්ට ආරක්ෂාව තහවුරු වෙලා තිබෙනවා. මේ තිබෙන තත්ත්වය තුළත් සංචාරකයන් විකල්ප ගුවන් යානා පාවිච්චි කරමින් ලංකාවට එනවා. ඊයේත් තුර්කි ගුවන් යානය හරහා ජර්මන් සහ යුරෝපීය සංචාරකයෝ විශාල ප්‍රමාණයක් ලංකාවට ආවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, පිළිතුර කෙටි කරන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
යුරෝපීය සංචාරකයන්ගේ පැමිණීම නතරවෙලා නැහැ. මේ තත්ත්වය තුළත් ඒ විශ්වාසය අපි ඇති කරලා තිබෙනවා. ආරක්ෂාව පිළිබඳව ඒ සහතිකය අපි ලබා දීලා තිබෙනවා. මානුෂීය ආධාර කළ යුතු තැන්වලදී අපි මානුෂීය ආධාර ලබා දෙමින් තිබෙනවා. මේ ඇති වුණු තත්ත්වය තුළ රජයක් විධියට ගත යුතු, ගත හැකි සියලු ක්ෂණික ක්‍රියාමාර්ග අපි අරගෙන තිබෙනවා, ඉදිරියට අවශ්‍ය වුණොත් අපි තවදුරටත් ක්‍රියාමාර්ග ගන්නවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, කෙටි පැහැදිලි කර ගැනීමකට අවස්ථාව තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ අවස්ථාවේදී ගරු අමාත්‍යතුමාට මේ කාරණය මම විශේෂයෙන්ම මතු කරන්න කැමැතියි. ඔබතුමා සඳහන් කළා, හෝමුස් සමුද්‍ර සන්ධිය වසා දැමීම තුළ ලොකු බාධාවක් සිදු වෙන්නේ නැහැ කියලා. මම නැවතත් වරක් කියන්නට කැමැතියි, shipping traffic සියයට 70ක් අඩුවෙලා තිබුණා, දැන් නම්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

හොඳටම අඩුවෙලා තිබෙනවා කියන එක. ඒ නිසාම තෙල් බැරලයක මිල ශීඝ්‍ර ලෙස ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම අපේ රටේ oil, gas ආනයනය අපි හුඟක් පදනම් කරගෙන තිබෙන්නේ ඕමානය, ඉරාකය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, බහරේන් වැනි මැදපෙරදිග රටවලින්. අපේ ආනයනික බොර තෙල් ගත්තොත්, විශේෂයෙන්ම සපුගස්කන්ද තෙල් පිරිපහදුවට supplies ටික එන්නේ හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා. කොහොමද කියන්නේ අපේ බලශක්ති ආරක්ෂිතභාවයට බලපෑමක් නැහැ කියලා. ඒ වාගේම අපි ඉන්දියාවෙන්, සිංගප්පූරුවෙන් පිරිපහදු තෙල් සහ ඩීසල් ගෙන්වනවා. නමුත් ඒ රටවලටත් බොර තෙල් එන්නේ ඇත්තවශයෙන්ම හෝමුස් සමුද්‍ර සන්ධිය හරහායි. එම නිසා මේ සැපයුම්දාමය පිළිබඳව මීට වැඩිය අවබෝධයක් ලබා ගැනීම යෝග්‍යයි කියන එක මම ඔබතුමාට මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ඒ වාගේම අපේ රටේ ශ්‍රමික ජනතාව දස ලක්ෂයකට අධික ප්‍රමාණයක් මේ රටවල සේවය කරනවා. ඒක අවතක්සේරු කරන්න එපා. මා ඔබතුමාට යෝජනාවක් කරනවා. මම දන්නවා කාල වකවානු වෙනස් කියලා. නමුත්, 1990දී ගල්ෆ් යුද්ධය, ඒ කියන්නේ ඉරාකය කුවේටය ආක්‍රමණය කිරීමත් සමඟ නිර්මාණය වුණු ගල්ෆ් යුද්ධයේදී අපේ රටට ඒ කාල සීමාව තුළ මේ ප්‍රශ්නය ඉහළ මට්ටමකින් කළමනාකරණය කරන්නට පුළුවන්කමක් ලැබුණා. ඒකෙන් අපි පාඩම් ඉගෙන ගැනීම වැදගත් කියන එක මම කියන්න කැමැතියි.

ඒ වාගේම මම තවත් යෝජනාවක් කරන්න කැමැතියි. විශේෂයෙන්ම ද්‍රවීකෘත වායුව - LNG - සහ gas suppliesවලට ලොකු බලපෑමක් එනවා. ඒක අපට වක්‍රව හෝ බලපානවා කියන එක මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි. නෞකා රක්ෂණ මිල ඉහළ යෑම, ඉන්ධන නෞකා මාර්ග වෙනස් වීම, ඉන්ධන මිල ඉහළ යෑම, සංචාරක කර්මාන්තය, ප්‍රේෂණය, තේ අපනයනය ආදිය ගැන අපි ඔබතුමාගෙන් ප්‍රශ්න කළා. නමුත් ඒවාට සාර්ථක පිළිතුරු ලැබුණේ නැහැ. මේ තුළින් අපේ රටේ සාර්ව ආර්ථිකයටත් - macroeconomy එකටත්, ක්ෂුද්‍ර ආර්ථිකයටත් - microeconomy එකටත් - බරපතළ බලපෑමක් සිද්ධ වෙනවා.

ගරු ඇමතිතුමනි, මා අවසාන වශයෙන් ඔබතුමාගෙන් පැහැදිලි කරවා ගන්න කාරණයක් කියන්න කැමැතියි. මේ හදිසි තත්ත්වයට මුහුණ දෙනකොට ඕනෑවට වඩා සුබවාදී දර්ශනය - optimistic scenario එක - මත පදනම් කරගෙන සැලසුම් කරන්න එපා. ඉතාම අශුභවාදී තත්ත්වය - pessimistic scenario එක - ගැන හිතලා, ඒ කියන්නේ ලෝකයේ සිදු වෙන්න යන මේ ව්‍යසනකාරී තත්ත්වය වඩාත් ව්‍යාප්ත වෙනවා කියන පදනම මත හිතලා අපේ රටේ සැලසුම් දියත් කිරීම යෝග්‍යයි. මොකද, එවිට අපේ රටේ ක්‍රමෝපායට, වැඩ පිළිවෙළට වඩාත් වාසිදායක තත්ත්වයක් එයින් නිර්මාණය වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා එල්ල වන බලපෑම අවතක්සේරු කරන්න එපා කියන එක මම ඔබතුමාට මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
හෝමුස් සමුද්‍ර සන්ධිය වසා තැබීමෙන් අපට සිදු වන බලපෑම පිළිබඳව අවබෝධයක් ලබා ගත යුත්තේ ඔබතුමාද, මමද කියන එක මේ තිබෙන සැපයුම් දාමය එක්ක තේරුම් ගන්න පුළුවන්, ගරු විපක්ෂ නායකතුමනි. ඇත්තටම ගත්තොත්, දැනට අගෝස්තු මාසය දක්වා අපට අවශ්‍ය කරන බොරතෙල් සංචිත ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා හෝමුස් සමුද්‍ර සන්ධිය පිළිබඳ කාරණය අපට දැනටමත් ලොකු බාධාවක් වෙලා නැහැ. නමුත්, ලෝකයේ ප්‍රවාහනයට, නිෂ්පාදනයට ඒක බාධාවක් වෙන්න පුළුවන්. මා ඒකයි කලිනුත් කිව්වේ. ලංකාවට තෙල් ආනයනය කරද්දී අප කොහෙන්ද ගෙනෙන්නේ කියන එක මම පැහැදිලිව සඳහන් කළා. අපට මේ මොහොතේ එය ලොකු ප්‍රශ්නයක් වෙලා නැහැ. නමුත්, ඉදිරියේදී සමස්ත ලෝක තෙල් සැපයුමට, තෙල් නිෂ්පාදනයට බාධාවක් වුණොත් අපි ඒ පිළිබඳව අවශ්‍ය පියවර ගන්නවා. එහිදී අපි අසුබවාදී නැහැ. ඒ කියන්නේ නරකම දෙයටත් මුහුණ දෙන්න අපි ලෑස්තියි. හැබැයි, අපි බලාපොරොත්තු වෙනවා, සුබවාදී දේ. ඒක ආණ්ඩුව රජය විධියට ජනතාව වෙනුවෙන් කළ යුතු දෙයක්. ඒ නිසා අපි සුබවාදී දෙයක් බලාපොරොත්තු වෙනවා. අසුබවාදී දෙයක් ඇති වුණොත් ඒකට මුහුණ දෙන්නත් අවශ්‍ය කරන සැලසුම්, සංවිධානය වීම් අපි දැනටමත් කරලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඔය කාරණය අවසන් කරන්න. මේ 27 (2) ප්‍රශ්නයට විනාඩි 40ක් ගියා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු අමාත්‍යතුමා අවසර දුන්නා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ, අවසර නොවෙයි- *[බාධා කිරීමක්]* ගරු අමාත්‍යතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු කථානායකතුමනි, එතුමාට අවස්ථාව දෙන්නකෝ බලන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කියපු දේ වැරැදියට වැටහිලා තිබෙනවා කියලායි මා හිතන්නේ. Plan කරන කොට අශුභවාදීම දේ සිදු වෙයි කියන විධියට සැලසුම් වුණොත්, වැඩේ සුබවාදීව ක්‍රියාත්මක වනකොට අපට ඒක බෝනස් එකක්. ඒකයි මම මේ කියන්නේ. මේක අසුබවාදී වෙයිද, සුබවාදී වෙයිද කියන කථාවෙන්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අවසන් කරන්න. *[බාධා කිරීමක්]* ගරු විපක්ෂ නායකතුමනි, විනාඩි 40ක් ගත්තා, මේ ප්‍රශ්නයට.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා කියන දේ මට පැහැදිලියි.

ඊයේ ගරු ජනාධිපතිතුමාත් ඉතා පැහැදිලිව කිව්වේ මේක තමයි. අපි ඕනෑම නරක දෙයකට ලෑස්තියි. හැබැයි, අපි මේ තත්ත්වය සුභවාදී පැත්තට වෙනස් කර ගන්න මැදිහත් වෙන්න ඕනෑ. ඒක තමයි optimistic thinking. අපි එතැන ඉන්නවා. ඒ නිසා අප මේ කාරණයේදී විපක්ෂයට කියන්නේ, ගුණ්ඩු දාන්න එන්න එපා, මෙය ගුණ්ඩුවක් කර ගන්නත් එපා කියලායි. ඒකත් හොඳට තේරුම් ගන්න. අප මේක රටක් විධියට මුහුණ දෙන්න ඕනෑ තත්ත්වයක්. ඒ රට විධියට මුහුණ දෙන තත්ත්වයට අපි ඔක්කොම මුහුණ දෙමු. ඒකට අපි සියලු දෙනාම සූදානම්.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඉතා කෙටියෙන් අහන්න දෙයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ 27(2) ප්‍රශ්නයටත් විනාඩි 42ක් ගියා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු අමාත්‍යතුමනි, ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කරමින් මිත්‍ර රටක නායකයෙකු ඝාතනය වෙලා තිබෙනවා. ඒ, ඉරානයේ උත්තරීතර නායකතුමා. එතුමාගේ මරණය පිළිබඳව හෙළා දැකීම, නැත්නම් ශෝකය පළ කිරීම් තවමත් රජයෙන් කරලා නැහැ කියා අපට පෙනෙනවා. මේ කාරණය පිළිබඳව පොඩ්ඩක් පැහැදිලි කරන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු කථානායකතුමනි, විදේශ අමාත්‍යාංශය විධියට අපේ ස්ථාවරය, නිල ප්‍රකාශය දැනටමත් නිකුත් කර තිබෙනවා. අද සවස 1.30ට මම තානාපති කාර්යාලයට ගිහිල්ලා, ඒ ශෝක පොතේ මගේ ප්‍රකාශය සටහන් කරනවා. *[බාධා කිරීම්]* රට වෙනුවෙන් මම ඒ ප්‍රකාශය කරනවා. කළ යුතු දේවල් සියල්ල කරලා ඉවරයි. ගරු මන්ත්‍රීතුමනි, මම කරන්නේ ඔබතුමාට ඕනෑ දේ නොවෙයි; රටට ඕනෑ දේයි. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ඔබතුමන්ලාට ඒ ගැන ප්‍රකාශයක් කර ගන්න බැහැ. ලජ්ජයි! ලජ්ජයි!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

## II

## උද්ධමන ඉලක්කයෙන් බැහැර වීම
## பணவீக்க இலக்கிலிருந்து விலகல்
## DEVIATION FROM INFLATION TARGET

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26 වැනි වගන්තිය යටතේ ක්‍රියාත්මක මූල්‍ය ප්‍රතිපත්ති රාමුව මඟින් නියම කර ඇති ඉලක්කගත උද්ධමන මට්ටමෙන් අඛණ්ඩව බැහැර වීම සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 27(2) යටතේ රජයෙන් හදිසි ප්‍රකාශයක් බලාපොරොත්තු වෙමි.

මහ බැංකුව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති අපගමන වාර්තා - Deviation Reports - මඟින් තහවුරු වන්නේ, කාර්තුමය මතුපිට උද්ධමනය - headline inflation - සියයට 5ක ඉලක්කගත මට්ටමේ පහළ සීමාවට (සියයට 3ට) වඩා අඛණ්ඩව පහළ මට්ටමක පවතින බවයි. වඩාත්ම මෑතකදී, 2025 දෙවන කාර්තුවේදී මතුපිට උද්ධමනය සාමාන්‍යයෙන් ඍණ සියයට 1.1ක් වූ අතර, තෙවන කාර්තුවේදී එය සියයට 0.8ක් විය. මේ අනුව උද්ධමනය සියයට 3ට වඩා අඩුවෙන් පැවතීම හේතුවෙන් ව්‍යවස්ථාපිත වාර්තාකරණ අවශ්‍යතාව සක්‍රිය වී ඇත.

මේ සම්බන්ධයෙන් ගරු මුදල් ඇමතිතුමාගෙන් පහත කරුණු පිළිබඳව පුළුල් පැහැදිලි කිරීමක් අපේක්ෂා කරමි.

1. 2023 ජූනි මාසයේ සිට පදනම් අංක 800ක පමණ - ratio එක 800 basis points පමණ - සැලකිය යුතු මූල්‍ය ලිහිල් කිරීමක් සිදු කර තිබියදීත්, වාර්තාකරණ චක්‍ර 5ක් පුරා මතුපිට උද්ධමනය ඉලක්කගත පරාසයට වඩා අඩුවෙන් පැවැතීමට හේතුව කුමක්ද? එමෙන්ම සියයට 3ට වඩා අඩු උද්ධමන අගයන් සහ මහජනයා අත් විඳින, පවතින ඉහළ ජීවන වියදම අතර ඇති පරස්පරතාව රජය පැහැදිලි කරන්නේ කෙසේද?

2. 2025 පළමු මාස 9 තුළ සියයට 5ක දළ දේශීය නිෂ්පාදිතයේ - GDPහි - වර්ධනයක් වාර්තා වුවද, ඉලක්කයට වඩා අඩු මෙම දීර්ඝ කාලීන උද්ධමන තත්ත්වයෙන් පෙන්නුම් කරන්නේ අපේක්ෂිත ප්‍රමාණයට වඩා දුර්වල සමස්ත ඉල්ලුමක් - aggregate demand එකක් - පවතින නිසා යැයි රජය පිළිගන්නේද?

[ගරු රවී කරුණානායක මහතා]

3. පෙර පුරෝකථනයන් මඟින් උද්ධමනය, වේගයෙන් ඉලක්කගත මට්ටමට පැමිණෙනු ඇතැයි අපේක්ෂා කළ ද, වත්මන් දත්ත අනුව 2026 තෙවන කාර්තුව දක්වාම එය සියයට 3ට වඩා අඩුවෙන් පවතිනු ඇතැයි පෙනී යයි. මේ අනුව මධ්‍ය කාලීන උද්ධමන ප්‍රක්ෂේපණයන් සහ ආකෘතිකරණ උපකල්පන - modelling assumptions - සංශෝධනය කර තිබේද?

ගරු කථානායකතුමනි, මූල්‍ය මණ්ඩලයේ සභිකයෙක් Public Finance Committee එකට ඇවිල්ලා අපව දැනුවත් කළා, "අපට ලැබුණු තොරතුරු 2019 ඒවා, ඒ නිසා මේ තොරතුරුවල ප්‍රශ්නයක් තිබෙනවා" කියලා. මේ, ස්වාධීනව තිබෙන මහ බැංකුව- ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ වාගේ හෙළිදරව් කිරීම් අපට කළා. ස්වාධීනව තිබෙන මේ වාගේ ආයතනයක් එක්ක තමයි ඔබතුමන්ලාගේ ආණ්ඩුව මේ කටයුතු කරගෙන යන්නේ. මේ ස්වාධීනත්වය ගැන ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒකයි මම නිරන්තරයෙන් ඔබතුමන්ලා වෙනුවෙන් මේ ප්‍රශ්නය අහන්නේ. මේ රට ඉදිරියට ගෙන යන්න ඕනෑ නම්, කවුද වර්ධන වේගය ඇති කරන්නේ, කවුද රක්ෂා ඇති කරන්නේ, කවුද උද්ධමනය පාලනය කරන්නේ? ඒගොල්ලෝ ඒක විතරක් දීලා හරියන්නේ නැහැ. මේ ඔක්කෝම කරන්න ඕනෑ.

4. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම යටතේ සිදු කරන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව - fiscal consolidation - ඉල්ලුම සීමා වීමට සහ උද්ධමනය අඩු වීමට කොතරම් දුරට බලපා තිබේද? පවතින සියයට 7.75ක ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සැබෑ අගයන්ගෙන් - real terms - උචිතද? එමෙන්ම සියයට 5 උද්ධමන ඉලක්කය නැවත සමාලෝචනයට ලක් කරන්නේද?

   මම මේ ගැන මීට පෙරත් ඇහුවා. සියයට 5ක් කියන්නේ,- ඔබතුමන්ලාගේ ආණ්ඩුව අවුරුදු 10කින් ජීවන වියදම සියයට **සියයක්** වැඩි වෙනවා කියලා උපකල්පනය කරනවා. ඒක පිළිගන්න පුළුවන්ද?

5. 2023 අංක 16 දරන පනත යටතේ, පාලක මණ්ඩලය - Governing Board - සහ මූල්‍ය ප්‍රතිපත්ති මණ්ඩලය - Monetary Policy Board - අතර ඇති ව්‍යවස්ථාපිත වෙනස කුමක්ද? පාර්ලිමේන්තුවට වගකීම පැවරෙන්නේ කොතැනටද? මේ වන විට එක් එක් මණ්ඩලයට පත් කර ඇති සාමාජිකයන් කවුද? පැරණි මූල්‍ය නීති පනත යටතේ පැවැති මූල්‍ය මණ්ඩලයෙන් මෙය වෙනස් වන්නේ කෙසේද? විශේෂයෙන්ම මහා භාණ්ඩාගාර ලේකම් මහ බැංකුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් ඉවත් කිරීමට ඇති පදනම කුමක්ද?

ගරු කථානායකතුමනි, මීට පෙර අවුරුදු ගණනාවක් සාමාජිකයකු ලෙස සිටි මුදල් අමාත්‍යාංශයේ ලේකම් Monetary Policy Board එකෙන් එළියට දමනවා කියනවා. ඉතින්, මේ ස්වාධීනත්වයේ තිබෙන වටිනාකම මොකක්ද? ඔබතුමන්ලාට හරි, ජනතාව පත් කරන ජනාධිපතිට හරි අවශ්‍ය නම් මේ පොලී අනුපාතය අඩු කරන්න, ඒක මහ බැංකුවේ ස්වාධීනත්වයට විරුද්ධව කටයුතු කිරීමක්. It is a battle between fiscal and monetary policies. So, I could not understand -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please go ahead with your Question.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Okay, Hon. Speaker.

6. 2023 පනත මඟින් මධ්‍යකාලීන උද්ධමන ඉලක්කයෙන් ඔබ්බට ගිය ආර්ථික වර්ධනය, රැකියා නියුක්තිය, මූල්‍ය ස්ථාවරත්වය, විදේශ සංචිත ප්‍රමාණවත් බව හෝ ගෙවුම් ශේෂයේ තිරසාරභාවය පිළිබඳ පැහැදිලි සාර්ව ආර්ථික ඉලක්ක ලබා නොදීම තුළ නීතිමය හිඩැසක් පවතින බව රජය පිළිගන්නේද?

ඒ කියන්නේ, මේකේ කිසිසේත්ම ව්‍යවස්ථානුකූලව ඉලක්කයකුත් දමලා නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, මේ පාර්ලිමේන්තුවේ අවසර නැතුව රටේ debt standstill එකක් ඇති වෙලා තිබෙනවා කියලා. මට තවම පුදුමයි. මේ පාර්ලිමේන්තුවේ අවසරයක් නැතුව, කොහොමද මහ බැංකුවට මේ අවසරය ලබා දුන්නේ? ඉතින් ස්වාධීනත්වය කියන්නේ මේකද? මෙහෙම හැසිරෙන්න ඕනෑද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කිව්වාය කියලා?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please proceed with the Question.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

7. පාරිභෝගික මිල දර්ශකයේ විශ්වසනීයත්වය පිළිබඳව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී - Public Finance Committee එකේදී - මතු වූ කරුණු සැලකිල්ලට ගෙන, එම දර්ශකය අවසන්වරට යාවත්කාලීන කළේ කවදාද? එය තවමත් 2019 වසරේ පාරිභෝගික බර තැබීම් මත පදනම් වී තිබේද? ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන්නේ යල් පැන ගිය දත්ත මතද?

ඒ නිසා මහ බැංකුවේ වගකියන්නේ කාටද, වගවීම ඇති වන්නේ කාටද කියන ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ගිය සුමානයේ පාර්ලිමේන්තුවේදී දුන්නු උත්තරය අනුව, මේ පාර්ලිමේන්තුව බංකොලොත් බව කිව්වේ නැත්නම්, කවුද දෙවියනේ ඒක කරලා තිබෙන්නේ?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම කල් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, ගරු චමින්ද විජේසිරි මහතා.

## ගරු චමින්ද විජේසිරි මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
## மாண்புமிகு சமிந்த விஜேசிறியினது சொந்த விளக்கம்
## PERSONAL EXPLANATION BY HON. CHAMINDA WIJESIRI

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (8) යටතේ පෞද්ගලික පැහැදිලි කිරීමක් සිදු කිරීමට අවසර ඉල්ලීම.

පාර්ලිමේන්තුවේ මගේ කථාවෙන් පසු දිගින් දිගටම ආණ්ඩු පක්ෂයේ බොහෝ කථා කරන මන්ත්‍රීවරුන් "මුදල් ලබාගෙන මන්ත්‍රීකම විකිණූ" බවට නමක් සඳහන් නොකරමින් විවිධ ආරෝපිත චෝදනා සිදු කරයි. ඔවුන් එසේ චෝදනා කරන්නේ පාර්ලිමේන්තුවේ කිනම් මන්ත්‍රීවරයාටදැයි ගැටලුසහගතය.

එමෙන්ම, 2019 වර්ෂයේ දී පාර්ලිමේන්තුව තුළ මෙන්ම වෙනත් පෞද්ගලික ගැටලු හේතුවෙන් මම පාර්ලිමේන්තුවෙන් ඉවත්ව ගියෙමි. එසේ ගිය පසු පාර්ලිමේන්තුව තුළත් ඉන් පිටත සමාජය තුළත් විවිධ චෝදනා මාහට එල්ල විණි. ඒවාට පිළිතුරු දීමට මට අවස්ථාවක් නොලැබුණි. නමුත්, මට මඩ අවලාද නැඟූ පුද්ගලයන්ට මා 2025 මහ මැතිවරණය ජයග්‍රහණය කිරීම තුළින් නිසි පිළිතුරක් ලැබුණි. ඊට මා බදුල්ලේ ජනතාවට ස්තුතිවන්ත වෙමි.

පසුගිය දිනෙක මා පාර්ලිමේන්තුව තුළ කථාවක් සිදු කළ පසු අසිත නිරෝෂණ එගොඩ විතාන ගරු මන්ත්‍රීතුමා විසින් "බණ්ඩාරවෙල මහජන බැංකුවේ කෝටි 09ක මුදලක් තැන්පත් කර මන්ත්‍රීකම අළෙවි කරලා අපට උපදෙස් දෙන්න එපා" යනුවෙන් අයුතු ආරෝපණයක් සිදු කළේය. විපක්ෂය නියෝජනය කරන බණ්ඩාරවෙල එකම මන්ත්‍රීවරයා මා බැවින්, බණ්ඩාරවෙල මහජන බැංකුවේ හෝ ලංකාවේ කොහේ හෝ එවැනි මුදලක් මගේ ගිණුමක තිබෙනවා නම්, ඒ ගිණුම් අංකය, ගිණුම අයත් ශාඛාව සමඟ එතුමා පෙන්වා දිය යුතුය. එවැනි මුදලක් මන්ත්‍රීවරයෙකුගේ ගිණුමට පැමිණ තිබේ නම්, එසේ මුදල් ලැබුණු ආකාරය පිළිබඳව සෙවීමට පැමිණිල්ලක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් කළ හැකිය.

එසේ නොකොට, දිගින් දිගටම මෙම ආණ්ඩුව බහුතර බලයක් තබාගෙන, අධිකරණ, මහජන ආරක්ෂක අමාත්‍ය ධුර තබාගෙන, සොරකම්, වංචා සෙවීමෙහි විවිධ ආයතන තබාගෙන මෙවැනි බොරු අවලාද හා මඩ ප්‍රචාරය කිරීම ගැන අප්‍රසාදය පළ කරමි.

එමෙන්ම ඕනෑම මන්ත්‍රීවරයෙකු විසින් "මන්ත්‍රීකම විකිණූ බවට" නිශ්චිතව නම් කිරීම පාර්ලිමේන්තුව තුළ මෙන්ම ඉන් පිටතදීත් මාධ්‍ය සාකච්ඡාවක් තබා ප්‍රකාශ කරන ලෙසට මම අභියෝග කිරීමට කැමැත්තෙමි.

ගරු කථානායකතුමනි, ඇත්තටම පාර්ලිමේන්තුවේදී මගේ නම කියලා එහෙම නැත්නම් මාධ්‍ය තුළ හෝ ඉන් පිටත හෝ මගේ නම සඳහන් කරලා ඒ කාරණය කියන්න පුළුවන් නම් මම අභියෝග කරනවා.

ස්ථාවර නියෝග 27 (8) මම කියෙව්වා, ගරු කථානායකතුමනි. ඒකේ පැහැදිලිව තිබෙන්නේ අවසරය ගන්න මේක භාරදෙන්න කියලා. හැබැයි, මේකේ තිබෙන දේ කියවන්න කියන කාරණය සඳහන් වෙලා නැහැ. ඒකත් අපි පැහැදිලි කර ගන්න ඕනෑ. මොකද, ඔබතුමාගෙන් මේකට අවසරය ගන්න ලිඛිතව දුන්නාට පස්සේ, අපට ඒ අවසරය ලැබෙනවා. ඒක මන්ත්‍රීවරයකුගේ පෞද්ගලික පැහැදිලි කර ගැනීමක් නේ. ඒ නිසා ගරු කථානායකතුමනි, අවලාද, මඩ ඕනෑ තරම් ගහන්න. මම අභියෝග කරන්නේ, තමන්ගේ තාත්තාට හෝ තමන්ගේ අම්මාට දාව ජාතක වෙලා තිබෙනවා නම් මේ කියන කාරණා ඔප්පු කරලා පෙන්වන්න කියලායි. එහෙම නැත්නම්, අවජාතකයෙක් කියන කාරණය තමයි කියන්න තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු,-

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ප්‍රධාන වැඩ කටයුතු ආරම්භ කරන්න කලින් මේ කාරණය කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, "දිට්වා" සුළි කුණාටුවට රට මුහුණ දීලා දවස් කිහිපයක් ගතවනකොට විපක්ෂය පැත්තෙන් පාර්ලිමේන්තුවේදීත්, එළියේ මාධ්‍ය ඉස්සරහත් සුළි කුණාටුවට මුහුණ දෙන්න ආණ්ඩුව පූර්ව සූදානමක් වුණේ නැහැ කියලා මහා ඝෝෂාවක් නැඟුවා. ඒ පිළිබඳව අපි විවාදයකුත් කළා, අපේ පැත්තෙන්ම යෝජනාවක් ඉදිරිපත් කරලා. ඊට පස්සේ විපක්ෂ නායකතුමාත් ඇතුළු මන්ත්‍රීවරු 29දෙනෙක් අත්සන් කරලා ජනවාරි 21වන දා යෝජනාවක් භාර දීලා තිබෙනවා, "දිට්වා" සුළි කුණාටුව පිළිබඳ විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා. ආණ්ඩු පක්ෂ සංවිධායක කාර්යාලය විසින් ඒ විශේෂ කාරක සභාවේ අපේ සාමාජිකයන්ගේ නම් ටික පෙබරවාරි 05වැනි දා මහ ලේකම්තුමියට යවලා තිබෙනවා. දැන් මාසයක් ගත වෙලා තිබෙනවා. මම අහන්න කැමැතියි, "දිට්වා" සුළි කුණාටුව සම්බන්ධයෙන් යෝජනා කළ විශේෂ කාරක සභාව පිහිටුවීමට ප්‍රමාද වෙන්නේ ඇයි කියලා. අද මාර්තු 04වැනි දා. මේ ප්‍රමාදයට හේතුවෙලා තිබෙන්නේ මොකක්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපට ඒක හෙට announce කරන්න පුළුවන්. දැන් තමයි නම් ටික ලැබුණේ කියලා ලේකම්තුමිය කියන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
කාගෙන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂයෙන්. ඊයේ හවස් වෙලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒ නම් ටික එව්වේ කවදාද, ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊයේ හවස් වරුවේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඊයේ හවස් වරුවේ තමයි විපක්ෂයේ නම් ටික එවලා තිබෙන්නේ. මහා සෝෂාවක් නගනවා යම් යම් ප්‍රශ්නවලට. ඊට පස්සේ විශේෂ කාරක සභා පත් කරන්න කියලා ඉල්ලනවා. හැබැයි, ඒ කාරක සභාවලට නම් එවන්නේ නැහැ, නියමිත කාලයට. එවැනි විශේෂ කාරක සභාවක් යෝජනා කළා නම්, අපටත් අවශ්‍යයි ඒ සඳහා සාමාජිකයන් පත් කරලා ඒ කටයුතු ඉස්සරහට කරගෙන යන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
විපක්ෂයේ නම් ටික යවලා ඉවරයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊයේ හවස් වරුවේ තමයි එවලා තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මේ සතියේ ඒ විශේෂ කාරක සභාව කැඳවන්න අපි සූදානම්, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක අපි හෙට දින ප්‍රකාශයට පත් කරන්නම්.

ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත දෙවන වර කියවීම ඉදිරිපත් කිරීම, කම්කරු අමාත්‍ය ගරු අනිල් ජයන්ත මැතිතුමා.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Anil Jayantha, please move the Second Reading of the Bill.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
Thank you, Sir.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, what is your point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විශේෂ කාරක සභාවකට නම් එවීම ගැන කථා කළා. විශේෂයෙන්ම අපි කරපු යෝජනාව තමයි, ඒ කාරක සභාවේ වැඩ කටයුතු නිවැරදිව ක්‍රියාත්මක වන්නට නම් ඒ කාරක සභාවේ සභාපතිකම සහ බහුතර සංයුතිය විපක්ෂයට ලබා දීම වැදගත් කියන එක. එතකොට "දිට්වා" සුළි කුණාටුවේ සත්‍ය යථාර්ථය සොයා ගන්න පුළුවන්.

ඊළඟ කාරණාව මෙයයි. මේ කාරක සභා හරහා සිදු වන ක්‍රියාවලිය ගැන කථා කරනකොට මම එතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමන්ලා පළාත් සභා මැතිවරණය පවත්වන්නේ නැතිව, පළාත් සභා මැතිවරණය කල් දමන්නට කාරක සභා ක්‍රියාත්මක කරන්න උනන්දු වෙන්නේ ඇයි කියලා. "දිට්වා" සුළි කුණාටුව සම්බන්ධයෙන් වූ විශේෂ කාරක සභාවේ සභාපතිකම ප්‍රමුඛ බහුතරය ඇයි විපක්ෂයට නොදෙන්නේ?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාරක සභාවක් පත් කරන්නේත්, මන්ත්‍රී සංඛ්‍යාව තීන්දු කරන්නේත් - ආණ්ඩු පක්ෂයෙන් කොච්චරක්ද, විපක්ෂයෙන් කොච්චරක්ද කියන එක - ස්ථාවර නියෝග අනුව තමයි. ඒ ස්ථාවර නියෝගවලට පටහැනිව කටයුතු කරන්න බැහැ. ඒ අනුව අපි අපේ නම් ප්‍රමාණය යවලා තිබෙනවා. විපක්ෂයේ නම් ප්‍රමාණය යවලා තිබෙනවා. බහුතරයේ කැමැත්ත මත සභාපතිවරයෙකු පත් කරනවා. ඒක තමයි ක්‍රමය. මම හිතන හැටියට ඒක දැනගෙන තමයි විපක්ෂය විශේෂ කාරක සභාවක් ඉල්ලන්න ඇත්තේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Anil Jayantha, you may move the Second Reading of the Bill, please. - *[Interruption.]* Hon. Leader of the Opposition, there is no debate on this. - [Interruption.] Hon. (Dr.) Anil Jayantha . - [*Interruption]* We are already late. Let him move the Second Reading of the Bill before lunch.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, there is no debate on it. We are already late.- *[Interruption.]*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
අද දින න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල විෂය අංක 1, ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත දෙවන වර කියැවීම - *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.- *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the House, you can take it up later. - [*Interruption.]* The Hon. Minister had explained himself. - *[Interruption.]* He had already explained himself.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Speaker, when the Hon. Leader of the Opposition wants to speak, you must respect that.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, if you want to speak, you can go to your seat, please. *[Interruption.]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Deputy Speaker, I am the Leader of the Opposition. Please give me that courtesy.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
It is a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I will give you a minute. Hon. Leader of the Opposition, you may raise it.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අහපු ප්‍රශ්නයට පැහැදිලි උත්තරයක් ලැබුණේ නැහැ. එතුමා කිව්වා, ස්ථාවර නියෝග අනුවයි කටයුතු කරන්නේ කියලා. එතුමන්ලාට ඕනෑ ඕනෑ වෙලාවට ස්ථාවර නියෝග suspend කරලා, එතුමන්ලාට ඕනෑ ඕනෑ දේ කරනවා. මෙතැනදීත් කාරක සභාවේ බහුතරයයි, සභාපතිකමයි විපක්ෂයට දෙන්න පුළුවන්, ස්ථාවර නියෝග අත්හිටුවලා. රජයට ඕනෑ ඕනෑ වෙලාවට ස්ථාවර නියෝග අත්හිටුවන්නයි, රජයට වාසිදායක වන විධියට ස්ථාවර නියෝග ක්‍රියාත්මක කරන්නයි කටයුතු කරනවා. ඇත්ත වශයෙන්ම මේ ක්‍රියාත්මක වෙන්නේ ඒකපාක්ෂික රාජ්‍යත්වයක් ගොඩනඟන්න; මේ හදන්නේ one-party State එකක් ගොඩනඟන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, you have made your point.

Hon. (Dr.) Anil Jayantha, I am sorry. You may move the Second Reading of the Bill, please.

## ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත
## நுண்நிதி மற்றும் கடன் ஒழுங்குபடுத்தும் அதிகாரசபை சட்டமூலம்
## MICROFINANCE AND CREDIT REGULATORY AUTHORITY BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ.භා. 12.17]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පතෙහි ප්‍රධානම අරමුණ බවට පත් වෙන්නේ, මේ අධිකාරිය පිහිටුවීමයි. ඒ වාගේම මුදල් ණයට දීමේ ව්‍යාපාරය, ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර නියාමනය කිරීම, ක්ෂුද්‍රමූල්‍ය සහ ණය දීමේ ක්‍රියාකාරිත්වයට සම්බන්ධ වන ගනුදෙනුකරුවන්ට ආරක්ෂාව සැපයීම සඳහාත්, ඒ වාගේම දැනට පවතින 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත ඉවත් කිරීම සඳහාත් වන විධිවිධාන සැලැස්වීමත් මෙහි අරමුණු වෙනවා. මෙහි පසුබිම විශ්ලේෂණය කළාම, ක්ෂුද්‍ර මූල්‍ය සම්බන්ධයෙන් මේ සමාජයේ විශාල කථාවක් නිර්මාණයක් වුණු බව අපට පැහැදිලි වෙනවා. ඒ වාගේම ණය දීමේ ක්‍රියාවලිය -ක්ෂුද්‍ර මූල්‍ය ණය- ගම දක්වා පැතිරීමේදී ඇති වුණු ගැටලු, මූල්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ ගැටලු, සමාජයීය ගැටලු සහ සංස්කෘතික ගැටලු ගණනාවක් තිබෙනවා වාගේම, ඒවා නියාමනය කිරීම සඳහා අලුත් පනතක් අවශ්‍යයි කියන සාකච්ඡාව මතු වුණා.

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත මඟින් විවිධ උත්සාහයන් ගත්තත්, එහි තිබුණු ප්‍රතිපාදන ඇතුළේ ක්ෂුද්‍ර මූල්‍ය නියාමනය කිරීමටත්, විධිමත්භාවයක් ගෙන ඒමටත් අසමත් වෙලා තිබෙන

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

බව අපි දන්නවා. ණය දෙන ක්‍රම ක්ෂුද්‍ර මූල්‍ය සහ වෙනත් නම්වලින්, online, ඒ වාගේම mobile phonesවල applications මඟින් විශාල පරාසයක් තුළ විසිරිලා ගිහින් තිබෙන ආකාරය දැනටමත් විවිධ වූ සංඛ්‍යාලේඛන මඟින් ඉදිරිපත් කරනවා. එහෙත් ක්ෂුද්‍ර මූල්‍ය පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වෙලා තිබෙන්නේ සමාගම් 4ක් විතරයි. ඒ නිසා නව තත්ත්වයක් යටතේ නව පනතක ඇති අවශ්‍යතාව ගැන අපි සාකච්ඡා කරලා තිබෙනවා. මෙහි ගමන් මාර්ගය විශ්ලේෂණය කරලා බැලුවාම, 2019 අගෝස්තු මාසයේ ණය නියාමන අධිකාරියක් පිහිටුවීමේ අවශ්‍යතාව මතු කරලා අමාත්‍ය මණ්ඩලය අවසර දීලා තිබෙනවා. නමුත්, එය නිසි ආකාරයෙන් ඉදිරියට ඇවිල්ලා නැහැ. ඉන් අනතුරුව 2021 මාර්තු මාසයේදීත් ණය නියාමන අධිකාරිය බලාත්මක කිරීම සඳහා පනත් කෙටුම්පතකට අනුමැතිය ලැබී තිබෙනවා. පසුව 2023 ඔක්තෝබර් මාසයේත් මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලැබී තිබෙනවා. ඒ අනුව 2024 ජනවාරි මාසයේ මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ වුණත් ඊට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් වීම නිසා 2024 ජනවාරි මාසයේදී ඒ සඳහා ඉඩ ලබා දෙමින්, එම පෙත්සම්වලින් ඉදිරිපත් කළ කරුණු කාරණා සැලකිල්ලට භාජන කරලා ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මඟින් ලබා දුන් නිගමන ඉදිරිපත් කරලා තිබෙනවා. එම නිර්ණායක මත ඉදිරියට අරගෙන යන්න බැරි නිසා 2024 අප්‍රේල් මාසයේදී අර කෙටුම්පත ඉවත් කරගෙන තිබෙනවා. ඒ ඉවත් කර ගැනීම් සිදු කළාට, ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්බන්ධයෙන් නියාමන කටයුත්ත සිද්ධ වෙන්නේ නැති නිසා 2025 අගෝස්තු මාසයේදී ක්ෂුද්‍ර මූල්‍ය පනත් කෙටුම්පතක් නැවත සකස් කිරීම සඳහා වැඩ කටයුතු සූදානම් කරනවා. ඒ සඳහා 2025 සැප්තැම්බර් මාසයේදී අනුමැතිය ලැබීමෙන් පසුව එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. එම පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා නවදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කරනවා. එහි, ආයතන නියෝජනය කරන සහ ක්ෂුද්‍ර මූල්‍ය සම්බන්ධයෙන් තිබෙන විවිධ සංවිධානවල නියෝජිතයන් ඉන්නවා. මම ඒ නම් ලැයිස්තුව කියවන්න කැමැතියි: Mr. Sanjeewa Wimala Gunarathna, Mrs. K. K. S. L.P. Gunawardhana, Mr. Wijayalath, Mrs. W.M. Priyadarshani, Mr. T.A.D. Wijekoon, Ms. M. Renuka Badrakanthi, Ms. Amali Wagedara, Mr. K. Suneth Aruna Kumara, Mr. Aruna Athapaththu කියන කණ්ඩායම ඒකට සම්බන්ධ වෙලා තිබෙනවා.

ඊළඟට, මෙයට තවදුරටත් සංශෝධන ගෙන ආ යුතුද කියලා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන් නොවැම්බර් මාසයේදී සලකා බලනවා. එම සාකච්ඡාවේ ප්‍රතිඵල විධියට ඉදිරිපත් කරන ලද සංශෝධන ප්‍රමාණයක් නැවතත් නීතිපති දෙපාර්තමේන්තුවට යවලා, යම් ප්‍රමාණයක් සංශෝධන ලෙස එකතු කරන්න නීතිපති දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා දීලා තිබෙනවා. තවත් ප්‍රමාණයක් සංශෝධන වශයෙන් එකතු කරන්න නොහැකි බව ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් ඉදිරිපත් වූ කරුණු සලකා බලමින්, ඒ තත්ත්වයන් මත තමයි මේ ඉදිරිපත් කිරීම් කරලා තිබෙන්නේ. තවදුරටත් ඇතුළත් නොකළ කරුණු තිබෙනවා නම් ඉදිරියේදී එම අධිකාරිය බලගන්වනකොට, රෙගුලාසි පනවනකොට ඒ කටයුතු සිද්ධ කිරීමේ හැකියාව තිබෙනවා.

විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී තිබුණු ගැටලු වුණේ ක්ෂුද්‍ර මූල්‍ය නියාමනය කිරීම, ණය දීම, ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම කියන කාරණා 2016 පනත අනුව විවිධ විධියට පැතිරිලා තිබීමයි. මහ බැංකුවට කොටසක් තිබුණා, තවත් කොටසක් ස්වේච්ඡා සංවිධානවලට තිබුණා. මේ සියල්ල එක අධිකාරියක් යටතට, එක නියාමන අධිකාරියක් යටතට ගෙන ඒම තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ අනුව ප්‍රධාන කොටස් ගණනාවක් මේ අලුත් පනත් කෙටුම්පතේ තිබෙනවා. එකක්, ක්ෂුද්‍ර මූල්‍ය ණය නියාමන අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය. එම අධිකාරියට සාමාජිකයන් හත්දෙනෙකු ඇතුළත් කරලා තිබෙනවා. අමාත්‍යවරයා විසින් පත් කරන සාමාජිකයන් වාගේම, නිල බලයෙන් පත් වෙන කණ්ඩායමකුත් ඒකේ ඉන්නවා. මේ අධිකාරියේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීමට අධ්‍යක්ෂ ජෙනරාල්වරයෙක් පත් කර ගැනීම කියන කාරණයටත් මේ කෙටුම්පත හරහා ප්‍රතිපාදන සලසා තිබෙනවා. මෙතැනදී ණය දීමේ ව්‍යාපාර සහ ක්ෂුද්‍ර මූල්‍ය ණය කියන කාරණා දෙකම ආවරණය වෙනවා. කවුද ණය දෙන්නේ, කවුද ණය ගන්නේ, ඒ වාගේම ඒ ණය ලබාදීමට බලපත්‍රය ලබා ගන්නේ කොහොමද, ඒ බලපත්‍රලාභියා පරීක්ෂා කරන්නේ කොහොමද, ඒ වාගේම ගනුදෙනුකරුවන් ආරක්ෂා කර ගන්නේ කොහොමද, ඒ ණය දීමේ ක්‍රියාවලිය ඇතුළතදී යම් වැරදි සිදු වෙනවා නම්, ගැටලු සිද්ධ වෙනවා නම් ඒවා විමර්ශනය කරන්නේ කොහොමද, ඒ විමර්ශන ඇතුළතදී අනාවරණය වන වැරදි සඳහා අදාළ දණ්ඩනයන්, දඩ මුදල් නියම කිරීම වැනි කාරණා මේ කෙටුම්පතට ඇතුළත් වෙනවා. සාරාංශයක් විධියට කිව්වොත්, මේ ක්‍රියාවලිය කඩලා, වැරදි ආකාරයට ණය ලබා දීමක් කරලා වැරදිකරු බවට පත් වුණොත්, මේ නියාමන ක්‍රියාවලිය ඇතුළේ උපරිමය රුපියල් මිලියන 5ක් ලෙස දඩ නියම කිරීමකටත්, වසර 5ක සිර දඬුවම් නියම කිරීමකටත් යටත් කළ හැකියි. මේ අධිකාරිය ක්‍රියාත්මක කරගෙන යාමේදී ඔවුන්ගේ ස්වාධීනත්වය සහ වැඩ කටයුතු පහසු කර ගැනීම සඳහා අවශ්‍ය අරමුදලක් පිහිටුවීම සඳහාත් මෙහි විධිවිධාන ඇතුළත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණාවලට අදාළ පසුබිම සැලකිල්ලට භාජන කළොත් -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition, what is it?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වැදගත් මාතෘකා රැසක් පිළිබඳව සාකච්ඡා වුණු නිසා, ඒ අහිමි වුණු වේලාව lunch break එකෙන් ලබාගෙන lunch break එක තුළත් ගරු කථික මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියලාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Anil Jayantha, you may continue.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ පනත ගොඩක්ම වැදගත් වන්නේ ඇයි කියන කාරණය සැලකිල්ලට භාජන කරද්දී, මෙහි පසුබිම ටිකක් විපරම් කර බැලීම ඉතාම වැදගත් වනවා. *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දිවා විවේකයෙන් තොරව විවාදය පවත්වාගෙන යමු.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, I would like to get the approval of the Government side also to your proposal.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Harshana Nanayakkara, I see you are on your feet.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Hon. Deputy Speaker, I do not see any reason to change the schedule.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. Hon. (Dr.) Anil Jayantha, you may continue.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනතින් ඒ නියාමන කටයුතුවලට පහසුකම් සැපයීමත්, ඒ අනුව ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය කාර්යක්ෂම වන්නේ කොහොමද, ආර්ථිකයට සම්බන්ධ වන්නේ කොහොමද කියන කාරණය වාගේම මෙහි පසුබිම විපරම් කර බැලීමත් ඉතාම වැදගත් වනවා. වසර ගණනාවක් පුරා පැවත ගෙන ආ ග්‍රාමීය මට්ටමින්, ක්ෂුද්‍ර මට්ටමින් ණය ලබා දීමේ ක්‍රමවේදය, අවසානයේදී ආක්‍රමණශීලී ණය ලබා දෙන තත්ත්වයකට පරිවර්තනය වෙලා තිබීමෙන් බොහෝ ගැටලු සහගත තත්ත්වයක් වුණා. මේ සඳහා ලියැවුණු එක්තරා පර්යේෂණ පත්‍රිකාවක් තිබෙනවා. Prof. Chandana Alawattage, Prof. Cameron Graham and Prof. Danture Wickramasinghe කියන professorsලා තුන්දෙනා ලංකාව පදනම් කරගෙන එය ලියා තිබෙනවා. එහි නම තමයි, "Microaccountability and iopolitics: Microfinance in a Sri Lankan village". එය "Accounting, Organizations and Society" කියන journal එක 2019දී ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. මේ පර්යේෂණ පත්‍රිකාවෙන් පෙන්නුම් කරනවා, විශේෂයෙන්ම ලංකාව ඇතුළේ ග්‍රාමීය ප්‍රදේශවලට යනකොට, මිනිසුන් අතර තිබෙන අන්තර් සම්බන්ධතා, සහජීවනය ඇතුළේ එකිනෙකාට උදවු කර ගැනීමේ සම්බන්ධතාව වැදගත් ලක්ෂණයක් විධියට. ඒක ඒගොල්ලන් හඳුන්වනවා, convivial relationship එකක් කියලා. ඒ, සුහදත්වය, මිත්‍රත්වය, එකිනෙකාට උදවු කර ගැනීමේ තත්ත්වය. මෙන්න මේ සුහදත්වය මත ණය ලබා දීමේ ක්‍රමවේදය, උදවු-පදවු කර ගැනීමේ ක්‍රමවේදය, ඉන් එළියට ගිහිල්ලා කණ්ඩායම් ණය දෙන ක්‍රමවේදයක් බවට පරිවර්තනය කර ගන්නවා. මේ convivial relationship එක කණ්ඩායම් පොකුරු ණය දීමේ ක්‍රමවේදයක් බවට පරිවර්තනය කර ගන්නවා.

ඒ වාගේම biopolitics කියන කොටසත් මෙහිදී වැදගත් වනවා. විශේෂයෙන්ම මේ ණය උගුලට හසු වුණාම, මේ ආක්‍රමණශීලී ණය ලබා ගත්තාම සිදු වන දේ තමයි, ඒ කණ්ඩායම් හරහා තමන් ලබා ගත් ණය ආපසු ගෙවන ක්‍රමයක් සොයන්නට වීම. විශේෂයෙන්ම නියාමනයකින් තොරව ණය ලබා දීමේ ආයතන විසින් ප්‍රධාන වශයෙන් අනුගමනය කරන්නේ, ඔවුන් ලබා දෙන ණය මුදල ආපසු අය කර ගන්නේ කොහොමද කියන කාරණය. ඒ නිසා ගම ඇතුළේ තිබුණු සම්බන්ධතා, ඔවුන්ගේ එදිනෙදා ජීවිත පසෙක තබලා, උපයා ගන්නා සෑම මුදලක්ම මේ ණය ආපසු ගෙවීම සඳහා වැය කරන්න ඔවුන්ට සිද්ධ වනවා. ඒ නිසාම තමයි, අපි වඩා විධිමත් ක්‍රමවේදයකට මේ ණය කළමනාකරණය ඉදිරියට ගෙන යා යුතු වන්නේ.

ඒ වාගේම මේ හා සම්බන්ධව පැන නැඟිලා තිබෙන ගැටලු කිහිපයක් පිළිබඳවත් සාකච්ඡා කරන්න මම කැමැතියි. විශේෂයෙන්ම මේ ණය ලබා දීමේ ක්‍රියාවලිය ඇතුළේ පොලී අය කිරීම ඉතාම අසාධාරණ මට්ටම්වලට යනවා. ඒ සඳහා ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතාවත් බලපානවා. මේ ආක්‍රමණශීලී ණය ලබා දීම ඇතුළේ සමහර පොලී අය කිරීම් ගත්තාම, සියයට 300කට වැඩි පොලී අනුපාතයක් තිබෙනවා. සරලව ගත්තොත්, මේ ගම්වල ඉන්න ජනතාව දන්නවා, රුපියල් 5,000 වාගේ සුළු ණය ප්‍රමාණ තිබෙනවා, ඒක රුපියල් 100 බැගින් දින 65ක් ඇතුළතදී අය කළාම, රුපියල් 6,500ක් ගෙවන්න සිදු වන බව. මතුපිටින් බැලුවාම, රුපියල් 5,000ක් ණය දීලා රුපියල් 6,500ක් අය කර ගන්නවා. එතකොට පොලිය විධියට පෙනෙන්නේ රුපියල් 1,500යි, එහෙම නැත්නම් සියයට 30යි. නමුත් මේක වාර්ෂිකව ගණනය කරලා බැලුවාම පෙනෙනවා, සියයට 300කටත් වැඩි පොලී අනුපාතයක් මේ සඳහා අය කරන බව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Anil Jayantha, you have two more minutes.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. Are we not going beyond the lunch break?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We are suspending in two minutes, Hon. Leader of the Opposition. - *[Interruption.]*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ඒ වාගේම මේ ණය ලබා දීමෙන් ඇති වෙච්ච පරිසර, සමාජ ප්‍රශ්න නිසා, බොහෝ අය දිවි හානි කරගත් අවස්ථා ද තිබෙනවා. එවැනි තත්ත්වයන්ද මේ නිසා නිර්මාණය වෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, the Debate will go on only for two extra minutes. - *[Interruption.]* It has precedent; even before, when even speakers from the Opposition were speaking, I had allowed them to speak for two minutes beyond the time to suspend just to permit them to complete their speeches. - *[Interruption.]* I have given the chance to you all also; I have given it equally to both sides of the House. So, there is a precedent for this.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ඒ නිසා මේ ණය නියාමනය කිරීම ඇතුළේ ඊට අදාළ ප්‍රතිපාදන අපි සකස් කර තිබෙනවා. ප්‍රජා මූල ආකාරයට ණය ලබා දෙන ආයතනවලට කිසිදු ගැටලුවක් ඇති නොවී, ඔවුන්ගේ ඒ ගම පදනම් කර ගත් ණය ලබා දීමේ ක්‍රියාවලියට හානියක් නොවී, ඉදිරියේදී ඒ සඳහා රෙගුලාසි පැනවීමත්, අදාළ සංශෝධන ගෙන ඒමත් අපි නිසි පරිදි සිද්ධ කරනවා. ඒ නිසා ප්‍රජා මූල ණය ලබා දීමේ ක්‍රමවේදය ක්ෂුද්‍ර ණය ලබා දීමේ ක්‍රමවේදයෙන් අනිවාර්යයෙන්ම වෙනස් කරලා ඔවුන්ට අදාළ සහනය අපි ලබා දෙනවා.

ඒ වාගේම මෙම නියාමනය කිරීමේ වැඩසටහනට සමගාමීව ඔවුන්ව මේ ණයගැතිභාවයෙන් මුදා ගැනීමට, ඔවුන්ව සවිබල ගැන්වීමට මුදල් අමාත්‍යාංශය විධියට ණය ලබා දීමේ වැඩ පිළිවෙළ ගණනාවක් අලුතින් යෝජනා කර තිබෙනවා. ඒ සඳහා 2026 වසරට රුපියල් බිලියන 95.6ක් වෙන් වෙලා තිබෙනවා. ඒ අනුව ප්‍රතිමූල්‍ය ණය ලබා දීමේ යෝජනා ක්‍රම විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම පොලී සහනාධාර ලබා දෙන ණය යෝජනා ක්‍රම විශාල ප්‍රමාණයක් තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා, ඒ ණය යෝජනා ක්‍රම "ප්‍රජා ශක්ති" ජාතික වැඩසටහන හරහා සහ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ඉදිරිපත් කරන ප්‍රජා සංවර්ධන සභා හරහා ක්‍රියාත්මක කරමින් මේ නියාමන අධිකාරිය මඟින් පැනවෙන බලතලත්, ආණ්ඩුවේ වැඩ පිළිවෙළත් ඉතා සාර්ථකව යොදා ගනිමින් ඉදිරියේදී ග්‍රාමීය ණයගැතිභාවය තුරන් කිරීමටත්, ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කිරීමටත්.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Kabir Hashim. You have nine minutes.

[අ.භා. 1.00]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

Hon. Deputy Speaker, අපි අද ඉතා වැදගත්, කාලෝචිත පනත් කෙටුම්පතක් ගැන විවාද කරනවා. නමුත්, රජය විසින් මේ පනත් කෙටුම්පතට අදාළ සංශෝධන ඉදිරිපත් කරනවාය කිව්වාට තවම අපි කාටවත් එම සංශෝධන දීලා නැති එක ගැන මට කනගාටුයි. එම නිසා ඒ සංශෝධන නැතුවයි අපි මේ ගැන කථා කරන්නේ.

ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳව කථා කරද්දී, මේ සම්බන්ධයෙන් වන ඈත ඉතිහාසයක් තිබෙන බවත් මා සඳහන් කරන්න කැමැතියි. 1900 ගණන්වල සමුපකාර ණය සමිති - credit co-operatives - මේ රටේ ආරම්භ කළා. 1977 වර්ෂයෙන් පසුව එක්සත් ජාතික පක්ෂ රජය මේ ක්ෂේත්‍රයට විශාල දායකත්වයක් ලබා දුන්නා. හිටපු ජනාධිපති දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් 1980 ගණන්වල "ජන සවිය" සංකල්පය ආරම්භ කළා. ඒක පදනම් කළේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්ෂේත්‍රය වර්ධනය කිරීම සඳහායි. 1990 වර්ෂයේදී එක්සත් ජාතික පක්ෂ රජය යටතේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය ව්‍යාප්ත කළා, මේ රට තුළ මේ ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන හරහා විශේෂයෙන්ම අඩු ආදායම්ලාභීන්ට, ස්වේච්ඡා සංවිධානවලට ශක්තියක් ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Kabir Hashim, I think that Amendment is on your table in all three languages.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

But, I do not see it on my table, Sir. I had to fish for it. It should have been made prominent. The Government should have said it clearly, that these are the Amendments. Sir, since I have very little time, I am not going to get caught in that.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ඊළඟට, 2016 වසරේදී යහ පාලන රජය යටතේ මේ ක්ෂේත්‍රය සම්බන්ධව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. හැබැයි,

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයක් මත ඒ කටයුත්ත නැවතුණා. නැවත 2023 ඔක්තෝබර් 27වැනි දා රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමාගේ රජය යටතේ ගැසට් කිරීමක් මඟින් ජනවාරි මාසයේ 09වැනි දා ක්ෂුද්‍ර මූල්‍ය නියාමනයට අදාළ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙනාවා. හැබැයි, ඒ වෙලාවේදී රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආණ්ඩුව කොටස්කරුවන්ගේ අදහස් විමසුවේ නැහැ; හරියාකාරව පුළුල් සමාජ සංවාදයක් සිදු කළේ නැහැ. ඒ නිසා සුප්‍රීම් උසාවියට පෙත්සම් 7ක් ඉදිරිපත් වුණා. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒක නැවැත්වුවා.

ඔබතුමන්ලා අද මේ පනත් කෙටුම්පත ගෙනැවිත් තිබෙනවා. මේ පනත් කෙටුම්පත ගෙන ඒම කාලෝචිත වුණාට අපි මෙහි අඩුපාඩු කිහිපයක් දකිනවා. අපි උදාහරණ කිහිපයක් ගනිමු. ශ්‍රී ලංකා ආර්ථිකයේ අවිධිමත් අංශය ගත්තාම, ඒ අවිධිමත් අංශය තුළ තමයි අද වනවිට ශ්‍රම බලකායෙන් සියයට 65ක්ම නියැළෙන්නේ. ඒ කියන්නේ, ලක්ෂ 55ක්. අපේ රටේ දළ දේශීය නිෂ්පාදනයට සියයට 32-40ත් අතර දායකත්වයක් ලබා දෙන්නේ මේ අවිධිමත් නැත්නම් අසංවිධානාත්මක අංශයෙනුයි.

ශ්‍රී ලාංකීය ආර්ථිකයේ ජීවනාලිය බඳු වූ මේ අසංවිධානාත්මක ක්ෂේත්‍රය නියෝජනය කරන කණ්ඩායම කවුද? ඒගොල්ලන් තමයි වීදි වෙළෙන්දෝ, කුඩා පෙට්ටි කඩ හිමියන්, අත්කරත්ත මඟින් වෙළෙඳාම් කරන අය, ගෘහස්ථ කර්මාන්ත කරන අය, දෛනික කුලී කම්කරුවන්, සුළු පරිමාණ ගොවීන්, ධීවරයන්, පශු සම්පත් ක්ෂේත්‍රයේ ඉන්න අය, ත්‍රී වීලර් හිමියන්, මේසන් බාස්ලා, වඩු බාස්ලා සහ ස්වයං රැකියා කරන අය. මේ පනත සම්මත වීම තුළින් සෙතක් ඇති වෙන්න ඕනෑ මෙන්න මේ අයටයි. ඒ සඳහා ඉලක්ක විය යුත්තේ මේ අයයි. මේ අයගෙන් බහුතරයක් ගියවර ඡන්දය දීලා ඇත්තේත් මේ ආණ්ඩුවට කියලා මම හිතනවා. අද මේ ප්‍රජාව පදනම් වූ ප්‍රජා මූල ස්වේච්ඡා සංවිධාන මේ පනත ගෙනෙන එක ගැන සතුටු වෙන්න ඕනෑ මොහොතක් පවතින්නේ. හැබැයි, ඒ කිසි කෙනෙක් සතුටු වෙන්නේ නැහැ. ඒ ප්‍රජා මූල සංවිධානවල ඉන්න, ස්වේච්ඡා සංවිධානවල ඉන්න අය මේ වනවිට කලබල වෙලා ඉන්නවා. ඇයි, ඒ? ඒ අයට සාධාරණ සැකයක් ඇති වෙලා තිබෙනවා. මොකද, මේ ආණ්ඩුව මෙතෙක් කාලයක් හාල් මාෆියාවට යටත් වුණු ආකාරය, ක්‍රිකට් මාෆියාවට යටත් වුණු ආකාරය, ඒ වාගේම බලශක්ති මාෆියාවට යටත් වුණු ආකාරය පිළිබඳව දකිනකොට, ඒ ප්‍රජා මූල සංවිධානවල ඉන්න අයට භයක් තිබෙනවා, මේ ආණ්ඩුව මේ පනත සම්මත කිරීම හරහා බැංකු මාෆියාවට මේ ක්ෂුද්‍ර ණය ක්ෂේත්‍රයත් යටත් කරන්න යනවාද කියලා; බැංකු මාෆියාවට මේක දෙන්න යනවාද කියලා.

ඒ නිසා මේ යෝජිත සංශෝධනය තුළට අපි සංශෝධනයක් ගෙනෙනවා. විපක්ෂය වෙනුවෙන් අපි ඒ සංශෝධනය ඉදිරිපත් කරනවා. මම බැලුවේ නැහැ, රජය දීලා තිබෙන සංශෝධන. ලියාපදිංචි වූ බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන මේ පනත තුළ නියාමනයට ඇතුළත් වෙලා නැති බවයි අපට පෙනී යන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 2023දී බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන ඒ පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තිබුණේ නැති නිසා ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරලා, ශ්‍රේෂ්ඨාධිකරණය ඒක නැවැත්වුවා. ඒ වාගේම බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන මේ පනත් කෙටුම්පතේ නියාමනයට ඇතුළත් කරගෙන ගෙනෙන්න කියලා කිව්වා. මේ පනත් කෙටුම්පතේ 3වැනි වගන්තිය යටතේ අධිකාරියේ පරමාර්ථ දක්වා තිබෙනවා. එහි (ඇ) යටතේ කියනවා, ලියාපදිංචි සමුපකාර සමිති, සමෘද්ධි ප්‍රජා මූල බැංකු ආදි වශයෙන් මහ බැංකුවත් එක්ක සම්බන්ධීකරණයක් කරනවා කියලා. හැබැයි, කොතැනකවත් සඳහන්වම බැංකු, ඒ කියන්නේ ලොකු finance companies, leasing companies මෙහිදී නියාමනය වෙන්නේ නැහැ. ඒගොල්ලන්ට ක්ෂුද්‍ර මූල්‍ය ණය ඕනෑ විධියට දෙන්න පුළුවන්, ඕනෑ පොලියක් අය කරන්න පුළුවන් විධියට තමයි මේ පනත සකස් කරලා තිබෙන්නේ. අපි ඒකට තරයේ විරුද්ධයි. අපි කියන්නේ, බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන මේ පනතින් නියාමනය විය යුතුයි කියන ආකාරයට ඒ සංශෝධනය ගෙනෙන්න කියන එකයි. මේ ආණ්ඩුව උසාවියටත් වංචාවක් දාලා තිබෙනවා වාගේ තමයි අපට පෙනී යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේකට අදාළව කරුණු කාරණා කියන්නම්. එහිදී මම වැදගත්ම කරුණක් කියන්නම්. ශ්‍රේෂ්ඨාධිකරණය සිය නඩු තීන්දුවට පාවිච්චි කළ එක කාරණාවක් තමයි, 2019 මහ බැංකු වාර්තාව. ඒ මහ බැංකු වාර්තාවේ කියනවා, ක්ෂුද්‍ර මූල්‍ය ණය පද්ධතිය තුළ ප්‍රශ්න ඇති වීමට ප්‍රධාන හේතුව වෙන්නේ බහුවිධ ණය දීම සහ ණයගැති වීම කියලා. ඒක ගොඩක්ම වෙන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් කියාත් එහි කියා තිබෙනවා. නමුත්, අපි ඒක පිළිගන්නේ නැහැ. ඒ අර්ථ කථනය වැරදියි. බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන, ලියාපදිංචි මහා පරිමාණ මූල්‍ය ආයතන ඕනෑ තරම් අවස්ථාවල අඩු ආදායම්ලාභීන්ට, අවිධිමත් අංශයට, පුංචි ව්‍යවසායකයන්ට බහුවිධ ණය ලබා දීලා ඔවුන්ව අධික ණයගැතිභාවයට ලක් කරපු හැටි අපට සංඛ්‍යාලේඛන, දත්ත මත ඔප්පු කරන්න පුළුවන්. ඒ නිසා ආණ්ඩුව බැංකු මාෆියාව රකිනවාද කියන සැකය මේ ගන්න ක්‍රියාමාර්ගවලින් අපට දැන් තවදුරටත් තහවුරු වෙනවා. ලියාපදිංචි වූ, ඒ කියන්නේ බැංකු සහ බැංකු නොවන ආයතන ගත්තාම ඔවුන්ට ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය තුළ ලොකු සම්බන්ධකමක් තිබෙනවා. ඒගොල්ලන් මේ ක්ෂේත්‍රය තුළ දැනට වැඩ කරනවා. ඒක හොඳයි. උදාහරණයක් වශයෙන් ගත්තොත්, LOLC Finance PLC එකේ 2024/2025 වාර්ෂික වාර්තාව අනුව ඒගොල්ලන් මාර්තු 25ට ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්ෂේත්‍රයට රුපියල් මිලියන 24,000ක් වෙන් කර ආයෝජනය කරලා තිබෙනවා. ඒගොල්ලන් මේක කරන්නේ ලාභ ලබන්න නේ; ඒගොල්ලන් සේවයක් නොවෙයි නේ කරන්නේ. Commercial Credit and Finance PLC, Alliance Finance Company PLC, Mercantile Investments and Finance PLC එක මේකට සම්බන්ධයි. ඒගොල්ලන්ගේ ආයතන ගොඩක් තිබෙනවා. හැබැයි, ඒගොල්ලන් මේ පනතින් නියාමනය වෙන්නේ නැත්නම් මොකක්ද වෙන්නේ? මම හිතන විධියට, මේ තුළින් පොඩි මිනිසුන්ව සූරා කන්න යනවා.

දැනට ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් ණය ගත්ත ස්වයං රැකියා කරන අය සහ ත්‍රී වීලර් හිමියන් අපි උදාහරණයකට ගනිමු. දිස්ත්‍රික් උසාවිවල තිබෙන විශාල නඩු ප්‍රමාණයෙන් සියයට 95ක්ම තිබෙන්නේ බැංකු සහ බැංකු නොවන මේ ප්‍රධාන මූල්‍ය ආයතනවලින් දාපු නඩු. මේගොල්ලන් තමයි ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය තුළ මේ අයව නඩුවලට පටලන්නේ; මේ මිනිසුන්ව උසාවි ගෙනියන්නේ. ඒ නිසා අපි යෝජනා කරනවා, මේ අයව නියාමනය කිරීම සඳහා වහාම තීරණයක් ගන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට මම කියන්න කැමතියි, මේ පනතේ තිබෙන වැදගත්ම දෙයක් ගැන. මේ පනතේ තිබෙන ලොකුම හිඩැස මේකයි. ප්‍රජාව පදනම් සංවිධාන, ඒ කියන්නේ ස්වේච්ඡා සංවිධාන සම්පූර්ණයෙන්ම මේ පනතින් අයින් කර තිබෙනවා. මේ පනත අනුව ඒගොල්ලන්ව සලකන්නේ හරියට බලපත්‍රලත් මුදල් ණයට දෙන්නන් හැටියටයි. එහෙම නැත්නම් බලපත්‍රලත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හැටියට තමයි මේ ප්‍රජා මූල සංවිධාන සහ ස්වේච්ඡා සංවිධාන සලකන්නේ. මෙතෙක් කාලයක් ප්‍රජා මූල සංවිධාන ප්‍රජා ණය ලබා දෙනකොට ඊට අදාළ ක්‍රමවේද සම්ප්‍රදායිකව ක්‍රියාත්මක වුණේ නැහැ. මූල්‍ය රෙගුලාසි තිබුණේත් නැහැ. ඒගොල්ලන් ඒ ප්‍රාග්ධනය දුන්නේ, බැංකුවකට යන්න බැරි, විධිමත් බැංකුවකින් මුදලක් ගන්න බැරි අහිංසක මිනිසුන්ට ව්‍යාපාරයක් කිරීම සඳහා, ජීවත් වීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට; ගමේ මිනිස්සු එකතු වෙලා හදා ගත්ත ස්වේච්ඡා

[ගරු කබීර් හෂීම් මහතා]

සංවිධානයකට. දැන් මේ පනත ගෙනාවට පස්සේ මොකද වෙන්නේ? ඒ ප්‍රජා සංවිධානත්, ස්වේච්ඡා සංවිධානත්, මරණාධාර සමිතිත් -ඒ ගොල්ලන් වෙනම ගණනයක් හැටියට ගත්තේ නැත්නම්- මේ පනතට යටත් වෙලා, ඒගොල්ලනුත් මේ එක එක නීති රීතිවලට යටත් වෙනවා. ඒ විතරක් නොවෙයි, ඒගොල්ලන් CRIB එකට යවන්න පුළුවන්. ඒ කියන්නේ පොඩි මිනිහෙකුට බැංකුවකට ගිහිල්ලා ණය ගන්න බැරි නම්, ඒ පුද්ගලයාට තිබෙන අන්තිම අවස්ථාව තමයි ගමේ සමිතියට ගිහිල්ලා, විශ්වාසය මත ඒ හවුල් සංවිධානයෙන් කීයක් හරි අරගෙන, තමන්ගේ ව්‍යාපාරය හදා ගන්න එක; කරත්තයේ බිස්නස් එක කර ගන්න එක. දැන් මේ පනත සම්මත වීමෙන් පස්සේ මොකක්ද වෙන්නේ? ඒ ස්වේච්ඡා සංවිධානත් මේ නීතිය යටතට ගෙනාපු ගමන්, ඒවාත් ණය දෙන සමිති බවට පත් කරපු ගමන්, ඊට පස්සේ ඒගොල්ලන්ටත් CRIB එකට යන්න වෙනවා. ඒ අනුව මෙහි ලොකු හිඩැස් දෙකක් තිබෙනවා.

මට තවත් කාරණා කිහිපයක් කියන්න තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් කාල වේලාව මදි නිසා මගේ කථාව මෙතැනින් අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Lakshman Nipuna Arachchi. You have 10 minutes.

[අ.භා. 1.10]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත සම්බන්ධව කෙටියෙන්ම කියන්න තිබෙන්නේ, "මහ ජනතාව කලබල නැහැ. හැබැයි, මහ ජනතාව කලබල කරවන්න එපා" කියන එකයි. මොකද, ආණ්ඩුව හැටියට අපි කිසිම පනතක්, රෙගුලාසියක් ගෙනෙන්නේ නැහැ මේ රටේ ජනතාව පීඩාවට පත් කරන්න. ඇත්තටම කිව්වොත්, මේක ජනතා ආණ්ඩුවක්. මේ වෙනකොට මේ ක්ෂුද්‍ර මූල්‍ය ණයවලට සම්බන්ධ වෙලා මේ රටේ කාන්තාවෝ 200ක් විතර සිය දිවි හානි කරගෙන තිබෙනවා. මීට ඉස්සර වෙලා මේ රටට මේ ක්ෂුද්‍ර මූල්‍ය සම්බන්ධව විධිමත් නියාමනය කිරීමක්, විධිමත් ආකාරයක මහ පෙන්වීමක් තිබුණා නම්, ඒ ඛේදවාචකයට මුහුණ දෙන්නේ නැහැ, ලංකාවේ කාන්තාවෝ. ආණ්ඩු කිහිපයක් ඔස්සේම මේකට උත්සාහ කරලා තිබුණා. නමුත් හරියට ඒ වැඩේ කරලා තිබුණේ නැහැ.

මේක අපි එක පාරට ඕපපාතිකව ගෙනැල්ලා ඉදිරිපත් කරන පනතක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ ආණ්ඩුවට කලින් තිබුණු ආණ්ඩු යටතේත් මේ ගැන කිසියම් ආකාරයක පරීක්ෂණයකට භාජන වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ සම්බන්ධව උසාවියටත් ගිහිල්ලා තිබෙනවා. අපි මේ පනත සම්බන්ධයෙන් වෙනම කාරක සභාවක් පත් කළා. ඒ කාරක සභාවේදී සාකච්ඡා කළා. මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය, අනෙකුත් ආයතන, ඔය කියන ප්‍රජාමූල සංවිධානවල අය -ඒ ඔක්කෝම අය- කැඳෙව්වා, ඒ කාරක සභාවට. ඒ සියලුදෙනාගේම අදහස් අරගෙන අපි සාකච්ඡා කරලා, ඒ සාකච්ඡාවල ප්‍රතිඵලයක් හැටියට තමයි අවසානයේදී මේ පනත අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා කවුරු බය කළත්, කවුරු කලබල කළත් අපි කාන්තාවන්ට, මේ රටේ පුරවැසියන්ට වගකීමෙන් කියනවා, මේකෙන් කිසිම කෙනෙකුට අගතියක් වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ කියන එක.

ඇත්තටම මේ පනතේ නිර්දේශ හැටියට තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වර්ගීකරණය සඳහා සවිස්තරාත්මක රෙගුලාසි සකස් කළ යුතුයි කියලා. ඒ කියන්නේ මේක මෙතැනින් නතර වෙන්නේ නැහැ. මේ පනතට අමතරව, මේ මඟින් ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය වෙනවා. ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය වන නිසාම සමහර දේවල් සම්බන්ධයෙන් අපට මේක තවත් විධිමත් කරන්න වෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රෙගුලාසිවලින්. ඒ නිසා මේකට රෙගුලාසි අන්තර්ගත කරගන්න පුළුවන්. ඒ කථාව තමයි ඒ කියන්නේ. ඒ වාගේම ශ්‍රී ලංකා ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරියත් ශ්‍රී ලංකා මහ බැංකුවත් අතර පැහැදිලි සම්බන්ධීකරණ ක්‍රියාපටිපාටියක් මේකෙන් ස්ථාපිත වෙනවා. මොකද ඇත්තටම මහ බැංකුවට මේ හැම දෙයක්ම නියාමනය කරන්න බැහැ. හැබැයි නියාමනය කිරීම සඳහා අවශ්‍ය යම් සම්බන්ධීකරණ ක්‍රියාවලියක් මේ පනත හරහා හැදෙනවා. ඒ කියන්නේ මොකක්ද? ඒ කියන්නේ, ප්‍රධානම ආයතනයටත්, මූල්‍ය සම්බන්ධව කටයුතු කරන ප්‍රධානම ආයතනයටත් මේ හරහා සම්බන්ධයක් ගොඩ නැඟෙනවා.

ඒ වාගේම තමයි ප්‍රජා මූලික මූල්‍යකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කරන තෙක් මේ යටතේ ඒ සම්බන්ධවත් කටයුතු කෙරෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රජා මූල සංවිධාන කියන්නේ, මේකට එකතු විය යුතු තවත් කොටසක්. හැබැයි, ඒගොල්ලෝ එම සාකච්ඡාවේදී ඉල්ලීමක් කළා. ප්‍රජා මූල සංවිධානවලට ටිකක් නිදහස්ව කටයුතු කිරීමේ හැකියාවන් තිබෙනවා. ඒගොල්ලන්ට තිබෙන ප්‍රශ්න, තමන්ගේ community එක ඇතුළේම සාකච්ඡා කරලා විසඳන ක්‍රමයක් ගොඩනැඟිලා තිබෙනවා. ඒක හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම ක්‍රමයකුත් තිබෙනවා. එම නිසා ඒගොල්ලන්ගේ ඉල්ලීම වුණේ, ඒ කාරණයට මෙම පනතින් යම් යම් බාධා තිබෙනවා නම් ඒ බාධාවලින් නිදහස් කරලා දෙන්න කියන එකයි. ඒ සඳහා ආණ්ඩුව කටයුතු කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි ප්‍රජා මූල සංවිධානවලට වෙනම ප්‍රතිපත්තියක් හදන්න ඕනෑ. ඒක තවම හැදිලා නැහැ. මෙම පනතින් යම් කොටසක් cover නොවන බව මම විශ්වාස කරනවා. ඒක ඇත්ත. අපි ඒක පිළිගන්න ඕනෑ. අවශ්‍ය සියල්ලක්ම මෙම පනතින් ආවරණය වන්නේ නැහැ. එම නිසා අපි ඒකට ජාතික ප්‍රතිපත්තියක් හදන්න ඕනෑ. දැනට ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්බන්ධව තිබෙන ගැටලුවලට යම් උත්තරයක් තමයි මෙම පනතින් සපයන්නේ. යම් උත්තරයක් කියන්නේ, ඇත්ත උත්තරයක් තමයි මේ සපයන්නේ. හැබැයි, මෙම පනතිනුත් ආවරණය - cover - නොවන තැනක් තිබෙනවා නම්, මේ ප්‍රජාමූල සංවිධානවලට නීත්‍යානුකූලව ලියාපදිංචි වීමට සහ නව නියාමන රාමුවකට අනුගත වීමට අපි සහාය වෙන්න ඕනෑ. මෙම පනතින් ඒකට වැට බැඳිලා නැහැ. එම නිසා ඒ මිනිසුන්ව භය කරන්න එපා. ඒ ප්‍රජාමූල සංවිධානවල ඉන්න කාන්තාවන්ව භය කරන්න එපා. විශේෂයෙන්ම අපි විපක්ෂයෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, ඒක කරන්න එපා කියලා. ඒ අවශ්‍ය ආකාරයෙන් මේ පනත සකස් වෙලා තිබෙනවා.

ඒ වාගේම, දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් මේ යටතේ සිදු වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ගොඩක් අයට බොහෝ වෙලාවට කළමනාකරණය සම්බන්ධ දැනුමේ යම් අඩුවක් තිබෙනවා. ගම්වල ඉන්න කාන්තාවන් ගත්තාම, අපි කියන්නේ නැහැ ඒගොල්ලෝ සම්පූර්ණයෙන්ම ඒ කටයුත්තෙන් බැහැර වෙලා ඉන්නවාය කියලා. නමුත්, යම් යම් මඟ පෙන්වීම් කිරීමේ කාර්යභාරයක් තිබෙන්න ඕනෑ. අන්න ඒ කාර්යභාරය ගැන මෙම පනත ඇතුළේ සලකා බලා තිබෙනවා. සමහර වෙලාවට එම කොටස නීතියට යටත් කර නැතිව ඇති. හැබැයි, ඒගොල්ලෝ සම්බන්ධව අවබෝධයෙන් කටයුතු කිරීමේ වගකීමත් තේරුම් අරගෙන ඒ ගැනත් මෙම පනත හරහා සාකච්ඡා කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම, අධිකාරියේ පාලන ව්‍යුහය තුළ ඉහළ කාන්තා නියෝජනය සහතික කළ යුතුයි. මොකද, අපි දන්නවා එම ණයගැතියන්ගෙන් විශාල ප්‍රමාණයක් කාන්තාවන් බව. එතකොට ඒගොල්ලෝ සම්බන්ධව විශේෂ වගකීමක් අපට තිබෙනවා. විශේෂයෙන්ම මිනිසුන් ණයට පෙලඹෙන්නේ මොකද කියලා අපි දන්නවා. ව්‍යාපාරික කටයුත්තකට ණය ගන්නවාය කියන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ව්‍යාපාරික අර්ථයෙන්. හැබැයි, මේවායෙන් ගොඩක් ණය අරගෙන තිබෙන්නේ ව්‍යාපාරවලට නොවෙයි. ණයක් අරගෙන මොකක් හරි කරන්නයි කටයතු කර තිබෙන්නේ. ඒ කියන්නේ, ණයක් අරගෙන තිබෙන්නේ දරිද්‍රතාවෙන් ගොඩ එන්න. බොහෝ අය ක්ෂුද්‍ර මූල්‍ය ණය අරගෙන තිබෙන්නේ ව්‍යවසාය සඳහා නොවෙයි. ණය ගන්න හේතුව වෙලා තිබෙන්නේ, දරිද්‍රතාවෙන් මිදීම. ඒක අපි තේරුම් ගන්න ඕනෑ. සාමාන්‍යයෙන් ව්‍යවසායකයකු ගන්නා ණයයි, දරිද්‍රතාවෙන් පෙළෙන කවුරු හෝ දරිද්‍රතාවෙන් මිදීම සඳහා මොකක් හරි දෙයක් පටන් ගැනීම සඳහා ගන්න ණයයි අතර තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙනසක්. අපි ඒ වෙනස බොහොම සූක්ෂ්ම විධියට තේරුම් ගන්න ඕනෑ. එම නිසා ඒගොල්ලන්ට අවශ්‍ය ණය විතරක් නොවෙයි, දැනුමත් අවශ්‍යයි. ඒ දැනුම දෙන්න ඕනෑ. ඒ වාගේම ඒගොල්ලන්ට නිෂ්පාදන මාර්ග හඳුන්වා දෙන්න ඕනෑ. ඒ මග පෙන්වීම කරන්න ඕනෑ. ඒගොල්ලෝ ගන්න ඒ ණය මුදල කළමනාකරණය කර ගන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධව මග පෙන්වීමක් අපි දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය වළකට අද දමා තිබුණු රටක්, ණය උගුලකට හසු කරපු රටක්. ආණ්ඩුව හැටියට අද අපි සමත් වෙලා තිබෙනවා මේ රට ණය උගුලෙන් ගලවා බේරා ගන්න. රටක් විධියට අපට එය කරන්න පුළුවන් වෙලා තිබෙනවා. හැබැයි, රට විතරක් ගලවලා වැඩක් නැහැ, මේ පහළම මට්ටමේ ඉන්න දරිද්‍රතාවෙන් පෙළෙන අයත් අපි එතැනින් ගලවාගන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා එකකට එකක් සම්බන්ධයි; අන්තර් සම්බන්ධයි. අපි දැන් රටක් විධියට නිෂ්පාදන ක්‍රියාවලියක් හඳුන්වා දෙමින් යන ගමන මේකට අනිවාර්යයෙන් හේතු වනවා. විශේෂයෙන්ම "ප්‍රජා ශක්ති" වැඩසටහන යටතේ අපි ගම්වල ක්‍රියාත්මක කරගෙන යනවා, වැඩසටහනක්. ඒ ප්‍රජා ශක්ති සංවිධානවලින් - ඒ සභාවලින් - දැන් යෝජනා එනවා. ප්‍රජා ශක්ති වැඩසටහන යටතේ මේ අවුරුද්දේ -2026 අවුරුද්දේ- යෝජනා, නිෂ්පාදන යෝජනා දැන් එනවා. අපි ඒකට දිස්ත්‍රික් මට්ටමින් මහ පෙන්වීමක් කරනවා. දිස්ත්‍රික් මට්ටමින් ඒ ප්‍රජා සංවිධානවලට - විශේෂයෙන්ම ප්‍රජා ශක්ති සංවිධානවලට- කරන මහ පෙන්වීම අතරේ ඔය කියන අමාරුවේ වැටී සිටින කාන්තාවන්, දරිද්‍රතාවෙන් පෙළෙන අය, මේවා සමඟ අනිවාර්යයෙන්ම ගැට ගැහෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ කියන්නේ මොකක්ද? ඒගොල්ලෝ නැවත උගුල්වල වැටෙන්නේ නැහැ. මොකද, ඒගොල්ලන්ට මහ පෙන්වීමක් කෙරෙනවා. ඒගොල්ලන්ට පෙන්වනවා, ඒ අයගේ නිෂ්පාදන ක්‍රියාමාර්ග මේවායි කියලා. පුරන් වෙලා ගිය කුඹුරක් තිබෙනවා නම්, එය නිෂ්පාදන ක්‍රියාවලියකට යොදා ගන්නේ කොහොමද, තමන් ණයක් ගත්තා නම්, ඒ ණය උගුලෙන් බේරීම සඳහා කළ යුත්තේ කුමක්ද යනාදි වශයෙන් මහ පෙන්වීමක් සිදු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
හොඳමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අවසාන වශයෙන්, මේ පනත, ඉහත කී පරිදි රටේ දරිද්‍රතාවෙන් පෙළෙන විශාල ජනතාවක් ඉන් මුදා ගන්නා වූ සහ ඔවුන්ට අවශ්‍ය මහ පෙන්වීම කරන පනතක් බව මා සඳහන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Sajith Premadasa, Leader of the Opposition. You have six minutes.

[අ.භා. 1.21]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිසිම පියවරක් තබන්නේ නැති ලූ, රටට, ජනතාවට අහිතකර. ඒකද, බාල ගල් අඟුරු ගෙනාවේ? ඒකද, විදුලි බිල වැඩි කරන්නට යෝජනා ඉදිරිපත් කරන්නේ? ප්‍රජා ශක්තියක් ගැන කථා කළා. මොන ප්‍රජා ශක්ති ද? ඒක මාලිමා ශක්ති; ඒක ජනතා විමුක්ති පෙරමුණ ශක්ති. බිම් මට්ටමේ ණය ලබා දීමේ ක්‍රමවේදය පිළිබඳව, ක්ෂුද්‍ර මූල්‍ය ණය පිළිබඳව, එහි ඉතිහාසය පිළිබඳව කිසිම ආකාරයේ අවබෝධයක් නැතිව තමයි මේ යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ. මොකක්ද මේවායේ ආරම්භය? Sarvodaya SEEDS ආයතනය, "ජන සවිය", මොහොමඩ් යූනුස් බංග්ලාදේශයේ ආරම්භ කළ "ග්‍රාමීන් බැංකු" ක්‍රමවේදය ආදියයි. මේවා හරහා නිර්මාණය වුණු ක්ෂුද්‍ර මූල්‍ය ණය වාණිජකරණයට ලක් කරලා, බිස්නස් බවට පත් කරලා තිබෙනවා. එය පුංචි මනුස්සයා තළා පෙළා පොඩි කරලා, ස්වේච්ඡා සංවිධාන, ප්‍රජා මූල සංවිධාන, ප්‍රජා සංවිධාන, ජනශක්ති කාන්තා ව්‍යාපාරය, සමාජ නියාමන වැඩසටහන යනාදි බිම් මට්ටමේ ව්‍යාපාර කුඩුපට්ටම් කරලා, අර කියපු ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමවේදය වාණිජ ක්‍රියාදාමයක් හැටියට, බිස්නස් එකක් හැටියට ක්‍රියාත්මක කරන, ලොකු ලොක්කන් ආරක්ෂා කරන්න ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක්. අඩුම ගණනේ online mafias, හොර ණය ලබා දීම තහනම් කරන්නට ගත යුතු පියවරවත් මෙහි සඳහන්ව තිබෙනවාද? ගනුදෙනුකරුවන් ආරක්ෂා වෙන්නේ නැහැ. පාරිභෝගික ආරක්ෂාව නිර්මාණය කරන්නේ අදාළ නිලධාරින්, බලධාරින් නොවෙයි, බලපත්‍රලාභීන්; ලොකු ලොකු බැංකු; ලොකු ලොකු මූල්‍ය ආයතන. ඒවාට විශේෂිත වාසි ලබා දෙනවා.

අදාළ පාලන අධිකාරිවල කාන්තා නියෝජනත්වය අවම කර තිබෙනවා. හෙට තිබෙනවා නේද, ජාත්‍යන්තර කාන්තා දිනය පිළිබඳ මහා ලොකු විවාදයක්? මාර්තු 08වැනි දා ජාත්‍යන්තර කාන්තා දිනය නේද? ඒ දෙකම ක්‍රියාත්මක කරන්න ඉස්සර වෙලා කාන්තා මූලික ප්‍රජා ණය -ග්‍රාමීය ණය, නාගරික ණය- වැඩසටහන් සහමුලින්ම විනාශ කරන අණ පනත් අද ගෙනෙනවා. විශේෂයෙන්ම විපතට පත් වුණු උතුරු, නැඟෙනහිර බල ප්‍රදේශයේ, ඒ වාගේම වතු ආශ්‍රිත ප්‍රජාව කේන්ද්‍ර කරගත් දුප්පත් ජනතාව, ග්‍රාමීය ජනතාව, නාගරික ජනතාව, කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ, ධීවර ක්ෂේත්‍රයේ, ස්වයං රැකියා ක්ෂේත්‍රයේ, අවිධිමත් ක්ෂේත්‍රයේ, අසංවිධානාත්මක ක්ෂේත්‍රයේ ජනතාව - මරණාධාර සමිතිය පවා - CRIB එකට ගෙන යන්නට කටයුතු කරන ඉතාම වැරැදි ක්‍රියාදාමයක් තමයි මේ ක්‍රියාත්මක වෙන්නේ කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

අපි විශ්වාස කරනවා, අනිවාර්යයෙන්ම නියාමනයක් අවශ්‍යයි කියලා. මේ කියන නියාමනය අවශ්‍ය වුණේ ඇයි? ඉතාම හොඳින් ක්‍රියාත්මක වුණු පුංචි සංවිධාන විනාශ කරලා, මහා ලොකු බැංකු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ආයතන, මහා ලොකු මූල්‍ය ආයතන මේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරය තමන්ගේ මුදල් උපයන ව්‍යාපාරයක් බවට, තමන්ගේ බිස්නස් එක බවට පත් කර ගත්තු හින්දා අද වන විට ණය බරින් තෙරපුණු, ණය බරින් මිරිකුණු, ණය උගුලක හිර වුණු විශාල පිරිසක් බිහි වෙලා ඉන්නවා. නිකම් උගුලක් නොවෙයි, ණය මර උගුලක්. විශේෂයෙන්ම ගිනි පොලී ණය ආයතන නිසා අද සිය දිවි නසා ගැනීම් විශාල වශයෙන් සිදු වෙලා තිබෙනවා. ඒ නිසා කළ යුතුව තිබෙන්නේ මේ පුංචි පුංචි ප්‍රජා සංවිධාන ක්‍රියාත්මක කරගෙන යන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපාරයට මරු පහරක් එල්ල කිරීම නොවෙයි. ගිනි පොලී වෙළෙන්දා, විශාල බැංකු ආයතන, විශාල මූල්‍ය ආයතන, ධන බලය ආදි හැම බලයක්ම දැන් එකතු වෙලා. දැන් ඒ ධන බලය එකතු වෙලා රාජ්‍ය බලයත් එක්ක. ඒ දෙගොල්ලන්ම එකතු වෙලා නියාමනයක් හදා ගන්නවා සල්ලිකාරයා ආරක්ෂා කරන්න. ගමේ, නගරයේ ඉන්න කාන්තාව ඉතාම භයංකර, අනතුරුදායක තත්ත්වයකට පත් වෙලා ඉන්නවා. මොකද, කාන්තා මූලික පවුල්වලට, කාන්තාව කේන්ද්‍ර කරගත් මේ ණය ක්‍රමවේදයට මරු පහරක් එල්ල කරන ඉතාම දුර්දාන්ත පනතක් තමයි අද සම්මත කරන්න යන්නේ.

අපි යෝජනා කරනවා, මේ සම්බන්ධයෙන් පැහැදිලිවම නියාමනයක් අවශ්‍ය බව. නියාමනයක් අවශ්‍ය නැහැ කියලා අපි කියන්නේ නැහැ. නියාමනය කරන්න, සල්ලිකාරයන් ක්‍රියාත්මක කරන ගිනි පොලී ව්‍යාපාරය. නියාමනය කරන්න, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන. පොඩි මනුස්සයාගේ ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන තමන්ගේ බිස්නස් එක කර ගත් ඒ මහා පරිමාණයේ ආයතන නියාමනය කිරීමට කටයුතු කරන්න. ඒක තමයි යුතුකම. නිකම් කීමට කියනවා, ජනතාවට විරුද්ධ වැඩසටහන් කරන්නේ නැහැ කියලා. එසේ කරන බවට උදාහරණ අද ඕනෑ තරම් තිබෙනවා. බාල ගල් අඟුරු ගෙනැල්ලා අද දවසේ සිදු වන්නේත් ජනතා විරෝධී ක්‍රියාවක්. ඒ නිසා පැහැදිලිවම කාන්තාව ගැන හිතලා, කාන්තා මූලික පවුල් ගැන හිතලා, ගමේ ඉන්න පුංචි ස්වයං රැකියාලාභියා ගැන හිතලා අවිධිමත් ව්‍යාපාරයේ නියැළෙන පුද්ගලයින් -පිරිමි, කාන්තා දෙගොල්ලන්ම- ගැන හිතලා කරුණාකර ඒ අයට හිතවාදී ලෙස මෙය සංශෝධනය කරන්න කියා මම යෝජනා කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. (Dr.) Upali Pannilage. You have 13 minutes.

[අ.භා. 1.27]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින විශේෂයෙන්ම අපේ විවාදයට ගැනෙන්නේ ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පතයි. අප මේ පනත් කෙටුම්පත මූලික වශයෙන්ම ඉදිරිපත් කර තිබෙන්නේ විශේෂයෙන්ම 2016 අංක 6 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනත පරිච්ඡින්න කරලා අලුත් පනතක් ගෙන ඒම සඳහායි. ඒ වාගේම, මේ පනතේ ප්‍රධානම අරමුණු අතර විශේෂයෙන්ම බලාපොරොත්තු වන්නේ, ශ්‍රී ලංකාව තුළ මුදල් ණයට දීමේ හා ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර නියාමනය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා ශක්තිමත් නෛතික රාමුවක් හඳුන්වා දීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මෙතැනදී කිව්වා, මේ පනතින් ගනුදෙනුකරුවන් ආරක්ෂා වෙන්නේ නැහැ කියලා. දැන් අහගන්න, මේ පනත් කෙටුම්පතේ මොනවාද තිබෙන්නේ කියලා. මේ පනත් කෙටුම්පතේ මුල්ම පිටුවේ සඳහන්ව තිබෙනවා, මේ පනත් කෙටුම්පත ගෙන එන්නේ ඇයි කියලා. මේ පනත් කෙටුම්පතේ මුල් පිටුවේ ඉතා පැහැදිලිව සඳහන්ව තිබෙනවා, "...මුදල් ණයට දීමේ ව්‍යාපාරයේ සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයේ ගනුදෙනුකරුවන්ට ආරක්ෂාව සැපයීම සඳහා ද;..." කියලා. එය සිංහල ඇතුළු භාෂා තුනෙන්ම සඳහන්ව තිබෙනවා; ඉතා පැහැදිලිව එසේ සඳහන්ව තිබෙනවා. එහෙම නම්, මේ පනත ගෙන එන්නේ මේ ව්‍යාපාර නියාමනය කිරීමට විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමත් මේ පනතේ ප්‍රධානතම අරමුණක්. ඒ අනුව දැනට අපේ රටේ තිබෙන ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර නියාමනය කිරීමත්, ඒවා අධීක්ෂණය කිරීම වාගේම මේ රටේ මිලියන ගණනක් වූ මේ ව්‍යාපාරය හරහා ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමත් අපි මේ පනත යටතේ විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම බැලුවා මේ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳව තිබෙන අර්ථකථනය කුමක්ද කියලා.එක පැත්තකින් කනගාටුවකුත් හිතෙනවා, මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ තිබෙන අර්ථකථනය ගැන. එහි සඳහන් වෙනවා, "Microfinance is defined as 'provision of financial services to low-income people' ...." කියලා. අඩු ආදායම්ලාභී ප්‍රජාවට මූල්‍ය පහසුකම් ලබා දීම සඳහා තමයි මේ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය තිබෙන්නේ කියනවා. මේකේ හරි interesting කොටසක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි: "It brings credit, savings and other essential financial services to people who are too poor to be served by regular banks, …." අඩු ආදායම්ලාභී අයට සේවය සපයනවා. නමුත් අපේ තිබෙන සාම්ප්‍රදායික බැංකු system එක තුළ ඒ අයට service ලබා දෙන්න බැරි තරම් ඉතාම දිළිඳු - too poor - අයට සහන සැලසීම සඳහා තමයි මේ microfinance sector එක තිබෙන්නේ කියනවා. මොකද ඒ conventional banksවලින් ඒ අයට මේ service එක දෙන්න බැරි? එහි කියනවා, ".... because they are unable to offer sufficient collateral." යනුවෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අය අවශ්‍ය පරිදි සුරැකුම් ලබා දීමට අසමත් වීම නිසා තමයි ඒ අයට මේ රටේ තිබෙන බැංකු පද්ධතියෙන් නිවැරැදි සේවයක් ලබා දෙන්නට නොහැකි වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගෙනෙනවාත් එක්ක මම විශේෂ කරුණු කිහිපයකුත් සඳහන් කරන්න කැමැතියි. ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය, එහෙම නැත්නම් කුඩා මට්ටමේ ණය ගනුදෙනු ඇතුළත් මූල්‍ය සේවා අපේ රටේ වසර ගණනාවක්, දශක ගණනාවක් තිබුණු ඒ සමාජයත් එක්ක බැඳිච්ච ක්‍රියාවලියක්. විශේෂයෙන්ම සකසුරුවම් හා ණය ගනුදෙනු සමිති ආරම්භ වන්නේ 1911 වර්ෂයේ. ඒ කියන්නේ, මීට අවුරුදු 115කට කලිනුත් අපේ රටේ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය තිබිලා තිබෙනවා. විශේෂයෙන් දිළිඳු ප්‍රජාවට මූල්‍ය පහසුකම් ලබා දීම සඳහා තමයි, මේ වැඩසටහන් කාලාන්තරයක් තිස්සේ ක්‍රියාත්මක වුණේ. එහෙම තිබුණා වුණත්, අද වෙනකොට මේ ක්ෂේත්‍රය නියාමනය කිරීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත් වෙලා තිබෙනවා. එහෙම නියාමනය කිරීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත් වෙලා තිබුණත්, විශේෂයෙන් මම මේ කාරණයත්

සඳහන් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වසර 100කටත් අධික කාලයක් අපේ සමාජයේ තිබුණු ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ ඉතා වැදගත්, ඒ වාගේම සමාජයට ඵලදායී කාරණා කිහිපයකුත් තිබුණාය කියන එකත් අපි විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම දකුණු ආසියාව ගත්තාම ක්ෂුද්‍ර මූල්‍ය බැංකු ක්ෂේත්‍රයේ විශේෂයෙන් විශාල පරිවර්තනයක් කළේ බංග්ලාදේශ "ග්‍රාමීන් බැංකු" වැඩසටහන. "ග්‍රාමීන් බැංකු" වැඩසටහන 1983දී මහාචාර්ය මුහම්මද් යුනුස් මහතා දැවැන්ත ව්‍යාපාරයක් විධියට බංග්ලාදේශයේ ආරම්භ කළා. ඒ තුළින් ඉතාම සංවිධිත විධියට කාන්තාවන් සංවිධානය කළා. මේ ව්‍යාපාරයේ හිටපු ගනුදෙනුකරුවන්ගෙන් සියයට 97ක් කාන්තාවන්. මේ අය කණ්ඩායම් විධියට සංවිධානය කරලා, කණ්ඩායම් අතර කණ්ඩායම් ක්‍රියාකාරිත්වය, සාමූහික හැඟීම, නායකත්වය කියන මේ සියල්ල ඒ තුළින් ඔවුන් ප්‍රගුණ කළා.

දැන් නම් ටිකක් කිව්වා නේ. මම ඒ නම් ටික ඔක්කෝම කියන්නම්. මම ඒ ඔක්කෝම අධ්‍යයනය කරලා තිබෙනවා. 1970 ගණන්වල ආරම්භ කරපු Hambantota Integrated Rural Development Programme - HIRDEP - එකට NORAD එක තමයි fund කළේ. ඒක යටතේ තමයි සමාජ නියාමන වැඩසටහන් ආරම්භ කළේ. ඒ සමාජ නියාමන වැඩසටහනේ තමයි ජන ශක්ති බැංකු සංගම් කියලා කාන්තා මහා සංගමය තිබෙන්නේ. එවකට හම්බන්තොට දිස්ත්‍රික්කයේ හිටපු GA, මිත්‍රරත්න මහත්තයා බංග්ලාදේශයට ගිහිල්ලා අධ්‍යයනය කරලා, ඊට පස්සේ ඒක තමයි අපේ රටේත් විධිමත් විධියට පටන් ගත්තේ.

අපි පිළිගන්නවා, ඒ විධිමත් කරපු ව්‍යාපාරය ඊට පස්සේ 1990දී "ජනසවිය" වැඩසටහන ප්‍රයෝජනයට ගත්තා කියන එක. ඒක අවුරුදු හතරකින් නතර වුණා. ඊට පස්සේ 1995දී "සමෘද්ධි" වැඩසටහන ආරම්භ කරන කොටත් "සමෘද්ධි" වැඩසටහනටත් මේ අත්දැකීම් භාවිත කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 2013දී "දිවිනැඟුම" පනතින් සමෘද්ධි අධිකාරිය දිවිනැඟුම දෙපාර්තමේන්තුවක් බවට පත් වෙනකොට යම් වෙනසකට ලක් වුණා. ඒ දිවිනැඟුම පනත 2017දී සංශෝධනය කළා. සමෘද්ධි වැඩසටහන යටතේ ලංකාවේ 40 ලක්ෂයකට අධික සාමාජික ප්‍රමාණයක් ඉන්නවා. මේ වෙනකොට ඒ බැංකු 1,097ක් තිබෙනවා. ඒ යටතේ අපි 2026 වර්ෂයේදී ක්ෂුද්‍ර මූල්‍ය වශයෙන් කුඩා හා ක්ෂුද්‍ර මට්ටමේ ව්‍යවසායකයන් නැංවීම සඳහා රුපියල් මිලියන 60,000ක ණය ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය රාජ්‍ය මැදිහත් වීමෙනුත් ඉතා දැවැන්ත විධියට ක්‍රියාත්මක වුණා. ඒක නිසා මේක ව්‍යාපාරයක් විධියට දකුණු ආසියාවේ ව්‍යාප්ත වුණා. ඒ වාගේම කාන්තාවන් අතර ප්‍රචලිත වුණා. ඒ වාගේම ගම් මට්ටමේදී සාමූහිකත්වය ගොඩනඟන්න, අන්‍යෝන්‍ය වශයෙන් විශ්වාසය තහවුරු කරන්න මේ ක්‍රමය ඉවහල් වුණා. සාම්ප්‍රදායික ලෙස ණය ලබා ගැනීමේදී ඇපකර නැති නිසා ඒ අයට අපි හඳුන්වා දුන්නා, අලුත් ක්‍රමයක්. අපි කියන්නේ, මම නොවෙයි. මේ ක්‍රමය විසින් හඳුන්වා දුන්නා, අලුත් ක්‍රමයක්. ඒකට කියනවා, සමාජ සුරැකුමක් - social collateral එකක් - කියලා. ඒක ඉතා වැදගත්. මේක ලෝකයේ වෙනත් රටවල නැහැ. අපේ සමාජයේ තමයි මේ සමාජ සුරැකුම තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. යම් කෙනෙකුට ණයක් දෙනකොට විශේෂයෙන්ම කාන්තාවන්ට උකස් තියන්න ඉඩමක් නැහැ, ගෙයක් නැහැ, වාහනයක් නැහැ. අන්න එතැනදී සමාජ සුරැකුමක් ඇති කරනවා. කණ්ඩායමක් විධියට තමන්ගේ හිතවතුන් වෙනුවෙන් කණ්ඩායමේ සාමාජිකයන් විසින්ම සුරැකුමක් ලබා දෙනවා. ඒ කණ්ඩායමේ දහයක්, පහළොවක් ඉන්න පුළුවන්. ඒ කණ්ඩායමේ අනෙක් අය තමන්ගේ සගයන් වෙනුවෙන් සුරැකුමක් ලබා දෙනවා. අන්න ඒ සුරැකුම භාවිත කරලා ණය ගනුදෙනු කරනවා; ඉතිරි කරනවා; කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය කරනවා. මේක ලෝක ඉතිහාසයේ ඉතා වැදගත් කාරණයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ක්‍රියාවලිය දිගින් දිගටම වසර සියයකට ආසන්න ප්‍රමාණයක් පැවතුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අත්තම් ක්‍රම, සීට්ටු ක්‍රම වාගේම මේ ක්‍රමයත් වසර 100 ගණනක් අපේ රටේ පැවතුණු බව අපි දන්නවා. නමුත් මොකද වුණේ? සමාජය වෙනස් වෙනකොට මේ ක්‍රම ඒ විධියටම තිබුණේ නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, සමාජය ඒ විධියටම තිබුණේ නැහැ. සමාජ සාරධර්ම වෙනස් වුණා. මිනිස්සු අතර තිබුණු අගයන් වෙනස් වුණා; විශ්වාස වෙනස් වුණා. ඉතින් කාන්තා කණ්ඩායම් විශ්වාස කරලා සුරැකුම් ලබා දුන්නත්, ණය ලබා ගත්තාට පසු ගෙවන්න බැරි වුණාම, කණ්ඩායමේ අනික් සාමාජිකයන්ටත් ණය ගන්න බැරි වුණා. මෙන්න මෙවැනි තත්ත්වයක් ඇති වුණා. ඊටත් අමතරව මේ ව්‍යාපාරය තුළ මොකද වුණේ? ගමේ සාමූහික තුළ තිබිච්ච, ගමේ කාන්තාවන් අතර තිබිච්ච මේ ව්‍යාපාරය ඊට වඩා වෙනත් තලයකට ගියා. ඒක මම හොඳින් අධ්‍යයනය කළා. මම Grameen Bank වැඩසටහනත් අධ්‍යයනය කළා. මම එහේ ගිහිල්ලා ඒ වැඩසටහන මුලින්ම අධ්‍යයනය කළා. ඒ වාගේම ලංකාවේ තිබිච්ච microfinance වැඩසටහන් ගණනාවක් මම අධ්‍යයනය කළා. ඒ වැඩසටහන්වල තිබිච්ච ඒ ප්‍රධාන සංකල්පය අරගෙන ඒක ව්‍යාපාරයක් විධියට වෙළඳපොළට ගෙනාවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වෙළඳපොළ තුළ මොකද වුණේ? අන්න, හතු පිපෙන්නා වාගේ, ව්‍යාපාරික පැළැන්තිය අතට මේ ව්‍යාපාරය ගියා. ඒකෙන් ගමේ සාමාන්‍ය කාන්තාව අත තිබිච්ච, අතමාරුව, හුවමාරුව, සාමූහිකත්වය, ඒ සාමූහික සුරැකුම් මඟින් කර ගත් අතමාරු ක්‍රමය සම්පූර්ණයෙන් වෙනත් දිශාවකට ගියා.

අද කථා කළා ඒ ලියාපදිංචි සමාගම් ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියන්න කනගාටුයි, ශ්‍රී ලංකා මහ බැංකුවේ මේ microfinance sector එක ගත්තොත්, මම දැන් website එකට ගිහිල්ලා බැලුවා, ලියාපදිංචි වෙලා තිබෙන්නේ සමාගම් 4යි! ඕනෑ කෙනෙකුට දැන් ඒක බලන්න පුළුවන්. නමුත් ඒ හතර ගැන නොවෙයි කථා කරන්න ඕනෑ. දහස් ගණනක පිරිසක් ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ ඉන්නවා. මේවා ඉතා අවිධිමත් ක්ෂේත්‍රයක දැන් තිබෙන්නේ. මේවාට පසුගිය කාලයේ මොකද වුණේ? විශේෂයෙන්ම අපේ අධ්‍යයනවලින් හෙළි වුණා, උතුරු නැඟෙනහිර පළාත්වල කාන්තාවන් විශාල වශයෙන් මේවායින් පීඩාවට පත් වුණු බව. ඔවුන්ට ණය දුන්නා, ණය ආපසු ගෙවා ගන්න පුළුවන්ද කියලා බැලුවේ නැතිව. ඒ අයගෙන් අසීමිත පොලී අය කළා. අසීමිත පොලී අය කළාට පසු මොකද වුණේ? ඒ අයට මේ ණය ගෙවා ගන්න බැරි වුණා. ඒ නිසා සියදිවි නසා ගැනීම් සිය ගණනක් පවා වාර්තා වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සිය දිවි නසා ගැනීම් කියන්නේ එහි ඇති වෙච්ච අවසාන ඛේදනීයම තත්ත්වයයි. ඉන් මෙහා පවුල්වල තවත් ගොඩක් ගැටලු ඇති වුණා. ඒවා ඔවුන්ගේ ආර්ථිකයට බලපෑවා. දරිද්‍රතාව තුරන් කරන්න වැඩසටහන් ක්‍රියාත්මක කළත්, දරිද්‍රතාව එන්න එන්න වැඩි වුණා. ඒ වාගේම මානුෂික පීඩා ඇති වුණා. මෙන්න මේ හේතු නිසා මේ ව්‍යාපාර, මේ ආයතන නියාමනය කිරීමේ අවශ්‍යතාව මතු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අන්න ඒ නිසා තමයි මේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර, මේ ආයතන නියාමනය කිරීම සඳහා මේ පනත් කෙටුම්පත ගේන්නේ. මීට කලිනුත් මේ වාගේ පනත් කෙටුම්පතක් ගෙනාවා. ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවටත් ඉදිරිපත් කළා. නමුත් ඊට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට නඩු හතක් ගියා. ඉතින් අන්තිමට මොකද වුණේ? ඒ පනත් කෙටුම්පත සම්මත කර ගන්න බැරි වුණා.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

කෙසේ වෙතත්, මේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය කළ යුතුමයි. හැබැයි, ඒ නියාමනය කරනකොට එයින් ප්‍රතිලාභ ලබන ගනුදෙනුකරුවනුත් ආරක්ෂා කළ යුතුයි. එක පැත්තකින්, මේ ආයතන අසීමාන්තික විධියට පොලී මුදල් අය කරනවා. අසීමාන්තික විවිධ ගිවිසුම්වලට එනවා. මෙන්න මේවා දරා ගන්න බැහැ සාමාන්‍ය පුද්ගලයන්ට. තව පැත්තකින්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ජනතාව රැවටීමට ලක් වුණා. පසුගිය කාලයේ ඔබතුමා දකින්න ඇති, සමහර මූල්‍ය ආයතන මේ ගොල්ලන්ගේ තැන්පතු අරගත්තත් ඒ තැන්පතු ආපසු ගෙවා ගන්න බැරි තත්ත්වයට පත් වුණා. ඒ තැන්පතු ගෙවා ගන්න බැරි වුණාට පස්සේ ඒ තැන්පත් කරපු අයගේ මුදල අහිමි වුණා. ඒ, මම මුලින් කියපු සාමාන්‍ය ග්‍රාමීය කාන්තාවන් නොවෙයි. සාමාන්‍ය ග්‍රාමීය කාන්තාවගෙන් එහාට ගිහිල්ලා මේ ව්‍යාපාරය නාගරික ප්‍රදේශවලටත් ගියා. මධ්‍යම පන්තිය සහ ඉහළ ආදායම් ලබන අයත් මේ මූල්‍ය ආයතනවල මුදල් තැන්පත් කරන්න පටන් ගත්තා. අන්තිමට මොකද වුණේ? මේ අයට ආපහු මුදල් ලබා දෙන්නට මේ ආයතනවලට නොහැකි වුණා. එම නිසා මොකක්ද වුණේ? තමන්ගේ තැන්පතු ආපසු ලබා ගැනීමට නොහැකි වීම නිසා ඒ අය එවකට පැවතුණු ආණ්ඩුවලින්, මහ බැංකුවෙන්, ඒ වාගේම විධිමත් ආයතනවලින් ඉල්ලීම් කරන්න පටන් ගත්තා. මොකද වුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඒ ඉල්ලීම් ඉටු කරන්න අපට නෛතික ප්‍රතිපාදන නැහැ. නෛතික ප්‍රතිපාදන නැති නිසා, ඒ ජනතාවගේ තැන්පතු ආපසු ඔවුන්ට ලබා දෙන්න අපට කිසිම හැකියාවක් නැහැ. ඒ තැන්පත්කරුවන් ආරක්ෂා කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එම නිසා තමයි මේ යටතේ සෑම ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයක්ම වෙන් කර තිබෙන්නේ. අපි ඒවා වෙන් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පළාත් සභා යටතේ තිබෙන පළාත් පාලන ආයතන, සමුපකාර වැනි ආයතන, දැනටමත් ලියාපදිංචි වෙලා තිබෙන සමෘද්ධි වාගේ ව්‍යාපාර මේකට ඇතුළත් වෙන්නේ නැහැ. නමුත්, ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය තුළ ණය ගනුදෙනු කරන, මූල්‍ය පහසුකම් ලබා දෙන මේ ආයතන යම් නියාමනයකට ලක් කරන්න ඕනෑ. ඒගොල්ලෝ බලපත්‍රයක් ලබා ගන්න ඕනෑ. බලපත්‍ර ලබා ගත්තාට පසුව ඒ අයව අධීක්ෂණය කිරීමේ හැකියාව ලැබෙනවා. ඒ සඳහා තමයි අධිකාරිය පිහිටුවන්නේ, එහෙම නැතිව සමුපකාර වාගේ ආයතන පාලනය කරන්න නොවෙයි. අපි ඒවා මේ පනතින් ඉතා පැහැදිලිව අයින් කරලා තිබෙනවා. ඒවා අයින් කරලා, අද ඇති වී තිබෙන සමාජ තත්ත්වයට ගැළපෙන විධියට මේ නියාමන අධිකාරිය පිහිටුවන්න අවශ්‍යයි කියන එක මම විශේෂයෙන්ම සඳහන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Are you willing to take that question, Hon. Minister?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
Yes, Sir, I am willing to answer.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
මේ පනත් කෙටුම්පතට අනුව, ප්‍රජා මූල සංවිධාන - මරණාධාර සමිති වැනි ස්වේච්ඡා සමිති - හැම එකක්ම ණය දෙන සමිති හැටියට ගොනු කර තිබෙනවා. එතකොට මේවා ඔක්කෝම වෙන මට්ටමකින් නියාමනය වෙනවා. ඒගොල්ලෝ CRIB එකටත් වැටෙන්න යනවා. කාන්තා සංවිධාන වැනි ප්‍රජා මූල සංවිධානවල ලාභයක් නැතිව - not-for-profit - සමාජය ශක්තිමත් කරන ණය වැඩසටහන් මින් ඉස්සරහට අත්හිටුවන වැඩ පිළිවෙළක් තමයි මේ තුළ තිබෙන්නේ කියලා මම කිව්වේ ඒකයි. මේක සංශෝධනය කළ යුතුයි. ඔබතුමා ඒක පිළිගන්නවාද?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
Sir, that is his interpretation; ඒක එතුමාගේ අර්ථ කථනය.

මම කියන්නේ සමුපකාර ව්‍යාපාරය, දැනට වෙනත් ස්ථානවල ලියාපදිංචිවෙලා තිබෙන ස්වේච්ඡා සංවිධාන සියල්ල මේකේ ලියාපදිංචි වෙන්න ඕනෑ නැහැ කියලායි. ඒවා මේ පනත යටතේ අපි ඉවත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම මේ පනත යටතේ, අදාළ නොවිය යුතුයි කියලා, ඒ කියන්නේ පළාත් සභා, පළාත් පාලන ආයතන, මහ බැංකුව, - ඒවා වැඩක් නැහැ, මම පැහැදිලිව කියන්නම්. - කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කළ කල්බදු මූල්‍ය ආයතන, ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති, පළාත් සභාවක ප්‍රඥප්තිය යටතේ, සමෘද්ධි පනත යටතේ, ඒ වාගේම ගොවිජන සංවර්ධන පනත යටතේ තිබෙන ඒවා මේකට අයිති වෙන්නේ නැහැ. ඒවා දැනටමත් ලියාපදිංචි කරලා තිබෙනවා. මේ කියන්නේ ඒවා ගැන නොවෙයි. ලියාපදිංචියක් නැතිව, බලපත්‍රයක් නැතිව ව්‍යාපාරයේ යෙදීමෙන් සමහර ව්‍යාපාර විශාල ප්‍රශ්න ගණනාවක් ඇති කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එම නිසා වගකිව යුතු රජයක් විධියට අපට ඒ සඳහා මැදිහත් වීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ගනුදෙනුකරුවන් ආරක්ෂා කරගන්න අපට අවශ්‍යයි. ඒක තමයි මේකේ තිබෙන ප්‍රධානම දේ. එහෙම නැතිව මෙතුමා කියන විධියට සාමාන්‍ය සමිතියක්, මරණාධාර සමිතියක් regulate කරන එක නොවෙයි සිදු කරන්නේ. මේ Regulations තුළින් ඒවා නියාමනය කිරීම අවශ්‍යයි. ඒ වාගේම පැමිණිලි විභාග කිරීමේ ක්‍රමයකුත් තිබෙනවා. දැන් පැමිණිල්ලක් විභාග කරන්න ක්‍රමයක් නැහැ. අන්න ඒ ක්‍රමවේද හදලා මේක තවදුරටත් ක්‍රමවත් කිරීම තමයි අපේ අරමුණ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have 14 minutes.

[අ.භා. 1.43]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Speaker, Rural Development, Social Security and Community Empowerment ගරු ඇමතිතුමාගෙන් පස්සේ මේ කථාව කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

ඇත්ත වශයෙන්ම ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු concerns අපටත් ඉතා පැහැදිලිව තිබෙනවා. මගේ කථාව තුළ ඒ පිළිබඳවත් මම සඳහන් කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව බලයට එනකොට, එහෙම නැත්නම් රටේ ජනතාව ඉස්සරහ ඡන්දය ඉල්ලනකොට කිව්වේ, "පොහොසත් රටක්,

ලස්සන ජීවිතයක්" ඇති කරනවා කියලායි. රට තුළ සිටින දුප්පත්, නැත්නම් පීඩිත පන්තියේ ජනතාව වෙනුවෙන් පෙනී සිටින ආණ්ඩුවක් විධියට තමයි මේ ආණ්ඩුවේ campaign එක ගෙන ගියේ; එහෙම නැත්නම් election Manifesto එක හරහා කාරණා කිව්වේ. ඒ campaign එක ගෙන ගියේ පීඩිත පන්තියේ නියෝජිතයන් පාර්ලිමේන්තුවට එවන්න, පීඩිත පන්තිය ගොඩ ගන්න අපට ඡන්දය දෙන්න කියලායි. එහෙම නේද, ගරු මන්ත්‍රීතුමනි? එහෙම තමයි කිව්වේ. හැබැයි, මම දන්න විධියට අද මේ Microfinance and Credit Regulatory Authority Bill එක මේ පාර්ලිමේන්තුවට ගෙන ඒමේ ප්‍රධාන අරමුණක් තිබෙනවා. Asian Development Bank - ADB - එකෙන් ශ්‍රී ලංකාවට මිලියන 200ක loan එකක් දෙනවා. එම loan එක ලබා ගන්නවා නම් මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා condition එකක් දමලා තිබෙනවා කියන එක තමයි අපිට ලැබී තිබෙන තොරතුරු අනුව දැනගන්නට තිබෙන්නේ. කබීර් හෂීම් මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ ඔළුව හොල්ලමින් acknowledge කරනවා. මිලියන 200ක මුදල් ගෙන ඒම සඳහා ඉතා හදිස්සියේ මේ පනත් කෙටුම්පත අරගෙන ඇවිල්ලා තිබෙනවා. ගරු ඇමතිතුමාට නොවෙයි, මේ ගරු සභාවේ ඉන්න සමහර මන්ත්‍රීවරුන්ට මම කියන්න කැමතියි, ඔබතුමන්ලාගේ පක්ෂ මූලස්ථානයෙන් පනත් කෙටුම්පතක් පිළිබඳ කාරණයක් කියන නිසාම ඒ කාරණාව විශ්වාස කරලා ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ කියන්න එපා කියලා. ඒ කාරණාව පිළිබඳ වැඩිදුර අධ්‍යයනයක් කරන්න. මට මතකයි, පසුගිය ආණ්ඩු සමයේ - 2022දීත් - අපිත් එක්ක හිටපු සමහර මන්ත්‍රීවරු - පොහොට්ටුවේ හිටපු මන්ත්‍රීවරු - මෙන්න මෙහෙම තමයි කථා කළේ. හිටපු අමාත්‍ය ගරු රෝහිත අබේගුණවර්ධන මැතිතුමා මට එහා පැත්තෙන් ඉන්නවා; ඒ තෙල් පෝලිම, තෙල් ප්‍රශ්නය තවත් මාස කිහිපයකින්වත් ඉවර වෙන්නේ නැහැ කියලා අපි එදා කියනකොට, බැසිල් රාජපක්ෂ මහත්මයා කිව්වා 2022 අප්‍රේල් වෙද්දී තෙල් පෝලිම් ඉවරයි කියලා; අනිවාර්යයෙන් තෙල් පෝලිම් ඉවරයි කියලා ඔළුවෙන් හිටගෙන කෑ ගැහුවා. ඒ වාගේම තමයි අද සමහර මන්ත්‍රීවරු කථා කරන්නේ. මේ පනත් කෙටුම්පත පිළිබඳව ඒගොල්ලන්ට දීලා තිබෙන dossier එක, එහෙම නැත්නම් ඒගොල්ලන්ට දීලා තිබෙන information sheet එකේ තිබෙන කාරණා ටික විශ්වාස කරගෙන එතුමන්ලා මේ පාර්ලිමේන්තුව ඇතුළේ කථා කරනවා.

මට පෙර කථා කළ ගරු ඇමතිතුමා කිව්වා, මරණාධාර සමිති වාගේ සමිති මේකට ඇතුළත් වෙන්නේ නැහැ කියලා. හැබැයි, ඔබතුමන්ලාගේ පනතේ තිබෙන definition එක සහ "microfinance business" පිළිබඳ definition එක අතර තිබෙන වෙනස ඔබතුමා පොඩ්ඩක් හොඳට බලන්න, ගරු ඇමතිතුමනි. The definition of "microfinance business" is, "Business of lending money at interest and provision of other financial services to low-income persons and microenterprises with the primary objective of social empowerment while maintaining sustainability of the lender and the borrower". That is the definition of "microfinance business". දැන්, ඔබතුමන්ලාගේ Bill එක අනුව, it is also defined as "microfinance business". ගරු ඇමතිතුමනි, අපි බලාපොරොත්තු වුණේ සාමාන්‍ය මිනිස්සුන්ට සාධාරණයක් කරන ආණ්ඩුවක්. මීට පෙරත් මේ පාර්ලිමේන්තුව ඇතුළේ මම තමයි මේක ඉදිරිපත් කළේ, කෝප් කමිටුවේ වාර්තාවක් හරහා. 2015-2018 කාලයේ ප්‍රබල ඇමති ධුරයක් දරපු අමාත්‍යවරයෙක් හිටියා. එතුමාට තිබෙනවා finance company එකක්. එතුමාගේ සමාගම් ලංකා බැංකුවට සහ මහජන බැංකුවට බොල් ණය වශයෙන් බිලියන ගණනක ණය ප්‍රමාණයක් තිබෙනවා. බොල් ණය ගෙවන්නේ නැහැ. හැබැයි, එතුමාගේ තිබෙන company එකක් හරහා finance දෙනවා. දැන් මේ ගෙනැල්ලා තිබෙන පනත හරහා ඔබතුමන්ලා ඒ වාගේ සමාගම් ආරක්ෂා කරනවා. මේකේ ඉතා පැහැදිලිව banks, finance companies, leasing institutions, co-operative societies, Samurdhi communities තිබෙනවා. මේ වාගේ banks and finance companies කියලා කිව්වාම, මේවා නියාමනය කරන අධිකාරිය - Regulatory Authority එක - හරහා ඔබතුමන්ලා නියාමනයට ලක් කරන්නේ ඉතා කුඩා ප්‍රමාණයෙන්.

උතුර සහ නැඟෙනහිර ගැන ඔබතුමා කථා කළා. උතුර සහ නැඟෙනහිර යුද්ධය කාලයේ දී වෙනත් රටවලින් ඇවිල්ලා ශ්‍රී ලංකාවේ උතුර සහ නැඟෙනහිර කුඩා ආයතන පිහිටෙව්වා. මම ඒවා නම් වශයෙන් කියන්නේ නැහැ. එම ආයතන ඒ දවස්වල මිලියන 10ක, 15ක මුදලක් ඒගොල්ලන්ට දීලා තිබෙනවා. ඒ මුදලෙන් මාසයට යම් කණ්ඩායමක් - ඒ කියන්නේ කාන්තාවන් කිහිප දෙනෙක් - හොයා ගෙන, සියයට දෙකේ, තුනේ පොලියට ඒගොල්ලන්ට දෙනවා. ඒ සංගමය හරහා ඒ මුදල් අය කර ගන්නවා. ඒක not-for-profit ආයතනයක් හැටියටයි කරගෙන යන්නේ. දැන් ඔබතුමන්ලාගේ definition එක අනුව ඒක microfinance business category එක යටතට අනිවාර්යයෙන් එන්න ඕනෑ. එහෙම නැත්නම් මේ නියාමනය කරන එකෙන් වැඩක් වෙන්නේ නැහැ නේ. ඔබතුමා කියන එකයි, මේ පනත් කෙටුම්පතයි පරස්පර විරෝධීයි. මරණාධාර සමිතියක් ගත්තොත්, ඒකේ ක්‍රියාපටිපාටිය ණය දෙන එක නොවෙයි නේ. මේ ආයතන; සියයට දෙකට, තුනට පොලියට දෙන ආයතන ඔබතුමන්ලාගේ මේ නියාමනය ඇතුළට එන්න ඕනෑ. මම පිළිගන්නවා, microfinance වාගේ දේවල් රට තුළ නියාමනය කරන්න ඕනෑ කියලා. හැබැයි, නියාමනය කරන්න ඕනෑ කට්ටිය නියාමනය නොකර, ඔබතුමන්ලා නියාමනය නොකරන්න ඕනෑ කට්ටිය තමයි මේ නියාමනය ඇතුළට ගෙන්වා ගන්නේ. ඔබතුමන්ලාගේ මේ පනත හරහා ලංකාවේ තිබෙන ඕනෑම ලීසිං කොම්පැනි එකක්, ඕනෑම බැංකුවක්, ඕනෑම finance leasing institution එකකට පුළුවන් - දැන් සියයට 23ට, සියයට 24ට සමහර තැන්වල පොලියට දෙනවා. අද රටේ ජනතාව - 'අද' කියන්නේ පසුගිය මෑත ඉතිහාසයේ රටේ ජනතාව - microfinance ලබා ගන්නේ, මේ "microfinance" definition එකේ තිබෙන විධියට social empowermentවලට නොවෙයි. අද මිනිස්සු microfinance ගන්නේ තමන්ගේ ණය ගෙවා ගන්න. ඒ කියන්නේ ගමේ මනුස්සයාගෙන් සියයට 15 පොලියට ගන්නවා, සියයට 20ට ගන්නවා, සියයට 30ට ගන්නවා. මම හිතන විධියට, මම නියෝජනය කරන දිස්ත්‍රික්කය තමයි රට තුළ suicides වැඩිම ප්‍රමාණයක් කර ගන්නා දිස්ත්‍රික්කය. පසුගිය කාලයේ නම් ප්‍රේම සම්බන්ධතා නිසා සමහරුන් එහෙම suicide කර ගත්තා. දැන් ප්‍රේම සම්බන්ධතාවක් පවත්වාගෙන යන්නවත් තරුණ තරුණියන්ට මුදල් නැහැ. ඒ කියන්නේ, Valentine's Day එකට චොකලට් එකක් අරන් දෙන්නවත් මුදල් නැති තත්ත්වයක තමයි රටේ තරුණ තරුණියෝ ඉන්නේ. දැන් ඒ අයට රීලෝඩ් එකක් දමා ගන්නවත් බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එවැනි තත්ත්වයක් යටතේ මේ microfinance කියන concept එකම වෙනස් වෙලා තිබෙන්නේ. ගම් මට්ටමින් බැලුවොත් සියයට 5ට, සියයට 10ට, සියයට 15ට, සියයට 20ට, සියයට 30ට දෛනික පොලියට, මාසික පොලියට ණය දෙන මිනිස්සු ඉන්නවා. අපේ පැත්තේ ඒකට කියන්නේ, "මීටර් වට්ටි" කියලා. මට හිතෙන විධියට "මීටර් වට්ටි" කියන්නේ, ත්‍රීවිලර් එකේ මීටර් එක වැඩිවෙනවා වාගේ පොලිය වැඩිවෙන නිසා වෙන්න ඇති. අද රටේ ජනතාව ජීවත් වෙන්නේ ඉතාම දුප්පත් ලෙසයි. මේ social empowermentවලින් එහාට ගිහිල්ලා, මිනිස්සු එහෙන් මෙහෙන් පොලියට අරගෙන තිබෙන ණය ටික ගෙවාගන්න මොකක් හරි ආයතනයකට ගිහිල්ලා කලින් ගත්තාට වඩා ලොකු ප්‍රමාණයක ණයක් අරගෙන හිරවෙනවා. මේක නියාමනය කිරීම අවශ්‍යයි කිව්වාට නියාමනය කරන්න ඕනෑ පිරිස් මේකෙන් නියාමනය වෙනවාද කියන එක පිළිබඳව පැහැදිලිවම ප්‍රශ්නයක් තිබෙනවා.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ගරු ඇමතිතුමා කිව්වා, මීට පෙර පැවති රජයට උසාවි ගිහිල්ලාත් මේක ගේන්න බැරි වුණා වාගේ කාරණයක්. මම ඒ රජය නියෝජනය කළේ නැහැ. එතකොටත් අපි හිටියේ විපක්ෂයේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ Bill එක නොවැම්බර් මාසයේ මැද භාගයේ තමයි ගැසට් කරලා තිබුණේ. හැබැයි, "දිට්වා" සුළි කුණාටුව ආවේ නැත්නම් මේ Bill එකත් Supreme Court එකේ challenge වනවා. ගියපාර Supreme Court එකෙන් දීපු interpretation එකේම තිබෙනවා, සියලුදෙනාටම සම ලෙස මේ දේ කරන්න කියලා. දුප්පත් මිනිහාට උදවු කරනවා කියලා ආපු ආණ්ඩුව අද ලීසිං ආයතනවලට, finance companiesවලට, බැංකුවලට සහාය දෙනවා. ඒ බැංකු safety net එකෙන් එළියේ තියලා පොඩි පොඩි අය විතරක් මේකට ඇතුළත් කරලා තිබෙනවා. මේක, රටේ ජනතාව ජාතික ජන බලවේගය ආණ්ඩුවට දුන් ජන වරමට විරෝධී කාරණයක්. එක පැත්තකින් ඇමෙරිකානු ඩොලර් 200ක ණයක් ලබා ගන්න මේක අත්සන් කරනවා. ප්‍රශ්නයක් නැහැ, ණයක් ලබා ගන්න නේ. හැබැයි, නියාමනය කරනකොට සියලුදෙනාටම සම සේ මේ නියාමනය සිදු කළා නම් අපට මේක යම්තාක් දුරකට පිළිගන්න පුළුවන්.

ඒ වාගේම තමයි, CRIB එකත්. කබීර් හෂීම් මන්ත්‍රීතුමාත් ඒ ගැන සඳහන් කළා. සාමාන්‍යයෙන් රටේ ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන ජනතාවගෙන් බොහෝ පිරිසක් - සියයට 85කට වඩා - CRIB එකේ ඉන්නවා. එතකොට CRIB එකේ ඉන්න අයට social empowerment project එකකටවත් පොඩි NGO එකක් හරහා පවා ණයක් ලබා ගන්න බැහැ, මේ නියාමනය කිරීමෙන් පස්සේ. මොකද, ඒගොල්ලන්ගේ නම CRIB එකේ තිබෙන නිසා. එතකොට ඒ මිනිස්සු කොහේටද තල්ලු වෙන්නේ? ඒ මිනිස්සු තල්ලු වෙන්නේ, කොහෙන්වත් නියාමනය නොකරන ගමේ පොලී මුදලාලි ළඟට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගමේ පොලී මුදලාලිට මේ මිනිස්සු හසු වුණාට පස්සේ ඒ අයගේ අනාගතය ගැන ඔබතුමා තේරී පත්වුණු මේ පක්ෂයට, ආණ්ඩුවට ලොකු වගකීමක් තිබෙනවා කියන එකත් මේ වෙලාවේ මම කියන්න ඕනෑ.

ඊළඟට, අපි මේකේ safety net එක ගැනත් කථා කරනවා. මේකේ විශේෂයෙන්ම sexual bribes පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. මම, මගේ කථාවට පෙර Lobby එකේදී ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමා එක්කත් මේ ගැන කථා කළා. එතුමාත් කිව්වා, සමහර දිස්ත්‍රික්කවල මේ ණය ලබා ගන්නා අය ගෙදර bedroom එකටත් එනවා කියලා. ගෙදරට ඇවිල්ලා වාඩිවෙනවා, ගෙදර bedroom එකට යනවා. මේකට සාමාන්‍ය legal proceedings හරහා ගිහිල්ලා නඩුවක් දමා අධිකරණයට යන්න පුළුවන්. හැබැයි, මේ Regulatory Authority එක හරහා මේ ණය නැවත ලබා ගැනීම සම්බන්ධයෙන් නිවැරදි ක්‍රමවේදයක් මේ පනත තුළ නැහැ. ණය ලබා ගැනීමට ක්‍රමවේදයක් - කරන්න පුළුවන් මොනවාද, කරන්න බැරි මොනවාද, ගෙවල්වලට යන්න පුළුවන්ද, ගෙවල්වලට යන්න බැරිද කියලා - මෙහි සඳහන්ව නැහැ. අපි මේ ගැන ඇහුවොත් කියාවි, Regulatory Authority එක පත් කරන්නේ ඒකට, ඒගොල්ලෝ ඒක කරයි කියලා. හැබැයි, මේ sexual bribesවලින් විශාල වශයෙන් පීඩනයට පත්වන්නේ කාන්තාවන්. හැබැයි, මේ Regulatory Authority එකෙන් අඩුම තරමින් කාන්තාවට කියලා වෙනම කොටසක්වත් වෙන්වෙලා නැහැ. මම දන්නා තරමින් women representation එකක් compulsory කරලා නැහැ.

මේ ආණ්ඩුවට රටේ ජනතාව ඡන්දය දුන්නා. නමුත් අද ජීවන වියදම දරාගන්න බැරි මට්ටමට ඉහළ ගිහිල්ලා තිබෙනවා. සාමාන්‍ය මනුස්සයෙකුට අද මේ ගැන කථා කරන්න බැහැ. ගරු අමාත්‍යතුමා මම කියපු කාරණාවලට එකඟ වෙනවා ඇති. එතුමා සභාවෙන් පිටවී යන බවක් පෙනෙනවා. ඒ, මම කියපු කාරණා පිළිගන්න නිසා වෙන්න ඇති. එහෙම නැත්නම් අපට සමාජ මාධ්‍ය හරහා මඩ ගහයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමන්ලාට comments බලකායක් ඉන්නවා නේ. රුපියල් 25ට, රුපියල් 35ට comments ගහන ඒ බලකාය හරහා මේකට සමාජ මාධ්‍ය ඔස්සේ පිළිතුරු දෙයි, සභාව ඇතුළේ පිළිතුරු දෙන්නේ නැතුව. කමක් නැහැ, අපි ඒවාට බයත් නැහැ. ඊට වඩා විවේචන සමාජ මාධ්‍ය හරහා අපට එල්ල වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි මේ social safety nets ගත්තාම කාන්තාවන් මේකෙන් ආරක්ෂා කර ගැනීම සඳහා කිසිදු ක්‍රියාපටිපාටියක් මේ තුළ නැහැ. නියාමනය කිරීමේ පනතක් අවශ්‍යයි කියන එක අපි පිළිගන්නවා. ඒ නියාමනය කිරීම මේ පනත තුළින් කරන්නේ කොහොමද කියන එක පිළිබඳව තමයි ගැටලුව තිබෙන්නේ.

අද රටේ ජනතාව ජීවත් වෙන්නේ ඉතාම අමාරුවෙන්. ඔවුන්ට විදුලි බිලවත් ගෙවා ගන්න බැහැ. බලන්න, අද විදුලි බිල රුපියල් 650යි, 750යි. සමහර වෙලාවට SMS මඟින් තමයි ඒ බිල ලැබෙන්නේ. Technologically update වෙලා අපි ඔක්කෝම e-platform එකකට යන්න ඕනෑ කියලා මමත් පිළිගන්නවා. නමුත් ගම්වල ඉන්න සමහර මිනිස්සුන්ට SMS එකක් බලන්න තවම බැහැ. රුපියල් 750යි, 850යි කියලා විදුලි බිල SMS එක හරහා එනවා. ඒක ඒ මිනිස්සුන්ට miss වුණාම ඒකට පොලියක් අයකරනවා. ඒක ගෙවාගන්න බැරි වුණාම විදුලිය විසන්ධි කරනවා. ඊට පස්සේ ඒ පොලියත් එක්ක ගෙවන්න කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවන් තත්ත්වයක් තුළ තමයි අද රටේ ජනතාව ජීවත් වෙන්නේ.

அடுத்து, இன்னுமொரு முக்கியமான விடயத்தைச் சொல்ல வேண்டும். இன்று விவசாயிகள் மிகவும் கஷ்டத்துக்கு மத்தியிலே வாழ்ந்துகொண்டு இருக்கிறார்கள். விவசாயிகளுடைய பெரும் பிரச்சினை ஒரு பக்கம் இருக்கையில், இன்று அரசாங்கமானது கொழும்பு மற்றும் கம்பஹா மாவட்டங்களில் எரிபொருள் தட்டுப்பாடு ஏற்படாத வகையில், அங்குள்ள எரிபொருள் நிரப்பு நிலையங்களுக்கு எரிபொருளை விநியோகித்துக்கொண்டு இருக்கின்றது. நான் அறிந்த வகையில், வடக்கு, கிழக்கிலும் சரி, மலையகத்திலும் சரி, சில இடங்களில் எரிபொருள் தட்டுப்பாடு இருக்கின்றது. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பௌசர், can போன்றவற்றுக்கு எரிபொருள் வழங்க வேண்டாமென அரசாங்கம் சொன்னால், விவசாய உற்பத்திகளை அறுவடை செய்யும் காலப்பகுதியில் அறுவடைக்காகப் பயன்படுத்தும் இயந்திரங்களுக்குத் தேவையான எரிபொருளைப் பெற முடியாத நிலை ஏற்படும். இன்று மலையகத்தில் மரக்கறித் தோட்டங்களுக்கு கிருமிநாசினி தெளிப்பதற்குத் தேவையான இயந்திரங்களுக்கு எரிபொருளைப் பெற முடியாத நிலை இருப்பதாக நான் கேள்விப்பட்டேன். இவ்வாறு மக்கள் பெரும் கஷ்டத்துக்கு மத்தியிலே வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள்.

நான் இன்னுமொரு விடயத்தைச் சொல்ல வேண்டும். எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தின் மண்முனை, தென் எருவில்பற்று பிரதேச சபையின் தவிசாளர் கௌரவ மேகசுந்தரம் வினோராஜ் அவர்கள், இந்த அரசாங்கம் நுண்கடன் கொடுக்கின்றவர்களைக் கட்டுப்படுத்துவதற்குக் கொண்டுவந்து இருக்கின்ற திட்டங்களைவிட, அதிகளவான திட்டங்களை பிரதேச சபை கட்டளைச் சட்டத்தின்கீழ் கொண்டுவந்து இருக்கிறார். அவர் அந்தப் பிரதேசத்தில் சில கட்டுப்பாடுகளை விதித்து இருக்கிறார். இந்த அரசாங்கத்தைவிட அவருடைய செயற்பாடு சிறப்பாக இருக்கிறது.

இறுதியாக ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். தோட்டத் தொழிலாளர்களுடைய சம்பளம் அதிகரிக்கப்பட்டதாகச் சொல்லப்பட்டது. அதிகரிக்கப்பட்ட சம்பளம் அவர்களுக்கு வழங்கப்படுகின்றதா, இல்லையா? என்பது எனக்குத் தெரியாது. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தற்பொழுது முன்வரிசையில் ஓர் அமைச்சர்கூட இல்லை. இரண்டாவது வரிசையிலும் ஓர் அமைச்சர்கூட இல்லை. நாங்கள் யாரிடம் கேள்வி கேட்பது?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rasamanickam, your time is up.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am winding up.

Sir, you answer. Tell me why the Ministers in the front row are not there. අද අපට ප්‍රශ්නයක් අහන්න, ඉදිරි පෙළේ කිසිම ඇමතිවරයෙක් නැහැ. මේ විෂය පිළිබඳව මා කරන තුන්වන කථාව, මේක. Microfinance and Credit Regulatory Authority Bill එක ගැන පැහැදිලි කිරීමක් කරගන්නවත් ඉදිරි පෙළේ කිසිම ඇමති කෙනෙක් නැහැ. දෙවන පේළියේත් කිසිම ඇමති කෙනෙක් නැහැ. තුන්වන පේළියේ එක ඇමතිවරයෙක් ඉන්නවා. අපට අවශ්‍ය ආකාරයට මේ සභාව තුළදී Microfinance and Credit Regulatory Authority Bill එක ගැන පැහැදිලි කිරීමක්වත් කරගන්න බැහැ. මම ඒකයි කිව්වේ.

වතුකරයේ දෙමළ ජනතාවගේ පඩි වැඩි කළා කිව්වා. මේ වෙනකල් ඒ සම්බන්ධයෙන් ගැසට් එකක් නිකුත් වුණා කියලා අපි නම් දැක්කේ නැහැ. අපේ ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා සභාවේ ඉන්නවා. அண்ணா! gazette வந்திருக்கிறதா? ගැසට් එකක් තවම නිකුත් වෙලා නැහැ නේ, ගරු මන්ත්‍රීතුමනි. இது வரை அந்த வர்த்தமானி அறிவித்தல் வெளியிடப்படவில்லை. நாங்கள் இந்தச் சபையில் வெற்றுக் கதிரைகளிடம்தான் இது பற்றி கேட்க வேண்டும். பாராளுமன்றத்தில் வெற்றுக் கதிரைகளை வைப்பதற்குத்தான் மக்கள் மூன்றில் இரண்டு பெரும்பான்மையை இந்த அரசாங்கத்துக்கு வழங்கி இருக்கிறார்கள் எனக் கூறி, நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Mrs.) Samanmali Gunasingha. You have ten minutes.

Order, please! Before she starts, will an Hon. Member propose the Hon. Kins Nelson to the Chair?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
Sir, I propose that the Hon. Kins Nelson do now take the Chair.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. KINS NELSON took the Chair.*

[අ.භා. 1.58]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් අවසරයි. ඇත්තටම අපි මේ ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගෙනාවේ ඇයි? මේ පිළිබඳව අපි ආයතන දෙක තුනක් සමඟ මේ පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කළා. පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් ඉදිරිපත් වූ යෝජනා පිළිබඳවත් සාකච්ඡා කළා. ඒ වාගේම ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ අනුකාරක සභාවේදීත් මේ ක්ෂුද්‍රමූල්‍ය ගැටලුව නිසා ඇති වෙලා තිබෙන සමාජයීය ගැටලු, පෞද්ගලික ගැටලු හා ව්‍යුහාත්මක ගැටලු පිළිබඳව සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවේදීත් අපි දැක්කා, මේ පාර්ලිමේන්තුව තුළ මතු වුණු කරුණු.

මේ වන විට අපේ රටේ කාන්තාවන් ලක්ෂ 24කට වඩා වැඩි පිරිසක් අධික පොලියකට ණය අරගෙන විවිධ ආයතනවල ණයකරුවන් බවට පත් වෙලා ඉන්නවා. ඒ වාගේම තමයි කාන්තාවන් 200කට වඩා වැඩි පිරිසක් සිය දිවි නසාගෙනත් තිබෙනවා, ණය ගෙවාගන්න බැරිව. පසුගිය කාලයේ ණය ගෙවාගන්න බැරි වුණේ, ණය දෙන ආයතනවලින් ඔවුන්ට ණය දීම වාගේම ඒ ණය අරගෙන ඔවුන් කිසිදු ව්‍යාපාරයකට ඒ මුදල් යෙදෙව්වේ නැති නිසායි. සාමාන්‍යයෙන් ක්ෂුද්‍රමූල්‍ය ණයක් දෙනකොට ඒ ණය දෙන ආයතන අතර කොන්දේසි කිහිපයක් තිබෙනවා. ඒ කොන්දේසි අතර තිබෙනවා, ඔවුන් ණය ගනිද්දි ව්‍යාපෘතියක් පෙන්වන්න ඕනෑ කියලා. එහෙම නැත්නම් ණය ගන්නේ කුමකටද කියලා කියන්න ඕනෑ. ගොඩක් කාන්තාවන් ණය අරගෙන තිබෙන්නේ ව්‍යවසායිකාවන් විධියට යම්කිසි ව්‍යාපාරයක් කරන්න වුණාට, පසුගිය කාලයේ ඔවුන් ණය අරගෙන තිබුණේ ව්‍යාපාරයක් කරන්න නොවෙයි, ඔවුන්ගේ විවිධ අපහසුතා නිසා, එදිනෙදා ඔවුන්ට මුහුණ දෙන්න සිද්ධ වන ගැටලුවලට උත්තර විධියට. කෙසේ වෙතත් නව රජය මඟින් රුපියල් බිලියන 96ක් වෙන් කරලා තිබෙනවා, ව්‍යවසායකයින් ගොඩනැඟීම සඳහා.

මේ රුපියල් බිලියන 96ම වෙන් කරලා තිබෙන්නේ කාන්තාවන් විශාල පිරිසක් ව්‍යවසායකයන් බවට පත් කිරීම සඳහායි. ඔවුන්ගේ මූලික කොන්දේසි අනුව ඒ අය ඇපකර ඉදිරිපත් කරන්න ඕනෑ නැහැ; ඔවුන්ට තිබෙන වත්කම් ප්‍රකාශ කරන්න ඕනෑ නැහැ; ඒ වාගේම විවිධ බැඳීම් ඉදිරිපත් කරන්න

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

ඕනෑ නැහැ. ඔවුන් පෙන්වන්න ඕනෑ, ව්‍යාපෘතියක් පමණයි. ඒ ව්‍යාපෘතියට අවශ්‍ය මූල්‍ය ධනය -මූලික ප්‍රාග්ධනය- මේ රුපියල් බිලියන 96 හරහා විශේෂයෙන්ම කාන්තාවන්ට ස්වයං රැකියා සහ ව්‍යාපාර කිරීම සඳහා ලබා දෙනවා.

කලින් තිබුණු තත්ත්වයේදී අපි දැක්කා, මූල්‍ය ආයතන විශාල ප්‍රමාණයක් කිසිදු නියාමනයක් නැතුව, තමන්ට ඕනෑ-ඕනෑ විධියට කාන්තාවන්ට ණය ලබා දීලා, අධික පොලියක් ලබා ගන්නවා. ඒ නිසා සිද්ධ වුණු විශාල සමාජ ඛේදවාචක ටිකක් පසුගිය කාලවලදී අපි දැක්කා. ඒ නිසා තමයි මම මුලින්ම කිව්වේ, උතුරු නැඟෙනහිර, මඩකලපුව, පොළොන්නරුව, අනුරාධපුරය විතරක් නොවෙයි, කොළඹ වාගේ නාගරික ප්‍රදේශවලත් කාන්තාවන්ට ණය ගන්න තිබුණු ලෙහෙසිම ක්‍රමවේදය ක්ෂුද්‍රමූල්‍ය ආයතනයකින් ණය ගන්න කියන එක. හැබැයි, පසුගිය කාලයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වෙලා තිබුණේ ආයතන හතරයි. එතකොට මේක නියාමනය වෙන්න ඕනෑ නැද්ද? මේකට ක්‍රියාවලියක් ඕනෑ නැද්ද? මේ පිළිබඳව අධිකාරියක් ඕනෑ නැද්ද? පසු විපරමක් ඕනෑ නැද්ද? අනිවාර්යයෙන්ම ඕනෑ.

මම උදාහරණයක් වශයෙන් කියන්නම්, බිම්පුත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනය විසින් පසුගිය කාලයේ කරපු දේවල් පිළිබඳව. දයා ගමගේ කියන පාර්ලිමේන්තුව නියෝජනය කළ එක්තරා ඇමතිවරයෙකුට අයත් ආයතනයක් තමයි, බිම්පුත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනය. එතුමා මේ ක්ෂුද්‍රමූල්‍ය ණය දුන්නේ කාටද? ගම්වල ඉන්න කාන්තාවන්ට. නිවාස සංවර්ධන බැංකුවෙන් අඩු පොලියට රුපියල් මිලියන 200ක ණයක් අරගෙන වැඩි පොලියට ගම්වල කාන්තාවන්ට දුන්නා. ඒක ගෙව්වාද? නැහැ, ඒක ගෙව්වේ නැහැ. ඊට පසුව NSB එකෙන් රුපියල් මිලියන 200ක් ආපසු අරගෙන ගම්වල ඉන්න කාන්තාවන්ට අධික පොලියට ණය දුන්නා. එතැනින් නතර වුණේත් නැහැ. මේ බිම්පුත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනය මොකද කළේ? මහජන බැංකුවෙනුත් ණයක් ගත්තා, රුපියල් මිලියන 100ක. මේ ණය අරගෙන ඒකත් දුන්නේ කාටද? ගම්වල ඉන්න කාන්තාවන්ට. එහෙම ණය දීලා ඒ කාන්තාවන්ගෙන් අධික පොලියක් අරගෙන නිකම් හිටියේ නැහැ. ඒ කාන්තාවන්ට අයිති දේපළත් බලහත්කාරයෙන් ලබා ගත්තා. ඒ විතරක් නොවෙයි, කාන්තාවන්ට විවිධ විධියේ අඩන්තේට්ටම් කළා; බලපෑම් කළා; ලිංගික අල්ලස් ගත්තා; ඒ වාගේම තමන්ට දේපළ අයිති කර ගත්තා; විශාල හිංසනයක් කළා. මම මේ කිව්වේ එක ආයතනයක් පිළිබඳව විතරයි. මහ ලොකුවට කිඹුල් කඳුළු හෙළන මේ කට්ටියටයි මම මේ කාරණය කියන්නේ. මේ ආයතනය මොකද කළේ? කාන්තාවන්ට අධික හිංසාවක් සිදු කළා. මේවා රජයේ මුදල්. නිවාස සංවර්ධන බැංකුවෙන් රුපියල් මිලියන 200ක්, NSB එකෙන් රුපියල් මිලියන 200ක්, මහජන බැංකුවෙන් රුපියල් මිලියන 100ක් ගත්තා. හැබැයි, මේ එකදු මුදලක්වත් රජයට ගෙව්වේ නැහැ. ඒකයි තිබෙන ප්‍රධාන ප්‍රශ්නය.

මේ ණය කපා හැර තිබෙන්නේ. මේ ණය කපා හැරියේ කවුද? පසුගිය කාලයේ හිටපු ආණ්ඩු. ක්ෂුද්‍රමූල්‍ය ණය දෙන්න රජයේ බැංකුවලින්, ආයතනවලින් ණය අරගෙන, ඒ ණයවලින් තමන්ගේ ව්‍යාපාර කරගෙන අධික ලාභයක් ලබාගෙන, අපේ රටේ කාන්තාවන්ට විශාල බොරුවක් කරලා, ඒගොල්ලන්ට අයිති වත්කම් ප්‍රමාණයකුත් ඉතාම පහත් විධියට මේ ආයතන ලබා ගත්තා. අද කියනවා, මෙහෙම ආයතනයක් නැහැ ලු, බංකොලොත් වෙලා ලු කියලා. අද මේ ණය අයකර ගන්නේ කාගෙන්ද කියලා අහනවා. ඒක වෙනම කථාවක්. ඒ නිසා මේ ආයතන නියාමනය කරන්න ඕනෑ. පළමුවෙනි කාරණාව ඒකයි.

මේ ආයතන නියාමනය කිරීම සඳහා තමයි මේ ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. මීට පස්සේ අනිවාර්යයෙන්ම මෙවැනි ආයතන සියල්ලම නියාමනය වෙනවා. ඒක හොඳ නැද්ද? අපි ඒවා නියාමනය කරනවා විතරක් නොවෙයි. මේ පිළිබඳව අධිකාරියේ තිබෙනවා, Regulations. ඒ ගැන කලබල වෙන්න එපා. මේ Regulationsවලට, එහෙම නැත්නම් මේ යටතේ නියාමනය වන රෙගුලාසිවලට අපිට තවත් දේවල් එකතු කරන්නත් පුළුවන්. එලෙස එකතු කරන්න ඕනෑ දේවල් පිළිබඳව අපේ යෝජනා ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ තිබෙන අනු කාරක සභාවට අපි පසුගිය කාලයේදී ලබා දීලා තිබෙනවා. එහි ප්‍රධාන කාරණය පිළිබඳව තමයි කලින් මෙතැනදී කථා වුණේ. විවිධ ආයතනත් එක්ක හරි පුදුම විධියට සමහර ගිවිසුම් ගහගෙන තිබෙනවා. ඒ වාගේම අධික ලාභ ලැබූ ඒ ක්ෂුද්‍රමූල්‍ය ආයතනත් එක්ක ගිවිසුම් ගහගෙන තිබෙනවා. ගම්වල ඉන්න අපේ කාන්තාවන්ට සිංහල, දෙමළ නැත්නම් ඉංග්‍රීසි කියන තමන් කැමති භාෂාවකින් එම ගිවිසුමේ සඳහන් කාරණා අවබෝධ කර ගැනීමේ හැකියාව තිබෙන්නටත් ඕනෑ. තමන් ක්ෂුද්‍රමූල්‍ය ණයක් ගන්නවා නම් එම ගිවිසුමේ අන්තර්ගතය, ඒ ගිවිසුමේ කොන්දේසි තමන්ට පැහැදිලි වෙන්නට ඕනෑ. නමුත්, එම ආයතන ඒ කිසිවක් සලකන්නේ නැතුව තමන්ට ඕනෑ - ඕනෑ විධියට ණය දීලා තිබෙනවා විතරක් නොවෙයි, ඔවුන්ගෙන් අධික පොලියකුත් අය කරගෙන තිබෙනවා. ඒවා නියාමනය වෙන්නට ඕනෑ.

විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන්ට මම කියනවා, ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පත හොඳින් කියවා අධ්‍යයනය කරන්න කියලා. ඒක තමයි හොඳම දේ. පිටුවක් දෙකක් කියවලා කෑ ගහන්න එපා, පොඩ්ඩක් මේ පනත් කෙටුම්පත පිළිබඳව අධ්‍යයනය කරන්න. මොකද, මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙනවා, මේ සඳහා පත් වන සාමාජිකයින් පිරිසක් ඉන්නවා, ඒ සාමාජිකයන් හතරදෙනාගෙන් එක්කෙනෙක් අනිවාර්යයෙන්ම සාමාජිකාවක් -කාන්තාවක්- වෙන්න ඕනෑ කියලා. ඒ වාගේම, බලපත්‍රලත් මුදල් ණයට දෙන්නන් සහ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා යන්ත්‍රණයක් සකස් කළ යුතුයි. කලින් මෙහෙම දෙයක් තිබුණේ නැහැ. මේ වාගේ දෙයක් වුණොත් අපි කාටද කියන්නේ, මොන ආයතනයටද කියන්නේ, කවුද ඒ වගකීම භාර ගන්නේ? එම නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ග්‍රාම නිලධාරි වසම දක්වා මේ යන්ත්‍රණය සකස් කරලා තිබෙනවා. මේක අනිවාර්යයෙන්ම වැදගත් වනවා. තමන්ට හිංසාවක් ඇති වනවා නම් ඒ හිංසාව පිළිබඳව දැනුම් දෙන්න යන්ත්‍රණයක් අවශ්‍යයි. මේ පනත් කෙටුම්පත තුළින් ඒ සම්බන්ධයෙන් යන්ත්‍රණයක් සකස් කරලා තිබෙනවා.

ඒ වාගේම අපි ක්ෂුද්‍රමූල්‍ය ණය සම්බන්ධයෙන් තිබෙන දත්ත මොනවාද කියලා සොයා බැලුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් දත්ත නැහැ කියන එක ඔබතුමාට මම කියන්න ඕනෑ. මොන තරම් ප්‍රමාණයක් ණය අරගෙන තිබෙනවාද, මොන තරම් ප්‍රමාණයකට ණය දීලා තිබෙනවාද, කොපමණ පිරිසක් මේ තුළින් හිංසනයට ලක් වෙලා සිටිනවාද කියන කාරණා සම්බන්ධයෙන් දත්ත නැහැ. මගේ කථාව අවසන් කරන්න මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා බලපත්‍රලත් මුදල් ණයට දෙන්නන් සම්බන්ධයෙන් වාගේම ඒ ක්ෂුද්‍රමූල්‍ය ආයතන සම්බන්ධයෙන් මේ අධිකාරිය අනිවාර්යයෙන්ම දත්ත සමුදායක් පවත්වාගෙන යා යුතුයි. මේ සඳහා යන්ත්‍රණයක් සකස් කරන්න ඕනෑ. ඒ වාගේම, මේ පිළිබඳව සමීක්ෂණ සහ පරීක්ෂණ කරන්නත් ඕනෑ. එමෙන්ම මුදල් ණයට දුන්නාට පසුව විශේෂයෙන්ම කාන්තාවන් සවිබලගැන්වීමේ වැඩසටහනකුත් සකස් වෙන්න ඕනෑ කියන යෝජනාව අපේ පැත්තෙන් අපි ඉදිරිපත් කරනවා. ඒ අනුව, ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගෙන ඒමේදී එක පැත්තකින් අපි විශාල අඩියරක් ඉස්සරහට තබා තිබෙනවා. මේක ක්‍රියාවලියක්. මේ ක්‍රියාවලිය ඉස්සරහට ගෙන යන්න ඕනෑ කියලා අපි හිතනවා. ඒ අනුව අධික ලාභ ලබා

ගන්නා, තමන්ට ඕනෑ - ඕනෑ විධියට කටයුතු කරන, විශේෂයෙන්ම කාන්තාවන්ට කරන හිංසාවලට අපි මේ ක්‍රියාවලිය හරහා තිත තබන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත ඒ ක්‍රියාවලිය ඉස්සරහට ගන්න ගෙනාපු හොඳ පියවරක් විධියට අපි දකිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.10]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දවසේ ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කරනවා. එක පැත්තකින් මේ විධියේ අණපනත් ගෙනෙන එක හොඳයි. මෙවැනි අණපනත් ගෙනෙන්න ඕනෑ. ඒ වාගේම මේවා නියාමනය වෙන්නත් ඕනෑ; මේ රටේ නැති බැරි මිනිස්සු ආරක්ෂා වෙන්නත් ඕනෑ. එලෙස නැති බැරි මිනිස්සු ආරක්ෂා වනවා නම් කොයි ආණ්ඩුව වුණත් කමක් නැහැ, මෙවැනි අණපනත් ක්‍රියාත්මක කරන එක හොඳයි. හැබැයි, ඒක ඒ ආකාරයෙන්ම සිදු විය යුතු වෙනවා. නමුත්, එය ඒ ආකාරයෙන්ම සිදු නොවනවා නම් මේ පනත් කෙටුම්පතත් තවත් එක් පනත් කෙටුම්පතක් විතරක් බවට පත් වෙන්න පුළුවන්. අපි පාර්ලිමේන්තුව තුළ දීර්ඝ කාලයක් හිටපු නිසා අපට ඒ වාගේ දේවල් පෙනෙනවා. අපේ ආණ්ඩුව පැවති කාලයේදීත් පනත් ගෙනාවා. හැබැයි, ඒ පනත් ක්‍රියාත්මක වුණාද, නැද්ද කියන එක ගැන ප්‍රශ්න තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේදී මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මේ, ශ්‍රී ලංකාවාසී මුස්ලිම් ජනතාවගේ රාමසාන් උපවාස කාල සීමාව. මේ මොහොතේ අපේ පාර්ලිමේන්තුව නියෝජනය කරන රවුෆ් හකීම් මන්ත්‍රීතුමා සභාවේ ඉන්නවා. එතුමාත් රාමසාන් උපවාසයේ යෙදිලා ඉන්න කෙනෙක්. ශ්‍රී ලාංකීය මුස්ලිම් ජනතාව විතරක් නොවෙයි, ලෝක මුස්ලිම් ජනතාවම රාමසාන් උපවාසයේ යෙදෙනවා. ලෝකයේ මුස්ලිම් ජනතාව රාමසාන් කාලයට ඉස්ලාමීය ආගම වෙනුවෙන් හදවතින්ම ඒ උපවාසය කරනවා. ඒ උපවාසයේ යෙදිලා ඉන්නකොට තමයි ඇමෙරිකාවේ ජනාධිපති ට්‍රම්ප් සහ ඊශ්‍රායලය විසින් ඉරානයට පහර දුන්නේ.

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාමසාන් සහ මුස්ලිම් සමාජය විකුණලා කථාවක් පවත්වන එක නවත්වමු කියන යෝජනාව මම කරනවා. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තාම අවුරුද්දයි නේ. *[බාධා කිරීමක්]* කෑ ගහන්න එපා. තවම අවුරුද්දයි, nursery එකේ. ඒ හින්දා ඉගෙන ගන්නත් එපායැ? කමක් නැහැ, ඔහොම කෑ ගහන්න දෙන්න. ලජ්ජා නැතිව කෑ ගහනවා. අහගෙන ඉන්න. *[බාධා කිරීමක්]* මුලින් තමන්ගේ ජාතිය, ආගම ගැන හිතන්න. ඒක ගැන හිතන්න බැහැ. *[බාධා කිරීම්]* ඔව්. අපි අහන්නේ ඒ වෙලාවේදී මොකක්ද වුණේ? ඉරානයේ මිනිස්සු, ඉස්ලාමීය ජනතාව රාමසාන් උපවාසයේ යෙදිලා ඉන්නකොට මොකද වුණේ? පාසල් දරුවෝ 160දෙනකු විතර මරා දානවා. මේ වෙනකොට 1,000කට ආසන්න ජීවිත සංඛ්‍යාවක් බිලි අරගෙන. කවුද මේක කරන්නේ? මේක කරන්නේ ඇමෙරිකාවේ නායකයා ට්‍රම්ප් ජනාධිපතිවරයා ඊශ්‍රායලයත් එක්ක එකතු වෙලා. දැන් අපිට තිබෙනවා යුතුකමක් ඒ වෙනුවෙන් කථා කරන්න, ඒ ජනතාව වෙනුවෙන් කථා කරන්න මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ. මොකද අපි ට්‍රම්ප්ට භයේ ඉන්නද? ට්‍රම්ප් කියන්නේ ගමක ඉන්න අයිආර්සීකාරයෙක් වාගේ කෙනෙක්ද? ලෝකයේ තිබෙන අනෙක් රටවල් එයාගේ අම්ම තාත්තාගේ බූදලයද, මෙහෙම ගහගෙන ගහගෙන යන්න? මේ දැන් මොකක්ද කරන්නේ, ස්පාඤ්ඤයට සහ බ්‍රිතාන්‍යයට අවවාද කරනවා.

දැන් මේ ගැන රජයේ ස්ථාවරය මොකක්ද? රජය කෙළින් කියන්න, මේ ප්‍රහාර හෙළා දකිනවාද, නැද්ද කියලා. හැබැයි, ඔබතුමන්ලාට අපි මේ කාරණය කියන්න කැමැතියි. ඔබතුමන්ලා එදා පක්ෂයක් හැටියට විපක්ෂයේ හිටියා; විපක්ෂයේ කාර්ය භාරය ඔබතුමන්ලා ඉටු කළා. හැබැයි, ඔබතුමන්ලා විපක්ෂයේ කාර්ය භාරය ඉටු කරන වෙලාවක මේ දේ සිදු වුණා නම්, ඉරානයට මේ විධියට ගහන වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණ විපක්ෂයේ හිටියා නම් මොකද්ද සිද්ධ වෙන්නේ? එහෙනම් සමහර විට අද ඔබතුමන්ලා මේ සභා ගර්භයේ මැදට ඇවිල්ලා සෙංකෝලය උස්සාගෙන ගිහිල්ලා; එහෙමයි පෙනී ඉන්නේ. හැබැයි, දැන් මොකද කරන්නේ? දැන් මුනිවත රකිනවා. මුනිවත රකින්නේ ට්‍රම්ප්ට භයේද? එහෙම පුළුවන්ද? මේ එන්නේ දෙවෙනි හිට්ලර්ද? ඕනෑම රටකට ස්වාධීන අයිතියක් තිබෙනවා. ඒ රටවල් ඒ ස්වාධීන අයිතිය වෙනුවෙන් යම් යම් තීන්දු තීරණ ගන්නවා. එහෙම කළා කියලා මරා දාන එක හරිද? මේක මහ භයානක තැනකට යනවා.

අපි දැක්කා ඊයේ ජනාධිපතිතුමා ඇවිල්ලා කථාවක් කළා; හොඳයි. මේකේ අවදානම ගැන කිව්වා. මේකේ අවදානමක් තිබෙනවා. මොකක්ද ඒ අවදානම? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනකොට මැදපෙරදිග කලාපයේ ශ්‍රී ලාංකීය ශ්‍රමිකයන් ලක්ෂ 10කට ආසන්න සංඛ්‍යාවක් ඉන්නවා. මේ පිරිස තුළ රැකියාවල නිරත වෙන අයත් ඉන්නවා, ඒ අයගේ පවුල්වල අයත් ඉන්නවා. තමන්ගේ දරුවෝ, බිරිඳ, තවත් ඥාතීන් ඉන්නවා. රැකියාව කරන්නේ ඔහු විතරයි. අද ඒ අහිංසක පවුල්වල අය අසරණ වෙලා ඉන්නවා, මරණ භයෙන් ඉන්නේ. මට ඊයේ රෑ දුරකථන ඇමතුමක් ලැබුණා. ඒ කෙනා airline එකක - Qatar Airways එකේ - වැඩ කරන්නේ. තාත්තා ඇමෙරිකාවේ ඉන්නේ. ඇමෙරිකාවේ ඉඳන් එන්න බැරිව හිරවෙලා ඉන්නවා. දියණියයි, බිරිඳයි කටාර්වල හිරවෙලා ඉන්නවා. පුංචි දරුවා කථා කරලා තාත්තාගෙන් අහනවා ලු, "තාත්තේ, තාත්තා එනකොට අපිව මැරෙයිද දන්නේ නැහැ. අපිව මරලා දමයිද දන්නේ නැහැ, බෝම්බ ගහයිද දන්නේ නැහැ" කියලා. ඒ ශ්‍රී ලාංකීය දරු පැටව්. ඇයි, ඒ භය හිතෙන්නේ? ඉරානයේ දරුවෝ 180ක් බෝම්බ දාලා

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

මරන කොට, ඩුබායිවලට ගහන කොට, කටාර්වලට, මැදපෙරදිගට ගහන කොට ඒ දරුවන්ට එහෙම හිතෙන්නේ නැද්ද? ඒ දරුවන්ට මරණ භය ඇති වෙනවා. ඇයි, එහෙම ඇති වෙන්නේ නැත්තේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තෙල් තිබුණා. අපි දන්නවා, තෙල් තිබුණා කියලා. තෙල් තිබුණාත් ඔක්කොම අය පෝලිමට ගියා නේ. ඇයි, ඒ? භය නිසා. ඒ භය සමානයි. මැදපෙරදිග ජීවත් වෙන ශ්‍රමිකයෝ සහ ඔවුන්ගෙන් යැපෙන අයගේ ජීවිත ගැන මීට වැඩිය අවදානමක් ගන්න. රජයක් හැටියට අවදානමක් ගන්න. අපි දෙවියන්ගෙන් ඉල්ලා සිටිනවා, මේ යුද්ධය නම් දිගට යන්න එපා කියලා. මේ යුද්ධය අවසන් කරලා දෙන්න, කියලා අපි ඉල්ලා සිටිනවා. හැබැයි, තිබෙන තත්ත්වය භයානකයි. ඉරානයේ හිටපු නායකයාගේ පුතා තමයි, නැවත රට භාර ගන්න ලැහැස්ති වෙන්නේ. ඒක අවදානමක්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒක අවදානමක්. මොකද, ඔවුනුත් ලෙහෙසියෙන් අතහරින ජාතියක් නොවෙයි. ඒක අවසානයේදී බලපාන්නේ කාටද? මේ අපිට. අපි වාගේ රටවලට බලපානවා. ඒ නිසා මේ රටවල ඉන්න ශ්‍රමිකයින්, ඒ ශ්‍රමිකයින්ගෙන් යැපෙන්නන් වෙනුවෙන් ඔවුන්ව ලංකාවට ගෙන්වා ගන්නේ කොහොමද? මේ යුද්ධය එක්වරම මහා භයානක තත්ත්වයකට ගියොත් අපි මොකද කරන්නේ?

අපිට මතකයි, අපි ආණ්ඩු කරන කාලයේ ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා කරපු දේ. කොවිඩ් වසංගතය නිසා චීනයේ තමයි, මුලින්ම දරුවෝ හිර වුණේ. අපි ගිහිල්ලා ඒ ළමයි ටික අරගෙන ආවා. මිනිස්සුන්ගේ ජීවිත බේරා ගත්තා. ඒ හා සමාන වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. එහෙම නැත්නම් මේක ලෙහෙසියෙන් අපි හිතන තැනට යන්නේ නැහැ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, රජයක් හැටියට කරුණාකරලා මේකේ ඇත්ත, ඇති සැටියෙන් දකින්න කියලා. මුස්ලිම් ජනතාව, මුස්ලිම් බැතිමතුන් තමන්ගේ රාමසාන් කාලයේදී මේ විධියට මරා දමලා, ඒ යුද්ධය ඇති කිරීම ගැන අපි තරයේ හෙළා දකිනවා, විපක්ෂයක වගකීමක් හැටියට. අපි සම්පූර්ණයෙන්ම ඇමෙරිකාවට හා ඊශ්‍රායලයට විරුද්ධව කියනවා, මේක තනිකරම මිලේච්ඡ ක්‍රියාවලියක් කියලා. මේක මිලේච්ඡ ක්‍රියාවලයක්. ඕනෑ නම් අපිට කරන්න පුළුවන් මොකක්ද? අපිට ඕනෑ නම් වීසා නොදී ඉඳයි. මොකද, අපි බල්ලෝ අල්ලන්න යනවාද ඇමෙරිකාවේ? *[බාධා කිරීමක්]* ඇමෙරිකානු බල්ලෝද අපිට ඕනෑ. අපිට ඕනෑ නැහැ. අපේ රටේ ජීවත් වෙනවා, සිංහල, මුස්ලිම්, ද්‍රවිඩ හා මැලේ යන සියලු ජාතීන්. *[බාධා කිරීමක්]* හුණ්ඩුවේ. ඒ නිසා අපි බොහොම පැහැදිලිව කියනවා, කරුණාකරලා ස්ථාවරය කියන්න. ඒ ස්ථාවරයයි අපිට ඕනෑ. අපි පෙනී සිටිනවා, අපිට පුළුවන් විධියට ඒ මුස්ලිම් ජනතාව වෙනුවෙන්. ඒ වෙනුවෙන් අපට කරන්න පුළුවන් යුතුකම අපි ඉටු කරනවා.

ඊයේ ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වා, යම් විධියකින් මේ යුද්ධය වැඩි දියුණු වුණොත් අපට බලශක්ති අර්බුදයකට මුහුණ දෙන්න වෙනවා කියලා. අපට තෙල් නැහැ, අපට ගෑස් නැහැ. තෙල්, ගෑස් නැති වුණාම ඊට පස්සේ විදුලිය නිෂ්පාදනය කරන්න බැහැ. මේ ටික නැති වෙච්ච ගමන්ම ආණ්ඩුවක් ගෙදර යවන්න තිබෙන ප්‍රධාන සාධක තුන මේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
පොඩි වෙලාවයි යන්නේ.

මම දැක්කා ඇමතිවරයෙක් කියනවා, -එතුමා මගේ මිත්‍ර ඇමතිවරයෙක්. මම නම කියන්නේ නැහැ.- ගියවර තෙල් නැති වෙනකොට, ගෑස් නැති වෙනකොට තිබුණු තත්ත්වය නොවෙයි ලු දැන් තිබෙන්නේ. එතුමා මගේ හොඳ මිත්‍රයා. ගියවර හොඳටම බැන්නා ලු ආණ්ඩුවට, දැන් බණින්නේ නැති ලු. මම ඒ ඇමතිතුමාගෙන් ඉල්ලනවා, අනේ, ඇමතිතුමා ඔය නිලධාරින් එක එක්කෙනා ගෙනැල්ලා දෙන ඇඳුම් අඳින්න එපා. ඒවා ඇඟට හරියන්නේ නැහැ, දෙවියනේ. ඒ ලණු කන්න එපා. තෙල් පෝලිමට ගිහිල්ලා බලන්න කෝ. බණින්නේ නැහැ නොවෙයි, රෙද්ද ගලවන්නේ. තෙල් පෝලිමකට ගියා නම් එහෙම රෙද්ද ගලවනවා. යන්න බැහැ, අපි දැක්කා නේ. එහෙම යන්න බැහැ. අපිට විතරක් නොවෙයි බණින්නේ. ඒ කාලයේ බණින්නේ කාටද? අම්මලාටත් බණිනවා. ඒ නිසා මේ අර්බුදය ඇති වුණොත් මිනිස්සු භයානක තත්ත්වයකට යනවා. ඒ නිසා ඊට ඉස්සෙල්ලා මොකක්ද කරන්න තිබෙන්නේ? අපි කළ යුතු ක්‍රියාමාර්ගය තමයි, මේකට විසඳුම් සොයා ගැනීම, පෙර සූදානමක් ඇති කර ගැනීම. අපට පෙර සූදානමක් ඇති කර ගන්න බැරි වුණොත්, ඇති වන තත්ත්වය මොකක්ද? පෙර සූදානමක් ඇති කර ගන්න බැරි වුණොත්, මිනිස්සු කොහොමත් පාරට බහිනවා. තෙල් ටික නැති වෙච්ච ගමන්, ගෑස් ටික නැති වෙච්ච ගමන් පාරට බහිනවා. මේවා අපි ප්‍රාර්ථනා කරන්නේ නැහැ. තමුන්නාන්සේලා එදා විපක්ෂයේ ඉද්දී කරපු දේ නම්, අපි කරන්නේ නැහැ. දිවුරලා කියන්නම්, ඒක අපි කරන්නේ නැහැ.

දැන් තමුන්නාන්සේලා කිව්වා නේ, මේ අවුරුදු 76ට මොකුත් වෙලා නැහැ කියලා. ඒ කරපු දේවල් ඉතිහාසය අරගෙන බලන්න. අධිවේගී මාර්ගය හදනකොට විරුද්ධ වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම වරාය විෂය භාර ඇමතිවරයා හැටියටත් කටයුතු කළා. ඔය හම්බන්තොට වරාය හදන කොට, ඒකේ ගල් තිබෙනවා කිව්වා; ඒකේ ගල් ටික ඉවත් කරන්න ඕනෑ කිව්වා; ජීවිතේට එතැන වරායක් හදන්න බැහැ කිව්වා. නමුත් ගරු ජනාධිපතිතුමා අද කියපු විධියට අද ගෙනෙන ගෑස් ටික ගබඩා කරන්න ඒක නේද ඕනෑ වුණේ? නමුත්, ඒ වරාය හදන කොට විරුද්ධ වුණා. නොරොච්චෝලේ විදුලි බලාගාරය, Colombo Port City එක හදන කොටත් එහෙමයි. Colombo Port City එක හදන කොට කිව්වා නේ, ඒක පුරවන්න ගල් සපයා ගන්න සීගිරි ගලත් කඩන්න ඕනෑ කියලා. ඒ වුණාට සීගිරි ගල කැඩුවේ නැහැ නේ, අද වනතුරු. මේ කිව්වේ, ඔබතුමන්ලා එදා විරුද්ධ වෙච්ච ඒවා ගැන. ඔබතුමන්ලා ඒවාට විරුද්ධ වුණත් අද වන විට අපට හොඳ මාතෘ භූමියක් ඉතිරි වෙලා තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ ගරු ජනාධිපතිතුමා කිව්වා මේක හුණ්ඩුවක් කියලා. දැන් නම් හුණ්ඩු නැහැ නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් හුණ්ඩු නැහැ. හුණ්ඩු 4ක් සේරුවයි. මේ රට හුණ්ඩුවක් නම් - එහෙම වෙන්න එපා. මොකද, මේක අපේ මාතෘ භූමිය- අඩු ගණනේ මේක සේරුවක් කරන්නවත් අපි උත්සාහ කරමු.

අපි ගරු ජනාධිපතිතුමාට කියනවා, බලශක්ති ක්ෂේත්‍රය ගොඩ නැංවීම වෙනුවෙන් ඊයේ එතුමා කියපු ටික කරුණාකර කරන්න කියලා. අපේ පූර්ණ සහයෝගය දෙන්නම්. ඒ කියපු විධියට තෙල් ටැංකි ටික හදන්න; නළ ටික එළන්න; ත්‍රිකුණාමලයේ තෙල් ගබඩා ගැනත් අවධානය යොමු කරන්න. ඒ කියපු ටික කරන්න කියලා අපි නැවත කියනවා. ඒ වාගේම අපි කියනවා, මේ යුද්ධයේ අවදානම ගන්න කියලා. මේ යුද්ධයේ අවදානම නොගත්තොත්, තමුන්නාන්සේලා අප ඔක්කෝටම ආණ්ඩුව, විපක්ෂය කියලා නැතුව පොදුවේ තමයි කන්න වෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.22]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)

நன்றி! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் நுண்நிதி மற்றும் கடன் ஒழுங்குபடுத்தும் அதிகாரசபை சட்டமூலம் சம்பந்தமான விவாதம் நடைபெறுகின்றது. இந்தச் சட்டமூலத்தினால் பல்வேறுபட்ட நலன்கள் கிடைக்க உள்ளன. இந்தச் சட்டமூலம் கொண்டுவரப்பட முன்னர், 2016ஆம் ஆண்டின் 6ஆம் இலக்க, நுண்நிதியளிப்புச் சட்டத்தின் மூலம்தான் நுண்நிதி சார்ந்த விடயங்கள் நிருவகிக்கப்பட்டன. இன்றைய தினம் கொண்டுவரப்பட்டுள்ள இந்தச் சட்டமூலம் நிறைவேற்றப்பட்ட பின்னர், புதியதொரு அதிகாரசபை நிறுவப்படும். அந்த அதிகாரசபை ஊடாக கடன் வழங்குநர்கள் அல்லது கடன்பெறுநர்கள் நன்மை பெறுவதை நாங்கள் காணலாம்.

எமது நாட்டில் பல்வேறுபட்ட கடன் வழங்கும் நிறுவனங்கள் உள்ளன. தனிநபர் செய்கின்ற அல்லது கூட்டாகச் செய்கின்ற இந்த நிறுவனங்களை எந்தவொரு சட்டமும் நிருவகிக்கவில்லை. சட்டம் உருவாக்கப்பட்டு, அவற்றை நிருவகிக்க வேண்டிய தேவை பற்றி பலரும் பேசினார்கள். இன்று நுண்நிதி மற்றும் கடன் ஒழுங்குபடுத்தல் அதிகாரசபை சட்டமூலத்தை நிறைவேற்றி, அமுல்படுத்துவதன் மூலம் நாட்டில் காணப்படுகின்ற கடன் கொடுக்கல் வாங்கலுடன் தொடர்புபட்ட பல்வேறு பிரச்சினைகளுக்கு நிச்சயமாக தீர்வுகளைக் காண முடியும். இந்த அதிகாரசபையின் உறுப்பினர்களாக, மத்திய வங்கி ஆளுநரால் இரண்டு பேரும், அமைச்சரால் நான்கு பேரும், பதவிவழியாக மூன்று பேரும் நியமிக்கப்படுவார்கள். மொத்தம் ஒன்பது உறுப்பினர்கள் இந்த அதிகாரசபையில் அங்கம் வகிப்பார்கள்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට අදාළ මාතෘකාව microfinancing. ඒ මොකක් වුණත් අද ලෝකයේ පවතින තත්ත්වය ගැනත් අපි පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා මුස්ලිම් ජනතාව ගැන, රාමසාන් උත්සවය ගැන ඉතාම සංවේදීව ගොඩක් දේවල් කථා කළා. මට මතක හැටියට එතුමන්ලාගේ ආණ්ඩුව පැවැති කාලයේ දර්ගා නගරය විනාශ කළා. නායකත්වය දුන්නා, එතුමන්ලා. මට හිතා ගන්න බැහැ, එතුමන්ලාගේ ආණ්ඩුව ඒ වාගේ දේවල් කරන කොට නායකත්වය දීලා අද ඇවිල්ලා රාමසාන් උත්සවය ගැනයි, මුස්ලිම් ජනතාව ගැනයි, ඊශ්‍රායල-පලස්තීන ගැටුම් ගැනයි, ළමුන් ඝාතනය වෙන එක ගැනයි කියනවා. එදා තමන්ගේ රටේ පැවැති තත්ත්වය තමන්ට පාලනය කරන්න පුළුවන් අවස්ථාව තිබියදීත් ඒ තත්ත්වය පාලනය කළේ නැහැ; ඒක ඔබු දුවන්න දුන්නා; පල්ලිවල මිනිස්සු මැරුවා. කවුද ඒ අය ඝාතනය කළේ? ළමුන් මෙහේත් ඉන්නවා. නමුත්, පලස්තීනයේ හෝ ඉරානයේ හෝ මිනිස්සු මැරෙන කොට මෙතුමන්ලාට දුකයි.

තව මන්ත්‍රී කෙනෙක් ඉන්නවා, හෙට්ටිපොළ. හෙට්ටිපොළ මන්ත්‍රීතුමා හෙට්ටිපොළට ගිනි තිබ්බා. මෙහේ ඇවිල්ලා වකුෆ් සභාව ගැන කථා කරනවා. මුළු මුස්ලිම් සමාජයම SIS දමලා විමර්ශනය කරන්න ඕනෑ කිව්වා. අපි පුදුම වෙන කාරණය මේකයි. *[බාධා කිරීමක්]*

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බේරුවල ඉපදුණු කෙනෙක්. මම මුස්ලිම් ජනතාව වෙනුවෙන්- [බාධා කිරීම්] මම පළමුවෙනි සභාපතිවරයා. [බාධා කිරීම්] මම බේරුවල මුස්ලිම් ජනතාව වෙනුවෙන්- [බාධා කිරීම්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි. ගරු අස්ලම් මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න.

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිසිම මන්ත්‍රීවරයෙකුගේ නමක් කිව්වේ නැහැ. නමුත් අපි තවමත් තරයේ විශ්වාස කරනවා, මේ උදවිය රට විනාශ කළ බව. ඔය කියන අය මුස්ලිම් සමාජයට කරපු දේවල් අපි දන්නවා. මොකද, අපි කවුරුවත් නිදාගෙන හිටියේ නැහැ නේ. මේ සමාජය ඒවා ගැන දන්නේ නැතුවත් නොවෙයි. තවත් කණ්ඩායමක් ගැන මම කිව්වා නේ. තමන් නායකත්වය දෙන එක පාර්ශ්වයක් කියනවා SIS එක දාලා මුස්ලිම් සමාජය විමර්ශනය කරන්න ඕනෑ කියලා. තවත් කණ්ඩායමක් මුස්ලිම් ජනතාවගේ අයිතිය ගැන කථා කරනවා. මට හිතා ගන්න බැහැ, ඇයි මෙතුමන්ලා මෙහෙම හැසිරෙන්නේ කියලා.

සමහර ආණ්ඩු තිබුණා, එක එක පක්ෂ එකතු වෙලා හදා ගත්තු. යහ පාලන ආණ්ඩුවත් එහෙමයි. තමන් මුස්ලිම් නායකයෝ යැයි කියා ගන්නා අයත් ඒ ආණ්ඩුවේ හිටපු වෙලාවක තමයි පාස්කු ඉරිදා ප්‍රහාරය සිද්ධ වුණේ. කවුද ඒක හෙළා දැක්කේ? මොන වාගේ ප්‍රතිචාරයක්ද දැක්වූයේ?

පලස්තීන-ඊශ්‍රායල යුද්ධය අද ඊයේ ඇති වුණු එකක් නොවෙයි. ඒක දශක ගණනාවක් තිස්සේ පවතින යුද්ධයක්. පක්ෂයක් හැටියට, ආණ්ඩුවක් හැටියට අපි ඒ ගැන කම්පාවට පත් වෙනවා. කොයි රටක ඒ වාගේ දෙයක් සිද්ධ වුණත් අපි කම්පාවට පත් වෙනවා. ළමුන් නම් කොයි රටේ වුණත් ළමුන්. පළමුවෙන්ම මානවවාදී වෙන්න ඕනෑ. මේ කට්ටිය පාර්ලිමේන්තුවේ කථා කරන කිසිම දෙයක් රාජ්‍ය තාන්ත්‍රිකව බලපාන්නේ නැහැ. මේ අය කෑ ගහන්නේ රටේ ජනතාවට ඇහෙන්න.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று நாங்கள் பார்க்க வேண்டும், இந்த நாடகத்தில் யார் யார் நடிக்கிறார்கள் என்று. இந்த நாடகத்தின் பின்னணியில் இருப்பவர்கள் யாரென்றால், இந்த நாட்டில் 'கொவிட்'-19 தொற்றால் இறந்த முஸ்லிம்களின் ஜனாஸாக்களை எரித்தவர்கள்தான். இன்று கவலை தெரிவிப்பவர்கள் யாரென்றால், எமது நாட்டில் முஸ்லிம்களின் சொத்துக்களை அழித்தவர்கள்; முஸ்லிம்களின் இருப்பையே இல்லாமல் ஆக்கியவர்கள்.

இன்றும் அல்-குர்ஆன் பிரதிகள் தடுத்து வைக்கப்பட்டு இருப்பதற்குப் பிரதான காரணம், கடந்த ஆட்சியில் நடைபெற்ற குளறுபடிதான். இன்றும் அதை நிவர்த்தி செய்ய

[ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා]

முடியாமல் இருக்கின்றோம். இவர்கள் தங்களுக்குத் தேவையான சந்தர்ப்பத்தில் முஸ்லிம்களுக்குச் சார்பாக இருப்பார்கள்; ஆட்சியில் இருக்கும்போது முஸ்லிம்களுக்கு எதிராக இருப்பார்கள். ஆட்சியைப் பிடிக்க வேண்டுமென்றால், முஸ்லிம்களுக்கு எதிரான செயற்பாட்டை நிறுத்த வேண்டும். ஆனால், இவர்கள் ஆட்சிக்கு வர நினைக்கும்போதும் அதேபோன்று நாடகமாடுவார்கள். முஸ்லிம்களாகிய நாங்களும் மனிதர்கள்! எங்களுக்கு நிலையான தீர்வொன்று வேண்டும்.

இன்று மக்கள் எமது அரசாங்கத்துக்கு வாக்களித்தது, இந்த நாட்டை அழகாக நிருவகிப்பதற்குத்தான். நாங்கள் இரண்டு கோடி மக்களை நிருவகிக்க வேண்டும்; இந்த நாட்டின் பொருளாதாரத்தை ஸ்திரப்படுத்த வேண்டும்; பாதுகாப்பை உறுதிப்படுத்த வேண்டும். இந்த நாட்டின் பொருளாதாரத்தை வீழ்ச்சியடைய வைத்துவிட்டு, ஏனைய நாடுகளை நாங்கள் கண்டிக்க முடியாது. பாகிஸ்தான் அணிக்கும் இந்திய அணிக்கும் இடையிலான T-20 matchஐ எங்களுடைய ஆட்சியில் நடத்த முடிந்தது. அது சார்ந்த பிரச்சினையை எங்களால் நிவர்த்தி செய்ய முடியுமாக இருந்தது. மாண்புமிகு சனாதிபதி அவர்கள் பாகிஸ்தான் பிரதமர் அவர்களுடன் பேசி, அந்த matchஐ எமது நாட்டில் நடாத்தினார்கள்.

தற்பொழுது நடைபெறுகின்ற யுத்தம் நிறுத்தப்படுமானால், நிச்சயமாக எங்களால் குரல்கொடுக்க முடியும். நாங்கள் இந்த நாட்டில் பொருளாதார ஸ்திரத்தன்மையைப் பேண வேண்டும்; அமைதியைப் பேண வேண்டும். நடைபெறுகின்ற அநியாயங்களை நாங்கள் யாருமே ஒருபோதும் பாராட்டுவதில்லை. உண்மையில் நாங்கள் அனைவரும் -இந்த நாட்டு மக்களும் சரி, அரசாங்கமும் சரி- மிகுந்த கவலையோடுதான் இருக்கின்றோம். சிலர் இதனூடாக அரசியல் இலாபம் தேடுவதற்காக இந்தப் பாராளுமன்றத்தைப் பயன்படுத்துகின்றார்கள். இந்தப் பாராளுமன்றத்தைப் பிரதிநிதித்துவப்படுத்தக்கூடிய அவர்களுடைய கட்சித் தலைமைதான் இந்த நாட்டில் இனவாதத்தைத் தூண்டி, இந்த நாட்டை மோசமான நிலைக்குத் தள்ளியது. இந்த விவாதத்தில் கலந்துகொண்டு இந்தக் கருத்தை நான் சொல்வதற்குக் காரணம், நாட்டின் நடப்பு விவகாரம்தான். தற்பொழுது ஈரானில் ஏற்படுத்தக்கூடிய அழிவை நாங்கள் ஒருபோதும் ஏற்றுக்கொள்ள மாட்டோம். சிலர் கூறுகின்றார்கள், "சனாதிபதி அவர்கள் அவ்வாறு சொல்லவில்லை; இவ்வாறு சொல்லவில்லை" என்று. நாங்கள் இந்த நாட்டுக்குத் தலைமை வகிக்க வேண்டும். அப்போதுதான் எங்களால் உலகளவில் எமது நாடு சார்பாகத் தலைமை வகிக்க முடியும்.

ஒரு நாட்டின் இருப்பை இல்லாமலாக்கிவிட்டு, எவ்வாறு நாங்கள் நாட்டை நிருவகிக்க முடியும்? எதிர்க்கட்சியில் இருக்கும்போது பலதையும் சொல்லலாம். பொறுப்புவாய்ந்த அரசாங்கம் என்ற வகையில், நிச்சயமாக நாங்கள் நடக்கக்கூடிய இந்த அநியாயங்களை ஒருபோதும் சந்தோசமான விடயமாகப் பார்க்க மாட்டோம். நாங்கள் உங்களைவிட மிகுந்த மனிதநேயம் கொண்டவர்கள். எனவே, இதனை நாங்கள் கவலையோடுதான் பார்க்கின்றோம். இந்தச் செயற்பாட்டை வைத்து குறிப்பாக முஸ்லிம்களின் கவலையான விடயங்களை வைத்து அரசியல் செய்ய வேண்டாம். அன்று முஸ்லிம்களின் ஜனாஸாக்களை எரித்தவர்களோடு, முஸ்லிம்களின் சொத்துக்களை அழித்தவர்களோடு, முஸ்லிம்களின் இருப்பை இல்லாமலாக்கியவர்களோடு சேர்ந்து, சில தலைமைகள் இதற்கெதிராகச் சதி செய்வது கவலையாக உள்ளது. நீங்கள் சதி செய்வதனூடாக முஸ்லிம்களுக்கோ, தமிழர்களுக்கோ, சிங்களவர்களுக்கோ நலவு நடக்குமாக இருந்தால், நாங்களும் உங்களுடன் இணைந்து கொள்வோம். ஆனால், உங்களுடைய சதி இந்த நாட்டின் இருப்புக்கு மிகவும் அச்சுறுத்தலாக இருக்கும்; இந்த நாட்டு மக்களின் சந்தோசத்தைக் கெடுக்கும். எனவே, நாங்கள் சதி செய்வோம், இதைவிட நல்லதொரு நாட்டையும் நல்லதொரு சூழலையும் உருவாக்குவதற்கு.

இவர்கள் எல்லாவற்றையும் அரசியலாக்கிக்கொண்டு, அரசியல் இலாபம் தேடுவதற்காக இந்தப் பாராளுமன்றத்தை ஓர் ஊடகமாகப் பயன்படுத்துகின்றார்கள். நாங்கள் அரசியல் களத்தில் அரசியல் செய்வோம். ஒரு சமூகம் கவலைப்படக்கூடிய விடயங்களை வைத்து மக்களைத் தூண்டிவிட்டு, அதில் அரசியல் இலாபம் தேடுவதைத் தவிர்த்துக்கொள்ள வேண்டுமென நான் தயவாகக் கேட்டுக் கொள்கின்றேன். உண்மையிலேயே மக்களின் நலனுக்காகப் பாடுபடக்கூடிய, மக்களுக்காக அரசியல் செய்யக்கூடிய எந்தவொரு கட்சியும் எந்தவொரு நபரும் எந்தவொரு பாராளுமன்ற உறுப்பினரும் இதை வைத்து அரசியல் செய்ய மாட்டார்கள்.

இன்று TV channel ஒன்றின் தலைவர் இப்தார் நிகழ்ச்சி செய்கிறார். Easter attack இடம்பெற்ற காலப் பகுதியில் அவருடைய TV channelஇல்தான் முஸ்லிம் மக்கள் தீவிரவாதிகளாகக் காட்டப்பட்டார்கள். இன்று அவரோடு சேர்ந்து இவர்கள் அரசியல் செய்கின்றார்கள். அதுமாத்திரமன்றி, இவர்கள் கொரோனா தொற்றுக் காலத்தில் முஸ்லிம்களின் ஜனாஸாக்களை எரித்தவர்களோடு சேர்ந்து அரசியல் செய்கின்றார்கள்; முஸ்லிம் மக்களுடைய சொத்துக்களை அழித்தவர்களோடு சேர்ந்து அரசியல் செய்கின்றார்கள். இவர்களுடைய ஆட்சிக் காலத்தைவிட, இன்றைய தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் ஆட்சியில் எல்லா மக்களும் நிம்மதியாகவும் சந்தோஷமாகவும் வாழுகின்றார்கள். மக்களுடைய நிம்மதியும் சந்தோஷமும் ஆரோக்கியமும்தான் எமது நோக்கமாகும். அதுதான் எமது வெற்றி! இன்று எமது நாடு பொருளாதாரத்தில் ஸ்திரமடைந்துள்ளது. நாங்கள் இனவாதத்தை ஒழித்து நேரான பாதையில் செல்கின்றோம்; சூழலைப் பாதுகாக்கின்றோம். நிச்சயமாக நாங்கள் இந்த நாட்டை அபிவிருத்தி அடையச் செய்வோமெனக் கூறி, சந்தர்ப்பத்துக்கு நன்றி தெரிவித்து விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[2.33 p.m.]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Presiding Member, we are discussing the Microfinance and Credit Regulatory Authority Bill. This Bill has been under discussion for quite some time, for more than two years, perhaps. This is replacing the former legislation, which was brought in in 2016 when we were in Government and that was done for a good purpose.

But, yet, there have been requests from a variety of different quarters, particularly from community savings and credit service providers' organizations led by women all over the country. Also, several women's organizations have made representations to the oversight committee which went into the provisions of this Act and brought to their attention some of the glaring shortcomings. They also sought full exemption for their community savings and for credit service providers, particularly because their organizations are based on membership savings. They lend only to members and are non-profit entities, they do not require collateral and also, they have a cap on interest. So, therefore, they are not like the credit agencies which are charging very exorbitant rates of interest. Therefore, these organizations should be categorized separately and that was their request. But, that request has not been accommodated. That is their principle concern and it has been brought to the notice of the Government by a variety of parties. Even Members of the Government spoke about it, but the Government say that they will bring in some regulations later after the Bill has been enacted. But, that is inadequate.

Since there are other matters to be spoken about, now, I would like to digress to talk about another serious issue that is now engulfing our economy as well as the entire world's economy. That is, the current war in the Middle East. Sir, It was very unfortunate what happened in the morning. From the Hon. Foreign Minister Vijitha Herath, I asked a very simple question: "Totally violating all norms of international law, the Supreme Leader of Iran had been assassinated and what is the position of the Government, are you all prepared to openly condemn that action as well as to condole with the people of Iran?" What he said was, he was going to sign the condolence book at the Iranian Embassy in the afternoon. What a damn joke! To what levels have our Government gone down? Iran is a country which has helped Sri Lanka at every turn, at every international fora. Whenever it came to supporting Sri Lanka, they were in the forefront. But, now, the Government has forgotten all about it because they are afraid of the US. In the past, they used to call the US "The Great Satan", decrying all the actions of the Americans. Now, they have completely forgotten about it. Also, see what is happening in India. Prime Minister Modhi has also gone into total silence. He also has not condemned the US, nor has he even condoled the death of the Supreme Leader of Iran. They have said that they are taking a neutral position. Former Leader of the Opposition of India Sonia Gandhi has said, "This is not neutrality. This is abdication". This is total slavery, a slavish attitude towards the Americans! So, this is what is happening. The Tamil Nadu Chief Minister has condemned it; several other Chief Ministers in India have condemned it. But, our Government is still not prepared to do that. I asked about it in this House openly. Yesterday, the President came to the House and spoke about the petrol shortage, the gas shortage and the actions that the Government is taking, that they will see to it that extra storage facilities are developed and all that, but he did not utter a word about the death of a friendly country's leader. They are not even prepared to condole openly or to condemn the violation of international law. Such is the terrible level to which we have come. We should have compassion and courage to stand up against injustice. One fine day when these things happen to us, we would be in a terrible position.

This is not the first time it happened. When Venezuela's President Nicolas Maduro was openly abducted after attacking the Capital of Venezuela, this Government said nothing about it. For all this, Venezuela is a country which follows Che Guevara and his principles and you all also started your organization on Che Guevara's principles. But, now, Sir, they have forgotten about Che Guevara, they have forgotten about Maduro and have totally ignored them. They have become so pally with the capitalist nations.

Then, what happened? There was an attack by Israel on Qatar while they were facilitators in the talks between the Hamas and Israel. While the talks were on, Israel went and attacked Qatar. There also, the Government issued a statement, but did not name the perpetrator or say anything. They simply said, "We want countries to maintain peace." They did not have courage, even when Qatar was attacked by Israel, to name Israel and then condemn it. When the Supreme Leader of Iran is martyred by the atrocities or targeted attack by a US-Israeli bombardment, Sir, they have descended to such despicable levels that they do not have the decency to name the perpetrators or condemn that gross violation of international law.

It is also regrettable, Sir, that many Gulf countries, including the Kingdom of Saudi Arabia, have come under Iranian missile and drone attacks. It is regrettable. I have issued a statement to the press yesterday, where I have referred to that act, at least, in a summary way. I have said this, I quote:

> "We also wish to express solidarity with the Kingdom of Saudi Arabia, the United Arab Emirates, Qatar, Bahrain, Kuwait and Jordon, their peoples, and the broader region, as fear of wider regional conflict and global instability grows. We urge all parties to engage in constructive diplomacy.
>
> Our hope and prayer is for enduring peace and stability in the region, with meaningful de-escalation including nuclear disarmament and non-proliferation by Israel, while preserving the right of states to peaceful nuclear exploration and use. This should underpin a Greater Middle East built on mutual respect, cooperative security, and shared prosperity."

Sir, I must also say this. The Ambassadors of Gulf States based in Colombo, especially the Embassy of the Kingdom of Saudi Arabia, issued a statement, sharing their outrage upon Iran's actions. We understand that. Unfortunately, Iran has consistently been warning that US bases in host countries will be legitimate targets. However, they have gone beyond US bases and have targeted gas and petroleum terminals as well as some hotels and airports. Iran maintains that retaliatory attacks maybe launched against countries hosting enemy airbases. Despite Iran's justification, Gulf States including Saudi Arabia have shown outrage at the violation of their sovereign territory. There is a statement that I want to refer to here. Despite these happenings, the mature pragmatic leaderships in those countries, amidst

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

the onslaught, have shown immense restraint during this holy month of Ramadan. Their maturity and pragmatic approach not to be drawn into the US-Israeli trap must be applauded. I must remind here what Henry Kissinger once said, I quote:

"To be an enemy of the U.S. is dangerous, but to be a friend is fatal."

That is what Kissinger said. I am sure these Middle East nations, though they are coming under attack by Iran, though it may be seen as provocative, are maintaining some resistance and are even willing to bear it for the sake of peace and refusing to join the US and Israel in this holy month of Ramadan. I must congratulate them for what they are doing.

I must also quote here John F. Kennedy.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over now.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Hon. Presiding Member, I will finish with what John F. Kennedy said, I quote:

"Those who foolishly sought power by riding the back of the tiger ended up inside."

That is what may happen, if this type of action is tolerated by anyone anywhere in this world.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Including our Government.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Yes, including our Government, and that will certainly be the price we may have to pay, if we go on keeping mum in the name of the neutrality. It is not neutrality, but abdication of our sovereignty and slavery to the imperial Americans and the Zionist Israel. Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.44]

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*
அஸ்ஸலாமு அலைக்கும்! ஆயுபோவன்! வணக்கம்!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எந்தவொரு நாட்டைப் பொறுத்தவரைக்கும், அங்கு வாழுகின்ற மக்களின் வாழ்க்கைக்கு மிக முக்கியமாக அமைவது கல்வியும் சுகாதாரமும் ஆகும். எமது நாட்டில் 25 மாவட்டங்கள் உள்ளன. ஒவ்வொரு மாவட்டத்துக்கும் ஒவ்வொரு மாவட்ட வைத்தியசாலை தேவையாக இருக்கின்றது. புத்தளம் மாவட்டத்தின் புத்தளம் நகரில் தள வைத்தியசாலை ஒன்று இருக்கின்றது. அந்தப் பகுதியைச் சூழவுள்ள எல்லாப் பகுதிகளிலிருந்தும் மக்கள் அந்த வைத்தியசாலைக்குச் சிகிச்சை பெறுவதற்காக வருகின்றார்கள். குறிப்பாக, கரைத்தீவு, கற்பிட்டி, வனாத்தவில்லு, கருவெலகஸ்வெவ, ஆனமடுவ, முந்தல், ஆராய்ச்சிக்கட்டு போன்ற பகுதிகளிலிருந்து அதிகமான மக்கள் அங்கு வருகின்றார்கள். இதனால் இந்த வைத்தியசாலையைத் தரமுயர்த்த வேண்டிய தேவை இருந்தது. சென்ற அரசாங்கங்களில் இருந்தவர்கள் இந்த வைத்தியசாலையைத் தரமுயர்த்தித் தருவதாகக்கூறி, அந்த மக்களிடமிருந்து வாக்குகளைப் பெற்றுக் கொண்டார்கள். அவர்கள் அந்த அரசாங்கங்களில் பலமிக்க Cabinet அமைச்சர்களாக இருந்தும்கூட, அந்த வைத்தியசாலையைத் தரமுயர்த்துவதற்கு எந்தவிதமான நடவடிக்கையையும் எடுக்கவில்லை. அவர்களால் செய்ய முடியாத அந்த வேலையை எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் செய்திருக்கிறது. அந்த சந்தோஷமான செய்தியை தேசிய மக்கள் சக்தி அரசாங்கம் இன்று புத்தளம் வாழ் மக்களுக்கு அறிவித்திருக்கிறது.

கடந்த சனாதிபதித் தேர்தல் காலத்திலாக இருக்கலாம்; பாராளுமன்றத் தேர்தல் காலத்திலாக இருக்கலாம், மாண்புமிகு சனாதிபதி அவர்கள் புத்தளத்துக்கு வந்தபொழுது, புத்தளம் தள வைத்தியசாலையைத் தரமுயர்த்தித் தருவதாக வாக்குறுதி அளித்தார். அதற்கு இணங்க, அந்த மக்கள் தேசிய மக்கள் சக்தியையும் மாண்புமிகு சனாதிபதி அவர்களையும் நம்பி வாக்களித்தார்கள். புத்தளம் தொகுதியிலுள்ள இந்த வைத்தியசாலை இவ்வாறுதான் இருக்கும். எமது வாக்குகளைக் கொடுத்து ஏமாந்து விட்டோம். ஆகையால், இம்முறை இவர்களுக்கு வாக்களிப்போம் என்று அந்த மக்கள் வாக்களித்தார்கள். அந்த நம்பிக்கையை வீணடிக்காது, இன்று மாண்புமிகு சனாதிபதி அவர்கள் அதனை உறுதிப்படுத்தியுள்ளார். இன்று புத்தளம் தள வைத்தியசாலையானது, மாவட்ட வைத்தியசாலையாகத் தரமுயர்த்தப்பட்டு, மத்திய அரசாங்கத்தின்கீழ் கொண்டுவரப்பட்டுள்ளது. அதற்காக புத்தளத்தில் வாழ்கின்ற அனைத்து இன மக்கள் சார்பாகவும் நான் மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு நன்றி தெரிவிக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

அதேபோல், முழு முயற்சியாக செயற்பட்டு, இந்த வேலையைச் செய்து தந்த கௌரவ சுகாதார அமைச்சர் அவர்களுக்கும் புத்தளம் வாழ் அனைத்து இன மக்கள் சார்பாக நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கமானது எமது புத்தளம் வாழ் மக்களின் நம்பிக்கையைக் காப்பற்றி, அவர்களின் எதிர்பார்ப்பையும்

அவாவையும் நிறைவேற்ற முன்வந்துள்ளது. அதற்காக அரசாங்கத்துக்கும் மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் சுகாதார அமைச்சர் அவர்களுக்கும் இதற்காக முயற்சி செய்த புத்தளம் மாவட்ட பாராளுமன்ற உறுப்பினர்களுக்கும் புத்தளம் வாழ் அனைத்து இன மக்கள் சார்பாக எனது மனப்பூர்வமான நன்றியை மீண்டும் தெரிவித்து, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නෛයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.48]

**ගරු නෛයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ විවාදය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. අපි එම පනත් කෙටුම්පතින් සිදු වන නියාමනය කිරීම අනුමත කරනවා. කණ්ඩායම් හැටියට සුළු රැකියා කරන කට්ටිය, යම් යම් සමිතිවල ඉන්න කට්ටිය ණයක් ගන්නකොට ඒක නියාමනය වෙන්න ඕනෑ. නමුත් මේ පනත් කෙටුම්පත අනුව ධීවර කර්මාන්තය ආශ්‍රිතව කුඩා පරිමාණයෙන් කටයුතු කරන අයට ඇත්තටම අපහසුතාවක් ඇති වෙනවා.

විශේෂයෙන් මේ ආණ්ඩුව බලයට පත් වුණේ අඩු ආදායම්ලාභීන්ට විශේෂ සැලකීමක් කරනවා, ඒ අය වෙනුවෙන් යම්, යම් වැඩසටහන් කරනවා කියලායි. මරණාධාර සමිති, ගොවි සමිති, කාන්තා සමිති කියලා සමිති තිබෙනවා. ඒ සමිති බැංකු ක්‍රමය අනුව වාගේ මේකෙන් නියාමනය කරන්න ගියොත්, ඔවුන්ව CRIB එකට වැටුණාම ලොකු අමාරුවක වැටෙනවා. ඒ නිසා සුළු කර්මාන්තකරුවන්ට, සුළු ධීවර ජනතාවට සහනයක් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් ප්‍රශ්නයක් තිබෙනවා. සුළි කුණාටුවෙන් විපතට පත් වුණු කට්ටියට තවම මූල්‍ය ආධාර දීලා නැහැ. විශේෂයෙන් කල්පිටියේ නාවක්කාඩු, නරක්කලි, මාම්පුරිය, නොරොච්චෝලේ වැනි ප්‍රදේශවල ගොවි ජනතාවට තවම මූල්‍ය ආධාර ලබා දීලා නැහැ. එක පොල් ගහකට රුපියල් 10,000ක් දෙනවා. පොල් ගස් වැටිච්ච තැනක්වත් CDA එකේ මහත්වරු තවම බලලා නැහැ. මම මේ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරවනවා.

ஜனநாயக நாடான ஈரானில் ஆயதுல்லா அலி கமேனி அவர்கள் தனது குடும்பத்துடன் வீட்டில் இருக்கும்பொழுது படுகொலை செய்யப்பட்டு இருக்கிறார். அதனை எங்களுடைய அகில இலங்கை மக்கள் காங்கிரஸின் தலைவர் உட்பட நாங்கள் அனைவரும் வன்மையாகக் கண்டிக்கின்றோம். அவர் இந்த ரமழான் மாதத்திலே படுகொலை செய்யப்பட்டு இருக்கிறார். எல்லாம் வல்ல அல்லாஹ் அவருக்கு ஷஹீதுடைய அந்தஸ்தைக் கொடுத்து, சுவர்க்கத்தை வழங்க வேண்டுமெனப் பிரார்த்திக்கின்றேன். பலஸ்தீனில் கிட்டத்தட்ட 50,000 மக்களைக் கொன்றுகுவித்த அதே இஸ்ரேலும் அமெரிக்காவும் இணைந்தே அவரைப் படுகொலை செய்திருக்கிறது. கௌரவ ரோஹித்த அபேகுணவர்தன அவர்கள் இது சம்பந்தமாகப் பேசும்போது, அரசாங்கக் கட்சியில் இருக்கின்ற கௌரவ அஸ்லம் அவர்கள் எழுந்து, "நீங்கள் ரமழான் மாதம் பற்றி கதைக்க வேண்டாம்" என அவருக்குச் சொன்னார். இதையிட்டு நான் வெட்கப்படுகின்றேன். 'கலிமா' சொன்ன ஒருவர், இந்த ரமழான் மாதத்தில் இது பற்றி கதைக்கக் கூடாதெனக் கூறியதை நான் வன்மையாகக் கண்டிக்கின்றேன்.

இன்று நேற்றல்ல, பல வருட காலமாக ஈரான் நாடானது இலங்கைக்கு உதவி செய்து வருகின்றது. குறிப்பாக, கௌரவ றிஸாட் பதியுதீன் அவர்கள் அமைச்சராக இருந்தபோது, ஈரான் நாட்டிடமிருந்து மசகு எண்ணெயைக் கடனுக்குப் பெற்றுக்கொடுத்தார். அதுமட்டுமல்ல, 'உமா ஓயா' திட்டத்துக்கு நிதி உதவி செய்ததும் ஈரான் அரசாங்கமே! இவ்வாறான பாரிய உதவிகளை ஈரான் அரசாங்கம் எமது நாட்டுக்குச் செய்திருக்கின்றது. அதை நாங்கள் மறந்துவிடக் கூடாது. இந்நிலையில், ஆயதுல்லா அலி கமேனி அவர்கள் படுகொலை செய்யப்பட்டதற்கு இதுவரை இலங்கை அரசாங்கம் அனுதாபம் தெரிவிக்கவில்லை. அரசாங்கக் கட்சியில் எத்தனையோ முஸ்லிம் பிரதி அமைச்சர்களும் பாராளுமன்ற உறுப்பினர்களும் இருக்கிறார்கள். எனினும், அவர்கள் இப்படுகொலையைக் கண்டிக்கவும் இல்லை; இச்செயற்பாட்டுக்கு எதிர்ப்புத் தெரிவிக்கவும் இல்லை. இதையிட்டு நாங்கள் மனம் வருந்துகின்றோம். எதிர்க்கட்சியில் இருக்கின்ற எல்லோரும் இந்தச் செயற்பாட்டை வன்மையாகக் கண்டித்தபோதிலும், ஆளும் கட்சியினர் எதுவும் சொல்லவில்லை. சமாதானம் ஏற்பட வேண்டும் என்பதில் நாங்கள் உறுதியாக இருக்கின்றோம். இருந்தாலும், இப்படியான மிலேச்சத்தனமான செயலை அகில இலங்கை மக்கள் காங்கிரஸ் வன்மையாக கண்டிக்கிறது எனக் கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி! அஸ்ஸலாமு அலைக்கும்! வணக்கம்! ආයුබෝවන්!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිළිණ සමරකෝන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.54]

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ පාර්ලිමේන්තුවේ විවාද කරන මේ ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මගේ අදහස් ඉදිරිපත් කරන්න කලින් මම තවත් පොඩි අදහසක් ඉදිරිපත් කරන්න ඕනෑ. මොකද, මීට කලින් අදහස් දක්වපු විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා, අපි මොන්ටිසෝරි යන දරුවන් වාගේය, එහෙම නැත්නම් 1 වසර දරුවන් වාගේය, එහෙම නැත්නම් මේ සභාව ඇතුළේ හොඳ සංවාදයක් කරන්නට තරම් සුදුසු නැති පුද්ගලයන් වාගේය කියලා. එතැනදී අපට හිතන්න පොඩි කාරණයක් තිබෙනවා. ඇත්තටම විපක්ෂය සහ ආණ්ඩු පක්ෂය එකතු වෙලා මේ පාර්ලිමේන්තුව ඇතුළේ කරන සමහර සංවාද බැලුවාම, සමහර කාරණාවලට අදාළව හරවත් සාකච්ඡාවක් සිද්ධ වනවාද, එහෙම නැත්නම් ඇත්තටම 1 වසර දරුවන් විදියට හැසිරෙන්නේ කවුද, එහෙම නැත්නම් මේ පාර්ලිමේන්තුව ඇතුළේ කළ යුතු සංවාද සම්බන්ධව හොඳ පැහැදිලි, බරසාර අවබෝධයක් සහිතව කටයුතු කරන්නේ කවුද කියන එක පිළිබඳව හිතන්න අවස්ථා ඕනෑ තරම් අපට තිබෙනවා. ඊයේ උදැසනත් මේ පාර්ලිමේන්තුව ඇතුළේ සිද්ධ වෙච්ච දේවල් බැලුවාම 1 වසර දරුවන්ටත් පහළ මට්ටමේ දේවල් තමයි සිද්ධ වුණේ. අපි දැක්කා, අනවශ්‍ය කලබලයක් ඇති කරලා, අනවශ්‍ය විධියේ හැසිරීමක් මේ පාර්ලිමේන්තුව ඇතුළේ සිද්ධ වුණු බව.

[ගරු තිළිණ සමරකෝන් මහතා]

මේ පාර්ලිමේන්තුවට එන්න අවුරුද්දකට විතර පෙරදී පාර්ලිමේන්තුව ගැන අපිත් හිතුවේ, හැම වෙලාවෙම හොඳම සංවාද සිද්ධ වන, රටේ මිනිස්සු බලාපොරොත්තු වන විධියේ රටක්, යහපත් සමාජයක් නිර්මාණය කර ගැනීම සඳහා වන සාකච්ඡා සිද්ධ වන තැනක්ය කියලා. විපක්ෂය පැත්ත බැලුවාම සැලකිය යුතු මන්ත්‍රීවරුන් ප්‍රමාණයක් හරවත්, යහපත් සංවාද ඇති කරන්න උත්සාහ කළත්, සමහර අවස්ථාවලදී එවැනි තත්ත්වයක් දිස් වන්නේ නැහැ. ඒ නිසා 1 වසරේ අය කවුද, බාලාංශයේ අය කවුද, එහෙම නැත්නම් ජ්‍යෝෂ්ඨයන් කවුද කියලා ඒ හරහා හඳුනාගන්න පුළුවන්. ඒ නිසා ඔවුන්ට ඔවුන් ගැනම යම් විධියකට ඉදිරියේදී සලකා බලන්න කියන කාරණය මතක් කරන ගමන්, මම මේ ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත පිළිබඳ සාකච්ඡාවට අදාළව තොරතුරු ටිකක් ඉදිරිපත් කරන්නම්.

ක්ෂුද්‍ර මූල්‍ය කියන්නේ මොකක්ද කියන දේ පිළිබඳව අපි යම් අදහසක් ගන්නට ඕනෑ. ප්‍රධාන වශයෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය කියලා හඳුන්වා දී තිබෙන්නේ, එහෙම නැත්නම් ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතාව රට ඇතුළේ පැන නැඟිලා තිබෙන්නේ සමාජය සවිබලගැන්වීම සඳහායි. එහෙම නැත්නම් සමාජයේ පැහැදිලි ආර්ථික හැකියාවක් නැති, යහපත් ආර්ථික හැකියාවක් නැති ජනතාව ශක්තිමත් කිරීම සඳහා යම් කිසි කාල සීමාවක් ඇතුළත හඳුන්වා දීපු වැඩසටහනක් තමයි මේ ක්ෂුද්‍ර මූල්‍ය කියන්නේ. එතකොට මේ ක්ෂුද්‍ර මූල්‍ය සම්බන්ධව පසුගිය වර්ෂවලදී ඇත්තටම සාකච්ඡාවට බඳුන් වුණේ, මෙන්න මේ පොඩි පොඩි ණය දීම් ගැන විතරයි. ඇත්තටම ක්ෂුද්‍ර මූල්‍ය කියන එක ඇතුළේ මේ පොඩි පොඩි ණය දීම්වලට එහා ගිය කාරණා ගොඩක් සලකා බැලිය යුතුයි. එහෙම සලකා බැලුවොත් තමයි ඒක සාර්ථක වෙන්නේ. ඒ තුළ සලකා බලන කරුණු කිහිපයක් තිබෙනවා.

එකක් තමයි, විධිමත් බැංකු හරහා තම මූල්‍ය පහසුකම් සපුරා ගත නොහැකි දිළිඳු පුද්ගලයන් වෙත ණය පහසුකම්, ඉතිරිකිරීමේ පහසුකම් සහ වෙනත් මූල්‍ය පහසුකම් සැලසීම. ඒ කියන්නේ විධිමත් බැංකු පද්ධතියට ගිහින් යම් ණය පහසුකමක් හෝ මූල්‍ය පහසුකමක් ගන්න බැරි ජනතාවට මේ හරහා ඒ සඳහා ඉඩ තිබෙන්න ඕනෑය කියන එක. ණය දෙනවාට අමතරව වෙනත් මූල්‍ය පහසුකම් සැපයීමත් මේ හරහා සිද්ධ වන්න ඕනෑ. ඒ වාගේම ක්ෂුද්‍ර මූල්‍ය මඟින් අපේක්ෂා කරනු ලබන්නේ, අඩු ආදායම්ලාභීන්ගේ ආදායම් උත්පාදනය කිරීමේ කටයුතු සහ ආදායම් උත්පාදන ධාරිතා වැඩිදියුණු කිරීම සහ ප්‍රසාරණය කිරීමයි. ඒ කියන්නේ, ඔවුන්ගේ ආදායම් උත්පාදනයටත් යම් කිසි සහයෝගයක් මේ තුළින් තිබෙන්න ඕනෑ. ඒ වාගේම ඔවුන්ගේ ආදායම් උත්පාදන ක්‍රියාවලිය ප්‍රසාරණය කිරීම සඳහාත් යම් කිසි මැදිහත් වීමක් ක්ෂුද්‍රමූල්‍ය හරහා සිද්ධ වන්න ඕනෑ. ඉතින් ඒ නිසා ක්ෂුද්‍ර මූල්‍ය තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟාසිටුවීම අපේක්ෂා කරන අතර, රටෙහි ආර්ථික සංවර්ධනයෙහිලා ඔවුන්ගේ ක්‍රියාකාරී දායකත්වයත් බලාපොරොත්තු වනවා. ඒ කියන්නේ, ක්ෂුද්‍ර මූල්‍ය තුළින් රටේ ආර්ථික සංවර්ධනයට ඔවුන්ගේ දායකත්වය ලබා දෙන්නට ඕනෑ ආකාරය පිළිබඳවත් සලකා බලන්න ඕනෑ කියලා මෙහි සඳහන් වනවා. සමාජ සවිබලගැන්වීම සඳහා ක්‍රියාත්මක වන මේ ක්ෂුද්‍ර මූල්‍ය කියන එක සම්බන්ධයෙන් ඇත්තටම අපේ රට තුළ නියාමනයක් වුණාද කියා අපි සලකා බැලිය යුතුයි. 2016 වර්ෂයේත්, ඊට පසුව 2019 සහ 2024 වර්ෂවලත් පාර්ලිමේන්තුව තුළ ඊට අදාළ සාකච්ඡා සිදු වෙලා තිබෙනවා. හැබැයි, ඒ සාකච්ඡාවල යම් නිශ්චිත අවසානයක් සිද්ධ වෙලා නැහැ. ඒ නිසා අපි මේ සූදානම් වෙන්නේ මෙම පනත් කෙටුම්පත හරහා නිශ්චිත අවසානයක් සිදු කරන්නයි. මේ සඳහා තව විධිමත් වෙනස් කිරීම් කරන්නට අවශ්‍යතාවක් තිබෙනවා නම් ඉදිරියේදී ඒ වෙනස්කම් සිදු කිරීමටත් අපි සූදානම්. මොකද, ක්ෂුද්‍ර මූල්‍ය කියන එක පිළිබඳව 2019දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සලයේ 14වන සැසි වාරයේදීත් සාකච්ඡා කරලා තිබෙනවා. එම සැසි වාරයේදී ඒ ගැන සාකච්ඡා කරලා, ලංකාවේ එය කොයි මට්ටමකද තිබෙන්නේ කියන සාකච්ඡාවත් එතැනදී සිදු වෙලා තිබෙනවා. එහිදී ප්‍රකාශ වෙලා තිබෙනවා, ක්ෂුද්‍රමූල්‍ය ණය නිසා ලංකාව තුළ ලක්ෂ 29කට ආසන්න ප්‍රමාණයක් පීඩාවට පත් වෙලා සිටින බව. විශේෂයෙන්ම උතුරු නැඟෙනහිර හා උතුරු මැද වාගේ පළාත්වල ජනතාව මේ නිසා පීඩාවට පත් වෙලා සිටිනවා. ඊට අමතරව 170කට වැඩි පිරිසක් මේ හේතුවෙන් සිය දිවි නසාගෙන ඇති බවත් සඳහන්ව තිබෙනවා.

ඒ විධියට ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයට අදාළව ගත්තාම, අපට ඉතිහාසය තුළ ඒ සම්බන්ධයෙන් තිබෙන්නේ අමිහිරි අත්දැකීම් ටිකක්. එම අමිහිරි අත්දැකීම් ඉවත් කරමින් ජනතාව සවිබලගැන්වීම සඳහා යම්කිසි නියාමනයක් ඇති කරන්නට ඕනෑ කියන පදනමින් තමයි මේ කටයුත්ත මේ ආකාරයෙන් සිදු කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම ජනතාව සමඟ දීර්ඝ කාලයක් තිස්සේ බැඳුණු, අමිහිරි අත්දැකීම් එකතු කර ගත් ක්ෂේත්‍රයක් තමයි, ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය. ඊට අමතරව අධ්‍යාපනය අඩු, ග්‍රාමීය, දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාවට බැංකු පද්ධතියේ තිබෙන දුර්වලතා නිසාත් ක්ෂුද්‍ර මූල්‍ය කියන ක්ෂේත්‍රයේ අමිහිරි අත්දැකීම් ලබා ගන්න හේතුවක් වෙලා තිබෙනවා. එම නිසා අවිධිමත් විධියට රට තුළ සිදු වන මේ ක්ෂුද්‍ර මූල්‍යකරණය අපි විධිමත්භාවයකට පත් කරන්න ඕනෑ. මේ ගැන අදහස් දක්වද්දී විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිව්වා, මේ ආයතන දිහා බලලා විතරයි අපි මේ සඳහා යම්කිසි සූදානමක් වෙලා තිබෙන්නේ කියලා. එතුමන්ලා එවැනි අදහසක් මතු කරන්න උත්සාහ කළා. නමුත්, අපි කිසි ලෙසකින්වත් ආයතන දෙස බලා නොවෙයි ඒ කටයුතු කරලා තිබෙන්නේ. එක පැත්තකින් ආයතන සම්බන්ධයෙන් යම්කිසි විධියකට නියාමනයක් කරන ගමන් ජනතාවගේ පැත්තෙනුත් බලලා තමයි මේ ප්‍රශ්නයට අපි ප්‍රවේශ වෙලා තිබෙන්නේ.

ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත සම්මත කිරීම තුළින් අපි බලාපොරොත්තු වන කාරණා පිළිබඳව මම කෙටියෙන් තව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නම්. එයින් එක කාරණයක් තමයි, නව ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරියක් ස්ථාපිත කිරීම. ඒ කියන්නේ, මෙම පනත් කෙටුම්පත හරහා ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරියක් පිහිටුවනවා. ඊළඟට, ශක්තිමත් රාමුවක් හඳුන්වා දෙන්න ඕනෑ. මේ නියාමන අධිකාරියට ශක්තිමත් රාමුවක් හඳුන්වා දෙන්න අපි බලාපොරොත්තු වනවා.

ඊළඟ එක තමයි, මුදල් ණයට දීම සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර බලපත්‍රයක් රහිතව සිදු කිරීම තහනම් කිරීම. ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයේ යෙදී සිටින තැනැත්තන් සඳහා ලයිසන් එකක් දුන්නොත් තමයි අපට නියාමන කටයුත්ත හරියට කර ගන්න පුළුවන් වෙන්නේ.

ඊළඟ එක තමයි, ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ රාමුවක් හඳුන්වා දීම. මෙකට සම්බන්ධ වන ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සඳහා හොඳ, පැහැදිලි වැඩ පිළිවෙළක් සහිත රාමුවක් අපි ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ වාගේ තව කාරණා කිහිපයක් තිබෙනවා. තවත් කාරණයක් තමයි, විමර්ශන බලතල ලබා දීම. විමර්ශන බලතල ලබා දෙන්නේ එම ආයතන මෙන්න මේ නියාමන තුළ වැඩ කරනවාද කියන කාරණය පිළිබඳව හොයා බලන්නයි. එහෙම හොයා බැලීමක් කළොත් තමයි ඇත්තටම නිශ්චිත නියාමනයක් සිද්ධ කරන්න පුළුවන් වන්නේ. ඒ වාගේම ඔවුන් කරන වැරදිවලට අදාළව යම්කිසි දඩ මුදලක් නියම කිරීමේ හැකියාවත් තිබෙනවා. ඊට අමතරව තැන්පතු භාර ගැනීම සම්බන්ධයෙන් වන සීමා තිබෙනවා. විශේෂයෙන්ම ක්ෂුද්‍රමූල්‍ය

කියන ආයතන අපේ ගම්වලට ඇවිල්ලා තැන්පතු භාර අරගෙන මිනිසුන් අපහසුතාවට පත් කළ අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. එම නිසා මෙන්න මේවා සම්බන්ධවත් යම්කිසි සීමා පැනවීමක් මෙම පනත් කෙටුම්පත හරහා සිද්ධ වනවා. ඒ වාගේම මේ ක්ෂේත්‍රය සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව සතු සමහර බලතල ප්‍රමාණවත් නැහැ. එලෙස ප්‍රමාණවත් නොවන බලතල විශේෂයෙන් මේ ස්ථාපිත කරන මෙම අධිකාරිය හරහා ක්‍රියාත්මක කරන්න අපි සූදානම් වෙලා සිටිනවා.

ඒ වාගේම මෙම විවාදය තුළදී කථා වුණා, ප්‍රජා මූල සංවිධාන මේකට ඇතුළත් කළොත් ඒ කට්ටියගේ වැඩ පිළිවෙළ සංකීර්ණ වනවාය කියන කාරණය. ප්‍රජා මූල සංවිධාන කිව්වාම, මරණාධාර සමිති වෙන්න පුළුවන්, වෙනත් සමිති වෙන්න පුළුවන්. මෙම පනත් කෙටුම්පත හරහා අපි බලාපොරොත්තු වනවා, ඒ ප්‍රජා මූල සංවිධානවලට අදාළව යම්කිසි ගැටලුවක් තිබෙනවා නම් විසඳුම් ලබා දෙන්න. ඉදිරියේදී යම් ගැටලුවක් පැන නැඟුණොත් ඒවා ගැන සාකච්ඡා කරලා යම්කිසි වෙනසක් සිදු කර ගන්නත් ඕනෑ තරම් අවස්ථාව තිබෙනවා. අපි ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ ජනතාව පැත්තෙන් බලා මිසක් ආයතන ආරක්ෂා කර ගැනීම සඳහා හෝ එම ආයතන තවදුරටත් පොහොසත් කිරීමේ හුදු අරමුණින් නොවෙයි.ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය නියාමන යන්ත්‍රණයක අවශ්‍යතාව ගැනත් මට පොඩි අදහසක් කියන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව නීති විරෝධී තැන්පතු භාර ගැනීම, අධික පොලී අනුපාත හරහා ගනුදෙනුකරුවන් සූරා කෑම, ආචාරශීලී නොවන නැවත අය කිරීමේ ක්‍රම වැනි දේවල් නැති කරන්න ඕනෑ කියන අදහසක් තිබෙනවා. ඒ වාගේම දුර්වල පාලනය හේතුවෙන් ණය නැවත අය වීම අඩු වීම, වියදම් වැඩි වීම හා පාඩු ලැබීම නිසා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන යම්කිසි විධියකට නියාමනයක් කරන්න ඕනෑය කියලා තිබෙනවා. භාර ගත් තැන්පතුවල ආරක්ෂාව තහවුරු නොවන බැවින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව මත දැඩි තර්ජනයක් ඇති කරනවා. ඒ නිසා මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථායීතාව ඇති කරන්නත් මේ ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත ගෙන ඒමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ වාගේම ජනතාව ආරක්ෂා කරන්නත්, ඒ සඳහා අවශ්‍ය නීති කටයුතු මේ හරහා ක්‍රියාත්මක කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඔන්න ඔය කාරණා ඉදිරිපත් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. KINS NELSON left the Chair, and THE HON. UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 3.04]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ, විශේෂ පනත් කෙටුම්පතක් වන ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරනවා. එය අපි කතිකාවට ලක් කරන මාතෘකාවක් බවට පත් වුණේ වසර ගණනාවක් පුරාවටම ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනු හරහා මේ රටේ වෙසෙන ජනතාව විශාල පීඩනයකට ලක් වෙලා තිබීම. ඒ, කාරණා දෙකක් යටතේ.

ඉන් පළමුවන කාරණය මේකයි. ඉතුරුම්වලට සුරක්ෂිතතාවක් නොමැති වීම නිසා මේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පටන් ගන්නවා. ඉතුරුම් ඒක රාශි කරනවා. අවසානයේ ආ ගිය අතක් නැතුව, ඒ අය පැනලා යාම නිසා ඒවායේ මුදල් තැන්පත් කරපු ජනතාව අතරමං වෙලා, අනාථ වෙලා, ඒ අයගේ මුදල්වල ආරක්ෂණය අහිමි වන තත්ත්වයකට පත් වුණා. දෙවන කාරණය තමයි, ණය ලබා ගත් අය ලක් වුණු පීඩනය. විශේෂයෙන්ම කාන්තාවන්ට මේ හරහා විශාල පීඩනයකට ලක් වෙන්න සිදු වුණා. පවුල් සංස්ථාවට ඒ තුළින් විශාල බලපෑම් එල්ල වුණා. තමන්ගේ දරු පවුල් පවා විසිරිලා යන තැනට මේ කාරණා මුල් වුණා. එය රටේ ව්‍යසනයක් බවට පත් වුණාම තමයි මේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පාර්ලිමේන්තුවේත්, රටේත්, සමාජයේත් කතිකාවට ලක් වුණේ.

අපි අද මේ පනත ගෙනැල්ලා ආරක්ෂා කරන්න හදන්නේ මේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නිසා පීඩාවට පත් වන ජනතාවයි. මේ පනත් කෙටුම්පත සම්මත කිරීම හරහා සැබැවින්ම මේ කාරණා දෙකෙන් පීඩාවට පත් වුණු ජනතාව ආරක්ෂා කරන්න අපට අවශ්‍යයි. අපේ රටේ ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ගණනාවක් තිබෙනවා. ව්‍යාපාරික අරමුණින්, ලාභ ලැබීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන තිබෙනවා. අපි ඒවා කළමනාකරණය කළ යුතු, ඒවා දිහා බැලිය යුතු ක්‍රමවේදය වෙනස් විය යුතුයි. තමන්ගේ සමාජ පැවැත්ම වෙනුවෙන් වාගේම සමාජ මෙහෙවර

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

පවත්වාගෙන යාම වෙනුවෙන් ලාභදායී අරමුණකින් තොරව පවත්වාගෙන යන ආයතන ගණනාවක් තිබෙනවා. විශේෂයෙන් මරණාධාර සමිති, ගොවි සංවිධාන, සාමාන්‍යයෙන් ගමක හදා ගන්නා වූ කාන්තා සංවිධාන වාගේ දේවල් ලාභ ලැබීමේ පටු අරමුණින් එහාට ගිහිල්ලා තමන්ගේ අරමුදල් තර කර ගැනීම සහ සමාජයට යම්කිසි මෙහෙවරක් කිරීම කියන අරමුණු මුල් කර ගත් ආයතන. ඒ ආයතන කළමනාකරණය කරන්න කිව්වාට ඒ ආයතනවල ස්වේච්ඡාවෙන් වැඩ කරන පිරිස් ඉන්නවා. මරණාධාර සමිති ණය දෙනවා. ලංකාවේ තිබෙන හැම මරණාධාර සමිතියක්ම ණය දීම තුළ තමයි අරමුදල් තර කර ගැනීම ක්‍රියාත්මක කරන්නේ. හැබැයි, මේ ආයතනයේ මේ කටයුත්ත වෙනුවෙන් වෙහෙසෙන, මහන්සි වන නිලධාරින් ඒ සමිතියෙන් පඩි ලබන්නන් නොවෙයි. පඩි නොලබන, ස්වේච්ඡා සේවාවක් කරන ආයතනයක නිලධාරිවරයෙක් මේ කළමනාකරණයට ලක් වුණොත්, මේ ඇගැයීමට ලක් කිරීමට කටයුතු කරන්න වුණොත් ඒ අය මොන තරම් අපහසුතාවට පත් වෙනවාද? ඒ සමිතියේ තිබෙන අවශ්‍යතාව පැත්තකින් තබා මූල්‍ය ආයතනයක් හැටියට තමන්ගේ අරමුණින් ඔබ්බට ගිහිල්ලා කටයුතු කරන්න ඒ අයට සිදු වෙනවා. එතකොට සමාජයට වාගේම තමන්ගේ සාමාජිකයින්ට ඉෂ්ට කරන්නට බලාපොරොත්තු වන සේවාව සම්බන්ධයෙන් යම්කිසි ගැටලුවක් ඇති වනවා. තමන්ට ලැබෙන සුළු පොලියකට තමයි මේ අය ණය ලබා දෙන්නේ. ඒ ලැබෙන පොලියෙන් තව කෙනෙකුට වැටුප් ලබා දීලා, මේක කළමනාකරණය කරන්නට ගියොත් මේ ආයතන ලොකු අපහසුතාවකට පත් වෙනවා. ඒ නිසා අපි හදන මේ නීති රෙගුලාසි තුළින් මේ ආයතනවලට යම්කිසි සහනයක් ලබා දිය යුතුයි.

ඒ වාගේම, මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය හරහා ජනතාව පීඩාවට පත් කරන ආයතන ටික කළමනාකරණය කිරීම, ඒවා ඇගැයීමට ලක් කිරීම, ඒවාට නීති කොන්දේසි පැනවීම අනිවාර්යයෙන්ම සිද්ධ විය යුතු කාරණයක්. ඒ පිළිබඳව ගැටලුවක් නැහැ. විශේෂයෙන්ම මේ කටයුත්ත කාන්තාවන්ගේ ආරක්ෂණය මුල් කරගෙන තමයි අපි පටන් ගත්තේ. ඒ නිසා අපි යෝජනා කර තිබෙනවා, මේ අදාළ කමිටුවට අනිවාර්යයෙන්ම කාන්තා නියෝජනයක් ඇතුළත් කරන්න කියලා. ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, කොමිසමෙන් හොඳ නිර්දේශයක් මත කාන්තාවක් මේකට ඉදිරිපත් කරලා. කාන්තාවන්ගේ සුරක්ෂිතතාව වෙනුවෙන් නම් මේ කාරණය පැන නැඟුණේ, ඒ වෙනුවෙන් නම් මේ ආයතනය පිහිටුවන්න අපි මෙච්චර දුරකට ඇවිල්ලා තිබෙන්නේ, කාන්තා නියෝජනය අනිවාර්යය කිරීම පිළිබඳව අපි කටයුතු කළ යුතුම වෙනවා. මේ කාරණයේදී ජනාධිපතිතුමා කිව්වා වාගේ අපි හුණ්ඩු මානසිකත්වයේ ඉන්න හොඳ නැහැ. මේක හුණ්ඩුවක් වාගේ රටක් කියලා එතුමාට තේරුණාට, එතුමන්ලා මේ හුණ්ඩුවක් පාලනය කරන්න ආවාට, දැන් හුණ්ඩු මානසිකත්වයෙන් මිදෙන්න ඕනෑ. හුණ්ඩුවක ඉඳගෙන එතුමන්ලා විශාල ආදායම් ලබන කණ්ඩායමක් බවට පත් වෙලා ඉන්නවා. ඒ නිසා හුණ්ඩු මානසිකත්වයේවත්, ළිං මැඩි සංස්කෘතිය, නැත්නම් ළිං මැඩි මානසිකත්වයේවත් ඉන්නේත් නැතුව මේකේ පරාසයක් තුළ යන්න ඕනෑ. මේ ගැන හොයා බලා කටයුතු කළොත් තමයි මම හිතන විධියට අපට ඒ කටයුත්ත කරන්න පුළුවන් වෙන්නේ. එහෙම නැතුව, "අපි පොරවල්, අපි මේ ගැන හොඳට දන්නවා, අපි මේක කරනවා" කියලා කියාගෙන ගිහිල්ලා අවසානයේ මේ ලැබුණු අවස්ථාවෙනුත් අපට ප්‍රයෝජන ලබා ගැනීමට අවස්ථාව ලැබෙන්නේ නැති වෙයි.

ව්‍යාපාරික වශයෙන් කටයුතු කරනකොට අපි අද ගම්වල දකිනවා, වෙනත් මූල්‍ය ආයතනයකින් lease කරලා ගත්ත වාහන වෙන්න පුළුවන්, නැත්නම් ගෙවල්වල තිබෙන වෙනත් දෙයක් වෙන්න පුළුවන් උකසට තබා තිබෙනවා. මේවා ඇත්තටම නීත්‍යානුකූල නැහැ. මූල්‍ය ආයතන කඩා වැටෙන්නත් මේවා විශාල හේතුවක් වෙනවා. වාහනයේ පොත නැතුව උකස් ගත්ත වාහන කෑලි කඩන්න විකුණන බව ඔබතුමන්ලා දන්නවා. එතකොට වෙන්නේ මූල්‍ය ආයතනය සතුව වාහනයේ පොත තිබෙනවා, හැබැයි, ප්‍රායෝගිකව වාහනයක් ලංකාව තුළ හොයා ගන්න නැති වන එක. Engine එක ඇතුළු ප්‍රයෝජනයට ගන්න පුළුවන් සියල්ල විකුණලා, අනෙක් ටික යකඩවලට මකන්න විකුණන්න දාලා තිබෙනවා. මේකත් නීතිය අනුව අපරාධයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගම්වල තිබෙන උකස් ගන්නා ස්ථාන පොලීසියෙන් හෝ මොකක් හෝ ආයතනයකින් අධීක්ෂණය කරන්න ඕනෑ. ඒ ස්ථානවල නීතියෙන් තමන්ට අයිතිය තහවුරු කළ නොහැකි, ඒ පුද්ගලයාටවත් අයිතියක් නැති, වෙනත් මූල්‍ය ආයතනයකට අයිතිය තිබෙන දෙයක් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් පොලියට මුදල් ලබා දීම සඳහා ඇපකරයක් විධියට තබාගෙන තිබෙනවා නම්, ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරලා, ඒවාට නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතුත් මේ හරහාම අධීක්ෂණය නොකෙරුවොත් මේ රටේ මුදල් තිබෙන අය අතරින් විශාල අපරාධයක් සිද්ධ වෙනවා. ඒ කට්ටියත් යම් වෙලාවක අපරාධකරුවන් බවට පත් වෙනවා; හොර බඩු ළඟ තබා ගත්තා වෙනවා. තමන්ට අයිතියක් නැති දෙයක් තමන් ළඟ තබාගෙන සිටීමෙන් ඒ කට්ටියත් අපහසුතාවට පත් වෙනවා. ඒ නිසා නීත්‍යානුකූල නොවන; තමන්ට අයිතිය තහවුරු කරගත නොහැකි දෙයක් තව කෙනෙක් ළඟට උකස් තබන්න ගෙනෙනවා නම් ඒ දේවල් තිබෙන ආයතනවලට විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ.

අපි දන්නවා, ජුවලරි සම්බන්ධවත් මේ ප්‍රශ්නය තිබෙන බව. හොරකම් කරපු, චේන් කඩා ගත්ත ඒවා ගෙනැල්ලා දුන්නාම, ජුවලරිහිමියෝ ඒවා භාර ගන්නවා. හොරා අල්ලා ගත්තාම පොලීසියෙන් ගිහිල්ලා ඒ උකස් ගත්ත බඩු ටික අරගෙන යනවා. අවසානයේ ජුවලරිහිමියාට ඒ මුදල් ටික ලැබෙන්නේත් නැහැ. ඒ තුළින් හොරුන් රැකෙනවා මිසක් නීත්‍යානුකූලව කටයුතු කරන ව්‍යාපාරිකයා ආරක්ෂා වෙන්නේ නැහැ. මේ සියල්ල දෙස බලා අපි නිසි පරිදි කටයුතු කළ යුතුයි කියන එක තමයි මම කියන්නේ. මේ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය අපි කළමනාකරණය කළ යුතුයි. ඒක අපි ගළපා ගන්නට වෙනවා. මොකක්ද, අපි ගළපා ගන්නේ? මේ කාරණය නිසා අපහසුතාවට පත් වන්නේ මොන මූල්‍ය ආයතන නිසාද කියන එක අපි ගළපා ගන්න වෙනවා. මේ රටේ ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයින් ආරක්ෂා කරමින්, සාමාන්‍යයෙන් ගම් තුළ ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වසා දමා, අඩපණ කරලා මේ පනත ක්‍රියාත්මක කරලා වැඩක් නැහැ කියන එකයි අපේ පෞද්ගලික මතය. මේ කාරණා අපි බොහොම පැහැදිලිව අවබෝධ කරගෙන කටයුතු කරමු. එසේ කටයුතු කළ යුතු තව කරුණු කාරණා ගණනාවක් තිබෙනවා.

අද වනකොට ගොවි ජනතාව විශාල වශයෙන් පීඩාවට පත් වෙලා ඉන්නවා. දැන් අස්වනු නෙළමින් තිබෙනවා. ආණ්ඩුව කථා ගණනාවක් කිව්වා. හැබැයි, තවම මේ රටේ ගොවි ජනතාව වෙනුවෙන් සාධාරණය ඉෂ්ට කිරීමට, සාධාරණ විධියට ඔවුන්ගේ නිෂ්පාදන මිලදී ගැනීමට ආණ්ඩුවෙන් වැඩ පිළිවෙළක් සකස් කර නැහැ. ඒ නිසා ගොවි ජනතාව විශාල පීඩනයකට ලක් වෙලා සිටිනවා. ඒ ජනතාව දෙසත් බලන්න කියන කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.12]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින පාර්ලිමේන්තුවේ සම්මතය සඳහා ඉදිරිපත් කර තිබෙන Microfinance and Credit Regulatory Authority Bill එක, එහෙම නැත්නම් ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පැවැත්වෙන මේ මොහොතේදී ඒ සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන ඇත්තටම මම සතුටු වෙනවා.

විපක්ෂය විධියට ඔබතුමන්ලාත් පිළිගන්නවා, අපේ රට තුළ පවතින ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු නියාමනයකට ලක් කළ යුතු බව. නමුත්, පොදුවේ මතු වුණා ගමක තිබෙන සමුපකාර සමිති වාගේ ඒවා, එහෙම නැත්නම් ප්‍රජා මූල සමිති මේකට යටත් විය යුතු නැහැ කියලා. ඒක අපිත් පිළිගන්නවා. ඇත්තටම ලංකාවේ මෑත කාලීනව හතු පිපෙනවා වාගේ විශාල වශයෙන් ණය ලබා දෙන ආයතන බිහි වුණා. එවැනි ආයතනවලින් ණය ලබාගෙන මේ ණය උගුලට අහු වෙච්ච පිරිස් සංවිධානය වෙලා ඒ අය අපිව හම්බ වෙන්න ආවා. මේවා තුළින් ඔවුන් පීඩාවට ලක් වුණු බව, ඒ මොන වාගේ පීඩාවක්ද කියා අපට සඳහන් කළා.

ඒගොල්ලන් සඳහන් කරපු විධියට ඒ ආයතන විසින් මුලින්ම දුරකථන ඇප් එකක් මඟින් මේ ණය ගනුදෙනුවලට සම්බන්ධ කර ගන්නවා. ඊට පස්සේ මුලින්ම රුපියල් 2,000ක, 3,000ක, 5,000ක ණයක් ලබා දෙන්න ඔවුන් කටයුතු කරනවා. හැබැයි, ඒ ණය මුදල ලබාදෙන අවස්ථාවේදී එම ආයතන විසින් ඒ ණය ලබා ගන්නා පුද්ගලයාගේ සම්පූර්ණ විස්තර ලබා ගන්නවා. ඒ කියන්නේ, කිසිදු ඇපකරයක් නැතිව ණය ලබා ගන්නා පුද්ගලයාගේ සම්පූර්ණ විස්තර ගන්නවා. ඒ පුද්ගලයාගේ දුරකථන අංක සහ ඥාතීන්ගේ විස්තර සහ තමන් කොහේ හරි සේවය කරනවා නම් ඒ සේවා ස්ථානයේ අදාළ විස්තර, දුරකථන අංක සහ ආයතන ප්‍රධානීන්ගේ විස්තරත් ඔවුන් ලබා ගන්නවා. රුපියල් 5,000ක් ණයට අරගත්තොත්, පොලිය විධියට අය කරන්නේ රුපියල් 1,500ක් වාගේ මුදලක්. හැබැයි, ඒ සියලු මුදල් සතියක් ඇතුළත ගෙවන්න ඕනෑ. මේ සතියෙන් ගෙවන පොලී මුදල අපි වාර්ෂිකව ගත්තොත්, ඒක විශාල පොලී අනුපාතිකයක්. හැබැයි, රුපියල් 5,000ක් ණයට ගත්ත පුද්ගලයා ඒ මුදල කොහොම හරි ගෙවා අවසන් කරනවා, ඒක ලොකු මුදලක් නොවන නිසා. ඊට පස්සේ ඒ ආයතන තව රුපියල් 10,000ක විතර මුදලක් මේ අයගේ ගිණුම්වලට දානවා ලු. ඒ ණය මුදල් ලබා ගත්ත අය ප්‍රකාශ කරන විධියට ඊට පස්සේ ඔවුන් දන්නේත් නැතිව, ඔවුන් ඉල්ලන්නේත් නැතිව ඔවුන් ලබාදී තිබෙන ඒ ගිණුම්වලට රුපියල් 50,000ක්, රුපියල් 100,000ක් වැනි මුදල් ප්‍රමාණ බැර කර තිබෙනවා ලු. ඊට පස්සේ මේ අය කිව්වාම අපි මෙවැනි ණය මුදලක් ඉල්ලුවේ නැහැ කියලා, ඒ ආයතනවලින් කියනවා ලු, "දැන් මේ මුදල් ඔබේ ගිණුමට බැර කරලා තිබෙන්නේ. ඒ නිසා පොලියත් එක්ක නැවත මේ මුදල් ගෙවන්න" කියලා. සමහර අවස්ථාවලදී පොලිය විධියට රුපියල් 25,000ක්, 30,000ක්, 40,000ක්, 50,000ක් වාගේ විශාල මුදලක් එකතු කරලා ඒ මුදලත් එක්ක ගෙවන්න කියලා කියනවා ලු. එහෙම ගෙවන්න හැකියාවක් නැති නිසා තමන්ගේ ගිණුමට බැර වෙච්ච ඒ මුදල් නැවත එම ආයතනයේ ගිණුමට transfer කරන්න හදද්දී, ඒ ආයතන විසින් කලින් ලබාගෙන තිබෙන දුරකථන අංකවලට කථා කරලා ඒ පුද්ගලයාගේ ඥාතීන්ට තර්ජනය කරලා, ඒ පුද්ගලයා සේවය කරන ආයතනයේ ප්‍රධානීන්ට කථා කරලා, නොයෙකුත් දේවල් කරලා ඒ පුද්ගලයාට රැකියාව කරන ආයතනයට සහ සමාජයට මුහුණ දෙන්න තිබෙන හැකියාව සම්පූර්ණයෙන්ම නැති කර දමනවා.

මේ වාගේ සිදුවීම් නිසා අපේ රටේ විශාල පිරිසක් විපතට පත් වෙලා තිබෙනවා. එම නිසා ඔවුන් සංවිධානය වෙලා රජය විධියට අපට ඇවිල්ලා කථා කළා, මෙන්න මේවා නවත්වා දෙන්න කියලා. ඇත්තටම මේක සමාජයේ තිබෙන ලොකු අර්බුදයක්. මේක පැහැදිලිව කළමනාකරණයට ලක් වෙන්න ඕනෑ. අද ඉදිරිපත් කර තිබෙන පනතේ ප්‍රධානම අරමුණක් තමයි, මෙන්න මේ microfinance යටතේ තිබෙන ආයතන ටික නියාමනය කරලා, ඊටත් අමතරව ඒ ණය ලබා ගන්නා පුද්ගලයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම. Microfinance යටතේ දැන් ක්‍රියාත්මක වන ආයතන බැලුවාම ඒගොල්ලන් අධික පොලී අනුපාතයක් ලබා ගන්නවා. ඊට අමතරව මොවුන් මෙතැනදී බහුවිධ ණයගැතිභාවයට ලක් වෙනවා. ඊටත් අමතරව මේ ආයතන කිසිදු නියාමනයකට ලක් වෙන්නේ නැහැ. දැන් මේ පනත ගෙන ඒමේ ප්‍රධාන පරමාර්ථයක් තමයි මෙන්න මේ microfinance යටතේ ක්‍රියාත්මක වන ආයතන ලබා ගන්නා අසීමිත පොලී අනුපාත පාලනය කරන එක. ඊට අමතරව අනෙක් පරමාර්ථය තමයි, ණය උගුල්වලින් මේ ජනතාව බේරා ගන්න එක. ඊටත් අමතරව මේ සියලුම ණය දෙන ආයතන එක Authority එකක් යටතට, නියාමන අධිකාරියක් යටතට ගෙනැල්ලා ඒවා නිසි විධියට නියාමනය කරන එකත් මේකේ පරමාර්ථයක් වෙනවා. මෙන්න මේ ප්‍රධාන බලාපොරොත්තු තුන තමයි මෙතැනින් ක්‍රියාත්මක කරන්න අපි අදහස් කරන්නේ.

දැන් මෙතැනදී විපක්ෂය පැත්තෙනුත් මතු වුණා, බැංකු සහ විශාල ආයතන මෙතැනදී නියාමනයට ලක් කරන්නේ නැහැ කියලා. හැබැයි, මේ මූල්‍ය බලපත්‍රධාරී බැංකු සහ විශාල මූල්‍ය ආයතන මහ බැංකුව මඟින් විධිමත් නියාමනයකට ලක් වෙනවා. මහ බැංකුව මඟින් ඒවා විධිමත්ව නියාමනයකට ලක් වෙන හින්දා, වෙනත් පාර්ශ්වයකින් ඒක නියාමනයකට ලක් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒවා විධිමත් නියාමනයකට ලක් වෙනවා. ඒ අනුව එම කටයුතු නිසි ආකාරයෙන් සිද්ධ වෙනවා. ඊටත් අමතරව අපේ රටේ ක්ෂුද්‍ර මූල්‍ය වෙළෙඳ පොළෙන් වැඩිම කොටසක් හිමි කරගෙන තිබෙන සමුපකාර සමිති, රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු විවිධ ආයතන තිබෙනවා. ඒ වාගේම, නියාමනය නොවෙච්ච අවිධිමත් ආයතනත් තිබෙනවා. මෙන්න මේ වාගේ ආයතන නියාමනය කිරීම තමයි මේකෙන් බලාපොරොත්තු වෙන්නේ.

ඊට අමතරව මෙතැනදී විශේෂයෙන්ම මතු වුණා, අර්ථ නිරූපණය ගැන. මේ අර්ථ නිරූපණයේ සඳහන් වෙන්නේ කවුරු හරි කෙනෙක් පොලියක් ලබා ගැනීමේ පරමාර්ථයෙන් ණය මුදලක් ලබා දෙනවා නම් සහ එසේ පොලියක් ලබා ගන්නේ නැහැ, නමුත් ඒ ආයතනය උපයන ලාභය හෝ පාඩුව සමව බෙදා ගන්න විධියට එකඟතාවකට ඇවිල්ලා, ඒ වාගේ මූල්‍ය කටයුත්තක නිරත වෙනවා නම්, ඒක ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරික කටයුත්තක් කියන එක. නමුත් එහෙම ගත්තත්, මේ ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පතේ විශේෂයෙන්ම සඳහන් කරනවා, සමුපකාර සමිතියක් සහ පළාත් සභාවක ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කරන සමුපකාර සමිතියක් මෙතැනට අයිති වෙන්නේ නැහැ කියලා. ඒගොල්ලන් මේ අධිකාරියේ නියාමනයට යටත් වෙන්නේ නැහැ. ඊට අමතරව, සමෘද්ධි ප්‍රජා මූල බැංකුවක්, ප්‍රජා මූල බැංකු සමිතියක් මේකට අයිති වෙන්නේ නැහැ. ඒ වාගේම ගොවිජන සංවර්ධන පනත ප්‍රකාරව පිහිටුවා තිබෙන සමිතියක් අයිති වෙන්නේ නැහැ. නමුත් විපක්ෂය පැත්තෙන් මතු වුණා, මෙන්න මේවාත් නියාමනයට ලක් කරනවා කියලා. නමුත් මේ ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පත යටතේ ඒ වාගේ එකක් මෙතැන නියාමනයට ලක් කරන්නේ නැහැ. ඒගොල්ලන් මෙතැනින් ඉවත් කරලා තිබෙනවා.

ඊටත් අමතරව, විපක්ෂය පැත්තෙන් විශේෂයෙන්ම මතු කළා, මේවායේ ඉන්න ගනුදෙනුකරුවන්ට කිසිම රැකවරණයක් නැහැ කියලා. නමුත් මේ පනත් කෙටුම්පතේ පැහැදිලිවම දක්වලා

[ගරු නිශාන්ත ජයවීර මහතා]

තිබෙනවා, යම් ක්ෂුද්‍ර මූල්‍ය කටයුත්තක නිරත වෙනවා නම්, ඒ ක්ෂුද්‍ර මූල්‍ය කටයුත්තේ නිරත වන මෙතැනින් නිදහස් කරපු නැති, මෙතැනට අයත් වන ආයතනයක් මේ අධිකාරිය යටතේ ලියාපදිංචි වෙන්න ඕනෑ බව. අන්න ඒ ලියාපදිංචි වෙන ආයතනයක් තමන්ගේ ගනුදෙනුකරුවන් වෙනුවෙන්, ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාවට ගන්න ඕනෑ පියවර රාශියක් දක්වලා තිබෙනවා. පළමුවෙනි එක තමයි, ණයක් ප්‍රදානය කරන්න කලින් සියලු ගනුදෙනුකරුවන් සමඟ ලිඛිත ගිවිසුමකට එළැඹෙන්න ඕනෑ. ඊටත් අමතරව, අධික ලෙස ණයගැතිභාවයට පත්වීම වළක්වන්නට ඒ ගනුදෙනුකරුවන් වෙත ණය ප්‍රදානය කරනු ලබනකොට ඒ ගනුදෙනුකරුවන්ට ණය ගෙවීමේ හැකියාවක් තිබෙනවාද කියලා බලන්න ඕනෑ. ඊටත් අමතරව, ගිවිසුමකට එළැඹෙන අවස්ථාවේදී කොච්චර පොලියක් අය කරනවාද කියන එක පැහැදිලිව දැනුම් දෙන්න ඕනෑ සහ ගනුදෙනුකරුවෙක් මූල්‍ය ආයතනයකට ගිහිල්ලා තමන් කොච්චර ප්‍රමාණයක් ගෙවිය යුතුද කියලා ණය වාර්තාවක් ඉල්ලුවොත්, ඒ ණය වාර්තාව ලබා දෙන්නත් ඒ ආයතන බැඳෙනවා. ඊටත් අමතරව, තමන්ගේ ගනුදෙනුකරුවන්ට සාධාරණ ලෙස සහ ගෞරවාන්විතව සැලකීමක් දක්වන්න ඕනෑ බවට පැහැදිලිවම විධිවිධාන මෙහි ඇතුළත් කරලා තිබෙනවා.

ඒ වාගේම, මේ අධිකාරිය යටතේ පිහිටුවනු ලබනවා, අධ්‍යක්ෂ මණ්ඩලයක්. නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන් සහ අමාත්‍යවරයා විසින් ඒ විෂය දැනුම සහිතව පත් කරනු ලබන සාමාජිකයන්ගෙන් තමයි ඒ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වෙන්නේ. ඒ වාගේම මහ බැංකුව විසින් පත් කරනු ලබන නියෝජිතයන්ගෙන් තමයි පත් වෙන්නේ. මෙන්න මේ අධ්‍යක්ෂ මණ්ඩලයට විශේෂ කාර්යයන් තිබෙනවා. එතකොට මේ කාර්යයන් යටතේ, ලියාපදිංචි වන සියලු ආයතනවල නියාමනය සහ අධීක්ෂණය සිදු කරන්න ඕනෑ; ඒවා සම්බන්ධීකරණය කරන්න ඕනෑ; ඒවායේ ක්‍රියාකාරිත්වය සම්බන්ධ ඉදිරි ප්‍රතිපත්ති සම්පාදනය කරන්න ඕනෑ. ඊට අමතරව, මහජනයා දැනුවත් කරන්න ඕනෑ, මෙන්න මේ ආකාරයෙන් තමයි මෙහි ඉදිරි ක්‍රියාමාර්ග ගත යුත්තේ කියලා. ඒ වාගේම මේ යටතට එන සියලු දෙනා බලපත්‍රයක් ගන්න ඕනෑ. අන්න ඒ සියලු දෙනා ලියාපදිංචි කිරීමේ කාර්යභාරයත් මේ අධ්‍යක්ෂ මණ්ඩලය අධිකාරිය හරහා ක්‍රියාත්මක කළ යුතු වෙනවා. ඊටත් අමතරව, කවුරු හරි කෙනෙක් මේ පනත යටතේ ලියාපදිංචි වෙලා බලපත්‍රයක් ලබා නොගෙන ඉන්නවා නම්, ඊට අදාළ නීතිමය ප්‍රතිපාදනත් මේ පනතේ ඇතුළත් කරලා තිබෙනවා. ඒ නීතිමය ප්‍රතිපාදන යටතේ යම් කෙනෙකු ක්ෂුද්‍ර මූල්‍ය කටයුතුවල ඉදිරියේදී නිරත වෙනවා නම්, මේ අධිකාරිය යටතේ ලියාපදිංචි වෙන්න ඕනෑ. එහෙම නැතුව මේ කටයුතුවල නිරත වෙනවා නම්, මේ පනත යටතේ එය නීතිමය වරදක් වෙනවා. හැබැයි, අර විපක්ෂය පැත්තෙන් මතු වෙච්ච මරණාධාර සමිති, ප්‍රජා මූල සංවිධාන වාගේ ඒවා මෙතැනට අයිති වෙන්නේ නැහැ. මොකද, එහෙම කවුරු හරි කෙනෙක් අයිති වෙනවා කියලා හිතනවා නම්, මෙතැන මේ අධ්‍යක්ෂ මණ්ඩලයට මේ පනතේ විධිවිධානවලින් විශේෂ බලයක් දීලා තිබෙනවා, විශේෂ රෙගුලාසි ඇති කරලා ඒ රෙගුලාසිවලින් ඒ පුද්ගලයන්ව මෙතැනින් අයින් කරන්නට.

ඇත්තටම මේක තුළින් සමාජයට හොඳක් වෙනවා. මේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය කිරීම ඇතුළේ මූල්‍ය ක්ෂේත්‍රය හොඳ විධිමත්භාවයකට ලක් වෙනවා. මේක තමයි අපේ අවසාන බලාපොරොත්තුව කියන එක ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.22]

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අපි මේ සාකච්ඡාවට භාජන කරන්නේ ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත. අද දවස තිස්සේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ විවේචන දිහා බලනකොට ඇත්තෙන්ම හරි පුදුමයි. එක මන්ත්‍රීවරයෙක් කියනවා, මේ පනත කඩිමුඩියේ ගේන්නේ ADB එකෙන් ඩොලර් මිලියන 200ක මුදලක් දෙන නිසා ලු. මෙන්න මේ මුදල ගන්න ලු, මේ පනත කඩිමුඩියේ සම්මත කරන්න හදන්නේ. තව මන්ත්‍රී පොළක් කියනවා, මේකෙන් බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන නියාමනය සිද්ධ වෙන්නේ නැති ලු. ඒ වාගේම කියනවා, ගමේ මරණාධාර සමිතියත්, හදිසියකට අත මාරුවක් කර ගන්න තිබෙන සමිතියත් මේ හරහා නියාමනය කරනවා කියලා. එසේ කියමින් විපක්ෂය මොකක්ද මේ කරන්න හදන්නේ? බිල්ලෙක් මවන්න හදනවා; මේ සමාජය පුරා ඒ අසත්‍ය පතුරනවා.

පසුගිය සතියේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව පැවැත්වූවා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළාම ඒ කාරක සභාවේ සභාපති ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා කීවේ මොකක්ද? ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් විධියට, කලින් තිබුණු සියලුම ගැටලුකාරී තත්ත්වයන් මඟ හරින, සියයට 100ක් නිවැරදි පනත් කෙටුම්පතක් විධියට එතුමා මේක අර්ථ දැක්වූවා. මා හිතන විධියට, අද දවසේ එතුමා මේ විවාදයට සම්බන්ධ වන්නේත් නැහැ. මොකද, එතුමාට මේ ගැන තර්ක කරන්න යමක් නැහැ. නමුත්, විපක්ෂයේ අනෙකුත් මහත්වරුන් මොකක්ද කරන්නේ? සමාජය තුළ ඒ අසත්‍ය, ඒ මිථ්‍යාව පතුරනවා. ඔවුන් ඒක තමයි කරන්න බලන්නේ. ඔවුන්ට අවශ්‍යයි, මේ සමාජයේ ඉන්න ජනතාව කුපිත කරවන්න, කලබල කරවන්න. ඒ හරහා ඔවුන්ට අවශ්‍ය වෙනවා, මේ රට තුළ සතියක, දෙකක පොඩි සංදර්ශනයක් දාලා ජාතික ජන බලවේගයේ ආණ්ඩුව කරනු ලබන වැඩසටහන් පහළට දමන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කථා කරන මේ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය හරිම වැදගත්. මේ හරහා අපි කෙලින්ම ඉලක්ක කරන්නේ අඩු ආදායම්ලාභී මිනිසුන්; ඒ මහ ජනතාව. අපි දන්නවා, මේ රටේ විශාල මිනිසුන් කණ්ඩායමකට ඇපකර ඉදිරිපත් කරලා විධිමත් බැංකු හරහා තමන්ට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගන්න බැහැ කියලා. ඔවුන්ට මූල්‍ය පහසුකම් ලබා ගන්න ඕනෑ නම් ඔවුන්ගේ අතේ තිබෙන කාර් එකේ යතුර කරකවමින් බැංකු මැනේජර්ගේ මේසය වටේ යන්න ඕනෑ. එහෙම වුණොත් විතරයි ඒ මූල්‍ය පහසුකම ලැබෙන්නේ. එහෙම නම් ඔවුන්ට අවශ්‍ය ණය පහසුකම්, ඉතිරි කිරීමේ පහසුකම්, ඒ වාගේම වෙනත් මූල්‍ය පහසුකම් සලසන්න පුළුවන් ක්ෂේත්‍රය තමයි ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය විධියට අප සාකච්ඡා කරන්නේ.

ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය අද ඊයේ පටන් ගත්තු එකක් නොවෙයි. ඒකට ඉතිහාසයක් තිබෙනවා. විසිවන ශතවර්ෂයේ මුල් භාගයේ නිර්මාණය වුණු සීට්ටු ක්‍රමය මේකට උදාහරණයක්. මේ හරහා ප්‍රාග්ධනය ඒකරාශිකරණය සිදු කරනවා. ඒක සඵල ඉතුරුම් ක්‍රමයක්. අද වන විට ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය විශාල පරාසයක පැතිරිලා තිබෙනවා. මෙන්න මේ හරහා අපට පුළුවන්, මූල්‍යමය අන්තර්ගතභාවය - financial inclusion - කියන එක ඇති කරන්න. විශේෂයෙන්ම අපට පුළුවන්, මිනිසුන්, ජන කොට්ඨාස empower කරන්න, ඒ හරහා ඔවුන්ගේ ආර්ථිකය නඟා සිටුවන්න.

විරුද්ධ පක්ෂයේ අපේ ගරු මන්ත්‍රීවරු මේ සභාවේ කිව්වා, සමහර බැංකු ආයතන, සමහර මූල්‍ය ආයතන මේ යටතේ නියාමනය වෙන්නේ නැහැ කියලා. අපි ගත්තොත්, ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය තුළ විශාල පරාසයක ආයතන රාශියක් කටයුතු කරනවා. බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් එහි ඉන්නවා. මේවා නියාමනය කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවයි. ඒ වාගේම සමුපකාර ග්‍රාමීය බැංකු, සකසුරුවම් සහ ණය ගනුදෙනු සමුපකාර සමිතිද තිබෙනවා. මේවා අයිති වෙන්නේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට. ඒ වාගේම, දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා තමයි ඒවා නියාමනය වුණේ. ඊට අමතරව මේ සමාජයේ තිබෙනවා, ප්‍රජා මූල සංවිධාන, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්, ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරවල නිරත වන රාජ්‍ය නොවන සංවිධාන. මේවා පිළිබඳව තමයි අප මේ සාකච්ඡාව කරන්නේ.

ලංකාව ගත්තොත්, ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ කටයුතු කරන මෙවැනි ආයතන, microfinance institutions 10,000ක් විතර තිබෙනවා. හැබැයි, මේ ආයතන සම්බන්ධයෙන් නිසි නියාමනයක් නැහැ, ලියාපදිංචියක් නැහැ. අපි ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය ගත්තොත්, 2025 මැයි 25වන දා වන විට බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන 4යි ලියාපදිංචි වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය අපට හරිම වැදගත්. මේ රටේ පහළ මට්ටමේ ඉන්න ජනතාව දිළිඳුභාවයේ විෂම චක්‍රයෙන් ගොඩ ගන්න ඕනෑ. ඒ පහළ ආදායම් මට්ටම් නිසා පහළ මට්ටමේ ඉතිරි කිරීම් අපි දකිනවා. ඒ පහළ මට්ටමේ ඉතිරි කිරීම් නිසා පහළ මට්ටමේ ආයෝජන, පහළ ඵලදායිතාව ඇති වෙනවා. එහෙම නම්, මේ විෂම චක්‍රය - vicious circle එක - කඩන්න ඕනෑ. එහෙම නම්, මේ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය නියාමනය තුළින් මේ රටේ මිනිස්සුන්ට ගැළපෙන ආකාරයට ඒ මූල්‍ය පහසුකම ලබා දෙන්න පුළුවන්. නමුත්, අද දවසේ ව්‍යාපාරික පරිසරය බැලුවොත්, ඒ ව්‍යාපාරික පරිසරය තුළ ක්‍රියාත්මක වෙන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? අපි දන්නවා, ඔවුන් නීති විරෝධී තැන්පතු භාර ගන්න බව. ඒ විතරක් නොවෙයි. ඉතා අධික පොලී අනුපාත ඒ සමහර ආයතන අය කරනවා. දිනෙක පොලිය විධියට සියයට 2.2ක්. මේ පොලිය මාසයකට ගත්තොත් -දින 30කට ගත්තොත්- සියයට 66ක්. අපි මේ පොලිය අවුරුද්දකට ගත්තොත් ඒක සියයට 800ත්, 900ත් අතර තිබෙන ඉතා විශාල පොලී මුදලක්. එහෙම නම්, මෙන්න මේක නියාමනය කරන්න ඕනෑ. ඒ වාගේම අපි දකිනවා ආචාරශීලී නොවන නැවත අය කිරීමේ ක්‍රම. විශේෂයෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ විශාල වශයෙන් ඉන්නේ කාන්තාවන්. අපි දන්නවා, these women are sexually harassed by those people. අපි මේකට තිත තියන්න ඕනෑ. මේක නියාමනය කරන්න ඕනෑ. ඒ හරහා අපට පුළුවන් ඒ මිනිස්සුන්ට අවශ්‍ය යහපත් වූ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයක් නිර්මාණය කරන්න. ඒ හරහා අපට පුළුවන් අපි සඳහන් කරපු දිළිඳු පුද්ගලයන් දරිද්‍ර චක්‍රයෙන් කඩලා ඔවුන් මේ රටේ ආර්ථික සංවර්ධනයට දායක කරන්න. මේ රටේ මිනිස්සුන්ට මේ සමස්ත මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ විශ්වාසය බිඳ වැටිලා තිබෙනවා. ඒක සෘජුව සහ වක්‍රව මේ රටේ මූල්‍ය ස්ථාවරභාවය පවත්වා ගන්න බලපාලා තිබෙනවා. ඒ නිසා ඒක ස්ථාවර කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ප්‍රධාන කොටස් 14ක් යටතේ සාකච්ඡා කරනවා. මම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට මේ පනත් කෙටුම්පත කියවන්න කියලා ආරාධනා කරනවා. මේ පනත් කෙටුම්පතේ පිටු 89ක් තිබෙනවා. ඒ ගැන සාකච්ඡා නොකර, බාලාංශ පන්තියේ මිනිසුන් තමයි ආණ්ඩු පක්ෂයේ ඉන්නේ කියලා බොහොම පහළ තැනකට දාන්න එපා. අපිත් කැමතියි ඔබතුමන්ලාත් සමඟ හරවත් සාකච්ඡාවක් කරන්න. ඒකට සූදානම් වෙලා එන්න. එහෙම නැතිව විවිධ අසත්‍ය ප්‍රචාරය කරමින් ඔබතුමන්ලා මේ සාකච්ඡාව කරගෙන යන්න එපා. අපි දන්නවා මේ විපක්ෂය තවමත් දේශපාලන දරිද්‍රතාවේ ඉන්නේ කියලා; political povertyවලින්, දේශපාලන මන්ද පෝෂණයෙන් - political malnutritionවලින් - පෙළෙනවා. එහෙම නම්, මෙගොල්ලන්ට ත්‍රිපෝෂ දෙන්න වෙනවා. ඔබතුමන්ලා කියවලා හදාරලා එන්න.

විශේෂයෙන්ම ඔබතුමන්ලා උත්සාහ ගත්තා විශාල අසත්‍ය චෝදනා ප්‍රමාණයක් මේ සමාජය මත වපුරන්න. ඔබතුමන්ලා කිව්වා මේක බුදු දහමට නොසලකන ආණ්ඩුවක් කියලා. ඒ වාගේම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා අසභ්‍යකරණය පිළිබඳව සමාජයේ සාකච්ඡාවක් නිර්මාණය කරන්න හැදුවා. විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් අසරණ වූ මිනිස්සුන්ට රජය විසින් ලබා දෙන ප්‍රතිපාදන ගැන විශාල මිථ්‍යාවක් සමාජයේ මතු කළා. නමුත් ඔබතුමන්ලා අසමත් වෙලා තිබෙනවා, මේ රටේ ඉන්න ආදරණීය පුරවැසියන් පාරට ගෙනෙන්න. ඒකයි නිතරම මේ අසත්‍ය ප්‍රචාරය කරන්නේ. ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලාට බැරි වෙලා තිබෙනවා කම්කරුවන් අරගළ භූමියට කැඳවන්න. අපි දැක්කා විපක්ෂ නායකතුමා වරෙක කියනවා, "ලෙයින් අත්සන් කරලා දෙන්නම්" කියලා. එච්චර පහළට වැටෙනවා. ඒ වාගේම උත්සාහ කළා, සංඝ සමාජය නොසන්සුන් කරලා, කලබල කරලා, ඒ හරහා මතයක් හදලා මේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට පහර එල්ල කරන්න. අපි මහජන දේපොළ වංචා කරන්නේ නැහැ. අපි ඒ බෞද්ධ ආගමික ප්‍රතිපත්ති සියල්ලට වඩා හොඳින් තහවුරු කරනවා. අපි දළ දා වන්දනාව කළා. ඔබතුමන්ලා දැක්කා පසුගිය කාලයේ ගංගාරාම පුදබිම මුල් කරගෙන බෞද්ධාගමේ වත් පිළිවෙත් සිදු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම කියන්නේ අද අපි මේ සාකච්ඡා කරන මේ ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ඉතා වැදගත් කියන එකයි. ඒ හරහා මේ රටේ ණය නියාමනය කරලා, මේ රටේ පහළ මට්ටමේ මිනිස්සුන්ට අවශ්‍ය මූල්‍ය සම්පාදනය කරලා, ඔවුන් රටේ ආර්ථිකයට සම්බන්ධ කරලා මේ රටේ ආර්ථික වර්ධනය ඉහළ නංවන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 2ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.33]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත පරක්කුවෙලා හරි ගෙනාපු එක ගැන අපි සතුටු වෙනවා. නමුත් මේ පනත් කෙටුම්පත ගෙනෙනකොට රටේ මිනිස්සුන්ගේ සාක්කු, purse සුද්ද කරලා ඉවරයි. ඒ වාගේම මිනිස්සු ගෙවල් උගස් කරලා, බෙල්ලේ වැල දමාගෙන පවුල් පිටින්ම විනාශ වෙලා ඉවරයි. ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේක හොඳට අහගන්න. ඔබතුමා සමඟ යුද්ධ කාලයේ හිටපු හමුදා සොල්දාදුවන් 10,700කගේ මුදල්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි "ඉයෝන් ලංකා" ආයතනයේ තැන්පත් කරලා තිබෙනවා. ඒ ආයතනය Army එකේ හිටපු සාජන් කෙනෙකුගේ. ඔහුගේ නම දම්මික

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

කුමාර අතපත්තු. ඔහු සාජන් කෙනෙක්. ඔබතුමා නම් හිටපු major general කෙනෙක්. හැබැයි, ඔබතුමාටවත් මෙහෙම ගේමක් ගහන්න බැරි වුණා. ඒ සාජන්, Army එකේ හිටපු කොල්ලන්ගේ, ආබාධිත සෙබළුන්ගේ විශ්‍රාම වැටුප අරගෙන. ඒ "ඉයෝන් ලංකා" ආයතනය 10,700කගේ සල්ලිවලට පොල්ල තියලා තිබෙනවා. හමුදාවේ අයගේ විශ්‍රාම වැටුප, අරවා මේවා ඔක්කෝටම අරගෙන සියයට 6ක පොලියක් දෙනවා කියලා. ඒ නිසා කුරුණෑගල දිස්ත්‍රික්කයේ හමුදා සොල්දාදුවන් අසරණ වෙලා තිබෙනවා. පව්. ඒ, යුද්ධය වෙනුවෙන් දිවි පුදන්න හිටපු සොල්දාදුවන්ගේ සල්ලි. හෙණ ගහනවා. මේ පනත් කෙටුම්පත සම්මත කරන්න. මේවා පරක්කු වෙලා හරි සම්මත කරන එක ගැන අපි සතුටු වෙනවා. ඒ වාගේම ඒ අය අධිකරණයට ගෙනැල්ලා මේ මිනිස්සුන්ගේ සල්ලි ටික අරගෙන දෙන්න.

ඒ වාගේමයි පොළොන්නරුවේ Earnviv කියන ආයතනයත්. ඒ මිනිස්සු 5,000ක් "හිරු" මාධ්‍යයට ඇවිල්ලා හිටියා. අද ඒ මිනිස්සු කොළඹ ඇවිල්ලා. මිනිස්සු 5,000කගෙන් cryptocurrency trading කියලා කෝටි ගණනක් අරගෙන තිබෙනවා. ඒ නිසා අද පොළොන්නරුවේ පවුල් 5,000ක් අනාථයි. මේ පනත හොඳයි. මේක ගෙනෙන්න තිබුණේ, මීට අවුරුදු 15කට විතර කලින්. හැබැයි, පරක්කු වෙලා හරි මේ පනත ගෙනාපු එක ගැන මම ස්තුතිවන්ත වෙනවා. හැබැයි, මේ පනත ගෙනැල්ලා විතරක් මදි. ගරු නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමා සභාවේ ඉන්නවා. ඔබතුමාට වගකීමක් තිබෙනවා. ඔබතුමා යුද හමුදාවේ නිල ඇඳුම ඇඳපු කෙනෙක්. ඒ නිසා මේ කුරුණෑගල වැඩෙයි, පොළොන්නරුවේ වැඩෙයි ඔබතුමා බලන්න. පොලීසිය භාර ඇමතිතුමාට, එහෙම නැත්නම් පොලිස් දෙපාර්තමේන්තුවට මේක කරන්න බැරි නම්, ආරක්ෂක අමාත්‍යාංශයට බලය තිබෙනවා නම් මේ වැඩේ නතර කරන්න; මේවා අල්ලන්න. අද ඉඳලාවත් මේ වැඩේ නවතිනවා නම් හොඳයි. මේකෙන් වැඩිපුරම දුක් විඳින්නේ කාන්තාවන් සහ දරුවන්. සමහර දරුවන් පාසල් යන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒ වාගේම දරුවන්ට ඉන්න තැනක් නැහැ. මේ ප්‍රශ්නය නිසා පොළොන්නරුවේ පවුල් 5,000ක් අනාථ වෙලා තිබෙනවා. මෙන්න මේවා ගැන හොයලා බලන්න. ගරු නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමා ගරු සභාවේ ඉන්නවා. කුරුණෑගල "ඉයෝන් ලංකා" ආයතනයේ සාජන් ගැන හොයලා, හමුදාවේ මිනිස්සුන්ගේ මුදල් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා මට කථා කරන්න විනාඩි දෙකක් දුන්නා. එතුමාටත් ස්තුතිවන්ත වෙනවා. මේක ගැන හොයන්න. මේ පනත් කෙටුම්පත ගෙනාපු එක ගැනත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.36]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වැදගත් පනත් කෙටුම්පතක් සම්මත කිරීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ ඒ ගැන අදහස් දක්වන්නට ලැබීම ගැන සතුටු වෙනවා. ගම්වල ඉන්න දුප්පත්, අහිංසක ජනතාව තමයි මේ ක්ෂුද්‍ර මූල්‍ය ණයට සම්බන්ධව කටයුතු කළේ. ඒ අතරිනුත් කාන්තාවන් තමයි -සියයට 98ක්ම- ක්ෂුද්‍ර මූල්‍ය ණයට සම්බන්ධව කටයුතු කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම කථා කරන්න යන්නේ මේ පනත් කෙටුම්පත ගැන විතරක්ම නොවෙයි. මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය නිසා ඉතා අන්ත අසරණභාවයට පත්වෙච්ච මිලියන 3කට ආසන්න මේ රටේ ජනතාව ගැනත් මම කථා කරනවා.

මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ගැන කථා කරනකොට, විශේෂයෙන්ම ගම්වල තිබෙන මරණාධාර සමිති, ගොවි සංවිධාන, ස්වේච්ඡා සංවිධාන මේ ගෙනෙන පනත් කෙටුම්පත ගැන අප හමුවෙලා කථා කරනවා, අපේ සමිතිත් අධිකාරි බවට පත්වෙලා, අපි ගමේ කරගෙන යන ස්වේච්ඡා සංවිධානවලටත්, ස්වාධීන සංවිධානවලටත් මහ බැංකුවත් එක්ක කටයුතු කරන්න වෙයිද කියලා. ඒක සමහර වෙලාවට වැරදි වැටහීමක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් නොදැනුවත්කම වෙන්න පුළුවන්. නමුත් අද මේ ජනතාව දැඩි කලකිරීමකට පත්වෙලා සිටිනවා.

ක්ෂුද්‍ර මූල්‍ය ණය ගත් විශාල පිරිසක් මේ රටේ ඉන්නවා. ඒ නිසා මේ පනත් කෙටුම්පතට සංශෝධන ගෙනෙනකොට ඒ අයත් එක්ක සාකච්ඡා කරලා මේ සම්බන්ධයෙන් සුදුසු දෙයක් කළොත් හොඳයි කියලා මම විශේෂයෙන්ම මේ රජයට යෝජනා කරනවා. ඒ වාගේම මේ පනත් කෙටුම්පත අද සම්මත කරගත්තොත් මේකේ තිබෙන යම් යම් දේවල් ඉදිරියේදී සංශෝධනය කරගන්න පුළුවන් කියලා ගරු මන්ත්‍රීවරු කියනවා. මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා අද මේ සභාවට ආවේ නැත්තේ මේ ගැන කථා කරන්න දෙයක් නැති නිසාය කියලා. ඇත්තටම, අද හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කථා කරන්න බලාපොරොත්තුවෙන් හිටියා. එතුමාට තමයි පළමුවෙනි කථාව තිබුණේ. හැබැයි, එතුමාට අද දහවල් 2.00ට විදේශගත වෙන්න තිබුණා. කාලය නැති නිසා එතුමා අද මේ සභාවට පැමිණියේ නැහැ. ඒ නිසා මේ කාරණා කියනකොට පොඩ්ඩක් හොයලා බලලා කියන්න. ඔබතුමන්ලා අපට චෝදනා කරනවා, නිකම් මේ දේවල් කියනවා කියලා. ඇත්තටම, අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට අද විදේශගත වෙන්න තිබුණා. ඒ නිසා තමයි එතුමා අද මේ සභාවේ නැත්තේ. ඒ නිසා ඒ වාගේ දේවල් කියන්න එපා.

ක්ෂුද්‍ර මූල්‍ය ණය ගැන කථා කරනකොට මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, ක්ෂුද්‍ර මූල්‍ය ණය සමිති, සකසුරුවම් සහ ණය ගනුදෙනු සමුපකාර සමිතිය ආරම්භ වෙන්නේ 1906 වසරේදී බව. ඒ වාගේම ඒ.ටී. ආරියරත්න මහත්මයා විසින් ආරම්භ කරපු සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය, පී.ඒ. කිරිවන්දෙනිය මහතා විසින් ආරම්භ කරපු සණස සංවර්ධන බැංකුව, ඒ වාගේම 1992 වසරේදී රණසිංහ ප්‍රේමදාස මහත්මයා ආරම්භ කරපු ජන සවිය වැඩසටහන යනාදියෙන් ප්‍රතිලාභ ලැබූ අය මේ ආයතනවල කොච්චර වටිනාකමක්, වැදගත්කමක් තිබුණාද කියලා බොහොම වුවමනාවෙන් කථා කරනවා. හැබැයි අද මේවා සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා තිබෙනවා. ඒවායෙන් ප්‍රතිලාභ ලැබූ අයත් එක්ක සාකච්ඡා නොකර, සංශෝධන ගෙන එමින් මේවාගේ පනත් කෙටුම්පත් සම්මත කරගන්න ගියාම තමයි මෙවැනි චෝදනා ඇති

වෙන්නේ. මේවාට ඇතුළත් වෙන්න ඕනෑ සංශෝධන තිබෙනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විශාල පිරිසක් මාව මුණ ගැහෙන්න ආවා, මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්බන්ධයෙන් කථා කරන්න. ඒ අනුව, මේ පනත් කෙටුම්පත සඳහා යෝජනා කරනු ලබන සංශෝධන ගණනාවක් මා ළඟ තිබෙනවා. මෙය කියවන්න මට තිබෙන වෙලාව මදි නිසා එම ලේඛනය මේ අවස්ථාවේ මා **සභාගත***කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2021 වර්ෂයේ මාර්තු මාසයේ 08වැනි දා - කාන්තා දිනයේදී - මේ ක්ෂද්‍ර මූල්‍ය ණය සම්බන්ධ උපවාසයක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආරම්භ කළ ආකාරය මට මතකයි. දින 52කට වැඩි කාලයක් එම උපවාසය පැවතුණා. කොවිඩ් වසංගතයත් එක්ක තමයි එම උපවාසය නැවැත්තුවේ. ඒ උපවාසය අතරතුරදී වත්මන් ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා එදා විපක්ෂයේ මන්ත්‍රීවරයකු විධියටත්, වත්මන් අගමැතිතුමිය මන්ත්‍රීවරියක් විධියටත්, ඒ වාගේම පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරමින් වර්තමානයේ නියෝජ්‍ය අමාත්‍යවරයකු හැටියට කටයුතු කරන ටී.බී. සරත් මැතිතුමාත් එදා එයට සම්බන්ධ වුණා. මගේ මේ phone එකේ තිබෙනවා, ඒ තුන්දෙනාම එතැනට ගිහිල්ලා ඒ අයත් එක්ක සාකච්ඡා කරන පොටෝ එකක්. සාකච්ඡා කරනවා විතරක් නොවෙයි, එතැන තිබුණා සටහන් පොතක්. ඒ සටහන් පොතේ ගරු අගමැතිතුමිය ලියා තිබෙනවා, අපේ රජයක් තුළින් මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය අරගෙන තිබෙන අපේ රටේ කාන්තාවන්ට උපරිම සාධාරණයක් කරනවා කියලා. ඉතින්, කෝ ඒ සාධාරණය? අද ඔබතුමන්ලා ඉන්නේ, ආණ්ඩුවේ. එදා විපක්ෂයේ මන්ත්‍රීවරු විධියට හිඟුරක්ගොඩ පැවැති ඒ උද්ඝෝෂණයට ඔබතුමන්ලා සහභාගි වුණා. එතැනට ගිහිල්ලා සටහන් පොත්වල ලියපු දේවල්වලට අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද ඒවා නිකම් වචන, අකුරු බවට පත්වෙලා තිබෙනවා. ඒ අයට සාධාරණයක් ඉෂ්ට සිද්ධ කර දෙන්න අද ඔබතුමන්ලාට අවස්ථාව තිබෙනවා. අපි මේ වෙනස හඳුනාගන්න වෙනවා.

ගමේ ඉන්න පුළුවන්, පොලී මුදලාලි කෙනෙක්. එතකොට ගමේ ඉන්න පොලී මුදලාලියි, මේ අහිංසක කාන්තාවන් එකතු වෙලා හදාගත්ත සංවිධානයයි මොකක්ද කියන එක අපිට ඉස්සෙල්ලාම හඳුනා ගන්න වෙනවා. එහෙම හඳුනාගෙන තමයි මේ අලුත් පනත්වලින් ගෙනෙන නීති රීති ක්‍රියාත්මක කරන්න වෙන්නේ. දැන් මෙතැනදී මේ දෙකම එක සමාන වෙලා තිබෙනවා. ඒ නිසා මේක හඳුනා ගත්තොත් අපට පුළුවන් අද මේ ඉල්ලීම් කරන අයට සහනයක් සලසන්න. විශේෂයෙන්ම සියයට 98කට වඩා වැඩියෙන් ඉන්න කාන්තාවන් තමයි මේ ඉල්ලීම කරන්නේ. මේ පාර්ලිමේන්තුව තුළත් ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් කාන්තා නියෝජන 22ක් තිබෙනවා. අපේ ඉන්නවා මන්ත්‍රීතුමියලා දෙදෙනෙක්. ඔබතුමන්ලාගේ පැත්තේ මන්ත්‍රීතුමියලා 20දෙනෙක් ඉන්නවා.

මේ පනත් කෙටුම්පත සම්මත කරන්න කලින් මේ සම්බන්ධව කථා කරලා, අවශ්‍ය දේ මොකක්ද කියන එක හොයා බලන්නේ නැතිව එක සැරේටම පනත් කෙටුම්පත් ගෙනැල්ලා සම්මත කර ගත්තොත් ලොකු ප්‍රශ්නයක් වෙනවා. මෙවැනි පනත් කෙටුම්පත් ගෙනෙන එක හොඳයි. ජාතික කාන්තා කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ඇතුළත් කරන්න කියලා කියනවා, මේ අධිකාරියට.

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

හැබැයි, අද කාන්තා කොමිෂන් සභාවක් තිබෙනවාද කියා මම අහන්න කැමැතියි. කාන්තාවන්ට ගිහිල්ලා මේ ප්‍රශ්න ගැන කථා කරන්න තිබෙන තැන තමයි ජාතික කාන්තා කොමිෂන් සභාව. නමුත්, ජාතික කාන්තා කොමිෂන් සභාවක් අපේ රට තුළ අද නැහැ. මේ සම්බන්ධව මේ අයගේ ඉල්ලීමක් තමයි මේ තිබෙන්නේ. ජාතික කාන්තා කොමිෂන් සභාවේ නියෝජිතයෙක් මේකට ඇතුළත් කරන්න කියන ඉල්ලීම තමයි මේ අය කරන්නේ.

විශේෂයෙන්ම ආබාධිත අයට දෙන දීමනාව ගැනත් අපි කියන්න කැමැතියි. ජනාධිපතිතුමා අය වැය කථාවේදී කිව්වා, ආබාධිත අයට දෙන දීමනාව වැඩි කර තිබෙනවා කියලා. එක පැත්තකින්, ආබාධිතයන්ට ලබා දෙන දීමනාව තවම ලබා දී නැහැ. වකුගඩු රෝගීන් සඳහා දීමනාවක් ලබා දෙනවා කිව්වා; ඒක වැඩි කර දෙනවා කිව්වා. නමුත්, ඒ දීමනාවත් තවම ලබා දී නැහැ. ඒ වාගේම වැඩිහිටි දීමනාවත් ලබා දීලා නැහැ. විශේෂයෙන්ම මේවා ක්‍රියාත්මක කරන්න වෙනවා.

රජය විසින් තවමත් අපට වීවලට සහතික මිලක් ලබා දී නැහැ. මේ වනකොට අම්පාර, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ යම් යම් ප්‍රදේශවල ගොයම් කපනවා. හැබැයි, තවම වීවලට සහතික මිලක් ලබා දීලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේවා කරන්න අවසාන මොහොත වනතෙක් ඉන්න එපා. අද වනකොට ගොවියා පාරට බහින තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අපි කවදාවත් ගොවීන්ට කියන්නේ නැහැ, පාරට බහින්න කියලා. හැබැයි, අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්නේ ඒ තැනට ගොවියාව තල්ලු කරන්න එපා කියලායි. එක පැත්තකින් ආබාධිතයන්ට දෙන දීමනාව ලබා දීලා නැහැ. ඒ වාගේම වැඩිහිටි දීමනාව දීලා නැහැ. ගොවීන්ට සාධාරණයක් ඉෂ්ට කරනවා කිව්වාට එහෙම දෙයක් සිද්ධ වෙලාත් නැහැ. ඒ නිසා අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඔබතුමන්ලාට මේවා කියන්නේ මේ දේවල් ඉක්මනින්ම කරන්න ඕනෑ නිසායි. එම නිසා ඒ දේවල් කරන්න අවසාන මොහොත වනතෙක් ඉන්න එපා. ඔබතුමන්ලා බලයට එන්න කලින් කිව්වේ, "අපට බලය දෙන්න, අපි එක පෑන් පහරකින් මේවා වෙනස් කරනවා" කියලා නේ. හැබැයි, අද ඒක යථාර්ථයක් කර ගන්න බැරි වුණාම ඔබතුමන්ලා විපක්ෂයට ඇඟිල්ල දිගු කරලා කියනවා, අපි මේවා අවුල් කරනවා කියලා. අපි මේවා අවුල් කරන්නේ නැහැ, මේවා පෙන්නලා දෙන එක තමයි කරන්නේ.

විශේෂයෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්බන්ධව මේ රටේ කාන්තාවන් අද අන්ත අසරණභාවයට පත් වෙලා දුක් විඳිනවා. මේ අයගේ ඡන්දයෙන් තමයි ඔබතුමන්ලා බලයට ආවේ. ඒකයි මම කිව්වේ. වත්මන් ජනාධිපතිතුමා එදා පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙකු විධියට, ඒ වාගේම අගමැතිතුමිය එදා මන්ත්‍රීතුමියක විධියට ඒ උද්ඝෝෂණයට හිඟුරක්ගොඩ ගියා. ගිහිල්ලා ඒ අයත් එක්ක කථා කරලා කිව්වා, මේකට කඩිනම් විසඳුමක් ලබා දෙනවා කියලා. ඒ කියපු කඩිනම් විසඳුම මේකද? මේ අයත් එක්ක සාකච්ඡා කරලා බලලා මේ අයට සාධාරණයක් ඉෂ්ට කර දෙන්න කියලා අපි ඉල්ලනවා. මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිය පළ කරමින්, මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නන්දන මිල්ලගල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.46]

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයේදී විපක්ෂයෙන් මේ හා සම්බන්ධයෙන් දැවැන්ත විවේචනාත්මක අදහස් ඉදිරිපත් වුණේ නැහැ. ඊට පරිබාහිරව එතුමන්ලා උත්සාහ කළා, ඊයේ ජනාධිපතිතුමා ඉදිරිපත් කළ කථාව විකෘතිකරණය කරන්න. එම න්‍යාය පත්‍රය ඇතුළේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අසභ්‍යකරණයට ලක් කළාය කියා අර්ථ දැක්වූවා වාගේ "හුණ්ඩු" රණ්ඩුවක් බොරුවට මතු කරගෙන ඒක ඇතුළේ කථා කරන්න හදපු යථාර්ථය සඟවන්න උත්සාහ කළා. ඒ නිසා ඒකට පොඩි පිළිතුරක් දෙන ගමන්ම මගේ අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වනවා.

"හුණ්ඩුව" කියන්නේ කුඩා පරිමාවන් මැනීමට භාවිත කරන මිනුම් ඒකකයක් කියන එක අපි හැමෝම දන්නවා. මේක මාධ්‍යවලින් සහ ඊයේ හවස්වරුවේ පාර්ලිමේන්තුව ඇතුළේ විපක්ෂයේ නීති විශාරද මන්ත්‍රීවරුන් විවිධාකාර විධියට, අසභ්‍ය විධියට අර්ථ නිරූපණය කරන්න උත්සාහ කළා. නමුත්, ජනාධිපතිතුමා හුණ්ඩු පිළිබඳවත්, සේරු පිළිබඳවත්, කුරුණි පිළිබඳවත්, පැල පිළිබඳවත්, බුසල් පිළිබඳවත් මනා අවබෝධයකින් තමයි ඒ කථාව කළේ.

අපේ රටේ ඉන්ධන ගබඩා කර ගැනීම සඳහා 1979න් පස්සේ අලුත් ටැංකි සංකීර්ණ ඉදිකරන්න, එහෙම නැත්නම් ඉන්ධන ගබඩා කිරීමේ ක්‍රම වැඩිදියුණු කරන්න සමත් වෙලා නැහැ. හැබැයි, අවුරුදු 45ක විතර කාල සීමාවක් තිස්සේ අපි වාහන ගෙන්වනවා, machine ගෙන්වනවා. ඒවාට අදාළ ප්‍රමාණයෙන්, ඒ ධාරිතාවට ගැළපෙන විධියට ඉන්ධන ටැංකි අලුතින් ඉදිකරලා නැහැ, එහෙම නැත්නම් ගබඩා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපුරලා නැහැ කියන එක කියන්න ඕනෑ. ඒ නිසා තමයි එතුමා ඉතා පැහැදිලිව කිව්වේ, රටකට අවශ්‍ය කරන දේ හුණ්ඩුවකට ගාල් කරන්න හදනවා කියලා. ජනාධිපතිතුමා එසේ පැහැදිලි කළේ, ඉන්ධන ටැංකි සංකීර්ණ අලුතින් ඉදිකිරීම සඳහා රුපියල් බිලියන 32ක් වෙන් කරමින්. කොළොන්නාවේ අලුත් ටැංකි 6ක් හදන්න, ඒ වාගේම කොළොන්නාව අංක 30 සහ 31 දරන ටැංකි පුළුල් කරන්න, මුතුරාජවෙල අලුත් ටැංකි 3ක් හදන්න, ත්‍රිකුණාමලයේ ටැංකි 24ක් අලුත්වැඩියා කරන්න, කොළොන්නාවේ සිට කොළඹ වරාය දක්වා බට ලයින් එක හදන්න, කොළොන්නාවේ සිට කැලණිතිස්ස විදුලි බලාගාරය දක්වා අලුත් බට ලයින් එකක් හදන්න, මුතුරාජවෙල ටැංකි අලුත්වැඩියා කරන්න සහ මුතුරාජවෙල - කටුනායක supply එක හදන්න, කොළොන්නාවේ කලාප අංක 7 පිරවුම් පහසුකම් වැඩිදියුණු කිරීම වාගේ දේවල් සඳහා තමයි මුදල් වෙන් කළේ. රුපියල් බිලියන 37ක් වියදම් කරලා ඉන්ධන ගබඩා කර ගන්න අවශ්‍ය පහසුකම් අලුතෙන් සපයන්න උත්සාහ කරමින්, 2027 වර්ෂය වනකොට බොහෝ දේවල් සංවර්ධනය කරලා අවසන් කරන්න උත්සාහ කරමින් සිටින අතරතුර සිදු කරනු ලබන එම ව්‍යාපෘතිය ගැන පැහැදිලි කිරීමේදී ඔවුන් අවුරුදු 45කටත් වැඩි කාලයක් මේ පිළිබඳව අවධානය යොමු කළේ නැහැ කියන කාරණය පැහැදිලි කරන්න තමයි ජනාධිපතිතුමා ඒක කිව්වේ. ඒකෙන් අපට පැහැදිලි වනවා, විපක්ෂය මේ ආණ්ඩුවේ සංවර්ධන වැඩ පිළිවෙළ තේරුම් ගන්නේ හුණ්ඩු මානසිකත්වයකින්, ඒ කුඩාම ඒකකයේ මානසිකත්වයෙන් කියන එක.

ඊළඟට, ඉරානය සහ ඊශ්‍රායලය අතර තිබෙන යුද්ධය සම්බන්ධයෙන් ආණ්ඩුවේ ස්ථාවරය ප්‍රකාශ කරන්නේ නැහැයි කියන චෝදනාව මේ විවාදය අස්සේම ගෙනාවා. ඒ සම්බන්ධයෙනුත් මා යම් අදහසක් ප්‍රකාශ කරන එක හොඳයි. ආණ්ඩුව විධියට ජනාධිපතිවරයාත්, ඒ වාගේම අපේ ඇමතිවරුනුත් මේ සම්බන්ධයෙන් ඉතා පැහැදිලි අදහසක් ප්‍රකාශ කළා. මේ යුද්ධය ඉරානය තුළ සිද්ධ වුවත්, ඊශ්‍රායලය තුළ සිද්ධ වුවත්, මැද පෙරදිග අනෙකුත් රටවල සිද්ධ වුවත්, මේ යුද්ධය නිසා මිනිස් ජීවිත විනාශ වනවා වාගේම මිනිසා විසින් ගොඩනඟන ලද භෞතික සම්පත් පවා විනාශ වනවා. ඉරානය සම්බන්ධයෙන් ගත්තොත්, මහා පර්සියානු ශිෂ්ටාචාරය, මෙසපොතේමියානු ශිෂ්ටාචාරය වාගේ දේවල් පවා විනාශ වනවා. අවසානයේදී මනුෂ්‍යත්වය, ඒ වාගේම මිනිසුන් අතර තිබෙන අන්‍යෝන්‍ය බැඳීම පවා විනාශ වනවා. ඒ වාගේම සාමය විනාශ වීම හරහා අනාගතයේදී ලෝකයට දැවැන්ත ගැටලුවකට මුහුණ පාන්නත් සිද්ධ වනවා. එම නිසා යුද්ධයට සම්බන්ධ සියලු පාර්ශ්ව මැදිහත් වෙලා යුද්ධය නතර කරලා සාමකාමී වීම තමයි කළ යුත්තේ කියන එක රජයක් විධියට අපි පැහැදිලිව දැනුම් දුන්නා. එම නිසා ඒ හා සම්බන්ධයෙන් කිසි ගැටලුවක් නැහැ.

අද දවසේ විවාදයට ගැනෙන ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පතේ තිබෙන යහපත් පැත්ත පිළිබඳව ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේත් බොහෝ කථිකයින් අදහස් ප්‍රකාශ කළා. ඇත්තවශයෙන්ම අපි මේ පනත ඉදිරිපත් කරලා තිබෙන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ බැංකු පැත්තෙන් විතරක් හිතලා නොවෙයි, විශේෂයෙන්ම මෙයින් පීඩාවට පත් වන ජනතාව පැත්තෙන් හිතලා. ඔබතුමන්ලා දන්නවා, මේ වනකොට විසි ලක්ෂයකට අධික පිරිසක් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් යම් යම් සේවා ලබා ගන්නවා වාගේම ඔවුන් එයින් පීඩාවට පත් වන තත්ත්වයකුත් ඇති වෙලා තිබෙන බව. අන්න ඒ ජනතාව පැත්තෙන් හිතලා තමයි අපි මේ පනත ගෙනාවේ. මීට කලින් අදහස් ඉදිරිපත් වුණා, පීඩාවට පත් වන ජනතාව සම්බන්ධයෙන් අපි සැලකිලිමත් වෙලා නැහැ කියලා. ඒ ජනතාව සම්බන්ධයෙන් සැලකිලිමත් වන නිසා තමයි අපි මේ පනත ගෙනැල්ලා තිබෙන්නේ. මේ පනත හරහා එක පැත්තකින් අපට අවශ්‍යයි, පීඩාවට පත් වන ඒ ජනතාව බේරාගන්න. ඔවුන්ගේ පීඩාවට හොඳින් සවන් දෙමින්, ඒ පීඩාව හොඳින් දකිමින් එය නිරාකරණය කරන්න අපට අවශ්‍යයි. ඒ නිසාම තමයි අපි මේ පනත ගෙනාවේ.

අනෙක් පැත්තෙන් අපට අවශ්‍යයි, රටේ ආර්ථිකයත් එක්ක යම් සාධනීය ගනුදෙනුවක් කළ හැකි මට්ටමට මේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පත් කරන්න. ඒ සඳහා හොඳ මූල්‍ය විනයක් සහිතව, හොඳ මූල්‍ය සාක්ෂරතාවක් සහිතව රටක් ඇතුළේ නියාමනය වුණු මේ වාගේ ආයතන, සමිති, සමාගම් ක්‍රියාත්මක වීම ඉතාම වැදගත් වනවා. ඒ නිසා මූල්‍ය ආයතනත්, ජනතාවත් කියන දෙපාර්ශ්වයටම අදාළව සාධාරණය ඉෂ්ට කිරීම සඳහා තමයි මේ පනත ගෙනැල්ලා තිබෙන්නේ. මේ පනතෙන් අපේ ආණ්ඩුවේ ඉදිරි සංවර්ධන දැක්ම යථාර්ථයක් බවට පත් කරන්න උත්සාහ කරනවා කියන අදහස ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.55]

**ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් දශක ගණනාවක් තිස්සේ ලෝකයට හුරුපුරුදු සංකල්පයක් තමයි, මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය සංකල්පය. දශක ගණනාවක් තිස්සේ මේ සංකල්පය අපේ රටේ ක්‍රියාත්මක වනවා, සමුපකාර ක්‍රමය හරහා සහ ග්‍රාමීය බැංකු හරහා. පසු කාලීනව ඒක පුළුල්වීමක් සිදු වනවා, පෞද්ගලික මූල්‍ය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන හරහා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ග්‍රාමීය ආර්ථිකයට සැලකිය යුතු වටිනාකමක් එක් කිරීමට ඇති හැකියාව, ක්ෂණිකව ණය ලබා ගැනීම, ඇප රහිත බව, කුඩා මුදලක් අවශ්‍ය අවස්ථාවක ලබා ගැනීම වැනි ලක්ෂණ නිසා මෙම ණය ක්‍රමය අපේ ජනතාව අතර ප්‍රචලිතවීමක් සිද්ධ වනවා. මෙම ණය ක්‍රමය හරහා අපේක්ෂා කරන සංකල්ප කිහිපයක් තිබෙනවා. ස්වයං රැකියා අවස්ථා පුළුල්වීම, කුඩා පරිමාණ ව්‍යාපෘති ආරම්භ කිරීම, ග්‍රාමීය ආර්ථිකය සක්‍රිය වීම, කාන්තාවන්ගේ ආර්ථිකය ශක්තිමත්වීම වාගේ අපේක්ෂා එක්ක තමයි මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමය අපේ රටේ බොහොම ප්‍රචලිත වැඩසටහනක් බවට පත් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙසේ නමුත් මේ ණය සම්බන්ධ ඉල්ලුම වැඩිවීමත් එක්ක මේ ක්‍රියාවලිය වෙනත් මානයකට යොමුවීම ගැන පසුගිය කාල සීමාවේ අපට අත්දැකීම් තිබෙනවා. ඒවා විශාල සමාජ ඛේදවාචක බවට පත් වුණු අවස්ථාත් අපි දැකලා තිබෙනවා. දත්ත විධියට බැලුවොත්, මේ සම්බන්ධව අපේ රටේ නිශ්චිත දත්ත සොයා ගන්න නොමැති වුණත් මෙහි වින්දිතයන් බවට පත් වුණු පිරිස ලක්ෂ 20කට ආසන්න බවට සඳහන් වනවා. ඊට අමතරව මේ ක්ෂුද්‍රමූල්‍ය ණය නිසා සිය දිවි හානි කර ගත් පිරිස 200කට ආසන්න බවට තොරතුරු ලැබිලා තිබෙනවා. නමුත් නිශ්චිත දත්ත තවදුරටත් අප ළඟ නැහැ.

පසුගිය කාල සීමාවේ මේ ක්‍රියාවලිය සමාජ ඛේදවාචකයක් බවට පත් වෙච්ච හේතු කාරණා සලකා බැලුවොත් ඉහළ පොලී අනුපාත අය කිරීම ප්‍රධාන වනවා. ඇතැම් අවස්ථාවල මේ හරහා වැඩියෙන්ම පීඩාවට පත් වුණේ අපේ කාන්තා ප්‍රජාව. ඒ අයට මෙම ණය මුදල් ගෙවා ගත නොහැකි අවස්ථාවල තමා සතු දේපළ විකුණා මුදල් දීමට හෝ තමා සතු දේපළ ලබා දීමට පවා සිද්ධ වෙලා තිබෙනවා. ඊළඟට, නඩු පැවරීම්වලදී පවා අධික පොලියක් ගණනය කිරීම නිසා මේක කොතරම්දුරට සමාජයට බලපාලා තිබෙනවාද කියන කාරණය පැහැදිලි වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ණය යම්කිසි චක්‍රයක් බවට පත් වනවා. එක ණයක් ගන්නවා, ඒක ගෙවා ගන්න බැරි වනකොට නැවත ණයක් ගන්නවා. මේ නිසා ණය ආපසු ගෙවීම වාගේම ණය මුදල විශාල වීම නිසාත් අපේ කාන්තාවන් වැඩි පිරිසක් පීඩාවට පත් වෙලා සිටිනවා.

මේ කාරණය ගැන කථා කරද්දී මෙහි තිබෙන අහිතකරම ගැටලුව තමයි, මේ මුදල් අය කර ගැනීම සඳහා ඇතැම් මූල්‍ය ආයතන හා එවැනි කටයුතු කරන අය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවැනි ක්‍රියාමාර්ග හරහා පවුල් සංස්ථා බිඳ වැටීම, දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීම, දේපළ අහිමි වීම වාගේම මරණයෙන් කෙළවර වීම දක්වා එහි බලපෑම කොතරම් දුරට පසුගිය කාල සීමාවේදී අපේ රටේ ක්‍රියාත්මක වෙලා ද කියන කාරණය පැහැදිලි වෙනවා. ඒකට අපට ප්‍රධාන උදාහරණයක් හැටියට දක්වන්න පුළුවන්, යුද්ධයෙන් පසු විශේෂයෙන්ම 2015-2018 කාල සීමාවේදී අපේ රටේ උතුරු, නැඟෙනහිර ප්‍රදේශවල ක්ෂුද්‍ර මූල්‍ය ණය ආශ්‍රිත අර්බුදය කෙතරම් දුරට බලපෑවාද කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මගේ කථාවේ මුලිනුත් මම මේ කාරණය පැහැදිලි කළා. ඒ අනුව, මේ ණය ලබා දීමේ ප්‍රධාන අරමුණ වශයෙන් ආර්ථිකය ප්‍රසාරණය කර ගැනීම, එහෙම නැත්නම් තමන්ගේ නිවසේ ආර්ථිකය ස්ථාවර කර ගැනීම අපේක්ෂා කළත්, බොහෝ පිරිස් මේ ණය ලබා ගැනීම තුළින් සිදු කර තිබෙන්නේ නිවාස සෑදීම, ආහාර වැනි දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සහ ජීවන වියදම සපුරා ගැනීම වැනි කාර්යභාරයන්. එතැනදී අපට දකින්න ලැබෙන කාරණයක් තිබෙනවා. මේ ණය ආපසු අය කර ගැනීමේ ක්‍රමවේදයත්, ලබා ගන්නා වූ මුදල තුළින් තමන්ගේ ආර්ථික ක්‍රියාවලිය කොතරම් දුරට ශක්තිමත් කර ගන්නවාද කියලා පසුවිපරමක් නොමැති වීමත්, මේ සමාජ ඛේදවාචකයේ එක් පැතිකඩක් විධියට දකින්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි තත්ත්වයක් තුළ තමයි, මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය නියාමනය කිරීමේ අවශ්‍යතාව මතු වෙලා තිබෙන්නේ. සරලවම කිව්වොත්, මෙය ණය දෙන්නන් සහ ණය ගන්නන් කියන දෙපිරිසටම ආරක්ෂිත නීතිරීති, ආරක්ෂිත ක්‍රියාමාර්ග ගන්නා වූ නව පනතක් විධියට හඳුන්වන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි වෙනත් විධියකින් ඒ ගැන සාකච්ඡා කළොත්, ණයක් අරගෙන ඒ ණය නොගෙවීම අදාළ ණය දෙන ආයතනය බංකොලොත් වීමට හේතුවක් වෙනවා. ණය ලබා නොදීම නිසා ඒ ණය ලබා ගැනීමට යොදා ගන්නා උපක්‍රම ණය ගැනුම්කරුවා දැඩි පීඩාවට ලක් වෙන්න හේතුවක් වෙනවා. එතකොට මේ පනත් කෙටුම්පත හරහා අදාළ ආයතන සහ ණය ගැනුම්කරුවා කියන දෙකොට්ඨාසයම ආරක්ෂා වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මේ නව පනතින් අපේක්ෂා කරන්නේ මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය දෙන ක්‍රියාවලියේ විධිමත් නියාමනයක් සිදු කිරීමයි. අපට දශක ගණනාවක් පුරා මේ ගැටලුව පිළිබඳව කථා කරන්න වෙලා තිබෙන්නේත්, මෙය මේ තරම් සමාජ ඛේදවාචකයක් බවට පත් වෙලා තිබෙන්නේත්, කාන්තාවන් මුහුණ දුන් විශාලම ගැටලුව හැටියට මේ ගැන කථා කරන්න සිදු වෙලා තිබෙන්නේත් මේ ණය ලබා දෙන ක්‍රමවේද හා ඒ ආයතන පිළිබඳව නිසි නියාමනයක් නොමැති වීම නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව මේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමක් අවශ්‍යයි. ඒ වාගේම බලපත්‍රලාභීන්ට නීතිරීති, විධිවිධාන නිකුත් කරලා, නිසි පසුවිපරම් ක්‍රමවේදයක් තුළින් වඩාත් පුළුල්ව මේ ණය ලබා දීමේ ක්‍රමවේදය ගැන සාකච්ඡා කිරීම අවශ්‍යයි. ඒ වාගේම වෙළෙඳ පොළ හැසිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති නිශ්චය කිරීම, වගකිව යුතු විධියට ණය දීම සංස්කෘතියක් වශයෙන් ක්‍රියාත්මක කරලා, විධිමත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් කර දීම මේ හරහා අපේක්ෂා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජනයා සඳහා ණය උපදේශනය, මූල්‍යමය සාක්ෂරතාව, මුදල් ණයට දීම හා ක්ෂුද්‍ර මූල්‍ය ණය ආදී සියල්ල ගැන පුළුල් කතිකාවක් ඇති කිරීම මේ හරහා අපේක්ෂා කරනවා. විශේෂයෙන්ම මේ නීතිරීති පද්ධතිය ශක්තිමත් කිරීම හරහා අදාළ ගනුදෙනුකරුවන්ට පැමිණිලි සිදු කිරීමට, ඒවා විභාග කරන්න සහ ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත හැකි යාන්ත්‍රණයක් අපට අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමස්තයක් වශයෙන් ගත්තොත්, මහ බැංකුව හරහා මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම අවශ්‍යයි. මේ සියලු කාර්යභාරයන් හරහා බලාපොරොත්තු

[ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය]

වෙන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රියාවලිය විධිමත් කිරීම, ඒ හරහා ණය දෙන්නන් සහ ණය ගන්නන් කියන දෙපාර්ශ්වයම ආරක්ෂා කිරීම යනාදියයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ණය දීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම වාගේම ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරන්න අවශ්‍ය වැඩසටහන් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන කාරණයත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ජනතාව ආර්ථික ක්‍රියාවලියක නිරත කිරීමේ අරමුණින්, සක්‍රිය ග්‍රාමීය ආර්ථිකයක් ආරම්භ කිරීමේ අරමුණින් තමයි ප්‍රජා ශක්ති වැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)
මේ කාරණයත් කියා මගේ කථාව අවසාන කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ පනත් කෙටුම්පත සම්මත කිරීමේ සමස්ත අරමුණ වන්නේ මුදල් ණයට දීම සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර විෂයයෙහි යහපත්, නෛතික, නියාමන හා අධීක්ෂණ රාමුවක් ඇති කිරීම වන අතර, එමගින් එකී ව්‍යාපාරවල අඩු ආදායම්ලාභී ගනුදෙනුකරුවන් පිරිසෙහි අපේක්ෂිත සමාජ, ආර්ථික, මූල්‍ය සංවර්ධනයන් ලබා ගැනීම සහ වඩාත් සුරක්ෂිත පරිසරයක් ඇති කිරීමයි කියන කාරණයත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ගයාන් ජනක මහතා**
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. UPUL KITHSIRI left the Chair and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 4.04]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දීම සම්බන්ධයෙන් නියාමනය කිරීම හොඳ වැඩක්, ඔබතුමන්ලා එය අවංකව කරනවා නම්. 2021 වසරේ විතරක් 200ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සියදිවි හානි කරගෙන තිබෙනවා, බැංකු පද්ධතියෙන් පිටත ණය ලබා ගැනීමට සම්බන්ධ කාරණා නිසා. මේ සම්බන්ධයෙන් කරන්න තව බොහෝ දේවල් තිබෙනවා. එසේ සියදිවි නසා ගත් අයගෙන් 6දෙනෙක්ම පොළොන්නරුවේ; අපේ ගරු කථානායකතුමාගේ ගමේ. ඔබතුමන්ලා විපක්ෂයේ සිටි කාලයේ පොළොන්නරුවට ගිහිල්ලා ඒ අයත් එක්ක ගිවිසුම් අත්සන් කරලා, එකඟ වෙලා තිබෙන්නේ ඒ අයට උදවු කරන්නම් කියායි. හැබැයි, ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දීම පිරමිඩ සහ digital currency කියන ඒවා එක්ක පටලවා ගන්නේ නැතුව ක්‍රමවේදයක් හදලා මේ ජනතාවට සාධාරණයක් ඉෂ්ට කරන්නට තමුන්නාන්සේලා අවංකව කටයුතු කරන්න ඕනෑ. ඒ, එක පැත්තක්.

ඒ වාගේම අද තවත් පුවතක් වාර්තා වෙනවා. ඒ, මොකක්ද? එම සිදුවීම වෙලා තිබෙන්නේ ලංකාවට අයත් ජාත්‍යන්තර මුහුදු තීරයේ. හැබැයි, Exclusive Economic Zone - EEZ - එක ඇතුළේ කියලා තමයි දැනගන්න තිබෙන්නේ. ජාත්‍යන්තර මුහුදේදී ඉරාන නෞකාවකට ප්‍රහාරයක් එල්ල වෙලා තිබෙනවා කියලා ජාත්‍යන්තර මාධ්‍ය වාර්තා කර තිබෙනවා. ලංකාවේ නාවික හමුදාව ගිහිල්ලා ඒ ප්‍රහාරය නිසා තුවාල වුණු කට්ටිය ගෙනැවිත් ගාල්ලේ රෝහලට ඇතුළත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 101ක් අතුරුදහන්, missing. මේ නෞකාව කොහේ ඉඳලාද ලංකාවේ මුහුදු තීරය ආසන්නයට ආවේ? අපිට ඒ ගැන දැනගන්න ඕනෑ. එක්කෝ, ඒ නෞකාව විශාඛාපට්ටනම්වල තිබුණු ජාත්‍යන්තර military exercise එකේ ඉඳලා ආපසු අරාබි මුහුදට යන ගමන් තිබුණු එකක්ද, එහෙම නැත්නම් ඒ මුහුදේ ඉඳලා ලංකාවට ආපු එකක්ද? මේ පිළිබඳව ඔබතුමන්ලා රට දැනුවත් කළ යුතුයි. මොකද, එක පැත්තකින් දකුණු මුහුදු තීරයේ සිටින අපේ ධීවර ජනතාව මාළු අල්ලන්න මුහුදට යනවා. හැබැයි, අපේ මුහුදු තීරය ජාත්‍යන්තර මුහුදු තීරය වුණාට, මේ සිද්ධිය වෙලා තිබෙන්නේ Exclusive Economic Zone - EEZ - එක ඇතුළේ. ඒ කියන්නේ, අපිට නාවික ආරක්ෂාව ලබා දෙන්න වගකීමක් තිබෙන සීමාව ඇතුළේ. ඒ නිසා ඉරාන නෞකාවකට අපේ මුහුදු තීරය තුළදී ප්‍රහාරයක් එල්ල වෙන්න කටයුතු වුණේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් ඔබතුමන්ලා රට දැනුවත් කළ යුතුයි. ඒ වාගේම මේ සම්බන්ධව තමුන්නාන්සේලා ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. මොකද, පැහැදිලිවම බුද්ධි අංශ එක්ක ඔබතුමන්ලා වැඩ කරන්නේ නැහැ. යහ පාලන ආණ්ඩුව ඇවිල්ලා කළේත් බුද්ධි අංශ ටික දුර්වල - dismantle - කළ එකයි. අද ඔබතුමන්ලා බලයට ඇවිල්ලා කරන්නේ මොකක්ද? ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඇතුළේ ඉන්න පාස්කු ඉරිදා එල්ල වුණු ප්‍රහාරයට අදාළ බුද්ධි අංශ වාර්තා හංගා ගත් අය ආරක්ෂා කරන්න ඕනෑ නිසා සලේව අත්අඩංගුවට ගත්තා. DO එකක් ගහනවා. එහෙම ගහලා කියන්නේ මොකක්ද? පාස්කු ඉරිදා එල්ල වුණු ප්‍රහාරය සම්බන්ධයෙන් කථා කරනවා. හැබැයි, එසේ අත්අඩංගුවට

ගැනීමෙන් පාස්කු ඉරිදා එල්ල වුණු ප්‍රහාරයට හසු වුණු වින්දිතයන්ට සාධාරණයක් සිදු වීම කෙසේ වෙතත්, එය ඔබතුමන්ලාගේ දේශපාලන අවශ්‍යතාවක් ඉටු කර ගන්න කරපු කාරණයක් බවට නම් දැන් හොඳටම පැහැදිලියි.

තවත් පැත්තකින් ගත්තොත්, දැන් මැදපෙරදිග තමයි යුද්ධයක් පවතින්නේ. ඊශ්‍රායලය සහ ඇමෙරිකාව, ඉරානය එක්ක යුද්ධ කරනවා. ඔබතුමන්ලා හොරාට ගිවිසුමක් අත්සන් කළා නේ. නෞකාවකට අපේ මුහුදු තීරය ආසන්නයේදී වෙච්ච හානිය ඒ හොරාට අත්සන් කරපු ගිවිසුමක ප්‍රතිඵලයක්ද? ඒ පිළිබඳව වගකිව යුතු කෙනෙක් ප්‍රකාශයක් කළ යුතුයි. ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ විෂයය මේක. එහෙම අත්සන් කරපු ගිවිසුමක ප්‍රතිඵලයක්ද මේක? එහෙම නැත්නම් ඔබතුමන්ලා අධ්‍යයනය කරන්න, අද මැදපෙරදිගට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. මැද පෙරදිග රටවල් එක්ක ඉරානය ගහ ගන්නේ නැහැ. ඇමෙරිකානු කඳවුරුවලට ගහන්නේ. ඇමෙරිකානු කඳවුරුවලට ගැහුවාම ඒකේ වින්දිතයා බවට පත් වෙන්නේ කවුද? ඒ, ඒ රටවල්. ඒ නිසා ඔබතුමන්ලා හොරට ගිවිසුම් අත්සන් කරනකොට මේවා ගැනත් අවධානය යොමු කරන්න.

තවත් පැත්තකින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ ජනාධිපතිතුමා ඇවිල්ලා මේ පිළිබඳව ලොකු විග්‍රහයක් කරනවා මම දැක්කා. විග්‍රහය එලක් වෙන්නේ නැහැ. 2009න් පස්සේ අපේ ආණ්ඩු ඇතුළු පත් වෙච්ච බොහොමයක් ආණ්ඩු භූගෝලීය දේශපාලනයේ වෙනස්කම් සහ භූගෝලීය දේශපාලන කාරණා පිළිබඳව අවධානය යොමු කළේ නැහැ. ඒක තමයි ඇත්ත කථාව. ඒ හින්දා තමයි අපට ක්‍රමානුකූලව, කාලානුරූපව නොයෙක් අභියෝගවලට, අර්බුදවලට මුහුණ දෙන්න සිද්ධ වුණේ. ඒ හින්දා ආණ්ඩුවක් විධියට ඔබට වගකීමක් තිබෙනවා, දැන්වත් මේ ගැන සොයා බලන්න. මැදපෙරදිග ගල්ෆ් කලාපයේ ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක ලංකාවට ඇති වෙලා තිබෙන බලපෑම මොකක්ද, ඒ බලපෑමට අපි මුහුණ දෙන්නේ කොහොමද, ඒකෙන් අපට ආර්ථික වශයෙන් යම්කිසි ප්‍රතිලාභයක් ලබාගන්න පුළුවන් විධියට අලුත් නාවික සහ ගුවන් මාර්ග හැදෙනවාද කියන දේවල් පිළිබඳව ආණ්ඩුව මේ වන විට අධ්‍යයනයක් කරලා තිබෙනවාද?

තවත් පැත්තකින් විදේශ ප්‍රේෂණවලට අනිවාර්යයෙන් විශාල අභියෝගයක්, බලපෑමක් එල්ල වෙන්න පුළුවන්. සංචාරක ව්‍යාපාරය ගත්තොත්, අද ලෝකයේ සංචාරකයන් රැගත් ගුවන් යානා බහුතරයක් අරාබි මුහුද ආශ්‍රිත ගුවන් කලාපය, නැත්නම් ගල්ෆ් ගුවන් කලාපය හරහා තමයි යන්නේ. ඒ තුළ අපේ රටට එන බලපෑම කොහොමද? ඒකට ආණ්ඩුවක් විධියට ඔබ මුහුණ දෙන්නේ කොහොමද? රටක් විධියට අපි ඒකට සූදානම් වෙන්නේ කොහොමද?

තවත් පැත්තකින් අපේ රටින් තේ සහ අනෙකුත් අපනයන නිෂ්පාදන ගල්ෆ් කලාපයට වාගේම ලෝකයේ අනෙක් කලාපවලට යනවා. මේ තත්ත්වයත් එක්ක අපි අලුත් වෙළෙඳ පොළකට යනවාද, අපි තවදුරටත් මේ රටවල් එක්ක මේ කාරණා ඉෂ්ට කරගන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව ඔබ ආණ්ඩුවක් විධියට මෙතෙක් දුරට කොතරම් අවධානය යොමු කරලා තිබෙනවාද, නැද්ද කියන කාරණය පිළිබඳව මේ පාර්ලිමේන්තුව දැනුවත් කළ යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි ඔබතුමන්ලාට කියන්නේ මේකට අපට බැණලා හරියන්නේ නැහැ. මම දැක්කා, එක්කෙනෙක් කියනවා කරන වැඩ ගැන. ඕවා අපි ඒ කාලයේ කරන්න හදනකොට විරුද්ධ වෙච්ච අය තමයි ඔය. ඒ කාලයේ තෙල් ටැංකි හදනකොට විරුද්ධ වෙච්ච අය තමයි. හැබැයි, ඒක නොවෙයි උත්තරේ. තමුන්නාන්සේලා මේ එන අභියෝගවලට මුහුණ දෙන්නේ කොහොමද, මේ සඳහා රටක් විධියට මුහුණ දෙන්නේ කොහොමද කියන කාරණය පිළිබඳ අනිවාර්යයෙන් මේ පාර්ලිමේන්තුව දැනුවත් කළ යුතුයි. ඒ වාගේම ආණ්ඩුව මේ ගැන දේශපාලන කෝණයෙන් බලන්නේ නැතිව කටයුතු කළ යුතුයි. තෙල් පෝලිමක්, ගෑස් පෝලිමක් දිහා බලලා, "මේක සතියක වැඩක්, මාසයක වැඩක්" කියන එක නොවෙයි කළ යුත්තේ. ලෝකයේ ප්‍රධාන හැම රටක්ම මේ අර්බුදයත් එක්ක පැන නැඟෙන අතුරු අර්බුදවලට මුහුණ දෙන්න ලැහැස්ති වෙනවා. ඒ වෙනුවෙන් අපේ සූදානම මොකක්ද? අපි ඒකට සූදානම් වෙන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව ඔබතමුන්නාන්සේලා මේ රට දැනුවත් කරන්න. ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ මොකක්ද?

එක වෙලාවක ඔබතුමන්ලාගේ දේශපාලන න්‍යාය පත්‍රය අනුව ඔබතුමන්ලාට වීරයෝ ඉන්නවා; ඉල්මහ විරුවෝ ඉන්නවා. හැබැයි, යුද්ධය අවසන් කරපු කෙනා, එල්ටීටීඊ ත්‍රස්තවාදීන් එක්ක හැප්පුණු කෙනා සෙබළා. ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න, අද එල්ටීටීඊ ත්‍රස්තවාදය මේ රටේ ක්‍රියාත්මක වුණා නම්, මේ ලෝකයේ දැන් තිබෙන තාක්ෂණයත් එක්ක අර පොඩි කුරුම්බැට්ටි ප්ලේන් නොවෙයි කොළඹට එන්නේ. ඩ්‍රෝනවලින් ගහලා යන්නේ, උන් හිටි තැන් සොයාගන්න බැරි වෙන්න. ඒ ත්‍රස්තවාදය මර්දනය කරන්න මැදිහත් වෙච්ච බුද්ධි අංශයේ අය හිරේ දමනවා. ත්‍රස්තවාදය අතහැරලා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයට ආපු අය හිරේ දමනවා. රණවිරුවා සෙබළා බවට පත් වුණා. ඔබතුමන්ලා ඉල්මහ විරුව සමරා ගන්න. ඒක අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, රණවිරුවා සෙබළා බවට පත් වුණා. අනෙක් පැත්තෙන් මහ සංඝ රත්නය -අපේ හාමුදුරුවරු, ගරුතර මහ සංඝ රත්නය- ආගමික නායකයන් වනචාරීන් බවට පත් කරලා තිබෙනවා, ඔබතුමන්ලාගේ ඇමතිවරුන්ගේ ප්‍රකාශවලින්; ජනාධිපතිවරයාගේ ප්‍රකාශවලින්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් අතට මේ මාතෘ භූමිය බේරා ගන්න, මේ මාතෘ භූමිය ගොඩ නඟන්න කැපවීම් කරපු ඉතිහාසයක් අපට තිබෙනවා. මේ මාතෘ භූමිය අද හුණ්ඩුවක් බවට පත් කරලා තිබෙනවා. ඔබතුමන්ලාගේ මානසිකත්වය, සිතුම් පැතුම්, හිතන විධිය ඒ හුණ්ඩුවට සීමා වෙන්න පුළුවන්. ලෝකයේ ඕනෑම රටක - පොඩිම රටක් වුණත්, පුංචිම දූපතක් වුණත් - නායකයෙක් තමන්ගේ රටට හුණ්ඩුවක් කියලා කියාගන්නේ නැහැ. එහෙම කරන්නේ නැහැ. මොකද, අභිමානයක් තිබෙන්න ඕනෑ, තමන්ගේ ජාතිය පිළිබඳව; රට පිළිබඳව; ආගම පිළිබඳව. ආගම, ජාතිය පිළිබඳව අභිමානයක් නැත්නම් එතැනින් එහාට දිගු කාලීන සැලැස්මකට අනුව මේ රටේ අනාගත පරම්පරාවට මුහුණ දෙන්න පුළුවන් තීන්දු තීරණ ගන්න රාජ්‍ය නායකයන් බිහි වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ මෙපමණයි. මේ දේශපාලන කාර්යය ඔබට, අපට විසඳා ගන්න පුළුවන්. හැබැයි, මැදපෙරදිග ගල්ෆ් කලාපයේ අභියෝගයක්, අර්බුදයක් ඇති වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගල්ෆ් කලාපයේ අභියෝගයක්, යුද්ධයක් ඇති වෙලා තිබෙනවා. ගල්ෆ් කලාපයේ ඇමෙරිකානු කඳවුරු පමණක්

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

නොවෙයි, සිවිල් පුරවැසියන්ට, ආර්ථික කේන්ද්‍රස්ථානවලට, ගුවන් කේන්ද්‍රස්ථානවලට, වරායවලට හානි වෙනවා. මේ තුළින් අපේ රටට කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන වශයෙන් ආර්ථික බලපෑමක් ඇති වෙන්න පුළුවන්. එම නිසා කරුණාකරලා ඔබතුමන්ලාගේ ඔය මානසිකත්වය පැත්තක තියලා, හුණ්ඩු මානසිකත්වය පැත්තක තියලා තිරසර සැලැස්මක් අනුව කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් රත්නසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.13]

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ඉදිරිපත් කර තිබෙන්නේ, ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පතයි. ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා කථා කරද්දී කිව්වා, මෙම පනත ගෙනෙන්න තිබුණේ, මීට අවුරුදු 15කට කලින්ය කියලා. ඒ වාගේම මට කලින් කථා කළ විපක්ෂයේ මන්ත්‍රීතුමා කියනවා, අවංකව කරනවා නම් මේක හොඳ වැඩක් කියලා. හැබැයි, එහෙම නම් මීට අවුරුදු 15කට කලින් මෙය ගෙනැවිත් ඒ විධියට කටයුතු කරන්න තිබුණා නේ. නමුත් කළේ නැහැ. ඒගොල්ලන්ට මේක කර ගන්න බැරි වුණේ, ඒගොල්ලන් ළඟ අවංකකම නැති නිසා. අවංකකම නැති නිසා ඒගොල්ලන්ට මේක කරන්න බැරි වුණා. අපි අවංක නිසා අපට මේක කරන්න පුළුවන් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයට අපි මේ කාරණා ටික කියන්න ඕනෑ. පළමු කාරණය තමයි රණ විරුවාට, රණ විරුවා කියන්න අපේ දිව නැමෙනවා. හැබැයි, ඒගොල්ලන් කටයුතු කළේ කොහොමද? තමන්ගේ සහෝදරයා හමුදාවට ඇතුළු කරන්න අවශ්‍ය නීති රීති, රෙගුලාසි ටික එක රැයකින් වෙනස් කරලා, හමුදාවට ඇතුළු කර ගත්තා. පිට රට සංචාරවලට තමන්ගේ මල්ලිව යැව්වා. රණ විරුවාගේ වීරත්වය ආරෝපණය කර ගත් ඒ අයට රණ විරුවෝ කියන්න අපේ දිව නැමෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, විපක්ෂය සංවර්ධන නිලධාරීන්ගේ උද්ඝෝෂණයට මුවා වෙලා මේ ආණ්ඩුවට පහර ගහන්න පටන් ගත්තා. ඒ වාගේම ඇතැම් වෛද්‍යවරුන්ගේ උද්ඝෝෂණයට මුවා වෙලා ආණ්ඩුවට පහර දෙන්න ගත්තා. දුම්රිය සේවකයන්ගේ වර්ජනයට මුවා වෙලා ආණ්ඩුවට පහර දෙන්න ගත්තා. ඒ කිසිවක් සාර්ථක නොවුණාට පසුව අද ඉරානය සහ ඊශ්‍රායල, ඇමෙරිකානු යුද්ධය අල්ලාගෙන ආණ්ඩුවට පහර දෙන්න හදනවා. හැබැයි, මේ කුජීත, නන්නත්තාර වුණු විපක්ෂයට මේ ආණ්ඩුවේ මයිල් ගහක්වත් හොල්ලන්න අපි ඉඩ තබන්නේ නැහැ කියන එක අපි ප්‍රකාශ කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දවසේ ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ගැන සාකච්ඡාව තිබුණාට ගරු විපක්ෂ නායකතුමා අදත් කථා කරන්න පටන් ගත්තේ ගල් අඟුරු ගැන. එතුමාට ඒ ගැන ආයේත් කියා දෙන්න ඕනෑ. බිහිරි අලින්ට වීණා වාදනය කර වැඩක් නැති වුණාට, මේ රටේ ජනතාවට හරි දැන ගන්න අපි කියන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගල් අඟුරු වංචාවක් වෙලා තිබෙනවාද, නැද්ද කියන කාරණය පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගල් අඟුරු සැපයුමට අදාළ මුදල් ගෙවීම ප්‍රධාන අදියර දෙකකින් වෙන්නේ. එකක්, පැටවුම් වරායේ රසායනාගාර වාර්තාව මත මූලික ගෙවීම සිද්ධ කරනවා. දෙවැනි ගෙවීම කරන්නේ, ගොඩබෑම් වරායෙන් ලබා ගන්නා වාර්තාව අනුව. මේ වනකොට ගල් අඟුරු නැව් 08ක් ඇවිල්ලා තිබෙනවා. ඒවායේ රසායනාගාර වාර්තා 06ක් අපි විශ්ලේෂණයට අරගෙන තිබෙනවා. ඒ අනුව, පළමුවැනි ගල් අඟුරු තොගය ලෙස මෙට්‍රික් ටොන් 59,831ක් ලැබී තිබෙනවා. එහි FOB අගය, පැටවුම් වරායේ මිල, මෙට්‍රික් ටොන් එකක් සඳහා ඇමෙරිකානු ඩොලර් 85.17ක්. ඒ අනුව, පළමු ගල් අඟුරු තොගයේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 5.09යි. නමුත්, අදාළ පිරිවිතර සම්පූර්ණ කර නොතිබුණු නිසා -ප්‍රමිති පරාසයෙන් පිටත අගයන් ගන්නා නිසා- දෙගුණයක දඩ මුදලක් අය කරන්න කටයුතු කරලා තිබෙනවා. දඩ මුදල දෙගුණයකින් අය කිරීම නිසා මෙට්‍රික් ටොන් එකක් සඳහා ඇමෙරිකානු ඩොලර් 34.75ක දඩයක් අය කර තිබෙනවා. ඒ අනුව, මෙට්‍රික් ටොන් එකක් ඇමෙරිකානු ඩොලර් 85.17ට - FOB මිලට - පිරිනැමූ ටෙන්ඩරයේ දෙගුණයකින් දඩ මුදල් අය කිරීමෙන් පසුව මෙට්‍රික් ටොන් එකක් සඳහා ගෙවනු ලැබ ඇත්තේ ඇමෙරිකානු ඩොලර් 50.42යි. ඒ අනුව, සැබෑවටම ගෙවා ඇති මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 3.01යි. දඩ අය කරන ලද මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 2.07යි. මීට අමතරව දෙවන, තුන්වන, හතරවන, පස්වන හා හයවන ගල් අඟුරු නැව්වලින් දඩ විධියට අය කරගෙන තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් 2,277,451ක්.

දැන් අපි විපක්ෂ නායකතුමාගෙන් අහනවා, ප්‍රමිතිය අඩු වෙලා ලංකාවට ගෙනාපු එකම ගල් අඟුරු තොගයද මේ, කියලා. ගල් අඟුරු 2014දී ගෙනාවා; 2021දී ගෙනාවා; 2022දීත් ගෙනාවා. අපි එතුමාට කියනවා, එදා ඒවා සම්බන්ධයෙන් මේ අරගෙන තිබෙනවාට අමතරව ගත්තු තීන්දුවක්, තීරණයක් කියන්න කියලා.

විපක්ෂය නියෝජනය කරන ගරු මරික්කාර් මන්ත්‍රීතුමා කිව්වා, ඒ ගනුදෙනුව ඇතුළේ වංචාවක් වෙලා තිබෙනවා කියලා. එතුමා මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, කිසියම් පුද්ගලයෙකුට අයත්, මහජන බැංකුවේ හෝමාගම ශාඛාවේ ගිණුමකට මුදල් බැර වෙලා තිබෙනවා කියලා. අදත් අපි එතුමාට කියනවා ඒ ගිණුම් අංකය ඇතුළු ඒ විස්තර කියන්න කියලා. කාගේ ගිණුමටද ඒ මුදල් බැර වුණේ කියන ප්‍රශ්නය මාධ්‍යවේදින් ඇහුවාම, ඒ අහිංසක මාධ්‍යවේදීන්ට තග දැම්මාට, චණ්ඩි පාට් දැම්මාට මේ පාර්ලිමේන්තුව ඇතුළේ චණ්ඩි පාට් දාන්න එතුමාට බැහැ. එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්න ඕනෑ, හෝමාගම කාගේ ගිණුමටද ඒ මුදල් බැර කළේ කියලා. ගිණුම් අංකයත් එක්ක කියන්න ඕනෑ, කාගේ ගිණුමටද ඒ මුදල් බැර කළේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මන්ත්‍රීවරු 159දෙනා මේ රටේ අහිංසක ජනතාවගේ බදු මුදල් අබමල් රේණුවකින් හෝ වංචා කරලාත් නැහැ; හොරකම් කරලාත් නැහැ. නැවත නැවතත් කියනවා, හොරකම් කරන්න, වංචා කරන්න අපි මේ දේශපාලනය තෝරාගෙන නැහැ කියලා. ගරු විපක්ෂ නායකතුමා කිව්වා, ක්ෂුද්‍ර මූල්‍යකරණය නිසා වාණිජකරණයට ලක් වෙලා පොඩි මිනිහා තළා පෙළා විනාශ කර දමා තිබෙනවා කියලා. අපි අහනවා, 2024න් පස්සේද එහෙම වුණේ කියලා. 2024න් පස්සේද පොඩි මිනිහා තළන්න ගත්තේ? එතුමන්ලා අවුරුදු ගණනක් පාර්ලිමේන්තුව නියෝජනය කළා. ඉතින් ගෙනෙන්න තිබුණා නේ, මේ පනත් කෙටුම්පත. ගෙනැල්ලා ඒ ජනතාව බේරා ගන්න

තිබුණා නේ. ඒ වාගේම එතුමා කිව්වා, වතු ආශ්‍රිත ප්‍රදේශවල ජනතාව මේ නිසා විශාල පීඩනයකට පත් වෙලා කියලා. අපි වතු ජනතාවගේ වැටුප රුපියල් 1,750 දක්වා වැඩි කරන එකට විරුද්ධව කෙඳිරි ගෑවා; විලාප නැඟුවා, විපක්ෂ නායකතුමාගේ මන්ත්‍රීවරියෝ සහ මන්ත්‍රීවරු. ක්ෂුද්‍ර මූල්‍ය ණයකරණයට ලක් වන නිසා තමයි අපි ඒ ජනතාව බේරා ගන්න ඒ අයගේ දෛනික වැටුප වැඩි කළේ. ඒකට එරෙහි වුණා, විපක්ෂය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂය මේ පනත් කෙටුම්පත ගැන කථා කරමින් කියනවා, නියාමනයක් අවශ්‍යයි කියලා; මහා පරිමාණ මූල්‍යකරුවන් සම්බන්ධයෙන්ද නියාමනයක් අවශ්‍යයි කියලා. අපි අහනවා, දයා ගමගේ මොන පරිමාණයටද වැටෙන්නේ කියලා. රජයේ බැංකුවලින් මුදල් අරගෙන ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් පවත්වාගෙන ගිය දයා ගමගේ වැටෙන්නේ මොන පරිමාණයටද? ඒගොල්ලන්ට බදු නිදහස දීලා, ජනතාවගේ බදු මුදල්, බැංකුවල තිබෙන මුදල් එළියට ඇදලා ණය දීලා ඒවා බොල් ණය විධියට කපා දමපු ඉතිහාසයක් තිබෙන්නේ.

කළුතර මන්ත්‍රීතුමා කිව්වා, තවම අපේ ආණ්ඩුවට අවුරුද්දයි කියලා. ඔව්, අපේ ආණ්ඩුවට තවම අවුරුද්දයි. ඔව්, අපි මොන්ටිසෝරියේ. හැබැයි, අපි අපේ රටේ ජනතාවට සහතික කරලා මේ කාරණය කියනවා. අපේ ආණ්ඩුවට අවුරුද්දයි. අපි මොන්ටිසෝරියේ. ඒ ගොල්ලන් ඉන්නවා ඇත්තේ 13 පන්තියේ. හැබැයි, අපි කාගේවත් කරේ තියෙන මාල කඩලාත් නැහැ. අතේ තියන වළලු ගලවලාත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඒවා කරලා නැහැ. 13 පන්තියට ගියත් අපි ඒ දේවල් කරන්නේ නැහැ. ඒ වාගේම අපි නයා ගැහුවා කියලා හැංගෙන්නේත් නැහැ. දර්ගා නගරයේ ජාතිවාදය වපුරලා, යාපනය පුස්තකාලය ගිනි තියලා විනාශයන් සිදු කරලා ජාතිවාදය අවුස්සපු අය තමයි අද ඇවිල්ලා අපේ ගරු ජනාධිපතිතුමා කරන්න ඕනෑ ප්‍රකාශය කියලා දෙන්නේ. ගරු ජනාධිපතිතුමා ඊයේ දවසේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා පැහැදිලි ප්‍රකාශයක් කළා. කවුරු යුද්ධය පටන් ගත්තත් ඒ යුද්ධයේ ආනිශංස ගැන එතුමා කිව්වා. සියලුදෙනා සාමය සඳහා ගමන් කළ යුතුයි කියලා එතුමා කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරන්නට මත්තෙන් මම ගරු විපක්ෂ නායකතුමාට කාරණයක් කියනවා. තල් අත්තට බෙලි ගෙඩිය වැටුණාට පස්සේ හාවා දිව්වා අහස කඩාගෙන වැටෙනවා කියලා. ආං ඒ වාගේ, විපක්ෂ නායකතුමා ඇවිල්ලා බොරුවක් අත් හරිනවා මෙතැන. ඒ බොරුව අරගෙන දුවනවා, විපක්ෂයේ මන්ත්‍රීවරු. ඒ වැඩේ නතර කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.23]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රථමයෙන්ම මැද පෙරදිග තත්ත්වය පිළිබඳව යමක් කියන්න අවශ්‍යයි. විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය ගමේ චණ්ඩියෙකු වාගේ ඉරානයට එල්ල කරන ප්‍රහාරය අප හෙළා දකින ගමන්ම, අනෙක් පැත්තෙන් ඉරානය මැදපෙරදිග කලාපයේ තිබෙන විශේෂයෙන් සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කුවේටය ආදි රාජ්‍යවලට ප්‍රහාර එල්ල කිරීමත් අපි හෙළා දකිනවා. විශේෂයෙන්ම ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් ඒ රටවල වෙසෙන තත්ත්වයක් තුළ මේ යුද්ධය අපටත් දිගටම බලපානවා. ඒ නිසා අප ඒ පිළිබඳව වගකීමෙන් හැසිරෙන්න ඕනෑ කියන එක මම විශේෂයෙන්ම කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නම් ජනාධිපතිතුමාට "හුණ්ඩුවා" කියන්නේත් නැහැ, "සේරුවා" කියන්නේත් නැහැ; අන්වර්ථ නාමයෙන් කථා කරන්නේ නැහැ. මොකද හේතුව, ඒ මම ආදරය කරන මගේ මාතෘ භූමියේ ජනාධිපතිවරයා. මම අකමැති දේශපාලන පක්ෂයක නායකයෙක් වුණත්, ඒ අපේ රටේ ජනාධිපතිතුමා. නමුත් එතුමන්ලා රණවිරුවන් සොල්දාදුවන් කරලා, හාමුදුරුවන් වහන්සේලා චනචාරින් කරලා, උපන් මව්බිම හුණ්ඩුවක් බවට පත් කිරීම ගැන නම් මට කනගාටුවක් තිබෙනවා. ඒ පිළිබඳව මම මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. මොකද, මැතිවරණයට පෙර නම් කිව්වේ, මේක සුරපුරයක් කරන්න පුළුවන් රටක් කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කළ මන්ත්‍රීතුමා කිව්වා මා කියපු කාරණයක් ගැන. මම එතුමාගේ නම දන්නේත් නැහැ, රැල්ලට ආපු කෙනෙක් හින්දා. මම චෙක් අංකයක් නම් කිව්වේ නැහැ. මහජන බැංකුව ගැනයි කිව්වේ. මම ඒ තොරතුර ලබා දෙන්නම්. හැබැයි, මීට අවුරුදු 10කට පෙර මහින්ද රාජපක්ෂට චීනයෙන් දීපු චෙක් එකේ අංකය දන්නවා කිව්වා, අනුර කුමාර මැතිතුමා. ඒක ඉදිරිපත් කරලා ඒකේ සල්ලි ගේන්න කියන්න; උගන්ඩාවේ තිබෙනවා කියලා ගෙනෙනවා කියපු සල්ලි ටික ගෙනෙන්න කියන්න. ඒ වාගේම, අර කැබ් එකක් පුරවාගෙන ගියා නේ, ෆයිල් මිටි අරගෙන? ඒ ෆයිල් ටික ගෙනැල්ලා, ඒවායේ තිබෙන්නේ මොනවාද කියලා මේ රටට ප්‍රකාශ කරන්න කියන්න. මොකද, ඒ ඔක්කෝම එන්න ඕනෑ පිළිවෙළටයි. ඒ වාගේම ඊට කලින් ප්‍රකාශ කරන්න කියන්න, රාජපක්ෂලාගේ සල්ලි ගෙනැල්ලා- *[බාධා කිරීමක්]* මම කාගේවත් නම් කිව්වේ නැහැ. ඒ වාගේම, විදුලි බිල තුනෙන් එකකින් අඩු කරන්න කියලා කියන්න, මීට අවුරුදු එකහමාරකට කලින් කිව්වා වාගේ. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, අධ්‍යාපනය, සෞඛ්‍යය කියන ක්ෂේත්‍රවලට අදාළ භාණ්ඩ සඳහා වන VAT එක බින්දුවක් කරනවා කිව්වා. ඒවා කරලා ඇවිත් ඊට පස්සේ අපෙන් අහන්න කියන්න. ඒ වාගේම, වරායෙන් බාන ගණනට තෙල් ගෙනෙන්න කියලාත් කියන්න. ඊට පස්සේ අපි අනෙක් ටික ගැන කථා කරමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මන්ත්‍රීතුමා සමහර කරුණු දන්නේ නැතුවයි කථා කළේ. එතුමා FOB ගාස්තුවක් ගැනත් කථා කළා. FOB කියන්නේ මොකක්ද කියලා දන්නේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ රැස්වීම පැවැත්වුවා. මහජන උපයෝගිතා කොමිසම ඒ ගල් අඟුරු නැව් 9 නිසා වෙච්ච පාඩුව රුපියල් මිලියන 8,497ක් විධියට ගණන් හදලා තිබෙනවා. මම දන්නේ නැහැ, ආණ්ඩුවේ අය කොහෙන්ද කථා කරන්නේ කියලා. ඒ කියන පාඩුව පළමුවැනි නැවෙන් රුපියල් මිලියන 554යි; දෙවැනි නැවෙන් රුපියල් මිලියන 362යි; තුන්වැනි නැවෙන් රුපියල් මිලියන 1,318යි; හතරවැනි නැවෙන් රුපියල් මිලියන 471යි; පස්වැනි නැවෙන් රුපියල් මිලියන 598යි; හයවැනි නැවෙන් රුපියල් මිලියන 1,182යි; හත්වැනි නැවෙන් රුපියල් මිලියන 931යි; අටවැනි නැවෙන් රුපියල් මිලියන 1,588යි; නවවැනි නැවෙන් රුපියල් මිලියන 1,493යි; එකතුව රුපියල් මිලියන 8,497යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Bid bond එක

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

කීයද? ඇමෙරිකානු ඩොලර් මිලියන 147.5 deal එකට bid bond එක ඩොලර් බිලියන 14.75යි. ඒ කියන්නේ, දළ වශයෙන් රුපියල් බිලියන 45යි. දැනට මේ නැව් 9 නිසා සිදු වෙලා තිබෙන පාඩුව විතරක් බිලියන 8කට ආසන්න ගණනක් වෙලා තිබෙනවා. එතකොට bid bond එකත් මදි, මේ නැව් 25 ටෙන්ඩරයෙන්, මේ දක්වා ආපු නැව් 9න් වෙලා තිබෙන පාඩුව අය කර ගන්න. දන්නේ නැත්නම් කරුණු අධ්‍යයනය කරන්න කියලා මම කියනවා. මේ මම කියන ඒවා නොවෙයි, PUCSL එකේ වාර්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, PUCSL එකේ වාර්තාව අනුව පළමුවැනි නැවේ ගල් අඟුරුවලින් මෙගාවොට් 300ක් නිපදවන්න බැහැ, නිපදවන්න පුළුවන් මෙගාවොට් 287යි. දෙවැනි නැවෙන් මෙගාවොට් 292යි; තුන්වැනි නැවෙන් මෙගාවොට් 261යි; හතරවැනි නැවෙන් මෙගාවොට් 290යි; පස්වැනි නැවෙන් මෙගාවොට් 284යි; හයවැනි නැවෙන් මෙගාවොට් 268යි; හත්වැනි නැවෙන් මෙගාවොට් 274යි; අටවැනි නැවෙන් මෙගාවොට් 257යි; නවවැනි නැවෙන් මෙගාවොට් 260යි. මාලිමාවේ මන්ත්‍රීවරුත් හිටියා ඒ කමිටුවේ. එතුමන්ලාගෙන් මේ වාර්තා ඉල්ලලා අධ්‍යයනය කරන්න. නිකම් බොරුවට බයිලා ගහන්න එන්න එපා. ඒ වාගේම, මූල්‍ය නාස්තියට අමතරව විශාල පරිසර හානියක්ද සිදු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පෙරට වඩා සියයට 102කින් අළු ප්‍රතිශතය වැඩියි. එය සාමාන්‍යයෙන් සියයට 11යි තිබෙන්න ඕනෑ. හැබැයි, එහි සියයට 22 සිට 26 දක්වා තිබෙනවා. මේ වන කල් ආපු ඒ නැව් 9ම ප්‍රමාදයි. ප්‍රමාද ගාස්තු අය කර ගන්නේ නැතුව ඒගොල්ලන් reminder emails යවලා, 25වැනි නැව අප්‍රේල් මාසයේ 22වැනි දාට එන්නේ නැති නිසා තවත් සතියක වැඩිපුර කාලයකුත් දීලා තිබෙනවා. කවුද, මේ හුරතල් කරන්නේ? ඔන්න ඔතැනින් තමයි දූෂණය පිළිබඳව සැකය මතු වෙන්නේ. දැන් අමාත්‍යාංශයේ ලේකම්වරයා කියනවා, මේක terminate කරන්න පුළුවන් කියා නීතිපති උපදෙස් දීලා තිබෙනවා කියලා. නීතිපතිවරයා එහෙම උපදෙස් දීලා තිබියදීත් reminder emails යවලා, අද වනකල් නැව් 9න් ප්‍රමාද ගාස්තු - දඩ - අය කරන්නේ නැතුව ඉන්නවා. නැව් 11ක් ඇවිල්ලා තිබෙනවා, එතුමා දන්නේ නැති වුණාට. 11වැනි නැව බාමින් පවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, ප්‍රමිතියෙන් බාල මේ ගල් අඟුරු පාවිච්චි කිරීම නිසා දැන් ටර්බයිනවල තාප ධාරිතාව සෙල්සියස් අංශක 565ට වඩා ඉහළ ගිහින් තිබෙනවා. සෙල්සියස් අංශක 565ට උඩින් ගිය නිසාම විනාඩි 15ක් ඇතුළත මේක වහන්න ඕනෑ. ඒක වැහුවොත් මොකද වෙන්නේ? එතකොට විදුලි ජනනය නතර වෙනවා. දැන් ඒක කරමින් තමයි යන්නේ. මේ වාර්තා අනුව තිබෙන්නේ ඒවා. එහෙම වුණාට පස්සේ මේ ටර්බයින් එකේ බ්ලේඩ් එකක් කැඩුණොත්, විදුලිබල මණ්ඩල වාර්තා අනුව ඒක හදන්න රුපියල් මිලියන 100ක් යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා කරුණු දන්නේ නැතිව හෝදන්න එපා. වැරැද්දක් වුණා නම් වැරැද්ද පිළිගන්න. වැරැද්ද පිළිගෙන අඩුපාඩු හදාගන්න. මොකද, අපට කිසිසේත්ම කාලකණ්ණි ආසාවක් නැහැ මේවා වෙන්න ඉඩ දීලා, කරන්ට් කපන්න ඉඩ දීලා ඒ මතින් දේශපාලනය කිරීමට. අපි දන්නේ නැහැ, ඒකට කැමැති වෙන වෙන දේශපාලන පක්ෂ ඇති. නමුත්, අපට එහෙම කිසිම වුවමනාවක් නැහැ. මොකද, ඔබතුමන්ලාට අවුරුදු 5කට බලය දීලා තිබෙන්නේ. මාස 16න් හුණ්ඩුවක් කරපු රට නිධානයක් කරන්න තවත් මාස 44ක් ඉතිරිව තිබෙනවා. ඒ කාලය තුළ මේ වැරදි පාර වෙනුවට හරි track එකට එනවා නම් ප්‍රශ්නයක් නැහැ.

ඊයේ ගරු ජනාධිපතිතුමා කිව්වා, දැන් මැදපෙරදිග තත්ත්වයත් එක්ක ඇති වෙන්න පුළුවන් ආර්ථික පාඩුව පිළිබඳව විශ්ලේෂණයක් රටට ඉදිරිපත් කරනවා කියලා. අපි මුදල් නියෝජ්‍ය ඇමතිතුමාට කිව්වා, ඒක එළියට දමන්න එපා කියලා. ඒක එළියට දමපු ගමන් මොකද වෙන්නේ? සංචාරක කර්මාන්තය අඩපණ වෙනවා; විදේශ ආයෝජන අඩපණ වෙනවා. ඒක රටේ ආර්ථිකයට බලපානවා. ඒ නිසා අපට ඒ වාගේ කාලකණ්ණි ආසාවක් නැහැ. ඒ වාගේම, මේ panicked තෙල් පෝලිමක් හැදුවාමත් අපි මිනිස්සු form කළේ නැහැ. අපි කිව්වේ, මේක panicked තෙල් පෝලිමක් කියලායි. ඊයේ යුද්ධය ආවා කියලා අද තෙල් නැති වෙන්නේ නැහැ. හැබැයි, මම එකක් කියන්න ඕනෑ. ඔබතුමන්ලා කිව්වා, පසුගිය ආණ්ඩු මේවා හැදුවේ නැහැ කියලා. ඇත්තවශයෙන්ම 88-89 කාලයේ වී මෝල් ගිනි තියපු විධියට,පෙට්‍රල් ෂෙඩ් ගිනි තියපු විධියට, බවුසර් ගිනි තියපු විධියට මේ රට මේ ගාණෙන් තිබෙන එකත් හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවාත් මතක් කරගන්න, දන්නේ නැත්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගල් අඟුරු වංචාව ගැන නැවත වතාවක් කිව්වොත් ඉතාම පැහැදිලිව අපි කියන්න ඕනෑ, මේක හෝදන්න එපා කියලා. දැන් නිල නොවන වශයෙන් වැරැද්ද පිළිඅරගෙන නේ තිබෙන්නේ. ඒක නේ emergency procurement එකක් කරන්නේ. Emergency procurement එකක් කරන්න ඕනෑ නැහැ නේ, හරියාකාරව ගල් අඟුරු එනවා නම්, පාඩුවක් වෙලා නැත්නම්; අළු ප්‍රතිශතය හරි නම්, මෙගාවොට් 300 ජනනය වෙනවා නම්. එහෙම වෙනවා නම් ඒක කරන්න ඕනෑ ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඒක කරන්න ඕනෑද? ඒ නිසා අපි ඉතාම පැහැදිලිව ඔබතුමන්ලාට මේ කාරණය කියන්න කැමැතියි. හරි දේට හරි කියන්න අපි ලැහැස්තියි. ඒ වාගේම, වැරදි දේ විවේචනය කරන්න, ඒකට විරුද්ධව කටයුතු කරන්නත් අපි ලැහැස්තියි. ඒ වාගේම, මේ නැව් 9න් වෙලා තිබෙන පාඩුව මිලියන 8,497ක් කියලා ගණන් හදලා තිබෙන්නේ, පෙර පැවැති තෙල් මිලට අනුව. ඊයේ ලෝක වෙළෙඳ පොළේ සියයට 15කින් තෙල් මිල වැඩි වුණා. එතකොට මේ මිලියන 8,497 සියයට 15කින් වැඩි වෙන්න ඕනෑ. ඇයි? ගල් අඟුරු නැති වුණාම ඊළඟට යන්න වෙන්නේ තෙල්වලට. ඒ නිසා විදුලි බිල වැඩි කරලා, විදුලි ඒකකයේ ගණන වැඩි කරලා මේ පාඩුවේ බර මේ රටේ ජනතාව පිට දමන්න අපි මේ ආණ්ඩුවට ඉඩ දෙන්නේ නැහැ කියන එක කියන්න ඕනෑ.

මම එදා පාර්ලිමේන්තුවේ කථාව කරලා කමිටු ශාලාවකට ගියාට පස්සේ අර කවුද මන්ත්‍රී කෙනෙක් - මට නම මතකත් නැහැ, අර fake profiles භාර මන්ත්‍රීවරයා - "කෝ, මරික්කාර්, කෝ, මරික්කාර්" කියලා අහලා තිබුණා. මරික්කාර් ඉන්නවා. ඊයේ නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් අහලා තිබුණා. මරික්කාර් ඉන්නවා. මරික්කාර් නඟන චෝදනාවලට උත්තර දෙන්න, වටේ යන්නේ නැතිව. අපි නඟන චෝදනාවලට, නඟන තර්කවලට, ඔප්පු කර පෙන්වන මේ කරුණුවලට උත්තර දෙන්න කියන්න. ගල් අඟුරු ෆේල් නැත්නම් දඩ ගහන්න ඕනෑ නැහැ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇයි, දඩ ගහන්නේ? දඩ ගහලා තිබෙන්නේ ඒවා ප්‍රමිතියෙන් බාල නිසා. ඒ නිසා ඒවාට උත්තර දෙන්න කියන්න. බලශක්ති ඇමතිතුමාත් සභාවේ නැහැ, නියෝජ්‍ය ඇමතිතුමාත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැවත වතාවක් මට කියන්න තිබෙන්නේ, අනික් ඒවා අහන්න කලින්, අර මහින්ද රාජපක්ෂගේ චෙක් එකේ අංකයයි, සල්ලියි ගෙනෙන්න කියන්න, උගන්ඩාවේ සල්ලි ගෙනෙන්න කියන්න, කැබ් පුරවපු file ටිකේ විස්තර ටික හොයන්න කියන්න, රාජපක්ෂලාගේ ධනය ගෙනෙනවා කියපු ඒවා ගෙනෙන්න කියන්න. නැවත වතාවක් මම කියනවා, අවුරුදු එකහමාරකට කලින් පොරොන්දු වෙච්ච, විදුලි බිල තුනෙන් එකකින් අඩු කරනවා කියපු එක කරන්න කියන්න. ඒ වාගේම, වරායෙන් බාන ගාණට දෙනවා කියපු තෙල් දෙන්න කියන්න. තමුන්නාන්සේලාට පුළුවන් කියලා නේ ගත්තේ. ඒ වාගේම, ආහාර, අධ්‍යාපන සහ සෞඛ්‍යයෙන් VAT බින්දුවට ගෙනෙනවා

කිව්වා නේ. එහෙම සුරංගනා කථා කියලා, සුරංගනා චිත්‍ර මවලා, මිනිස්සු සිහින ලෝකයකට පා කරගෙන ගිහින් ඉවරවෙලා වැඩේ කරගන්න බැරිව, කන්ටේනර් 323 වංචාව වෙන්න ඉඩ දීලා, ගල් අඟුරු වංචාව වෙන්න ඉඩ දීලා, ඒ ඔක්කොම වෙන්න ඉඩ දීලා මේකට හුණ්ඩුව කියන්න එපා.

මගේ කථාව අවසන් කරන්න කලින් මේ කාරණයත් කියන්න ඕනෑ. සුරේෂ් සලේව අත්අඩංගුවට අරගෙන ගල් අඟුරු වංචාව වහන්න බැහැ. සුරේෂ් සලේ නොවෙයි, ගෝඨාභය රාජපක්ෂ වුණත් පාස්කු ඉරුදින ප්‍රහාරයට වග කියනවා නම් අත් අඩංගුවට ගන්න ඕනෑ.

අපේ රටේ ලයිසන් වණ්ඩි නැහැ. 2009 කාලයේ මිනී මරන්න, මාධ්‍ය ආයතනවලට බෝම්බ ගහන්න, මාධ්‍යවේදීන් මරන්න ලයිසන් එකක් දීලා නැහැ. මේ කාරණය පිළිබඳව අපේ අවුලක් නැහැ. සුරේෂ් සලේ නොවෙයි, ඕනෑම කෙනෙක් අත්අඩංගුවට ගන්න. හරිද? හැබැයි, ඒකෙන් අනෙකුත් ඒවා වහන්න බැහැ. ඒ වාගේම මම කියන්න ඕනෑ, අපේ රට හුණ්ඩුවක් නොවෙයි කියන එක. මේ රට අපට නම් මහා මෙරක් කියන එකත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වේ මේ තත්ත්වය 2014, 2021, 2022දීත් සිද්ධ වෙලා තිබෙනවා කියලායි. ප්‍රමිති පරාසයෙන් පිටත අගයෙන් ගල් අඟුරු ඇවිල්ලා තිබෙන එක පිළිගත්ත නිසා තමයි දෙගුණයක දඩ මුදල් අය කරලා තිබෙන්නේ. ඔබතුමාගෙන් මම අහන නිශ්චිත ප්‍රශ්නය වුණේ මේකයි. ගල් අඟුරු ගෙන්වීමේදී වංචාවක් වෙලා තිබෙනවා කියලා දැන් ඔබතුමා දෙතුන් වතාවක් කිව්වා නේ. ඒ මුදල් ගියේ කාගේ ගිණුමට ද? කාටද ගියේ? ඔබතුමා කලින් කිව්වා නම් file ඔක්කෝම ටික පරීක්ෂා කරලා ඉවර වුණාට පස්සේ මේක කරනවා, චීනයේ වෙක්පත් අංක ඔක්කෝම ටික දැම්මාට පස්සේ කරනවා කිව්වා නම් ඒක හරි. හැබැයි, එදා එහෙම කථාවක් කිව්වේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. දැන් ඔබතුමා මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට කථා කරන්න මම විනාඩියක් දෙන්නම්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නමත් කියලා, මගෙන් ප්‍රශ්නයකුත් ඇහුවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩියක් දෙන්නම්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට ඕනෑ උත්තර මම දෙන්නේ නැහැ. ඒගොල්ලන් හිතාගෙන ඉන්නවා, ඒගොල්ලන් කියන විධියට අපි නටන්න ඕනෑ කියලා. අපි එහෙම ලෑස්ති නැහැ. 2014-2015 කාලයේ වරදක් වෙලා තිබෙනවා නම්, 2014දී රාජපක්ෂ පාලන කාලයේ වරදක් වෙලා තිබෙනවා නම් ඒවා හොයන්න. දැන් ආණ්ඩුව ඔයගොල්ලන්ගේ, ජනාධිපති ඔයගොල්ලන්ගේ, පළාත් පාලන ආයතන බහුතරයක් ඔයගොල්ලන්ගේ, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලය ඔයගොල්ලන්ගේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම නඟපු තර්කයට උත්තර දෙන්නේ නැහැ. දූෂණය කියන එක පිළිබිඹු වෙන්නේ නැව් 9ම Agreement එකේ තිබෙන දවස්වලට වඩා පරක්කු වෙලා ආවාම. නැව් 9 නොවෙයි නැව් 11ම. හැබැයි, Agreement එක අනුව termination එකට යන්න පුළුවන්කම තිබෙනවා කියලා නීතිපතිවරයා උපදෙස් දීලා තිබියදී, terminate නොකර, දඩත් නොගහා, reschedule කරලා තවත් සතියක වැඩිපුර කාලයක් දෙන්නේ දූෂණය නිසා නොවෙයිද කියන එක තමයි මම අහන්නේ. දූෂණයක් වෙලා නැත්නම්, එතැන දූෂණයක් වෙලා නැහැ කියලා ඔප්පු කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කන්දසාමි ප්‍රභූ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.35]

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நாங்கள் இச்சபையில் நுண்நிதி மற்றும் கடன் ஒழுங்குபடுத்தும் அதிகாரசபை சட்டமூலம் தொடர்பாக விவாதித்துக்கொண்டு இருக்கின்றோம். கடந்த காலங்களில் நுண் நிதிக் கடன் தொடர்பாகப் பல்வேறு விமர்சனங்கள் மக்கள் மத்தியில் இருந்தன. இந்தச் சட்டமூலத்தினூடாக அவற்றை நிவர்த்தி செய்வதற்கான தேவை அரசாங்கம் என்ற ரீதியில் எங்களுக்கு இருக்கின்றது.

நான் நினைக்கின்றேன், நுண்நிதிக் கடன் வழங்கும் திட்டமானது பங்களாதேஷ் நாட்டில்தான் முதலில் உருவாக்கப்பட்டது என்று. அங்கு கிராமங்களில் இருக்கின்ற சிறு கைத்தொழிலாளர்களை இனங்கண்டு, அவர்களுக்குக் குறைந்த வட்டி வீதத்தில் சிறிய தொகை கடன்களை வழங்கி, அதனூடாக அவர்களைப் பொருளாதார ரீதியாக வளர்ச்சியடையச் செய்வதுதான் இதன் நோக்கமாக இருந்தது. பங்களாதேஷ் போன்ற நாடுகள் பொருளாதார அபிவிருத்தியை எட்டடுவதற்கு இது காரணமாக அமைந்திருந்தது. மேலும், நிதி மூலங்களை உருவாக்கி, கிராமங்களில் இருக்கின்ற சிறு தொழில்முயற்சியாளர்களுக்குக் கடன்களை வழங்கி, அதனூடாக அவர்களின்

[ගරු කන්දසාමි ප්‍රභූ මහතා]

பொருளாதாரத்தை வளர்ச்சியடையச் செய்து, அவர்களது வாழ்க்கையை முன்னேற்றுவதற்கும் இது காரணமாக அமைந்திருந்தது.

தேசிய மக்கள் சக்தி அரசாங்கம் இந்த நாட்டைப் பொறுப்பேற்றதன் பின்னர், நுண் கடன்களினூடாக மக்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகளை இனங்கண்டது. அவற்றைத் தீர்ப்பதற்காகவே இந்தச் சட்டமூலத்தை அரசாங்கம் கொண்டுவந்து இருக்கிறது. இதன்மூலம் அவர்களைப் பாதிப்பிலிருந்து மீட்டெடுப்பதுதான் எங்களுடைய நோக்கமாக இருக்கின்றது. தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, எப்போதும் மக்கள் நலனைக் கருத்திற்கொண்டுதான் சட்டங்களை உருவாக்கும். இந்தச் சட்டமூலத்தை நிறைவேற்றுவதன்மூலம் சில விடயங்களை மேற்கொள்ளவேண்டி இருக்கின்றது. குறிப்பாக, கட்டுப்பாடு, ஒழுங்கமைப்பு, கண்காணிப்பு, பரிசீலனை போன்ற விடயங்களை மேற்கொள்ளவேண்டி இருக்கின்றது. இவற்றின் ஊடாகத்தான் நுண்கடன் நிறுவனங்களை நாங்கள் கட்டுப்படுத்தக்கூடியதாக இருக்கும்.

நுண்கடன் நிறுவனங்கள் வறிய மக்களை இலக்காகக் கொண்டே கடன்களை வழங்கிக்கொண்டு இருக்கின்றன என்பது உங்களுக்குத் தெரியும்! 2009ஆம் ஆண்டு யுத்தம் நிறைவடைந்ததன் பின்னரே இந்தக் கடன் வழங்குகின்ற நிலைமை ஏற்பட்டது. யுத்த சூழ்நிலையாலும் இயற்கை அனர்த்தங்களாலும் பாதிப்பை எதிர்கொண்ட வடக்கு, கிழக்கு போன்ற பிரதேசங்களிலுள்ள மக்களது அவசர நிதித் தேவையைப் பூர்த்திசெய்துகொள்வதற்காகவே இந்த நுண்கடன் திட்டம் உருவாக்கப்பட்டு இருந்தது.

விசேடமாக, பெண் தலைமைதாங்கும் குடும்பங்களை இலக்காகக் கொண்டே நுண் கடன்கள் வழங்கப்பட்டு இருந்தன. மேலும், கிழக்கத்திய நாடுகளில் தொழில்புரிகின்றவர்களின் குடும்பங்களை இலக்காகக் கொண்டும் இந்த கடன்கள் வழங்கப்பட்டிருந்தன. இந்தக் கடன்கள் அதிக வட்டி வீதத்தை உடையதாகவும் வாராந்த முறையில் அறவிடக்கூடிய தவணை முறையைக் கொண்டதாவும் அமைந்திருக்கின்றன. கடன்பெற்றவர்கள் கடனைச் செலுத்தத் தவறும்பட்சத்தில், அவர்களிடமிருந்து மேலதிக வட்டியை அறவிடுகின்ற முறைமையும் இத்திட்டத்தில் உருவாக்கப்பட்டு இருந்தது. பெண்கள் நுண்கடன் நிதி நிறுவனங்களிடமிருந்து கடனைப் பெற்று தொழில்முயற்சிகளை மேற்கொள்ளும்போது, அந்தக் கடனைத் திருப்பிச் செலுத்த முடியாத சந்தர்ப்பத்தில், வேறு நிதி நிறுவனங்களிடம் இருந்து இன்னுமொரு கடனைப் பெறுகிறார்கள். இவ்வாறு கடனுக்கு மேல் கடன் பெறுவதால் அவர்கள் அழுத்தங்களுக்கு உள்ளாகி, இறுதியில் மன அழுத்தத்துக்கும் உள்ளாகி, தற்கொலை செய்யக்கூடிய நிலைக்கு உள்ளாகிறார்கள். இவ்வாறானதொரு நிலைமையை இந்த நுண்கடன் உருவாக்கியிருக்கிறது. மட்டக்களப்பு மாவட்டத்தில் கூடுதலான தற்கொலைச் சம்பவங்கள் இடம்பெற்றுக்கொண்டு இருக்கின்றன. நுண் கடன் வழங்கும் நிதி நிறுவனங்களின் தொல்லைகளும் இதற்கு ஒரு காரணமாக அமைந்திருக்கின்றது.

அந்த வகையில், வறிய மக்களாகிய அவர்களுக்கு நிவாரணங்களை வழங்கி, அவர்களைப் பாதுகாக்க வேண்டிய பொறுப்பு எமது அரசாங்கத்துக்கு இருக்கின்றது. அதிகார வர்க்கத்தைக்கொண்ட தரப்பினர் கடந்த காலங்களில் நிதி நிறுவனங்களை உருவாக்கியிருந்தார்கள். கடந்த காலங்களில் இந்தப் பாராளுமன்றத்தில் அமைச்சர்களாக, பாராளுமன்ற உறுப்பினர்களாக இருந்தவர்களும்கூட, இதில் சம்பந்தப்பட்டு இருக்கிறார்கள். அவர்களது பெயரிலும் அவர்களுடன் சம்பந்தப்பட்டவர்களின் பெயரிலும் நிதி நிறுவனங்கள் உருவாக்கப்பட்டு இருந்ததையும், அவர்கள் மக்களைத் தொல்லைப்படுத்தி இருந்ததையும் நாங்கள் அவதானிக்கக் கூடியதாக இருந்தது.

இந்தச் சட்டமூலத்தின்மூலம் கடன் மற்றும் சேமிப்பு விடயங்களை நாங்கள் கண்காணிக்க முடியும். இந்த நிதி நிறுவனங்கள் மத்திய வங்கியின் கண்காணிப்பின்கீழ் இருந்தாலும்கூட, அதற்கு மேலதிகமாக இந்தச் சட்டமூலத்தின் ஊடாக நாங்கள் கண்காணிப்பை மேற்கொள்ள முடியும். உதாரணத்துக்கு, இந்த நிதி நிறுவனங்கள் வறிய மக்களை இலக்காகக் கொண்டுதான் கடன்களை வழங்குகின்றன. அவ்வாறு கடன்களை வழங்கும்போது, அவர்களிடம் சில ஆவணங்களில் கையொப்பத்தைப் பெற்றுக் கொள்கின்றன. அந்த ஆவணங்களில் இருக்கின்ற விடயங்கள் தொடர்பில் அந்த மக்களுக்கு எந்தவொரு தெளிவுமில்லை. அவர்களுக்கு அதன் பிரதிகள்கூட வழங்கப்படாத நிலையில்தான் கடன்கள் வழங்கப்படுகின்றன. இறுதிக் கட்டத்தில் கையொப்பமிட்ட ஆவணங்களில் குறிப்பிடப்பட்டுள்ள விடயங்களைச் சுட்டிக்காட்டி, அவர்களிடமிருந்து மேலதிக வட்டியை அறவிடுகின்ற நிலைமையையும் நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. இதனால் அவர்கள் இக்கட்டானதொரு சூழ்நிலைக்குள் தள்ளப்படுகின்றார்கள். குறித்த ஆவணங்களிலுள்ள விடயங்களை அறியாத நிலையில் அல்லது அவற்றில் என்ன இருக்கின்றது என்பதை அறியாமல் கையொப்பமிடுவதால் அவர்கள் இறுக்கமான கட்டுப்பாட்டுக்குள் செல்லவேண்டி இருக்கின்றது.

இவ்விடயம் தொடர்பில் ஒருசில தகவல்களை மட்டக்களப்பு மாவட்டத்திலே என்னால் பெற்றுக்கொள்ளக்கூடியதாக இருந்தது. அங்கிருக்கின்ற நுண்நிதி நிறுவனங்களால் 10 கோடி ரூபாய் கடன் வழங்கப்பட்டு இருக்கின்றது. அதில் 7 கோடி ரூபாய் இப்போது நிலுவையாக இருக்கின்றது. இதில் புதிய முறைமை ஒன்றைக் கண்டுபிடித்து இருக்கிறார்கள். அதாவது, தொலைபேசிமூலம் கடன்களை வழங்குகின்ற முறைமையைக் கண்டுபிடித்து இருக்கிறார்கள். அண்மையில் இவ்வாறு கடன்பெற்ற சுகாதாரத்துறை சார்ந்த ஊழியர் ஒருவர் தற்கொலை செய்துகொண்டதை எங்களால் அறியக்கூடியதாக இருந்தது. டிஜிட்டல் முறைமை வளர்ச்சியின் ஒரு சில தாக்கங்களை இப்படியான விடயங்களிலும் நாங்கள் உணரக்கூடியதாக இருக்கின்றது. சிறந்த நோக்கத்துக்காக உருவாக்கப்பட்ட இந்த நுண்நிதி நிறுவனங்கள், இன்று மக்களுக்குத் தொல்லை ஏற்படுத்துகின்ற நிறுவனங்களாக மாறியிருக்கின்றன. எனவே, பொருளாதார ரீதியாகவும் உளரீதியாகவும் தொடர்ச்சியாகப் பாதிக்கப்படுவதிலிருந்து மக்களைப் பாதுகாக்கவேண்டிய தேவை இருக்கின்றது.

இன்னுமொரு முக்கியமான விடயத்தை நான் இந்த இடத்தில் குறிப்பிடலாமென நினைக்கின்றேன். இன்று இலங்கைக் கலைஞர்கள் தங்களது திறமைகளை வெளிப்படுத்திக்கொண்டு இருக்கிறார்கள். விசேடமாக, எங்களுடைய இலங்கைத் தமிழ்க் கலைஞர்கள் இந்திய சினிமாவில் நுழைந்து தங்களது திறமைகளை வெளிப்படுத்திக்கொண்டு இருக்கிறார்கள். பல புதிய சினிமாப் படங்களை உருவாக்கி, அதில் வெற்றி பெறுவதற்கான முயற்சிகளில் அவர்கள் ஈடுபட்டுக்கொண்டு இருக்கிறார்கள்.

அண்மையில் இந்திய சினிமாவும் இலங்கை சினிமாவும் இணைந்ததாக, இசைஞானி இளையராஜா அவர்களின் இசையமைப்பில் 'அந்தோனி' என்ற திரைப்படம் உருவாக்கப்பட்டு இருக்கின்றது. இந்தத் திரைப்படம் தமிழ், சிங்களம், மலையாளம் ஆகிய மொழிகளில் உருவாக்கப்பட்டு இருக்கின்றது. இந்தத் திரைப்படத்துக்கு எங்களுடைய இலங்கைத் திருநாட்டில் பிறந்தவரே முதலீடு செய்திருக்கிறார். அதில் எங்களது நாட்டுக் கலைஞர்களும் தங்களது திறமைகளை வெளிப்படுத்தி இருக்கிறார்கள். எனவே, நாங்கள் இலங்கையில் தமிழ் சினிமாத்துறையை வளர்க்கவேண்டி இருக்கின்றது. யுத்தத்துக்கு முன்னர், இலங்கையில் தமிழ் சினிமாத்துறை வளர்ந்திருந்தது. யுத்தத்துக்குப் பின்னர் அவர்களுக்கான சந்தர்ப்பம் குறைவாக இருந்ததனால் வளர்ச்சியடைய முடியவில்லை. எனினும், தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் காலத்தில் தமிழ் கலைஞர்களுக்கான நலனைப் பெற்றுக்கொடுப்பதற்கான முயற்சிகளை நாங்கள் மேற்கொள்வோம். இந்த 'அந்தோனி' திரைப்படம் சர்வதேச ரீதியில் புகழ்பெற்று, எங்களுடைய நாட்டுக்குப் பெருமை சேர்த்துத்தருமெனக் கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி, வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.44]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற நுண்நிதி மற்றும் கடன் ஒழுங்குபடுத்தும் அதிகாரசபை சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன். உண்மையிலேயே நுண்கடன் விடயத்தில் மிக மோசமாகப் பாதிக்கப்பட்ட பிரதேசங்கள் வடக்கு, கிழக்குப் பிரதேசங்களாகும்.

அங்கு போர் முடிவடைந்தவுடன், அந்த மக்கள் கிட்டத்தட்ட 30 வருடங்கள் பொருளாதார ரீதியாக மிகவும் பாதிக்கப்பட்டு பின்னிலையில் இருந்த சூழலில், அன்றிருந்த அரசாங்கம் எந்தவிதமான வசதிகளையும் அவர்களுக்கு ஏற்படுத்திக் கொடுக்காமல், நாட்டின் ஏனைய பிரதேசங்களில் வாழ்கின்ற மக்களோடு போட்டிபோடுகின்ற நிலைக்குத் தள்ளியது. அவர்களால் நின்றுபிடிக்க முடியாதளவுக்கு அந்தப் போட்டித்தன்மை இருந்த நிலையில், அவர்கள் பாரிய பொருளாதார நெருக்கடிக்குள் தள்ளப்பட்டார்கள். குறிப்பாக, புருஷன்மாரை இழந்த பெண்கள் தங்களுடைய குடும்பத்தையும் வாழ்வாதாரத்தையும் பாதுகாப்பதற்காக நுண்கடனில் சிக்குண்டு மிக மோசமாகப் பாதிக்கப்பட்டார்கள். வடக்கு, கிழக்குப் பிரதேசங்களில் நிகழ்கின்ற தற்கொலைகள் பிரதானமாக நுண்கடன் காரணமாகவே நடைபெற்றன என்பது அனைவருக்கும் தெரிந்த விடயமாகும்.

இலங்கை மத்திய வங்கியின் முன்னாள் ஆளுநர் திரு. இந்திரஜித் குமாரசுவாமி அவர்கள் வடக்குக்கு விஜயம் செய்ததன் பிற்பாடு -யாழ்ப்பாணம் உட்பட- இந்த நுண்கடன் சம்பந்தப்பட்ட பிரச்சினை எந்தளவுக்கு ஆழமானது என்பதை அறிந்து கொண்டார். அதற்குப் பிற்பாடு அவர், நுண்கடனால் பாதிக்கப்பட்ட மக்களுடைய கடன்கள் அனைத்தையும் அரசாங்கம் பொறுப்பேற்க வேண்டும் என்ற அளவுக்கு, அது slavery போன்ற பாரதூரமான நிலைமையை உருவாக்கி இருக்கின்றது என்ற கருத்தைத் தெரிவித்து, அதைக் கணிசமாக முன்னிலைக்குக் கொண்டுவந்தார். அந்த அடிப்படையில், இந்த நுண்கடன் சம்பந்தப்பட்ட விடயங்களைக் கையாள்வதற்குரிய சட்டமூலங்களைக் கொண்டுவர வேண்டும் என்பதை நான் உட்பட எங்களுடைய வட, கிழக்கைச் சார்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் வலியுறுத்தி வந்திருக்கின்றோம் என்பதை இங்கு பதிவுசெய்ய விரும்புகின்றேன்.

நாங்கள் கொள்கையளவில் இவ்வகையான சட்டங்களைக் கொண்டுவருவதை வரவேற்கின்றோம். நாங்கள் அதை எதிர்க்கப்போவது இல்லை. ஆனாலும், இந்தச் சட்டமூலம் உண்மையிலேயே 2023ஆம் ஆண்டு கொண்டுவரப்பட இருந்த ஒரு சட்டமூலமாகும். அதிலுள்ள குறைபாடுகளை நிவர்த்திசெய்து, அதனைக் கொண்டு வருவதாகக் கூறப்பட்ட நிலையில்தான் இந்தச் சட்டமூலம் கொண்டுவரப்பட்டு இருக்கிறது. இந்தச் சட்டமூலத்தில் இருக்கக்கூடிய குறைபாடுகளைச் சுட்டிக்காட்ட வேண்டிய கட்டாயத் தேவை எங்களுக்கு இருக்கின்றது. யுத்தம் நடைபெற்ற காலப்பகுதி மிகவும் கஷ்டமான காலப்பகுதி என்பது உங்களுக்குத் தெரியும்! அந்தக் காலப்பகுதியில் வட, கிழக்கில் வங்கிகள் பெரியளவில் கடன் கொடுப்பதில்லை; கடன் கொடுப்பதற்கான ஏற்பாடுகளும் அங்கு இருந்ததில்லை. யுத்தம் காரணமாக அரசாங்கங்கள் அதைத் தடைசெய்தும் இருந்தன. அப்படிப்பட்ட சூழலில், வட, கிழக்கிலுள்ள எங்களுடைய மக்கள் சமூக ரீதியாகவே கடனைப் பெற்றார்கள்.

ஒரு சமூகத்துக்குள் இருக்கக்கூடிய குறிப்பிட்டதொரு மக்கள் கூட்டம் தங்களுடைய சொந்த முயற்சியால் ஒரு நிதியத்தை உருவாக்கி, அவர்களுக்கிடையில் சமூக ரீதியாகக் கடன்களைக் கொடுத்து, அவர்களுக்குத் தேவைப்படுகின்ற உதவிகளைச் செய்து, அவர்களுடைய வாழ்வாதாரத்தை ஏதோ ஒரு வகையில் தக்கவைத்துக்கொண்டு வந்தார்கள். உண்மையிலே இது பாதிக்கப்பட்ட ஒரு பெண்ணுக்கு அல்லது நபருக்கு மிகப் பெரியதோர் உதவியாக இருந்தது. இவ்வாறு அவர்களுக்குப் பாரிய பலமாக இருந்த இந்தக் கலாசாரம் போர் காலத்தில்கூட வட, கிழக்கில் இருந்தது. Community-based credit providers என்று சொல்லப்படுகின்ற இந்த முறைமை எங்களுடைய மக்களுக்கு மிகப் பெரியளவில் பலத்தைக் கொடுத்த ஒரு முறைமை ஆகும். இன்று கொண்டுவரப்பட்டுள்ள சட்டவரைவானது, இந்த முறைமையைக்கூட பாதிக்கின்றது. ஏனென்றால், ஒரு கிராமத்தில் 10-15 பேர் இணைந்து, தாங்கள் சேகரிக்கின்ற நிதியை வட்டி இல்லாமல் தங்களுக்கிடையில் சுழற்சி முறையில் பங்கிட்டு உதவி செய்கின்ற விடயத்தைக்கூட இந்தச் சட்டமூலம் உள்வாங்குமானால், அவர்கள் அந்தப் பணியைச் செய்ய முடியாத நிலைக்குத் தள்ளப்படுவார்கள். எனவே, இந்த விடயம் அந்த மக்களைப் பாதிக்கக் கூடாது. உண்மையிலே இது அவர்களைப் பலப்படுத்த வேண்டிய ஒரு விஷயமாக இருக்க வேண்டுமே தவிர, கட்டுப்படுத்துகின்ற விஷயமாக இருக்கக் கூடாது. இந்தச் சட்டமூலத்துக்கு அவசரமாகத் திருத்தத்தைக் கொண்டுவந்து, இன்றைக்கு இதை நிறைவேற்றாமல், community credit providers என்ற விடயத்தை இந்தச் சட்டமூலத்திலிருந்து நீக்க வேண்டுமென நான் தயவுடன் கேட்டுக் கொள்கின்றேன். அப்படிச் செய்யாவிட்டால், வட, கிழக்கில் மிகவும் மோசமாகப் பாதிக்கப்பட்ட எங்களுடைய மக்களின் குறிப்பாக பெண்களுடைய வாழ்வாதாரத்தைக் கேள்விக்குட்படுத்துகின்ற ஒரு விஷயமாக இது நிச்சயமாக மாறும்.

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

நுண்கடன் பெறுவதில் 85-90 சதவீதமானவர்கள் பெண்களாக இருக்கின்ற நிலையில், இதனுடன் தொடர்புடைய அதிகாரசபையில் - authorityஇல் - கடமைக்காக மட்டுந்தான் பெண்கள் இணைக்கப்பட்டு இருக்கிறார்கள். இதுதான் பிரதான விமர்சனம்! ஏனென்றால், பெண்களுடைய சூழ்நிலையை விளங்கிக்கொள்வதற்கு அவர்களுடைய பங்களிப்பு அதில் இருப்பது மிகவும் முக்கியமானது. அதை இந்தச் சட்டமூலம் கொண்டிருக்கவில்லை.

Sir, the Bill destroys grassroots and community credit mechanisms by subsuming them under moneylending. The grassroots community organizations founded on the principles of solidarity, mutual aid, participatory governance and economic justice are not moneylenders operating for profit. இது அவர்கள் இலாப நோக்கில் நடத்துகின்ற விடயம் அல்ல.

The Bill imposes a microfinance identity on community credit practitioners. Women's groups created in line with the IRDP and also by UN organizations, working for over three decades to build community assets and ensure the education and well-being of women are forcibly incorporated as microfinance institutions, destroying their identity and autonomy. Despite consumer protection being the core objective, the Bill fails to introduce legal enforcement mechanisms to ensure it. Nor does the Bill establish regulations to curb profit-driven lending.

The Bill also proposes to expand the outreach of the Credit Information Bureau, CRIB - this is very important, Sir - to the grassroots. Predatory microfinance lending by big finance companies has harmed the credit profiles of low-income borrowers and have got them enrolled in the CRIB as bad debtors. More than 85 per cent of the rural people are in the CRIB as bad debtors and are unable to access cheap and safe credit. Expanding the CRIB without addressing the financial disenfranchisement of the low-income people will aggravate the problems by pushing them permanently into the hands of moneylenders, Sir.

The right of communities to collectively organize credit is not a novel concept, but a fundamental tradition and a right now enshrined in the international law. The UN Declaration on the Rights of Peasants and Other People Working in Rural Areas -UNDROP- adopted on 17th of December, 2018 upholds these collective community rights while recognizing how such collective rights as well as community property or the commons, in everyday parlance, have been expropriated and are under threat, as a result of neoliberal reforms.

Therefore, Sir, these community-based credit providers must be made exempt from this Bill. You can bring in some other law to try and regularize their provisions. But, certainly, their coming under this particular Microfinance and Credit Regulatory Bill is going to disenfranchise them; it is going to seriously affect the women and the extremely vulnerable people with a low-income, particularly in the war-affected North and the East.

Sir, finally, I wish to raise just one other matter. Assume that we are willing to accept this Bill related to microfinance. Any case filed against defaulters is done by the organizations via their registered offices. So, if the registered office is in Colombo and the loan had been given to somebody in Jaffna, then that person has to come to Colombo. That is completely ridiculous! Microfinance primarily targets the most vulnerable sections of the society. Expecting defaulters from one end of the country to come all the way to Colombo simply because their financial institutions are registered in Colombo and not filing those recovery processes in their respective areas or where the defaulters are, you are effectively making it impossible for them to come and defend themselves. Therefore, I plead that the Civil Procedure Code be amended so that when it comes particularly to filing cases, those could be filed in the areas where the defaulters are, which would help those people to defend themselves and they would not be disenfranchised in the way they are currently being disenfranchised.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Presiding Member, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Sir, the Hon. Minister of Fisheries, Aquatic and Ocean Resources is here. கௌரவ அமைச்சர் அவர்களே, அன்னை வேளாங்கண்ணி கடற்றொழில் சங்கத்தைச் சேர்ந்த செல்வராஜா ராஜ்குமார், தங்கராஜா அமல்ராஜ் என்ற இரண்டு மீனவர்கள் 6 நாட்களுக்கு முன்னர் கடலில் காணாமல் போயுள்ளனர். இவர்கள் இருவரையும் கச்சதீவில் கண்டதாக இந்திய மீனவர்கள் இலங்கையில் இருக்கக்கூடிய இவர்களுடைய தரப்புகளுக்குத் தெரிவித்திருக்கிறார்கள். இது பற்றி Sri Lanka Navyக்கும் KKS பொலிஸுக்கும் உங்களுக்கும் அறிவித்து 6 நாட்களாகியும் எந்தவிதமான நடவடிக்கையும் எடுக்கப்படவில்லையென அவர்கள் தெரிவிக்கிறார்கள். அவர்கள் இது பற்றி என்னிடமும் தெரிவித்தார்கள். இது பற்றி முறைப்பாடு செய்து 6 நாட்களாகியும் இதுவரை அரசாங்கம் எந்தவித நடவடிக்கையும் எடுக்கவில்லை என்ற குற்றச்சாட்டு இருக்கின்றது. எனவே, தயவுசெய்து நீங்கள் இந்த விடயத்தைப் பொறுப்பேற்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ உறுப்பினர் அவர்களே, இந்த விடயம் எங்களுடைய கவனத்துக்குக் கொண்டுவரப்பட்டு இருக்கின்றது. இவர்களைத் தேடும் நடவடிக்கையை Sri Lanka Navyஉம் ஏனையவர்களும் ஆரம்பித்திருக்கிறார்கள். நான் இந்த இடத்தில் ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். அதாவது, அவர்களுடைய தகவல்களைத் தரும்படி நாங்கள் கேட்டால், இவர்கள் சென்ற படகு யாருடைய பெயரில் register பண்ணப்பட்டு இருக்கின்றது எனக் கேட்டால், அது தொடர்பான தகவல்கள் சரியான முறையில் பெற்றுக்கொடுக்கப்படாத நிலைமை இருக்கின்றது. இது பற்றி எங்களுக்குத் தகவல் கிடைத்தவுடனேயே நாங்கள் சகல நடவடிக்கைகளையும் எடுத்திருக்கின்றோம். இவர்களை இந்திய மீனவர்கள் சந்தித்ததாகச் சொல்கின்றார்கள். ஆனால், எந்தப் பிரதேசத்தில் சந்தித்தார்கள், எப்படிச் சந்தித்தார்கள் போன்ற எந்தவிதமான தகவலும் இதுவரை எங்களுக்குக் கிடைக்கவில்லை. அதனால் இவர்கள் எந்தப் பிரதேசத்தில் காணாமல் போயிருக்கிறார்கள் என்பதைக் கண்டுபிடிக்க முடியாத நிலைமை இருக்கின்றது. இருந்தபோதிலும்கூட, இன்று காலையிலிருந்து கடற்படையினர் தேடுதல் நடவடிக்கைகளில் ஈடுபட்டு வருகின்றார்கள். இன்று இரவுக்குள் இது சம்பந்தமாக தெளிவானதொரு பதில் கிடைக்குமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, කාලය සීමිතයි. ඔබතුමාට විනාඩියක් විතරක් දෙන්නම්.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

கௌரவ அமைச்சர் அவர்களே, பாதிக்கப்பட்டவர்களுடைய அடையாளங்களை அறிந்து, இந்திய மீனவர்கள் video ஒன்றைக்கூட குறிப்பிட்ட நபர்களுக்கு அனுப்பியிருக்கிறார்கள். அவர்கள் எங்கு இருக்கிறார்கள் என்பதெல்லாம் தெளிவாகச் சொல்லப்பட்டு, குறித்த விபரங்கள் எல்லாம் Policeக்கும் Navyக்கும் வழங்கப்பட்டு இருக்கின்றன. அந்த விபரங்கள் உங்களுக்கும் கொடுக்கப்பட்டதாகச் சொல்கின்றார்கள். Policeக்கும் Navyக்கும் அந்த videoகூட கொடுக்கப்பட்டு இருக்கின்றது. இந்த விபரங்கள் ஆறு நாட்களுக்கு முன்னர் கொடுக்கப்பட்டும், எந்தவிதமான நடவடிக்கையும் எடுக்கப்படவில்லை என்பதை நான் பொறுப்போடு உங்களுக்குச் சொல்கின்றேன். தயவுசெய்து, நீங்கள் இந்த விடயத்தைக் கவனத்திலெடுத்து, உரிய நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.59]

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අපි පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය අනුව ක්ෂුද්‍රමූල්‍ය ණය නියාමන අධිකාරිය පිහිටුවීම සඳහා වන විධිවිධාන සැලැස්වීමට අදාළ පනත් කෙටුම්පත පිළිබඳව තමයි සාකච්ඡා කරන්නේ. විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත ගෙන එන්නේ ඇයි කියන කාරණාව අපිට ඉතා වැදගත් වෙනවා. මේ පනත් කෙටුම්පත ගෙන ඒමේ ප්‍රධානම අරමුණ තමයි, මුදල් ණයට දීමේ ව්‍යාපාරය සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරය නියාමනය කිරීමත්, මුදල් ණයට දීමේ ව්‍යාපාරයේ සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයේ ගනුදෙනුකරුවන්ට සහන සැලසීමත්. විශේෂයෙන්ම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා බොහෝ දෙනෙකු කිව්වා, මේ පනත් කෙටුම්පත ගෙන එන්න මීට පෙර අවස්ථා තිබුණු නමුත් එය ගෙන එන්න බැරි වුණා කියලා. නමුත් ආණ්ඩුවේ අපේ වගකීමක් තමයි, මේ පනත් කෙටුම්පත ගෙනෙන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම්වල තිබෙන ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන් ගත්තාම, ඒවායේ සාධනීය වාගේම අයහපත් ලක්ෂණත් අපට දකින්න පුළුවන්. විශේෂයෙන්ම මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමය ආරම්භ වන්නේම මේ නිසායි. විධිමත් බැංකු හරහා සහ මූල්‍ය ආයතන හරහා ඔවුන්ට විධිමත් ක්‍රමයට මේ ණය ලබා ගන්න බැරි වුණාට පස්සේ ඔවුන් පෙලඹෙනවා, මෙවැනි සරලදායී ණය ක්‍රම වෙත. එතකොට එහි තිබෙන ප්‍රධාන සාධනීය ලක්ෂණ තමයි, ගම්වල ඉන්න අය කණ්ඩායම් ලෙස හැදිලා මේ ණය ක්‍රමවලට පෙලඹීමත්, ඒ තුළ යම් සාමූහික බවක් ඇති වීමත්. නමුත් මේ ක්‍රමය තුළ අයහපත් ලක්ෂණත් දක්නට තිබෙනවා. ඒ පහසුව නිසාම ග්‍රාමීය ජනතාව මේ ණය ක්‍රමයට හුරු වීම තුළ අපි දකිනවා, ආර්ථික දරිද්‍රතාව තව තවත් උග්‍ර වන බව. මොකද, මේ ණය ක්‍රම ඇතුළේ සමහර විට සමහර ණය තුළ තිබෙන්න පුළුවන්, සියයට 200ක, 300ක, 400ක වාගේ අධික පොලී ප්‍රමාණයක්. ඒ ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රම ඇතුළේ ඔවුන්ට යම් සහනයක් ලැබෙයි කියලා ඔවුන් බලාපොරොත්තු වුණත්, එය ඔවුන්ගේ ආර්ථික දරිද්‍රතාව තවත් ඉහළ යාමට හේතු වන ප්‍රධානම කාරණයක් බවට පත් වෙනවා.

ඒ වාගේම මෙහිදී අපි දකින තව විශේෂම කාරණාවක් තිබෙනවා. සමහර විට මේ ණය ලබා ගැනීමේදී ඔවුන් පවුල්වල ඉන්න ස්වාමි පුරුෂයාවත් දැනුවත් කරන්නේ නැතුව මේ ණය ගත් අවස්ථා තිබෙනවා. එවැනි අවස්ථාවල සමහර විට ඒ ණය ගෙවා ගන්න අමාරු වුණාට පසුව පවුල් අතරේ දැඩි විරසකයන් සහ ගැටුම්කාරී තත්ත්වයන් ඇති වෙලා ඒ පවුල් ජීවිත පවා විනාශ වෙන්න පුළුවන්.

විශේෂයෙන්ම 2019, 2020 වාගේ කාලය තුළ මේ ආර්ථික අර්බුදය නිවස දක්වා පැමිණියාට පසුව මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා ගැනීමේ සීමාව ඉක්මවා යනවා අපි දැක්කා. සමහර විට කුඩා කණ්ඩායම් හරහා ලබා ගත් මෙවැනි ණය ගෙවා ගන්න බැරිව ඇතැම් කාන්තාවන් ඔවුන්ගේ ජීවිත විනාශ කර ගත් අවස්ථා අපි පසුගිය කාලය තුළ දැක්කා. අපි ආණ්ඩුවක් විධියට පත් වන්නේම මෙන්න මේ කියන තත්ත්වයන් හොඳට හඳුනා ගෙනයි. අපි ඔවුන්ට දීපු පොරොන්දුවක් තිබෙනවා. ඒ අනුව, මෙවැනි ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමවලදී විශේෂයෙන්ම ඒ ජනතාවගේ ආරක්ෂාව සලසන එකත් අපේ ප්‍රධානම කාර්යයක් බවට පත් වුණා. ක්ෂුද්‍ර මූල්‍ය ණය පමණක් නොවෙයි, මේවා තුළ නියාමනය නොවුණු සමහර විට අධික ලෙස පොලී ලබා ගන්නා මහා පරිමාණයෙන් ක්‍රියාත්මක වන විවිධ වැඩසටහන් තිබෙනවා. ඒවා නිසාත්

[ගරු උපුල් කිත්සිරි මහතා]

ජනතාව විශාල පීඩාවකට පත් වන ආකාරය අපි දැක්කා. ඒ නිසා තමයි මෙවැනි පනතක් ගෙනෙන්න ආණ්ඩුවක් හැටියට අපි කටයුතු කරන්නේ.

විපක්ෂයේ චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා කියනවා අපි අහගෙන හිටියා, මේ පනත ගෙනෙනකොට සාක්කු ටික සුද්ද කරලා ඉවරයි කියලා. අපි එතුමාට කියනවා, සාක්කු ටික සුද්ද කරලා ඉවර වුණාට පසුව වුණත් මේ පනත ගෙනෙන්නේ අපේ ආණ්ඩුව ආවාට පසුවයි කියන එක. මොකද, සාක්කු සුද්ද කරන්න ඉස්සෙල්ලා ඔබතුමන්ලාට ඒ අවස්ථාව ක්‍රියාත්මක කරන්න තිබුණා. හැබැයි, මේක තවදුරටත් ගියොත් සාක්කු සුද්ද කරනවා විතරක් නොවෙයි, සාක්කුවත් හිල් කරලා තමයි සමහර ආයතන කටයුතු කරන්නේ. ඒ නිසා තමයි මේ පනත ගෙනෙන්නේ කියන එක විශේෂයෙන්ම අපි එතුමාට මතක් කරලා දෙන්න ඕනෑ. මොකද, මේ පනත ඔබතුමන්ලා ගෙනෙන්න ප්‍රමාද වීම තුළ මේ රටේ ජීවිත ගණනාවකුත් විනාශ වුණා. ඒ වාගේම පවුල් සංස්ථාව පැත්තෙන් ගත්තොත්, මේ හේතුවෙන් පවුල් ගණනාවකුත් විනාශ වුණා කියන එකත් අපට සාධක ඇතුව තහවුරු කරන්න පුළුවන්.

මරික්කාර් මන්ත්‍රීතුමා, සුනිල් රත්නසිරි මන්ත්‍රීතුමා කියපු කාරණාවකට කලබල වෙලා උත්තර දෙනවා අපි දැක්කා. සුනිල් රත්නසිරි මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිව කිව්වා, ගල් අඟුරු වංචාවක් වෙලා තිබෙනවා නම් එතුමා කියපු නම් ගම් එක්ක කරුණු මතු කරන්න කියලා. හැබැයි, ඊට පස්සේ මරික්කාර් මන්ත්‍රීතුමා එතුමාට කථා කරන්න ලැබුණු අවස්ථාවේදී පරණ කථා ගොඩක් කිය කියා ගියා; ඒවා හොයලා එන්න, මේවායේ තොරතුරු ඉල්ලන්න කියලා කිව්වා. එතුමාත් ඒ කරන්නේ ඉතාම බරපතළ වැරැද්දක්. එවැනි වංචාවක් වෙලා තිබෙනවා නම්, ඒ සල්ලි කාටද ගියේ කියලා එතුමාට කියන්න බැරි නම්, එතුමාත් ඒ කටයුත්තට දායක වුණා කියන එක අපට විශේෂයෙන්ම කියන්න වෙනවා.

ඒ වාගේම මම තව කාරණයක් මතු කරන්න ඕනෑ. කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා මේ කථා අතරේම ප්‍රකාශ කළා, වීවලට සහතික මිලක් ලැබෙන්නේ නැහැ කියලා. අපි එතුමාට කියන්න කැමැතියි, පසුගිය කන්නය වෙනකොට අපි වීවලට උපරිම සහතික මිලක් ලබා දුන් බව. විශේෂයෙන්ම අපි ඒ වෙනුවෙනුත් ආණ්ඩුවක් හැටියට ඉතාම පැහැදිලිව කටයුතු කළා කියන එකයි අපට කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපට කියන්න තිබෙන්නේ මේ පනත හොඳයි කියන එකයි. මේ පනත අනිවාර්යයෙන්ම ගෙනා යුතුයි. මේ පනත තවත් ප්‍රමාද වෙනවා නම් අර මන්ත්‍රීතුමා කිව්වා වාගේ සාමාන්‍ය ජනතාවගේ සාක්කු ටික හිස් වෙන්න පුළුවන්. ඒ නිසා තමයි අපි මේ පනත හොඳයි, ඒක ගෙනෙන්න ඕනෑය කියන්නේ. මේ පනත පිළිබඳව විපක්ෂය මතු කරන්න ගියේ මොකක්ද? ස්වේච්ඡා සංවිධාන, එහෙම නැත්නම් ගමේ තිබෙන අනෙකුත් ආයතන සම්බන්ධයෙන් තමයි ලොකු භීතියක් ඇති කරන්න ගියේ. මම කලින් කිව්වා වාගේ තත්ත්වයන් තිබෙනවා නම්, ඒ පිළිබඳව ඕනෑම වෙලාවක සාකච්ඡා කරලා, ඒ පනත ක්‍රියාත්මක වෙද්දී ඇතැම් කාරණා පිළිබඳව අපට ඇතැම් වගන්තිවලට යම් යම් සංශෝධන ගෙනෙන්න පුළුවන්. ඒ නිසා මේ පනත ගෙන එන්නම ඕනෑ පනතක් හැටියටයි අපි දකින්නේ. මොකද, අපේ රටේ ජනතාව එවැනි මූල්‍ය සමාගම් සමඟ තවදුරටත් කටයුතු කරද්දී ඒ ජනතාවටත් ආරක්ෂාවක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම මූල්‍ය ආයතනවලටත් ආරක්ෂාවක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම තමයි, රටේ ආර්ථිකය විධිමත් වෙන්න ඕනෑ. ආර්ථිකය විධිමත් වීමේ තවත් පියවරක් තමයි මේ තැබුවේ.

විශේෂයෙන්ම ආණ්ඩුවක් හැටියට වාගේම රජයක් හැටියට අපි සන්තෝෂ වෙනවා, අප ජනතාවට දීපු පොරොන්දුවක් හැටියටත්, ජනතාව අපෙන් බලාපොරොත්තු වන පොරොන්දුවක් හැටියටත්, ඔවුන් ආරක්ෂා කිරීම සඳහාත්, මූල්‍ය ආයතන ආරක්ෂා කිරීම සඳහාත්, කාලයක් තිස්සේ ගෙන එන්න බැරි වුණු මේ පනත අපට ගෙන එන්න ලැබීම පිළිබඳව. ඒ කාරණය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.07]

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත සාකච්ඡාවට ගන්න අද දවසේදී මතු වුණු කාරණා කිහිපයක් සම්බන්ධයෙන් මම අවධානය යොමු කරන්නම්. විශේෂයෙන් මේ පනත සම්බන්ධයෙන් විපක්ෂයේ විශේෂ විරෝධයක් අද පැන නැඟුණේ නැති බවයි මගේ හැඟීම. බහුතරයක් මේ පනත සම්බන්ධයෙන් එකඟයි. විශේෂයෙන් චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ මීට අවුරුදු 15කට කලින් මේක ගෙනෙන්න තිබුණා නම් හොඳයි. ඒ වාගේම මේ පනත සම්බන්ධයෙන් අවංකව කටයුතු කරනවා නම් හොඳයි වාගේ දේවලුත් අපට ඇහුණා. ඔව්, අවංකව, ජනතා හිතවාදීව, ජනතාව වෙනුවෙන් පත් වුණු ආණ්ඩුවක් විධියට තමයි මේ සියලු පනත් අපි ගෙනෙන්නේ. කිසිම විධියකට ජනතාව අනතුරේ හෙළන්න, එහෙම නැත්නම් ජනතාව අපහසුතාවට පත් කරන්න කිසිම පනතක් අපි පාර්ලිමේන්තුවේ සම්මත කරන්නේ නැහැ කියන එක මේ රටේ මහජනතාව දන්නවා.

අපි දන්නවා, පසුගිය කාලයේ සිවිල් ජන සමාජය තුළ මේ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සම්බන්ධයෙන් විශාල සංවාදයක් ඇතිවෙලා තිබුණු බව. ඔවුන්ගේ සොයා බැලීම්වලට, එහෙම නැත්නම් ඔවුන්ගේ පර්යේෂණවලට අනුව මේ රටේ නිල නොලත්, ලියාපදිංචි නොවුණු මෙවන් මූල්‍ය සමාගම් 10,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා කියන එක තමයි අපට දැන ගන්න ලැබෙන්නේ. ඒ සංඛ්‍යා දත්තවලට අනුව සමහර තැන්වල 15,000ක් පමණ කියලාත් සඳහන් වෙනවා. මෙයින් ආයතන 4ක් පමණයි මහ බැංකුවේ ලියාපදිංචි ආයතන විධියට තිබෙන්නේ. එහෙම නම් දහස් ගාණක් මේ මූල්‍ය ආයතන නිශ්චිත ක්‍රමවේදවලින් තොරව තමයි මේ ණය ගනු දෙනු ගම් ඇතුළේ කරන්නේ.

අපි දන්නවා, මේ ණය අර්බුදයට ගොදුරු වෙලා ඉන්නේ, එහෙම නැත්නම් ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල ණය ලබාදීම් එක්ක අර්බුදයට ගිහින් ඉන්නේ ගොඩක් වෙලාවට මේ රටේ දිළිඳු ජනතාව බව. විශේෂයෙන් ගම්වල ගොවි කම්කරු ජනතාව වෙන්න පුළුවන්, වතුකරයේ ඉන්න ජනතාව වෙන්න පුළුවන්, එහෙම නැත්නම්, උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධයෙන් පීඩාවට පත් වුණු කාන්තාවන් වෙන්න පුළුවන්. ලංකාවේ මේ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වලින් ණය ගත් පිරිස මිලියන 2.8ක් කියලායි කියන්නේ. මේකෙන් මිලියන 2.4ක් කාන්තාවෝ. පසුගිය කාලය

බැලුවොත්, මේ අර්බුදය තුළ මේ රටේ ගෘහ ඒකක, එහෙම නැත්නම් පවුල් සංස්ථා විශාල අර්බුදයකට ගිහින් තිබෙනවා. 2019 වෙද්දි මේ රටේ 170කට ආසන්න ප්‍රමාණයක් මේ සම්බන්ධ කාරණා හේතුවෙන් සිය දිවි හානි කරගෙන තිබෙනවා කියලායි සංඛ්‍යා දත්තවල සඳහන් වෙන්නේ. හැබැයි, අද අපි ඉන්නේ 2026 වර්ෂයේ. 2022දි ආර්ථික අර්බුදයකටත් මුහුණ දුන්නාට පසුව මේ වෙනකොට මේ සංඛ්‍යාව අඩුම ගානේ දෙගුණයක්වත් වෙලා ඇති කියන එකයි මගේ අදහස. මේක නවත්වා ගන්න නම් මේවා සම්බන්ධයෙන් අනිවාර්යයෙන් නියාමනය රැගෙන ආ යුතුයි කියන අදහසේ ඉඳිමින් තමයි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට අරගෙන එන්නේ.

සමහර අය මේක ඇතුළේම වෙනත් විධියක භීතියක්, එහෙම නැත්නම් අනියත බියක් සමාජය තුළ මතු කරන්නත් උත්සාහ ගනිමින් ඉන්නවා. පසුගිය දවසක "මව්බිම" පුවත්පතේ මේ සම්බන්ධයෙන් පුවතක් සඳහන් වෙලා තිබුණා, "ගමේ ණය දෙන සමිති 15,000ක් අර්බුදයක" යන මැයෙන්. "මව්බිම" පත්තරයේ headline එක විධියට මේක සඳහන්වෙලා තිබුණා. අපේ නියෝජ්‍ය මුදල් ඇමතිතුමාත් සභාවේ ඉන්නවා. අපි අනිවාර්යයෙන් සහතිකයක් දෙනවා, ගම්වල තිබෙන ස්වේච්ඡා සංවිධාන - මරණාධාර සමිති වෙන්න පුළුවන්, අනෙකුත් ස්වේච්ඡා සංවිධාන වෙන්න පුළුවන්- කිසිම එකකට කිසිම විධියකින් අතක් තියන්න මේ පනතින් අනුබලයක් ලැබෙන්නේවත්, ඒ සඳහා අපි පෙලඹෙන්නේවත් නැහැ කියලා. ඒවා ආරක්ෂා කළ යුතුයි. අපි දන්නවා, ගම තුළ යම් යම් මූල්‍ය කළමනාකරණ කටයුතු සිද්ධ වෙන එක සංස්කෘතියත් එක්ක බැඳිලා තිබෙන්නේ කියලා. මරණාධාර සමිතිය වෙන්න පුළුවන්, ගොවි සමිතියක් වෙන්න පුළුවන්, මේවා තුළත් ණය ලබා දීම්, එහෙම නැත්නම් මුදල් හුවමාරු කරගැනීම් සිද්ධ වෙනවා. ඒවා ගොඩක් වෙලාවට සිද්ධ වෙන්නේ ගමේ සුබසිද්ධිය සඳහා. නමුත්, මේ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් කියන ඒවා කටයුතු කරන්නේ එහෙම නොවෙයි.

අපි දන්නවා, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ලෝකයට හඳුන්වා දෙන්නේ බංග්ලාදේශයේ මොහොමඩ් යූනුස් කියන ආර්ථික විද්‍යාව සම්බන්ධ මහාචාර්යවරයා බව. බංග්ලාදේශයේ මේක අත්හදා බලනවා. නමුත්, ටික කාලයකට පස්සේ මේක අසාර්ථක වෙනවා. ඒ විතරක් නොවෙයි, ඉන්දියාවේ ප්‍රාන්ත කිහිපයක මේ සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කරලා තිබෙනවා. මේක අසාර්ථක වෙලා තිබෙනවා. මේක අසාර්ථක වුණා කියලා නතර වෙලා නැහැ. විශේෂයෙන් ලංකාව වාගේ රටක මේ ණය ලබා දීම් හෝ මූල්‍ය ගනු දෙනු සිදුකිරීම් නතර වෙලා නැහැ, මේක අසාර්ථක වුණා කියලා. මේ තුළින් සිද්ධ වෙලා තිබෙන්නේ මේ රටේ මිනිස්සුන්ගේ ජීවිත තව තවත් අර්බුදයට අරගෙන යන එක. නමුත්, ලෝකයේ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් පටන්ගෙන තිබෙන්නේ ආන්තික ජන කොටස්වලට, එහෙම නැත්නම් ආර්ථික හැකියාව අවම මට්ටමක පවතින අය වෙනුවෙන්.

විශේෂයෙන් බැංකුවකට ගිහිල්ලා ණයක් ඉල්ලද්දි අපි දන්නවා, බැංකුවෙන් අපෙන් වත්කම් අහනවා, එහෙම නැත්නම් ඇපකරයක් අහනවා. මේ කිසිම විධියක හැකියාවක් නැති, තමන්ගේ ආදායම බැංකුවට ඔප්පු කරගන්න බැරි පිරිස්වලට ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට මූල්‍ය සහයෝගයක් ලබාදීම සඳහා තමයි ලෝකයේ මේ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ඇති වෙන්නේ. නමුත්, දැන් අරමුණ වෙනස්වෙලා තිබෙනවා. එහෙම නැත්නම් එහි පරමාර්ථයට එපිටින් ගිහිල්ලා අවසානයේ ලංකාවේ දුගී දුප්පත් ජනතාව, විශේෂයෙන් කාන්තාවන් තමන් හිටපු තැනින් පහළට; කබලෙන් ලිපට වට්ටන්න මේ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වලට හැකියාව ලැබී තිබෙනවා. ඔවුන් ලාභ ලැබීමේ පරමාර්ථය ඔස්සේ කටයුතු කිරීම හරහා මිනිස්සුන්ගේ ජීවිතවලට සිද්ධවෙලා තිබෙන්නේ ඒක. එම නිසා මේ නියාමනය කියන එක ඉතා වැදගත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකෙදි ණය ගන්න කෙනා වාගේම, ණය ලබාදෙන ආයතනයත් සුරක්ෂිතයි. එහෙම නැත්නම් මේවා සම්බන්ධයෙන් නඩු පවරන්න හෝ මේවා සම්බන්ධයෙන් අනෙකුත් නීතිමය කටයුතු කරන්න අවකාශයක් හැදිලා නැහැ. මේකට නියාමන අධිකාරියක් අවශ්‍ය වන්නේ ඒ නිසා.

ඒ වාගේම අපි දන්නවා ලංකාවේ පිළිගත් බැංකුවක් කෙනෙකුට ණයක් ලබා දුන්නාට පස්සේ ඒ ණය අය කර ගන්න ඔවුන්ගේ ගෙදරට ගිහිල්ලා සාලයේ පුටුවක් තියාගෙන වාඩි වෙලා ඉන්නේ නැහැ කියලා. එහෙම නැත්නම්, ණය ගෙවනතුරු ගෙදරින් එළියට බහින්නේ නැහැ කියලා වාඩි වෙලා ඉන්නේ නැහැ. එහෙම නැත්නම්, ලිංගික බලහත්කාරකම් කරන්නේ නැහැ. තර්ජනය කරන්නේ, බය කරන්නේ, බිය වද්දන්නේ නැහැ. නමුත්, මේ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් මේ රටේ ක්‍රියාත්මක වුණේ ඒ විධියටයි. ඒ නිසා තමයි ලංකාවේ සිය දිවි නසා ගැනීම් මෙතරම් ප්‍රමාණයක් වාර්තා වෙන්නේ. ඕනෑ නම් යූටියුබ් එකේ බලන්න පුළුවන්, මේ සම්බන්ධයෙන් යම් යම් සංවිධානවලින් නිර්මාණය කරපු වාර්තා වැඩසටහන් තිබෙනවා. ඒවායේ කාන්තාවන් කථා කරනවා. ඔවුන් කියනවා, collectorsලා ඇවිල්ලා දවස පුරා පුටුව තියාගෙන එළියේ වාඩි වෙලා ඉන්නවා, සල්ලි අරගෙන එන්නම් කියලා ගෙට ගිහිපු කාන්තාවෝ සාරියෙන් බෙල්ල වැල ලා ගෙන මැරිලා තිබෙනවා කියලා. එහෙම වෙලා තිබෙනවා. එහෙම වෙලා තිබෙන්නේ සදාචාරාත්මක - ethical - සීමාවෙන් එහාට ගිහිල්ලා ණය අය කර ගැනීමේ කටයුත්තට ඔවුන් පෙලඹිලා තිබෙන නිසා. අපිට මෙම නියාමන කටයුත්තෙන් මෙන්න මේක නවත්වා ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අදහස වෙන්නේ මේ නියාමනය අනිවාර්යයෙන් සිද්ධ විය යුතුයි එකක්, ජන ජීවිතය සුරක්ෂිත කිරීම සඳහා. ණය ලබා දෙන්නා සහ ණය ලබා ගන්නා කියන දෙන්නාගේම මේ තත්ත්වයන් සුරක්ෂිත කිරීම සඳහා මේ නියාමනය අවශ්‍යයි.

ඒ වාගේම ඔබතුමන්ලා දන්නවා, අපි මේ රටේ විශේෂයෙන් දුගී දුප්පත්, අඩු ආදායම්ලාභී පවුල්වලට සහන සලසන ආණ්ඩුවක් විධියට පසුගිය කාලයේ ඇති වූ "දිට්වා" සුළි කුණාටුවත් එක්ක ආපදාවට පත් වුණු ජනතාවට විශාල සහන ප්‍රමාණයක් ලබා දීලා තිබෙන බව. වතු කම්කරු ජනතාවගේ වැටුප වැඩි කර තිබෙනවා. ඇයි ඒ? ඔවුන්ගේ ජන ජීවිත සුරක්ෂිත කරන්න ඕනෑ නිසා. ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමට අපි සහන ලබා දෙනවා වාගේම ඔවුන්ව බූවල්ලන් වාගේ වෙළා ගෙන සිටින අය සිටිනවා නම්, එහෙම නැත්නම් ඔවුන්ගේ ගම් තුළට කඩා වැදිලා ඔවුන්ගේ ආර්ථිකය බිඳ වට්ටන්න කෙනෙක් උත්සාහ කරනවා නම් අපි ඒකටත් මැදිහත් විය යුතු වෙනවා. මේකෙදි යම්කිසි විධියකින් කිසිම මූල්‍ය ආයතනයකට අපි තර්ජනාත්මකව, එහෙම නැත්නම් බලහත්කාරයෙන් මැදිහත් වෙලා ඔවුන්ගේ ඒ ව්‍යාපාර කඩාකප්පල් කරන්නවත්, එහෙම නැත්නම් ඒවාට බලපෑම් කරන්නවත් නොවෙයි හදන්නේ. මේ සියල්ල විධිමත් කිරීම සඳහා ගෙනෙන පනතක් විධියට මේ ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත මේ මොහොතේ ඉතා වැදගත් බව මේ රටේ ජනතාවට සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.15]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று நாங்கள் இந்தச் சபையில் நுண்நிதி மற்றும் கடன் ஒழுங்குபடுத்தும் அதிகாரசபை சட்டமூலம் தொடர்பாக விவாதித்துக்கொண்டு இருக்கின்றோம். பாராளுமன்றத்தில் இச்சட்டமூலம் கொண்டுவரப்பட்டதையிட்டு நாங்கள் மிகவும் சந்தோஷமடைகின்றோம்; வரவேற்கின்றோம். இந்தச் சட்டமூலமானது எங்களுடைய நாட்டுக்கு மிகவும் முக்கியமானதொரு சட்டமூலமாகும். ஏனெனில், நுண்கடனால் மிக மோசமாகப் பாதிக்கப்பட்ட இடங்களில் எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங்களும் அடங்குகின்றன.

2009ஆம் ஆண்டு எங்களுடைய நாட்டில் யுத்தம் நிறைவடைந்த பின்னர், இடம்பெயர்ந்த மக்கள் தங்களுடைய பொருளாதாரத்தை முற்றுமுழுதாக இழந்திருந்த நிலையில், அங்கு எந்தவொரு வருமானமும் அற்ற நிலையில் மிகவும் கஷ்டப்பட்டுக்கொண்டு இருந்தார்கள். அந்த நேரத்தில், தென் பகுதியிலிருந்து அங்கு வருகைதந்த 40க்கும் மேற்பட்ட நுண்கடன் நிதி நிறுவனங்கள், குறிப்பாக பெண் தலைமைத்துவக் குடும்பங்களுக்குக் கடனை வழங்கி, அவர்களைப் பலவிதமான துன்புறுத்தல்களுக்கு ஆளாக்கியிருந்தன. இதனை நாங்கள் நேரடியாகக் காணக்கூடியதாக இருந்தது.

எங்களுடைய பிரதேசங்களில் வங்கிகளில் கடன் பெறமுடியாதவர்களுக்குக்கூட, இந்த நுண்கடன் நிதி நிறுவனங்கள் அதிக வட்டிக்கு எந்தவொரு நிபந்தனையுமின்றிக் கடனை வழங்கிவிட்டு, அந்தக் கடனைப் பெறுவதற்காகப் பாலியல் ரீதியான துன்புறுத்தல் உட்பட பல்வேறு துன்புறுத்தல்களைச் செய்கின்றன. ஒரு கடனை அடைப்பதற்காக இன்னொரு நிதி நிறுவனத்திடமிருந்து கடனைப் பெற்று, பின்னர் அந்தக் கடனை அடைப்பதற்கு இன்னொரு நிறுவனத்திடமிருந்து கடனைப் பெறுகின்றார்கள். இப்படிப் பல நிறுவனங்களிடமிருந்து கடனைப்பெற்று, அதைச் சமாளிக்க முடியாத சூழ்நிலையில், இறுதியாக அந்தக் குடும்பத் தலைவர்கள் தற்கொலை செய்துகொள்கின்ற நிலைக்குத் தள்ளப்படுகின்றார்கள். இவ்வாறான பல சம்பவங்கள் கடந்த காலங்களில் எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங்களில் நடந்திருக்கின்றன. இவ்வாறு மிக மோசமாகப் பொருளாதார ரீதியில் நலிவடைந்த மக்களைக் காப்பாற்றுவதற்காகவும் நுண்கடன் மற்றும் கடன் வழங்கும் நிறுவனங்களைக் கட்டுப்பாட்டுக்குள் கொண்டுவருவதற்காகவும் கொண்டுவரப்பட்டுள்ள இந்தச் சட்டமூலமானது எங்களுடைய நாட்டுக்குத் தேவையானது. எனினும், இந்தச் சட்டமூலத்தில் சில குறைபாடுகள் இருப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது.

யுத்தம் நடைபெற்ற காலப் பகுதியில் எங்களுடைய மாகாணங்களில் வங்கிச் சேவைகள் முழுமையாக நடைபெறவில்லை. வங்கிச் சேவைகள் நடைபெற்றாலும்கூட, அச்சேவைகளைப் பெற்று பயனடையக்கூடிய நிலையில் எமது மக்கள் இருக்கவில்லை என்பது உங்களுக்குத் தெரியும். அந்த நேரத்தில், கிராம மக்கள் ஒன்றுசேர்ந்து தங்களுக்கிடையில் சில கிராம வலுவூட்டல் அமைப்புகளை உருவாக்கி, நிதியைச் சேகரித்து, மிகவும் மோசமான நிலையில் பணம் தேவைப்படுபவர்களுக்குச் சிறு கடன்களை வழங்கி வந்தார்கள். இவ்வாறு அவர்கள் தங்களுக்குள்ளே நிதி நிறுவனம்போல செயற்பட்டதால், அந்தக் கஷ்டமான காலத்திலும் பல குடும்பங்கள் அந்தப் பிரதேசத்தில் வாழக்கூடியதாக இருந்தது. யுத்த காலத்தில் மாத்திரமல்ல, யுத்தத்துக்குப் பின்னரும்கூட, எங்களுடைய பிரதேசங்களில் இவ்வாறான கட்டமைப்பு மிக அதிகளவில் இருக்கின்றது. இலங்கையில் மாகாண ரீதியாக எடுத்துப் பார்த்தால், வட, கிழக்கு மாகாணங்களிலே இப்படியான சமூக ரீதியான நிதி நிறுவனங்கள் அதிகமாக இருக்கின்றன. இவை இலாப நோக்கற்று, தங்களுக்குள்ளே தங்களை வலுப்படுத்திக்கொள்கின்ற அமைப்புகளாக இருக்கின்றன.

இப்பொழுது எங்களைப் போன்றவர்களுக்குள்ள பிரச்சினை என்னவென்றால், இந்தச் சட்டமூலத்தில் இருக்கின்ற பெரிய நிதி நிறுவனங்களுக்கான அதே சட்டதிட்டத்துக்குள் இவையும் உள்வாங்கப்பட்டால், இந்த சமூக நிதி நிறுவனங்கள் என்ன நோக்கத்துக்காகக் கொண்டுவரப்பட்டதோ, அந்த நோக்கம் அற்றுப் போய்விடும் என்பதுதான். இதனால் ஏழைக் குடும்பங்களுக்கு அல்லது தங்களுக்குள்ளே ஒரு கட்டமைப்பை உருவாக்கி வாழ்ந்துகொண்டு இருக்கின்ற பெண் தலைமைத்துவக் குடும்பங்களுக்குப் பாரிய பாதிப்பு ஏற்படும். ஏற்கனவே இங்கு பேசிய அரச தரப்பைச் சேர்ந்த சிலர், இவ்வாறான சிறிய நிறுவனங்கள் இதற்குள் உள்வாங்கப்பட மாட்டாதெனச் சொன்னார்கள். ஆனால், இந்தச் சட்டமூலத்தில் பணக்கடன் வழங்குநர்கள், நுண்நிதி நிறுவனங்கள் என இரண்டு முக்கிய பிரிவுகளாகப் பிரிக்கப்பட்டு, அனைவரும் உள்வாங்கப்படுகிறார்கள்.

என்னுடைய ஆலோசனை என்னவென்றால், இந்தச் சமூகமட்ட நிதி அமைப்புகளை மூன்றாவது பிரிவினராக உள்வாங்கி, அவற்றின் நோக்கத்தை நிறைவேற்றும் வகையில் இந்தச் சட்டமூலத்தில் சில திருத்தங்களைக் கொண்டுவர வேண்டும் என்பதுதான். இவ்வாறான அமைப்புகளை இந்தச் சட்டத்தின் ஊடாகக் கட்டுப்படுத்தாத ஒரு சூழல் இருந்தால் பெரும்பாலான குடும்பங்கள் பயனடையக்கூடிய நிலைமை ஏற்படும். ஏற்கனவே சொன்னதுபோல, இந்தச் சட்டத்தால் 90 சதவீதம் காப்பாற்றப்படப் போகின்றவர்கள் பெண்கள்! எனினும், இந்த அதிகாரசபையில் பெண் பிரதிநிதித்துவம் மிகவும் குறைவாக இருப்பது அல்லது ஒருவர் இருப்பது என்பது ஏற்றுக்கொள்ள முடியாத விடயமாகும். ஆகவே, அதில் பெண்களுக்குரிய பிரதிநிதித்துவம் வழங்கப்பட வேண்டும். இவ்வாறான திருத்தங்களை நாங்கள் கலந்துரையாடல்மூலம் கொண்டுவரலாம். இந்தச் சட்டமூலத்தில் கொண்டுவரப்பட வேண்டிய திருத்தங்கள் தொடர்பான விடயங்கள் அடங்கிய ஆவணத்தை நான் இந்தச் சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

இன்று நாங்கள் இந்தப் பாராளுமன்றத்தில் இருக்கும்பொழுது, இலங்கைப் பாராளுமன்றத்தில்தான் இருக்கின்றோமா என்பதை அறிய கிள்ளிப்பார்க்கவேண்டி இருந்தது. இந்த நாட்டில் யுத்தம் இடம்பெற்ற காலத்தில் இடம்பெயர்ந்த எங்களுடைய வட, கிழக்கு மாகாணங்களில் உள்ளவர்கள் தங்களுடைய வீடுகளுக்குப் போகாத சூழலில், காணாமல் ஆக்கப்பட்டவர்களின் உறவினர்கள் தங்களுடைய உறவுகள் எங்கே என்று தெரியாமல் இருக்கின்ற சூழலில், யுத்தத்தால் ஏற்பட்ட இரத்த வாடை இன்னும் மறையாத சூழலில், அதில் சம்பந்தப்பட்டவர்கள் இங்கு வந்து

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

மனிதாபிமானம் பற்றியும் யுத்தம் பற்றியும் கொலை செய்யப்படுவது பற்றியும் பேசுகின்றார்கள். இதன்போது, நாங்கள் இலங்கைப் பாராளுமன்றத்தில்தான் இருக்கின்றோமா? என்ற சந்தேகம் ஏற்பட்டது என்பதை இந்தச் சந்தர்ப்பத்தில் கூறி, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடை பெறுகின்றேன். வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.22]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. අද අප පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විපක්ෂය නම් වැඩිපුර කථා කළේ නැහැ කියලායි මා හිතන්නේ. නමුත් කරුණු කිහිපයක් මතු වුණා. ඒ කරුණු කිහිපය ආශ්‍රිතව, මේ පනත් කෙටුම්පතේ පරිණාමය, මේ පනත් කෙටුම්පත කොහොමද මෙතැනට ආවේ, මේක ඇයි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ, මෙතැනින් ඉස්සරහට මොකක්ද අපට කරන්න පුළුවන් වෙන්නේ කියන දේ ගැන අදහසක් සමාජයට ඉදිරිපත් කරන්න අවශ්‍යයි.

දැනට තිබෙන පනත, ඒ කියන්නේ 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත මේ පනත් කෙටුම්පත මඟින් අහෝසි කර දමනවා. 2016 ක්ෂුද්‍රමූල්‍ය පනත තමයි මුල්ම වරට "ක්ෂුද්‍ර මූල්‍ය" කියන මූල්‍ය ක්‍රමවේදය නියාමනය කිරීම සඳහා ගෙනාපු පනත. මේ පනත යටතේ එවකට තිබුණු ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ අද අප කථා කරපු ප්‍රජා මූල්‍ය ආයතන කියන වර්ග දෙකම නියාමනයට යටත් කරනවා. එකී නියාමනයට යටත් කරන්නේ ආයතන දෙකක් යටතේයි. ඒ අනුව අද අප කථා කරන මේ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් මහ බැංකුව යටතේත්, ප්‍රජා මූල්‍ය සංවිධාන රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය යටතේත් නියාමනය කිරීම සඳහා තමයි 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත සම්මත වෙන්නේ. 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත සම්මත වූ අවස්ථාවේදී, බැංකු සහ මූල්‍ය ලීසිං සමාගම් පනතේ පරිධියෙන් ඉවත් කරලා තමයි මේ පනත අරගෙන එන්නේ. මොකද, ඒක දැනටමත් Central bank එක යටතේ regulate වන නිසා ක්ෂුද්‍ර මූල්‍ය කියන නිශ්චිත ආයතන පමණයි මේ පනත යටතට ගැනෙන්නේ. මේ පනත සම්බන්ධව තිබුණු ගැටලුව තමයි, එක කොටසක් මහ බැංකුව යටතේ නියාමනය වීම සහ තව කොටසක් NGO Secretariat එක යටතේ නියාමනය වීම. එතැන තිබුණේ, ක්ෂුද්‍ර මූල්‍ය කියන නිර්වචනයයි. මේක තේරුම් ගැනීම වැදගත්. මේක අද කරපු සාකච්ඡාවලට උත්තරයක්. ඒ වාගේම අපි හිතනවා, ඉදිරියේදී සමහර දේවල් කරද්දීත් මේක තේරුම් ගැනීම වැදගත් වෙනවා කියලා. "ක්ෂුද්‍ර මූල්‍ය" කියන නිර්වචනයට 2016දී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් වාගේම ප්‍රජා මූල්‍ය සමාගම් ද ඇතුළත් කරලා තමයි පනත හදන්නේ. NGO Secretariat එක යටතේ ප්‍රජා මූල්‍ය සංවිධාන නියාමනය කරනවා. එතකොට අප අද කථා කරන ප්‍රජා මූල්‍ය කියන අදහස 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතට, මේ නියාමනය පටන් ගන්න පනතට ඇතුළත් වන්නේ නැහැ. ඔවුන් ක්ෂුද්‍ර මූල්‍ය category එකට ඇතුළත් වෙලා තමයි නියාමනයට ඇතුළත් වෙන්නේ. 2024දී මේ පනත ක්‍රියාත්මක වුණාට නිසි නියාමනයක් සිදු කිරීමට පනත හරහා හැකි වන්නේ නැහැ.

මා හිතන විධියට, මන්ත්‍රීවරු කිහිප දෙනෙක් මේ සම්බන්ධයෙන් කථා කළා. ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ලෙස register වෙලා තිබෙන්නේ, අතේ ඇඟිලිවලින් ගණන් කරන්න පුළුවන් සමාගම් ප්‍රමාණයක් පමණයි. මේ රටට, විශේෂයෙන්ම කාන්තාවන්ට වැඩිම හානියක් කරන ක්ෂුද්‍ර මූල්‍ය practice එක සිද්ධ කරන ආයතනත් තිබෙනවා. අපි ඒකට predatory lending කියලා කියනවා. කිසිදු දේපොළක් නොමැති කාන්තාවන්ට ඉතා ඉහළ පොලියකට ණය ලබා දෙන ආයතන යම්කිසි ප්‍රමාණයක් තිබෙනවා. ඒ ආයතන බැංකු සහ ලීසිං සමාගම් හැටියට කටයුතු කරනවා. ඒ ආයතන මේ පනතේ නියාමනයට යටත් වුණේ නැහැ. ඒ ගැටලුව එහෙමම තිබියදී තමයි 2024 අවුරුද්දේදී නියාමනය ශක්තිමත් කිරීම සඳහා "**ශ්‍රී ලංකා** ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය" කියලා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්නේ. ඒක ඉදිරිපත් කළාම පෙර පැවැති පනත අනුව NGO Secretariat එක යටතේ සහ මහ බැංකුව යටතේ නියාමනය වෙච්ච සමාගම්, ක්ෂුද්‍ර මූල්‍ය කියන category එක - ඒ දෙකම - ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරියේ නියාමනය යටතට ගෙනෙනවා. ඒ අනුව ක්ෂුද්‍ර මූල්‍ය කියන ව්‍යාපාරය ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නියාමනය කිරීම ඉවත් කරලා ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය යටතට ගෙනෙනවා, 2024 යෝජිත පනත් කෙටුම්පත මඟින්. නමුත්, 2024 යෝජිත පනත් කෙටුම්පතට 2016 වාගේම ආපු විවේචනය තමයි ලංකාවේ විශාලම මූල්‍ය සමාගම් වන බැංකු සහ ලීසිං සමාගම් පනතේ නියාමන අධිකාරියෙන් ඉවත් කර තිබීම. ඒක තමයි 2024 පනත් කෙටුම්පතේ තිබිච්ච ගැටලුව. පෙත්සම්කරුවන් මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කරනවා. ඒ පෙත්සම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය - Supreme Court Determination එක - කියවා බැලුවොත් පෙනෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණය ඒ Determination එක දෙන්නේ එවැනි exception එකක් කිසිම සමාගමකට දෙන්න බැහැ කියන කාරණය මත පදනම්වයි කියන එක. ඒ කියන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයේ නිරත වන සියලුම සමාගම් ක්ෂුද්‍රමූල්‍ය නියාමන අධිකාරිය යටතේ නියාමනය විය යුතුයි කියන අදහස ඇතිව තමයි ශ්‍රේෂ්ඨාධිකරණය ඒ Determinationඑක ලබා දෙන්නේ. එහි exceptions කිහිපයක් තිබෙනවා. ඉස්සෙල්ලා පනත යටතේත් තිබුණු co-operatives, agrarian societies වාගේ ඒවා මේ නියාමනයෙන් ඉවත් කරනවා. නමුත්, මේ සමස්ත කතන්දරය තුළ දිගටම එන එකම අදහස ක්ෂුද්‍ර මූල්‍ය පමණයි. මෙන්න මේක තමයි අප හැමෝම තේරුම් ගන්න ඕනෑ දේ. අපි අවංකව මෙයට මැදිහත් වෙනවා නම්, අපි අවංකව මේ පනත් කෙටුම්පත සම්බන්ධව අපේ අදහස් ප්‍රකාශ කරනවා නම්, පාර්ලිමේන්තුව තුළ වුණත්, පාර්ලිමේන්තුවෙන් එළියේ වුණත් අප මේක ගැන කථා කරනවා නම්, අප පිළිගත යුතු දේ තමයි, අද අප මේ කථා කරන පනත් කෙටුම්පත සම්මත වීමට පෙර අවස්ථාව වන විටත් ක්ෂුද්‍ර මූල්‍ය කියන නිර්වචනය තුළට ප්‍රජා මූල්‍ය සංවිධාන ඇතුළත් කර හමාරයි කියන එක. මොකද, මේ නිර්වචනය ගැන ගොඩක් කථා වුණා. අද උදේ ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමාත් මේ ගැන කථා කළා. ඊට පසුව ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා මේ ගැන කථා කළා. මම දන්නේ නැහැ මීට පෙර මේ මන්ත්‍රීවරු මේ ගැන කොච්චර කථා කළාද කියන එක. නමුත්, අද කථා කළා. ඒක හරි.

ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී මේ ප්‍රජා මූල්‍ය සංවිධාන සම්බන්ධව, ප්‍රජා මූල්‍ය සංවිධාන සමඟම අපි දෙවරක් කථා කළා. ඊට පෙර අපි මේ පනතේ තිබෙන යම් යම් කාරණා සම්බන්ධවත් සාකච්ඡා කළා. ඒ වාගේම අපි නිර්දේශත් නිකුත් කළා, වෙනස් කරන්න පුළුවන් නම් වෙනස් කරන්න පුළුවන් දේවල් සම්බන්ධයෙන්. ඒ අතර වෙනස් කරන්න පුළුවන් නිර්දේශ තිබෙනවා. අපි තේරුම් ගන්න ඕනෑ දේ තමයි, පනත් කෙටුම්පතක් ගැසට් පත්‍රයේ පළ කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත්

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

කළාට පසුව එය මුද්‍රණය කරන්න නියෝග කරනවා. ඊට පසුව ඒක අභියෝගයට ලක් කරන්න Supreme Court එකේ දවස් 14ක කාලයක් තිබෙනවා. ඒ කාලයට පසුව තමයි එය පාර්ලිමේන්තුවේ කමිටු අවස්ථාවට එන්නේ. ඒ කමිටු අවස්ථාවේදී අපට කරන්න පුළුවන් වෙනස්කම් සම්බන්ධයෙන් සීමාකම් තිබෙන්න පුළුවන්. ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශ කර තිබෙනවා, යම් යම් වෙනස්කම් කරන්න පුළුවන් වාගේම ඇතැම් වෙනස්කම් මේ අවස්ථාවේදී කරන්න බැහැ කියලා.

මේ ප්‍රජා මූල්‍ය සම්බන්ධයෙන් අද දවසේ තැනින් තැනදී කථා වුණා. ඇත්තටම, මේ පනත් කෙටුම්පතට දෙන්න ඕනෑ අවධානය ගැන විපක්ෂයෙන් කථා කළේ නැහැ. නමුත්, මේ ප්‍රජා මූල්‍ය සම්බන්ධයෙන් කථා වෙච්ච මේ ගැටලුව අපේ කමිටුවේ අවධානයටත් ලක් වුණා. ඒ සම්බන්ධයෙන් අපිත් නිර්දේශ නිකුත් කර තිබෙනවා. ඒ නිර්දේශ අනුව, රෙගුලාසි මඟින් හෝ වෙනත් ආකාරයකින් ප්‍රජාමූල්‍ය සංවිධාන - විශේෂයෙන් කාන්තාවන් විසින් පවත්වාගෙන යන සමිති - මේ ආකාරයෙන් ක්ෂුද්‍ර මූල්‍ය කියන category එකට දැමීමේදී යම් ගැටලුවක් තිබෙන්න පුළුවන්. අප ඒ ගැටලුව විසඳා ගත යුතුයි කියලා අපි හිතනවා. ඒක විසඳා ගත යුතු ගැටලුවක් හැටියට අපි දකිනවා. නමුත්, මේ නීතියේ පරිණාමය තුළ අපි එක එක්කෙනා කරපු කාර්යභාරය සම්බන්ධ ගැටලුවකුත් මෙතැන තිබෙනවා.

ප්‍රජා මූල්‍ය ආයතන 2016 වර්ෂයේදී ක්ෂුද්‍ර මූල්‍ය ලෙස නියාමනය වීමට එකඟත්වය පළ කරලා නියාමනය වීමට ලක් වෙලා තිබෙනවා. එහෙම ඇවිල්ලා තමයි අද වනකොට ප්‍රජා මූල්‍ය කියන අදහස වෙනස් අදහසක් ලෙස ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒක නරක දෙයක් නොවෙයි. අපේ ගරු උපාලි පන්නිලගේ ඇමතිතුමා ප්‍රජාමූල්‍ය සම්බන්ධයෙන් සහ ගම්වල මේ කියන සමිති ඇති කරගෙන කාන්තාවන් ණය දෙන එක, ඔවුන් කොහොමද මේකට මැදිහත් වෙන්නේ කියන එක, තමන්ගේ ගම්වල තිරසාර බව සහ ආරක්ෂාව සම්බන්ධයෙන් ඔවුන් මැදිහත් වෙන්නේ කොහොමද කියන එක ගැන කථා කළා. ඒක නරක practice එකක් නොවෙයි. නමුත් අපි තේරුම් ගන්න ඕනෑ කාරණය තමයි දැනටමත් මේවා "ක්ෂුද්‍ර මූල්‍ය" ලෙස නිර්වචනය කරලා හමාරයි, ඒකට ඉඩ දී හමාරයි කියන එක. එතකොට අපි මෙතැනින් එහාට ප්‍රජා මූල්‍ය ලෙස මේක පිළිගෙන, මේකේ තිබෙන වෙනස තේරුම් ගත්තොත් හොඳයි.

මේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අපි නියාමනය කළ යුතුයි. ජනතාවට හිරිහැර කරනවා සහ පීඩාකාරියි කියලා අපි හිතන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ඉතා ඉහළ පොලියට ණය ලබා දෙනවා. ඒවායේ ඉතා ඉහළ default rate එකක් තිබෙනවා. ඒ වාගේම, ඔවුන්ගේ ණය නැවත එකතු කර ගැනීමේ practices ජනතාවට ඉතාම පීඩාකාරියි. ඒ කාරණයට වඩා වෙනස්, ප්‍රජා මූල්‍ය ආයතන. ඔවුන් ගම් තුළ ක්‍රියාත්මක වෙන්නේ; සාමාජිකත්වය මත වැඩ කරන්නේ. ඒ වාගේම ඔවුන් ඇත්තටම ඉතාම අඩු පොලියකට තමයි ණය දෙන්නේ. ඒ නිසා ඒ default rate එක අනෙක් සමාගම් තරම් නැහැ. ඒ නිසා මේ categories දෙක අතර යම් වෙනසක් තිබෙනවා. අපි හිතනවා, ඉදිරියේදී මේ වෙනස සැලකිල්ලට ගෙන රෙගුලාසි නිකුත් කිරීම හෝ මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කිරීම වැදගත් බව. අපේ ආංශික අධීක්ෂණ කාරක සභාව නිර්දේශ නිකුත් කළේත් ඒ නිසායි. මෙතැන අද කථා කරපු පිරිස් මේ සඳහා මීට පෙර අවධානය යොමු කළා නම්, -2016දී කළා නම්, 2024දී කළා නම්- අද කථා කරන ගොඩක් දෙනා තමන්ගේ කාර්යභාරය කරන්න ඕනෑ අවස්ථාවලදී හරියට කළා නම් මේ තත්ත්වයට මේක එන්නේ නැහැ. ඒ නිසා අපට වගකීමක් තිබෙනවා, ජනතාවාදී රජයක් ලෙස ජනතාවට - විශේෂයෙන් කාන්තාවන් වෙනුවෙන් - යහපත් ආකාරයට මේ නීති ගෙනෙන්න. අපි බොහොම අවධාරණයෙන් කියන්න ඕනෑ, ජනතාවට අවාසිසහගත, විශේෂයෙන් කාන්තාවන් සහ ප්‍රජා මූල්‍ය සංවිධානවලට අවාසිසහගත, ඔවුන් දැඩි නියාමනයකට ලක් කරන හෝ ඔවුන් විනාශ කරනසුළු ආකාරයේ ප්‍රතිපත්තියකට අපි කිසිසේත්ම එළඹෙන්නේ නැහැ කියන තහවුරුව ලබා දෙන බව. ඒ බව කියමින් මගේ කථාව අවසන් කරනවා.

මට මේ කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත, දෙවන වර කියවීම.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Anil Jayantha]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 44 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 44ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 44 ordered to stand part of the Bill.*

## 45 වන වගන්තිය.- (ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම)
වාසකම් 45.- (வாடிக்கையாளர் பாதுகாப்பு பற்றிய வழிகாட்டு நெறிகளை வகுத்தமைத்தல்)
CLAUSE 45.- *(Formulation of guidelines in customer protection)*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"54 වන පිටුවේ, 30 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සේවානියුක්තයන්ට සන්නිවේදනය කරනු ලැබිය යුතු ය:

එසේ වුවද, සෑම බලපත්‍රලාභියකු විසින්ම මාර්ගෝපදේශ සකස් කිරීමේ දී 44වන, 46වන, 47වන, 48වන, 49වන සහ 52වන වගන්තිවල විධිවිධානවලට අනුකූලව කටයුතු කරන බවට අධිකාරිය විසින් වගබලා ගනු ලැබිය යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***45 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*45ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 45, as amended, ordered to stand part of the Bill.*

## 46 වන වගන්තිය.- (බලපත්‍රලාභියාගේ වගකීම්)
## வாசகம் 46.- (உரிமமளிக்கப்பட்டவரொருவரின் கடப்பாடுகள்)
CLAUSE 46.- *(Obligations of a licencee)*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "55 වන පිටුවේ, 17 වන පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'දීම; සහ' "

(2) "55 වන පිටුවේ, 20 වන පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ගැනීම,

(ඊ) බලපත්‍රලාභියා විසින් සපයනු ලබන සේවාවන් ද, ගිවිසුමේ නියම සහ අයකරනු ලබන පොලී අනුපාතික, අධිභාර සහ ගාස්තු ද සම්බන්ධයෙන් නිරවද්‍ය සහ නිශ්චිත තොරතුරු එක් එක් ගනුදෙනුකරු වෙත ලබාදීම;

(උ) ණය ගැනුම්කරුවන්ගේ පූර්ව ණය දීම සහ පශ්චාත් ණය දීම පිළිබඳ ඇගයීම් සිදුකිරීම;

(ඌ) යම් අපහාසාත්මක හෝ ප්‍රචණ්ඩකාරී ණය වාරික එකතු කිරීමේ පිළිවෙත් භාවිත නොකිරීම; සහ

(එ) ණය මුදලක් ආපසු ගෙවීම ආරම්භ කිරීමට පෙරාතුව සහන කාලසීමාවක් ප්‍රදානය කිරීම:

එසේ වුවද, බලපත්‍රලාභියා විසින්, එම සහන කාලසීමාව නිශ්චය කිරීමේ දී ණය ගැනුම්කරුගේ ව්‍යාපාරයේ ස්වභාවය සහ ණය ආපසු ගෙවීමේ හැකියාව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.' "; සහ

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***46 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*46ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 46, as amended, ordered to stand part of the Bill.*

***47 සහ 48 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*47ஆம், 48ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 47 and 48 ordered to stand part of the Bill.*

## 49 වන වගන්තිය.- (බලපත්‍රලාභියකු සම්බන්ධයෙන් වන තහනම් ක්‍රියා)
## வாசகம் 49.- (உரிமமளிக்கப்பட்டவரினால் தடைசெய்யப்பட்ட நடவடிக்கைகள்)
CLAUSE 49.- *(Actions prohibited by a licencee)*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "57 වන පිටුවේ, 2 වන පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) 37 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නිකුත් කරනු ලබන විධාන මඟින් නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් නිශ්චය කරනු ලබන උපරිම වාර්ෂික පොලී අනුපාතිකය සහ එම ණය මුදල් සහ ණය පහසුකම් සඳහා ගෙවිය යුතු ස්ථාවර අවම පොලී අනුපාතිකය ඉක්මවූ අනුපාතිකයක් මත යම් ණය මුදලක් සඳහා පොලී ලබාගැනීම;

(ආ) හිස්, අසම්පූර්ණ හෝ වෙනස් කළ ණය' ";

(2) "57 වන පිටුවේ, 24 වන පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'දී අයුතු බලපෑම් සිදුකිරීම;' " සහ

(3) "57 වන පිටුවේ, 31 වන පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'හෝ අවමන් කිරීම; හෝ

(ඌ) ණය ගෙවීම් වෙනුවට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ හිලව් කිරීම.' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***49 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*49ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 49, as amended, ordered to stand part of the Bill.*

***50 සිට 84 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*50ஆம் வாசகத்திலிருந்து 84ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 50 to 84 ordered to stand part of the Bill.*

***උපලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*அட்டவணை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Schedule ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Bill reported with Amendments.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ සහ අංක දෝෂ නිවැරදි කර ගැනීම සඳහා සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න, ගරු ඉම්රාන් මහරූෆ් මහතා.

# කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! அண்மையில் ஏற்பட்ட 'தித்வா' புயல் மற்றும் வெள்ளம் காரணமாக திருகோணமலை மாவட்டம் கடுமையாகப் பாதிக்கப்பட்டது. அதிலும் குறிப்பாக, மூதூர், கிண்ணியா, வெருகல், குச்சவெளி, சேருவிலை போன்ற பிரதேச செயலகப் பிரிவுகள் அதிகமாகப் பாதிக்கப்பட்டன. இந்த அனர்த்தம் ஏற்பட்டதற்குப் பிறகு பாராளுமன்றத்தில் உரையாற்றிய மாண்புமிகு சனாதிபதி அவர்கள், வீடு முழுமையாகச் சேதமடைந்திருந்தால் 50 இலட்சம் ரூபாயும், வீட்டையும் காணியையும் முழுமையாக இழந்திருந்தால் ஒரு கோடி ரூபாயும், வீடு பகுதியளவில் சேதமடைந்திருந்தால் 25 இலட்சம் ரூபாயும், வீட்டுக் கூரையின் தகரமொன்று பறந்திருந்தால் 25,000 ரூபாயும், வெள்ளநீர் புகுந்த வீடுகளைச் சுத்தம் செய்வதற்கு 25,000 ரூபாயும், வெள்ளநீர் புகுந்து சமையலறை உபகரணங்கள் உட்பட அத்தியாவசிய வீட்டுப் பொருட்கள் சேதமடைந்திருந்தால் 50,000 ரூபாயும், மாணவர்களின் பாடசாலை சீருடை மற்றும் உபகரணங்கள் சேதமடைந் திருந்தால் அவற்றைக் கொள்வனவு செய்வதற்காக 15,000 ரூபாயும், வீடுகளை இழந்தவர்கள் வாடகை வீட்டில் குடியிருப்பதற்கு 3 மாதங்களுக்குத் தலா 20,000 ரூபாயும் வழங்கப்படுமெனச் சொல்லியிருந்தார். ஆனாலும், திருகோணமலை மாவட்டத்தில் பாதிக்கப்பட்ட பலருக்கு உரிய கொடுப்பனவுகள் இன்னும் வழங்கப்படவில்லை என்பதை இந்த இடத்தில் தெரிவித்துக் கொள்கின்றேன்.

முக்கியமாக, மாவிலாறு அணை உடைப்பெடுத்ததன் காரணமாக மூதூர் பிரதேசம் முற்றாக நீரில் மூழ்கியது. இதன் காரணமாக ஒரே நாளில் அதிகமான மக்கள் வெள்ளத்தில் மூழ்கியிருந்தார்கள். அவர்கள் இடம்பெயர்ந்து பாடசாலை களிலே தங்கியிருந்தார்கள். இதனால் அவர்கள் பல கஷ்டங்களை அனுபவித்தார்கள். மாண்புமிகு சனாதிபதியின் அறிக்கைக்கு அமைவாக, பிரதேச செயலாளர்கள் மற்றும் கிராம சேவகர்கள் பாதிக்கப்பட்டவர்களை உரிய முறையில் பதிவுசெய்து, அது தொடர்பான விபரங்களை மாவட்டச் செயலகத்துக்கு அனுப்பியிருக்கிறார்கள். அதன் அடிப் படையில், மொத்தமாகப் பாதிக்கப்பட்ட குடும்பங்களின் எண்ணிக்கை 9,516. இதில் உலர் உணவு தேவைப்படுகின்ற 8,758 குடும்பங்களினதும், வீடுகளைச் சுத்தம் செய்யவேண்டிய 6,932 குடும்பங்களினதும், பாடசாலை சீருடை உட்பட உபகரணங்கள் சேதமடைந்த 4,383 மாணவர்களினதும், சமையலறை உபகரணங்கள் மற்றும் அத்தியாவசிய வீட்டுப் பொருட்கள் சேதமடைந்த 1,692 குடும்பங்களினதும் விபரங்கள் உள்ளடங்குகின்றன. இந்த விபரங்கள் பிரதேச செயலகத்தால் மாவட்டச் செயலகத்துக்கு அனுப்பிவைக்கப்பட்டு இருக் கின்றன. இதில், வீடுகளைச் சுத்தம் செய்வதற்கு வழங்கப் படுகின்ற 25,000 ரூபாய் கொடுப்பனவுக்காகத் தெரிவு செய்யப்பட்டுள்ள 6,932 குடும்பங்கள் 50,000 கொடுப்பனவுக்கும் விண்ணப்பித்து இருக்கின்றன.

ஆனால், பிரதேச செயலகத்தால் 50,000 ரூபாய் கொடுப்பனவுக்காக 1,692 பேர்தான் தெரிவுசெய்யப்பட்டு, விபரங்கள் அனுப்பி வைக்கப்பட்டு இருக்கின்றன. இவர்களில் இதுவரை 330 பேருக்கு மாத்திரமே இந்தக் கொடுப்பனவு வழங்கப்பட்டு இருக்கின்றது. இந்த அநீதி சம்பந்தமாக மூதூர் பிரதேச அனைத்துப் பள்ளிவாசல்கள் சம்மேளனம் மாண்புமிகு சனாதிபதி அவர்களுக்குக் கடிதமொன்றை அனுப்பி யிருக்கிறது. அந்தக் கடிதத்தின் பிரதியை நான் ஹன்சாட் பதிவுக்காகச் ***சமர்ப்பிக்கின்றேன்.**

பாதிக்கப்பட்டவர்களுக்கு உரிய கொடுப்பனவுகள் கிடைக்கப் பெறவேண்டும் என்ற அடிப்படையில்தான் நான் இன்று இந்த ஒத்திவைப்புவேளை வினாவைக் கேட்கின்றேன்.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

I. 'தித்வா' புயல் மற்றும் வெள்ளம் காரணமாக திருகோணமலை மாவட்டத்தில் பாதிக்கப்பட்ட குடும்பங்கள் எத்தனை? அதில், நிவாரணத்துக்காக விண்ணப்பித்த அனைவருக்கும் நஷ்டஈடு வழங்கப்பட்டுள்ளதா?

II. அரசாங்க சுற்றுநிருபத்தின்படி, 25,000 ரூபாய் நஷ்டஈட்டுக்கு விண்ணப்பித்தவர்களுக்கு 50,000 ரூபாய் நஷ்டஈடு கோரி விண்ணப்பிக்க முடியுமா, முடியாதா?

III. திருகோணமலை மாவட்டத்தில் முக்கியமாக மூதூர் பிரதேச செயலாளர் பிரிவில், 50,000 ரூபாய் நஷ்ட ஈட்டுக்காக 6,932 குடும்பங்கள் விண்ணப்பித்துள்ள போதிலும், 1,692 குடும்பங்களின் விபரங்கள் மாத்திரமே பிரதேச செயலகத்தால் மாவட்டச் செயலகத்துக்கு அனுப்பிவைக்கப்பட்டுள்ளது. இதற்கான காரணம் என்ன?

IV. 50,000 ரூபாய் நட்டஈட்டுக்கு விண்ணப்பித்த 1,692 பேரில், இதுவரை 330 பேருக்கு மாத்திரமே நஷ்டஈடு வழங்கப்பட்டுள்ளது. மிகுதிப் பேருக்கு இந்த நஷ்டஈடு எப்பொழுது வழங்கப்படும்?

V. கிராம சேவகர்களால் சரிபார்த்து சேகரிக்கப்பட்டு, பிரதேச செயலாளரால் உறுதிப்படுத்தப்பட்ட பயனாளிகளின் எண்ணிக்கையில் மாற்றம் செய்யுமாறு அரசாங்கம் மாவட்டச் செயலாளர்கள் ஊடாக அழுத்தம் கொடுக்கின்றதா?

VI. மண்சரிவு மற்றும் வெள்ளம் காரணமாக வீடுகளையும் காணிகளையும் இழந்தவர்கள் எத்தனை பேர்? அவர்களில் எத்தனை பேருக்கு வீட்டுக்கான நஷ்டஈடு 50 இலட்சம் ரூபாய் வழங்கப்பட்டுள்ளது?

VII. காணிகளை இழந்த எத்தனை பேருக்கு மாற்றுக் காணி அல்லது அதற்கான நஷ்டஈடு 50 இலட்சம் ரூபாய் வழங்கப்பட்டுள்ளது?

VIII. வீடுகளை இழந்தவர்கள் வாடகை வீட்டில் இருப்பதற்காக மூன்று மாதங்களுக்கு தலா 20,000 ரூபாய் வழங்குவதாக சனாதிபதி அவர்கள் அறிவித்திருந்தார். இதுவரையில் எத்தனை பேருக்கு வீட்டு வாடகைக்காக 20,000 ரூபாய் வழங்கப் பட்டுள்ளது?

IX. புத்தளம் மாவட்டத்தின் அறுவைக்காடு கிராமத் திலுள்ள மக்கள் இன்னும் வெள்ளத்தால் பாதிக்கப் பட்டுள்ளனர் என்பதை கௌரவ அமைச்சர் அவர்கள் அறிவாரா? அவர்கள் சொந்த வீடுகளில் குடியேறு வதற்கு துரித நடவடிக்கை மேற்கொள்ளப்படுமா?

வனாத்துவில்லு பிரதேச செயலகத்துக்கு உட்பட்ட கரைத்தீவு, சின்ன நாகவில்லு பகுதி கடந்த நவம்பர் மாதத்தில் ஏற்பட்ட 'தித்வா' சூறாவளியால் பெரும் பாதிப்புக்குள்ளானது. இவ்வனர்த்தம் ஏற்பட்டு 100 நாட்கள் கடந்தும் அங்கு இன்னும் 4 அடி உயரத்துக்கு வெள்ளநீர் தேங்கி நிற்கின்றது. அங்கு 24 வீடுகளும் ஒரு முன்பள்ளியும் இன்னும் வெள்ள நீரில் மூழ்கிக் காணப்படுகின்றன. 26 குடும்பங்கள் இதனால் பாதிக்கப்பட்டு இருக்கின்றன. அத்தோடு, 150க்கும் மேற்பட்ட ஏக்கர் தென்னை மற்றும் மரமுந்திரிகை பயிர்செய்கை செய்யக்கூடிய நிலங்கள் இன்னும் வெள்ள நீரில் மூழ்கிக் கிடக்கின்றன. இங்கு உரிய நிவாரண நடவடிக்கைகள் இடம்பெறாமையால், இது சம்பந்தமான பல முறைப்பாடுகளை அந்த மக்கள் முன்வைத்துக்கொண்டு இருக்கின்றார்கள். இந்த விடயம் சம்பந்தமாக அரசாங்கம் மேற்கொள்ளும் நடவடிக்கைகள் குறித்து பாராளுமன்றத்துக்குத் தெளிவுபடுத்த முடியுமா?

இந்தப் பிரதேச மக்கள் Rebuilding of Sinnanagawillu ஊடாக கோரிக்கை முன்வைத்து இருக்கிறார்கள். அதை நான் ஹன்சாட் பதிவுக்காகச் *சமர்ப்பிக்கின்றேன்.

X. கண்டி மாவட்டம் உடுநுவர தேர்தல் தொகுதி யிலுள்ள ரம்மலக்க கிராமம் 'தித்வா' அனர்த்தத்தின் போது கடுமையாகப் பாதிக்கப்பட்டது. அந்த அடிப்படையில் 7 வீடுகள் முழுமையாகவும் 3 வீடுகள் பகுதியளவிலும் சேதமடைந்தன. அத்துடன், மேலும் பல பிரச்சினை களும் இந்தப் பிரதேசத்தில் காணப்படுகின்றன. இங்கு இடம் பெற்ற பாதிப்புகளுக்கான நிவாரண உதவிகள் குறித்து வெளிப்படுத்த முடியுமா? அத்துடன், இந்தப் பகுதியிலுள்ள கற்குளியால் அனர்த்தம் ஏற்படுமென்ற அச்சம் நிலவுகின்றது. இது குறித்து அரசாங்கம் கவனம் செலுத்துமா?

கொடுப்பனவு வழங்குகின்ற விடயத்தில் கவனத் தைச் செலுத்தி, பாதிக்கப்பட்ட மக்களுக்கான கொடுப்பனவுகளை அரசாங்கம் வழங்குவதற்கான நடவடிக்கையை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුරු ලබා දීම, ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේදී අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

"දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා, ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළ පරිදි චක්‍රලේඛ මඟින් විශේෂ වැඩ පිළිවෙළක් සකසා තිබෙනවා.

I. ඒ අනුව "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට, පීඩාවට පත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පවුල් 27,515ක් සහ පුද්ගලයින් 91,087ක් වන්දි ඉල්ලුම් කර තිබෙනවා. ඒ සියල්ලන්ටම වන්දි ගෙවා අවසන් නැහැ. ඒ ගෙවීම් කටයුතු දැනටත් කරගෙන යනවා. තවත් ඉක්සරහට ගෙවීම් කටයුතු කරනවා. දැනට ගෙවලා තිබෙන සියලුම අයවලුන්ගේ විස්තර ඇතුළත් දීර්ඝ ලැයිස්තුවක් තිබෙනවා. එය ඇමුණුම 01 මඟින් දක්වා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒක ඔබතුමාට බලන්න පුළුවන්.

II. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් නිකුත් කර තිබෙන මාර්ගෝපදේශ අනුව රුපියල් 25,000 දීමනාව ලබා ගන්න සුදුසුකම් ලබන්නේ පහත අවස්ථාවන්හිදීය.

1. පූර්ණ හානියට පත් වූ නිවාස

2. ගංවතුර, පිටාර ජලය, සුළි සුළං, නාය යෑම්, කණ්ඩි කඩා වැටීම් හේතුවෙන් අර්ධ හානියට පත් වූ නිවාස

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

3. නිවාස හානියක් සිදු නොවුණද, ගංවතුර, සුළි සුළං, නාය යෑම්, කණ්ඩි කඩා වැටීම් හේතුවෙන් අපිරිසිදු තත්ත්වයකට පත් වූ නිවාස

ඒ වාගේම රුපියල් 50,000 දීමනාව ලබා දීමට සුදුසුකම් ලබන්නේ පහත අවස්ථාවන්හිදීය.

1. පූර්ණ හානියට පත් වූ නිවාස
2. ගංවතුර, පිටාර ජලය, සුළි සුළං, නාය යෑම්, කණ්ඩි කඩා වැටීම් හේතුවෙන් අර්ධ හානියට පත් වූ නිවාස
3. ගංවතුර, පිටාර ජලය, සුළි සුළං, නාය යෑම් හා කණ්ඩි කඩා වැටීම් හේතුවෙන් මුළුතැන්ගෙයි උපකරණ හා අත්‍යවශ්‍ය ගෘහ භාණ්ඩ හානියට පත් වූ නිවාස

ඒ අනුව රුපියල් 25,000 දීමනාව සඳහා සුදුසුකම් ලබන සියලුම ප්‍රතිලාභීන් රුපියල් 50,000 දීමනාව සඳහා සුදුසුකම් නොලබනවා.

මේ වන්දි ගෙවීම් සම්බන්ධව නිරන්තරයෙන් අසනු ලබන බැවින්, මේ ගෙවීම් ක්‍රමය සඳහා නිකුත් කර තිබෙන මාර්ගෝපදේශය ඇමුණුම 02 මඟින් දැක්වේ. ඒකෙන් ඔබතුමාට මේ පිළිබඳව විශේෂ අවබෝධයක් ලබා ගන්න පුළුවන්.

III. ඔබතුමාගේ තුන්වන ප්‍රශ්නය අනුව අපි ඊයේ මුතූර් ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් කරුණු විමසුවා. ඒවා ලැබුණු පසු විස්තරාත්මකව ගරු සභාවට ඉදිරිපත් කරනවා.

IV. 2026 පෙබරවාරි 20වන දා වන විට ප්‍රතිලාභීන් 499දෙනෙකු සඳහා දීමනාව ගෙවා අවසන් කර තිබෙනවා. ඔබතුමා සඳහන් කළ පරිදි 1,692දෙනාගෙන් 330දෙනෙකුට තමයි මේ වන විට වන්දි ගෙවා තිබෙන්නේ. ඒකේ ඉතිරි ප්‍රතිලාභීන් සඳහා වන්දි ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන මේ වන විට දිස්ත්‍රික් ලේකම්ට යොමු කර තිබෙනවා. මෙහිදී ගෙවලා තිබෙන 490දෙනාගේ විස්තරයි, ගෙවන්න තිබෙන ඉතිරි විස්තරයි ඇමුණුම 03 මඟින් දක්වා තිබෙනවා.

V. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයට මේ වන තෙක් එවැනි සිදුවීමක් වාර්තා වෙලා නැහැ. රජයේ නිලධාරින් ඉතාම වගකීමෙන් දිවා රාත්‍රි නොබලා කටයුතු කරනවා. අපේ රජය විසින් ඔවුන්ට කිසිම බලපෑමක් සිද්ධ කරන්නේ නැහැ.

VI. 2026 පෙබරවාරි 20 දින වන විට පූර්ණ නිවාස හානි සිදු වූ ප්‍රතිලාභීන් 19දෙනෙකු සඳහා මූලික වශයෙන් ගෙවනු ලබන රුපියල් මිලියන 2ක වාරික මුදල ගෙවා අවසන් කර තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 38ක් වියදම් කර තිබෙනවා.

VII. මේ පිළිබඳව දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් විමසා තොරතුරු අරගෙන ඉදිරියේදී ඒවා සභාගත කරනවා.

VIII. නිවාස කුලී දීමනාව සඳහා පෙබරවාරි 20වන දා වන විට පවුල් 2ක් පමණයි ඉල්ලුම් කරලා තිබෙන්නේ. ඒ ප්‍රතිලාභීන් දෙදෙනා සඳහා දීමනාව ගෙවා අවසන් කර තිබෙනවා.

IX. වගා හානි සඳහා ගෙවීම් කිරීම ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ චක්‍රලේඛ මඟින් ආවරණය වෙන්නේ නැහැ. ඒක වෙනත් අමාත්‍යාංශයකින් සිද්ධ වෙන්නේ. අපි ඒ අමාත්‍යාංශයට එය යොමු කරන්නම්. ඔබතුමාට එතැනින් තොරතුරු ලබා ගන්න පුළුවන්.

X. 2026 මාර්තු 3වන දා - ඊයේ - වනකොට මහනුවර දිස්ත්‍රික්කයේ පූර්ණ හානි සඳහා මූලික වශයෙන් ගෙවනු ලබන රුපියල් මිලියන 2ක වාරික මුදල ගෙවීම සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත රුපියල් මිලියන 3,948ක ප්‍රතිපාදන මුදලක්ද, ආර්ධ නිවාස හානි සඳහා වන්දි ගෙවීමට රුපියල් මිලියන 4,591ක්ද ලබා දී තිබෙනවා. ඒ කටයුතු ඉස්සරහට ඉක්මන් කරන්නත්, විධිමත් කරන්නත් විශේෂ වැඩ පිළිවෙළක් යොදා තිබෙන බවත් ගරු සභාවට කියනවා.

ඇමුණුම 01, 02 සහ 03 **සභාගත*** කරමි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන දෙවන ප්‍රශ්නය, ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෑත ඉතිහාසයේ ලංකාවට වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් ඇවිල්ලා තිබුණේ 2018 වසරේ. හැබැයි ඒ අභියෝගය අවසන් කරලා පසුගිය වසර වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් ලංකාවට ආ වසර විධියට වාර්තාවක් තැබුවා. පාස්කු ප්‍රහාරය, කොරෝනා වසංගතය, ආර්ථික අවපාතය වැනි දේවලින් පසුව වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් ලංකාවට ආ වසර බවට පසුගිය වසර පත් වුණා. හැබැයි, එසේ සංචාරකයන් විශාල ප්‍රමාණයක් අපේ රටට ආවත් ගුවන් තොටුපොළ ආශ්‍රිතව සංචාරකයන්ට පහසුකම් සැපයීමේදී එය ප්‍රමාණවත් නැති නිසා යම් යම් ගැටලු මතු වෙලා තිබෙන බව අපි දන්නවා. විදේශ රටක ඉඳලා එන සංචාරකයෙකුට Immigration එක හරහා ඇවිල්ලා clear වෙලා baggage අරගෙන එළියට එන්න සැලකිය යුතු කාලයක් ගත වෙනවා. අපි දන්නවා, සංචාරකයෙක් ලංකාවට එන්නේ මුදලක් වියදම් කරලා ඉතා ඉක්මනින් තමන්ගේ කාර්යභාරය කර ගන්නයි කියන එක. විශේෂයෙන්ම සංචාරකයින් රැගෙන යන රියැදුරන් පවා මෙහිදී අපහසුතාවට පත් වෙලා තිබෙනවා. එම රියැදුරන් තමන්ගේ වාහනය car porch එකට ගෙනෙන්න සැලකිය යුතු වෙලාවක් ගන්නවා. මේ වාගේ කාරණා කීපයක් නිසා වර්තමාන ආණ්ඩුව ගුවන් තොටුපොළ තුළ යම් යම් සංවර්ධන කටයුතු සිදු කරමින් පවතිනවා. ඒ සංවර්ධන කටයුතුවල ප්‍රගතිය සම්බන්ධව විමසා මම ප්‍රශ්න කිහිපයක් අදාළ අමාත්‍යතුමාට යොමු කරනවා.

2018 වසරෙන් පසුව මෙම වසරේ ජනවාරි මස ඉතිහාසයේ වැඩිම ගුවන් මගී හැසිරවීම වාර්තා කර ඇත.

1. 2026 ජනවාරි මස සමස්ත ගුවන් මගී හැසිරවීම කොපමණද?
2. මීළඟ වසර 2හි අපේක්ෂිත මගී හැසිරවීම් ප්‍රමාණය කොපමණද?
3. එහිදී වැඩිම දායකත්වය ලබා දෙන කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි දෙවන මගී පර්යන්තය ඇති කිරීම ඉදිරි ඉලක්ක සපුරා ගැනීමට අත්‍යවශ්‍ය බව ඔබතුමා පිළිගන්නේද?
4. එසේ නම්, ඒ සඳහා ඇති සැලසුම සහ කාල රාමුව කුමක්ද?
5. ඊට සමගාමීව අභ්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධනය සඳහා අමාත්‍යාංශයට ඇති සැලසුම කුමක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ප්‍රශ්න සඳහා මා ගරු අමාත්‍යතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුර ලබා දීම, ගරු අනුර කරුණාතිලක අමාත්‍යතුමා.

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. 2026 ජනවාරි මාසය තුළ සමස්ත ගුවන් මගී හැසිරවීම 1,045,994යි.

2. 2027 වසරේදී මිලියන 11.6ක්, 2028 වසරේදී මිලියන 12.6ක්.

3. ඔව්.

4. මේ සඳහා ඇති කාල රාමුව ගැන සඳහන් කරනවා නම්, ඉදිරි වර්ෂවලදී කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ දෙවන මගී පර්යන්තය ඉදිකිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව 2029 වර්ෂය වෙනකොට එහි වැඩ අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර දැන් එය දෙවන අදියරේ පවතින්නේ. නමුත් අපි දන්නවා, මම කලින් ප්‍රකාශ කළා වාගේ 2027 සහ 2028 අවුරුදුවල අපේක්ෂිත හැසිරවීම් ප්‍රමාණය දෙස බලද්දී අපිට 2029 වෙනකම් ඉන්න පුළුවන්කමක් නැති බව. ඒ නිසා දැනට අපි සැලසුම් සකස් කර තිබෙනවා, පළමුවන මගී පර්යන්තයේ කටයුතු තවදුරටත් පුළුල් කරන්න.

   ඒ වාගේම දැනට අපි තාවකාලික ඉදිකිරීමක් කර අදාළ counters සකස් කර තිබෙනවා. මම කලින් සඳහන් කළා වාගේ පළමුවන මගී පර්යන්තයේ ඉඩකඩ පුළුල් කිරීමත් එක්ක වැඩි counters ප්‍රමාණයක් අපට ලබා දෙන්න පුළුවන්. ඒ සඳහා ගුවන් සේවා ආයතන කිහිපයකට වැඩි අවස්ථාවක් ලබා දීලා සමාන්තරව වැඩි ගුවන් සේවා ප්‍රමාණයක් ක්‍රියාත්මක කර ගැනීම සඳහා කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

5. ඒ වාගේම ඊට සමගාමීව අභ්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීම සඳහා අපි සැලසුම් සකස් කර තිබෙනවා. විශේෂයෙන්ම සංචාරකයින්ගේ පැමිණීම වර්ධනය වීමත් එක්ක රට තුළ අභ්‍යන්තර ගුවන් සේවාවල වර්ධනයක් අපි අපේක්ෂා කරනවා. ඒ සඳහා අවශ්‍ය වන ගුවන් තොටුපොළ පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය හැටියට මේ වෙනකොටත් මූලික සාකච්ඡා කිහිපයක් සිදු කර තිබෙනවා. විශේෂයෙන්ම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ තුළ අභ්‍යන්තර ගුවන් ගමන් සඳහා දැනටමත් පෞද්ගලික ආයතනයක් විසින් ක්‍රියාත්මක කරන terminal එකක් තිබෙනවා. ඊට අමතරව එහි අමතර terminal එකක් - අභ්‍යන්තර ගුවන් ගමන් සේවා සඳහා කැප වුණු terminal එකක් - ඇති කිරීම සඳහා මූලික ශක්‍යතා අධ්‍යයනය මේ වනවිට සිදු කරමින් පවතිනවා. ඒ වාගේම මුළු ලංකාවේම ක්‍රියාත්මක වන අභ්‍යන්තර ගුවන් ගමන් සේවා සම්බන්ධව ශක්‍යතා අධ්‍යයනයක් අපි World Bank එකත් මුල් කරගෙන මේ වෙනකොට කරමින් පවතිනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඒකේ වාර්තාව ලබන අවුරුද්දේ අවසානය වෙනකොට අපට ලැබෙයි කියලා. එහි නිර්දේශ සහ සොයා ගන්නා කරුණු මත තවදුරටත් අපේ අභ්‍යන්තර ගුවන් ගමන් සහ ඊට අවශ්‍ය වන යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහා කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම දැනටමත් අභ්‍යන්තර ගුවන් සේවා ක්‍රියාත්මක කරන පෞද්ගලික දේශීය ආයතනත් සමඟ සම්බන්ධ වෙලා ඔවුන්ගේ ගැටලු හඳුනාගෙන ඒ සඳහා විධිමත් විසඳුම් ලබා දීමට කටයුතු කිරීම මඟින් අවශ්‍ය වන වර්ධනයන් ලබා ගන්න අපි අපේක්ෂා කරනවා.

ස්තුතියි.

*එකල්හි වේලාව අ.භා. **5.30** පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. **6.04**ට, **2026** මාර්තු **05**වන බ්‍රහස්පතින්දා පූ.භා. **9.30** වන තෙක් කල් ගියේය.*

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.04க்கு, பாராளுமன்றம் 2026 மார்ச் 05, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.04 p.m. until 9.30 a.m. on Thursday, 05th March, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.